229 වන කාණ්ඩය - 10 වන කලාපය
தொகுதி 229 - இல. 10
Volume 229 - No. 10

2014 ඔක්තෝබර් 21වන අඟහරුවාදා
2014 ஒக்ரோபர் 21, செவ்வாய்க்கிழமை
Tuesday, 21st October, 2014

පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)
பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)
PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන :
කථානායකතුමාගේ සහතික

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:
ශ්‍රී ලාංකීය සිනමාව මුහුණ දී තිබෙන අර්බුදකාරී තත්ත්වය

ඩීඑෆ්සීසී බැංකුව (ඉවත් කිරීමේ හා ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත :
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදි.

2005 වර්ෂයේ අය වැය ඇස්තමේන්තුවෙන් තෝරාගත් අමාත්‍යාංශවල වැය ශීර්ෂ පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා වන විශේෂ කාරක සභාව

කල් තැබීමේ යෝජනාව:
ලංකා පොස්ෆේට් ලිමිටඩ් ආයතනය තුළ සිදුවන අයථා ක්‍රියා

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:
சபாநாயகரது சான்றுரை

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல்மூல வினா:
இலங்கை சினிமாத்துறை எதிர்நோக்கும் நெருக்கடிகள்

டிஎவ்சீசீ வங்கி (நீக்கல் மற்றும் விளைவாந் தன்மையினவான ஏற்பாடுகள்) சட்டமூலம் :
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

2015ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்ட மதிப்பீடுகளிலிருந்து தெரிவு செய்யப்பட்ட அமைச்சுக்களின் செலவுத் தலைப்புக்கள் பற்றிக் கலந்துரையாடுவதற்கான தெரிகுழு

ஒத்திவைப்புப் பிரேரணை:
லங்கா பொசுபேற் நிறுவன முறைகேடுகள்

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Speaker's Certificate

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Crisis faced by Sri Lankan Cinema

DFCC BANK (REPEAL AND CONSEQUENTIAL PROVISIONS) BILL:
Read a Second, and the Third time and passed as amended

SELECT COMMITTEE TO DISCUSS THE HEADS OF EXPENDITURE OF THE MINISTRIES SELECTED FROM THE BUDGET ESTIMATES OF THE YEAR 2015

ADJOURNMENT MOTION:
Irregular Activities in Lanka Phosphate Limited

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2014 ඔක්තෝබර් 21වන අඟහරුවාදා
2014 ඔක්ටோபர் 21, செவ்வாய்க்கிழமை
Tuesday, 21st October, 2014

අ.භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m,
MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

කථානායකතුමාගේ සහතිකය
சபாநாயகரது சான்றுரை
SPEAKER'S CERTIFICATE

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වැනි ව්‍යවස්ථාව අනුව, 2014 ඔක්තෝබර් මස 16 වන දින මා විසින් පහත සඳහන් පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු දි.මු. ජයරත්න මහතා (අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு டி.எம்.ஜயரத்ன - பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சரும்)
(The Hon. D.M. Jayaratne - Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs)

ගරු කථානායකතුමනි, 2012 වර්ෂය සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ 2013 වර්ෂය සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තා මුද්‍රණ හා ක්‍රමසම්පාදන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

2011 වර්ෂය සඳහා පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව. -[පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

උපදේශක කාරක සභා වාර්තා
ஆலோசனைக் குழு அறிக்கைகள்
CONSULTATIVE COMMITTEE REPORTS

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, 2010 වර්ෂය සඳහා ජාතික ජල සම්පාදන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සම්බන්ධයෙන් ජල සම්පාදන හා ජලාපවහන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

ගරු කථානායකතුමනි, පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම 2011 වර්ෂය සඳහා පුනරුත්ථාපන අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශන සම්බන්ධයෙන් පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පිළිගන්වන ලද වාර්තා
சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள்
REPORTS PRESENTED

කල්පවෘක්ෂ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
கல்பவுருக்ஷ சங்வர்தன பதனம (கூட்டிணைத்தல்) சட்டமூலம்
KALPAWRUKSHA DEVELOPMENT FOUNDATION (INCORPORATION) BILL

ගරු චන්දිම වීරක්කොඩි මහතා (නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා)
(மாண்புமிகு சந்திம வீரக்கொடி - பிரதிச் சபாநாயகரும் குழுக்களின் தவிசாளரும்)
(The Hon. Chandima Weerakkody - Deputy Speaker and Chairman of Committees)

ගරු කථානායකතුමනි, "කල්පවෘක්ෂ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ)" නමැති පනත් කෙටුම්පත පිළිබඳව "ඒ" ස්ථාවර කාරක සභාවේ වාර්තාව සහ එහි කාර්ය සටහන් මම ඉදිරිපත් කරමි.

[ගරු චන්දිම වීරක්කොඩි මහතා]

"වාර්තාව

'කල්පවෘක්ෂ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ)' නමැති පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක විසින් කරන ලද සංශෝධන සහිතව කාරක සභාව සලකා බැලූ අතර, මෙයට අමුණා ඇති පුනර් මුද්‍රණයේ දැක්වෙන යථෝක්ත සංශෝධන සහිතව පනත් කෙටුම්පතට එකඟ වී ඇත."

පනත් කෙටුම්පත ''ඒ ' ස්ථාවර කාරක සභාව විසින් වාර්තා කරන ලද පරිදි 2014 ඔක්තෝබර් 23 වන ඉඛසප්තින්දා සලකා බලනු ලැබේ.

சட்டமூலம் நிலைக்குழு 'ஏ' இனால் அறிக்கை செய்யப்பட்டவாறு 2014 ஒக்ரோபர் 23, வியாழக்கிழமை பரிசீலிக்கப்படவிருக்கிறது.

Bill, as reported by Standing Committee 'A," to be considered upon Thursday, 23rd October, 2014.

සිව්මුනි සෑ වෙහෙර බෞද්ධ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත

ஸிவ்முனி ஸே வெஹெர பௌத்த மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்

SIVMUNI SE VEHERA BUDDHIST FOUNDATION (INCORPORATION) BILL

ගරු චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)

ගරු කථානායකතුමනි, ''සිව්මුනි සෑ වෙහෙර බෞද්ධ පදනම (සංස්ථාගත කිරීමේ)'' නමැති පනත් කෙටුම්පත ''ඒ'' ස්ථාවර කාරක සභාවේ වාර්තාව සහ එහි කාර්ය සටහන් මම ඉදිරිපත් කරමි.

"වාර්තාව

'සිවුමුනි සෑ වෙහෙර බෞද්ධ පදනම (සංස්ථාගත කිරීමේ)' නමැති පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක විසින් කරන ලද සංශෝධන සහිතව කාරක සභාව සලකා බැලූ අතර, මෙයට අමුණා ඇති පුනර් මුද්‍රණයේ දැක්වෙන යථෝක්ත සංශෝධන සහිතව පනත් කෙටුම්පතට එකඟ වී ඇත."

පනත් කෙටුම්පත ''ඒ ' ස්ථාවර කාරක සභාව විසින් වාර්තා කරන ලද පරිදි 2014 ඔක්තෝබර් 23 වන ඉඛසප්තින්දා සලකා බලනු ලැබේ.

சட்டமூலம் நிலைக்குழு 'ஏ' இனால் அறிக்கை செய்யப்பட்டவாறு 2014 ஒக்ரோபர் 23, வியாழக்கிழமை பரிசீலிக்கப்படவிருக்கிறது.

Bill, as reported by Standing Committee 'A," to be considered upon Thursday, 23rd October, 2014.

පෙත්සම්

மனுக்கள்

PETITIONS

ගරු පී. දයාරත්න මහතා (ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා)
(மாண்புமிகு பீ. தயாரத்ன - உணவுப் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. P. Dayaratna - Minister of Food Security)

ගරු කථානායකතුමනි, ගාල්ල, බටගන්විල, අංක 92 දරන ස්ථානයෙහි පදිංචි යූ.එස්. ජයසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ගාමිණී ලොකුගේ මහතා - පැමිණ නැත.

ගරු කුමාර වෙල්ගම මහතා (ප්‍රවාහන අමාත්‍යතුමා)
(மாண்புமிகு குமார வெல்கம - போக்குவரத்து அமைச்சர்)
(The Hon. Kumara Welgama - Minister of Transport)

ගරු කථානායකතුමනි, කළුතර, නාගොඩ, අයි.ඩී.එච්. පාර, අංක 816 දරන ස්ථානයෙහි පදිංචි ඇම්. නෙල්සන් සිල්වා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Susantha Punchinilame - Deputy Minister of Economic Development)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් පහ පිළිගන්වමි.

(1) රත්නපුර, කහවත්ත, යායින්න, හේමාවාස යන ලිපිනයෙහි පදිංචි කේ. ධර්මසේන මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) වවුනියා, කලාප 06, මන්නාරම පාර, දිවි නැහුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවය කරන යූ. අනුර එස්. වීරරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) රත්නපුර, හිඳැල්ලන, ඇල්ලෙගෙදර යන ලිපිනයෙහි පදිංචි ජී.කේ.කේ.එම්.එස්. කරුණාරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) කන්තලේ, ආරියවංශ මාවත, අංක 51/7 දරන ස්ථානයෙහි පදිංචි එච්.එච්. රසික ප්‍රියංකර මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(5) කොහිලගෙදර, නැලව, අංක 222/1 දරන ස්ථානයෙහි පදිංචි එම්.ඒ. ඉන්ද්‍රාණි ඥානලතා මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු විනායගමූර්ති මුරලිදරන් මහතා (නැවත පදිංචිකිරීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு விநாயகமூர்த்தி முரளிதரன் - மீள்குடியேற்ற பிரதி அமைச்சர்)
(The Hon. Vinayagamoorthi Muralidaran - Deputy Minister of Resettlement)

கௌரவ சபாநாயகர் அவர்களே, மட்டக்களப்பு சத்துருக் கொண்டான் குடியிருப்பில் வதியும் திருமதி கணேஸ்வரி அக்னேசியஸ் அவர்களிடமிருந்து கிடைக்கப் பெற்ற மனுவை நான் சமர்ப்பிக்கின்றேன்.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු එස්.ඒ. මුතුකුමාරණ මහතා - පැමිණ නැත.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

ගරු කථානායකතුමනි, බණ්ඩාරවෙල පොලිස් ස්ථානයෙහි සේවය කරන එස්.බී. දිසානායක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා - පැමිණ නැත.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

ගරු කථානායකතුමනි, අනුරාධපුර, උට්ටිමඩුව, කඟපත්විලගම යන ලිපිනයෙහි පදිංචි සෝමරත්න සෙනෙවිරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු යයි නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 1 - 2691/'12 -(1), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

අලි - මිනිස් ගැටුම හේතුවෙන් අහිමි වූ මිනිස් ජීවිත හා විනාශ වූ දේපොළ : විස්තර
யானை - மனித மோதலால் இழக்கப்பட்ட மனித உயிர்கள் மற்றும் சொத்துக்கள்: விபரம்
LIVES LOST AND PROPERTY DESTROYED DUE TO HUMAN-ELEPHANT CONFLICT: DETAILS

3958/'13

3. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය-(2):

(අ) (i) ශ්‍රී ලංකාවේ අලි - මිනිස් ගැටුම නිසා වාර්ෂිකව විශාල මිනිස් ජීවිත සංඛ්‍යාවක් අහිමි වන බව දන්නේද;

(ii) 2005 වර්ෂයේ සිට මේ දක්වා එසේ අහිමි වූ මිනිස් ජීවිත සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත සඳහන් කාල සීමාව තුළදී අලි - මිනිස් ගැටුම් හේතුවෙන් විනාශ වූ මිනිස් ජීවිත හා දේපොළ වෙනුවෙන් ගෙවන ලද වන්දි මුදල් ප්‍රමාණය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මාතර, මිදිගම රජයේ රෝහලේ ප්‍රධාන වෛද්‍ය සරත් විමලසූරිය මහතා අලි - මිනිස් ගැටුමට විසඳුමක් ලෙස විදුලි වැටක් නිර්මාණය කර ඇති බවත්;

(ii) මෙම උපකරණය පරීක්ෂණ කටයුතු සඳහා යොදා ගැනීමට වනජීවී නිලධාරීන් ලබා ගෙන ඇති බවත්;

(iii) එය මේ දක්වා ආපසු ලබාදී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) වෛද්‍ය සරත් විමලසූරිය මහතා විසින් අඩු වියදමින් නිර්මාණය කරන ලද විදුලි වැට පරීක්ෂා කර බලා එය අලි - මිනිස් ගැටුමට විසඳුමක් ලෙස භාවිතයට ගැනීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

වන සීවරාසිකළ්, වළප් පේණුකෛ අමෛච්සරෛක් කේට්ට විනා:

(அ) (i) இலங்கையில் யானை - மனித மோதல் காரணமாக வருடாந்தம் பெருமளவு மனித உயிர்கள் இழக்கப்படுகின்றன என்பதை அறிவாரா என்பதையும்;

(ii) 2005ஆம் ஆண்டு முதல் இன்றுவரை அவ்வாறு இழக்கப்பட்டுள்ள மனித உயிர்களின் எண்ணிக்கை வருடாந்த அடிப்படையில் தனித்தனியே எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி காலப்பகுதிக்குள் யானை - மனித மோதல்கள் காரணமாக அழிவடைந்துள்ள மனித உயிர்கள் மற்றும் சொத்துக்களுக்காக செலுத்தப் பட்ட நட்டஈட்டுத் தொகை வருடாந்த அடிப்படையில் தனித்தனியே எவ்வளவு என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மாத்தறை மிதிகம அரச வைத்தியசாலையின் ஓய்வுபெற்ற மருத்துவர் சரத் விமலசூரிய யானை - மனித மோதலுக்கான தீர்வொன்றாக மின்சார வேலியொன்றை உருவாக்கியுள்ளார் என்பதையும்;

(ii) இந்த உபகரணத்தை பரிசோதனை நடவடிக்கைகளுக்குப் பயன்படுத்துவதற்காக வனசீவராசிகள் அலுவலர்கள் பெற்றுக் கொண்டுள்ளார்கள் என்பதையும்;

(iii) அது இன்றுவரை திருப்பிக் கிடைக்கவில்லை என்பதையும்

அவர் அறிவாரா?

(இ) (i) மருத்துவர் சரத் விமலசூரிய குறைந்த செலவில் உருவாக்கியுள்ள மின்சார வேலியைப் பரிசோதனை செய்து அதனை யானை - மனித மோதலுக்கான தீர்வொன்றாகப் பயன்படுத்து வதற்கு நடவடிக்கை மேற்கொள்வாரா என்பதையும்;

(ii) ஆமெனில், அதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கை யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

[ගරු බුද්ධික පතිරණ මහතා]

asked the Minister of Wildlife Resources Conservation:

(a) Will he state -
  (i) whether he is aware that a large number of human lives are lost annually as a result of the human-elephant conflict in Sri Lanka;
  (ii) separately, the number of human lives lost annually as a result of this from the year 2005 to date; and
  (iii) separately, the amount of money paid annually as compensation for the human lives lost and property destroyed as a result of the human-elephant conflict during the above period of time?

(b) Is he aware -
  (i) that an electric fence has been designed as a solution to the human-elephant conflict by Dr. Sarath Wimalasuriya (retired) of the Midigama Government Hospital, Matara;
  (ii) that the aforesaid apparatus was obtained by wildlife officers to conduct tests; and
  (iii) that it has not been returned to him up to now?

(c) Will he inform this House -
  (i) whether action will be taken to examine the electric fence designed by Dr. Sarath Wimalasuriya at a low cost and use it as a solution to the human-elephant conflict; and
  (ii) if so, the action that will be taken in this regard?

(d) If not, why?

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා (වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමා)
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - வனசீவராசிகள் வளப் பேணுகை அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Minister of Wildlife Resources Conservation)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

(අ) (i) ඔව්, වන අලි පහරදීම් හේතුවෙන් වාර්ෂිකව මිනිස් ජීවිත 60-70 ක් පමණ අහිමි වේ.

(ii)

වර්ෂය	අහිමි වූ මිනිස් ජීවිත සංඛ්‍යාව
2005	77
2006	79
2007	72
2008	71
2009	50
2010	81
2011	60
2012	64
2013	70
2014.06.30 දක්වා	24

(iii) ඔව්.

වර්ෂය	ගෙවා ඇති මුදල රු: මිලියන
2005	6.82
2006	9.68
2007	11.92
2008	13.84
2009	16.63
2010	38.73
2011	25.18
2012	30.31
2013	31.08
2014.06.30 දක්වා	7.93 ගෙවා ඇත

(ආ) (i) වෛද්‍ය සරත් විමලසූරිය මහතා විසින් විදුලි වැටක් නිර්මාණය කර නොමැත. ඔහු විසින් එනජයිසරයක් පමණක් හඳුන්වා දී ඇත. එම එනජයිසරයේ විදුලි බල ධාරිතාවය විදුලි වැටෙහි කි.මී. 2 ක දුර ප්‍රමාණය සඳහා විදුලි බලය සැපයීමට පමණක් ප්‍රමාණවත් වේ.

(ii),(iii) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත භාරදී ඇති එනජයිසරය අයිනිකරු ඉල්ලා සිටින්නේ නම් ඔහුට එය නැවත භාර දීමට හැකිය.

(ඇ) (i) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මොරටුව විශ්වවිද්‍යාලය සමඟ සකස් කරන ලද පිරිවිතරයන්ට අනුව මිලදී ගන්නා ලද ජූල් 15 ක විදුලිබල ධාරිතාව සහිත එනජයිසරයක් මඟින් විදුලිවැට කිලෝමීටර 10ක් සඳහා විදුලිය සපයනු ලැබේ. වෛද්‍ය සරත් විමලසූරිය මහතා විසින් නිෂ්පාදනය කරන ලද එනජයිසරය කිලෝමීටර් දෙකක ප්‍රමාණයක් සඳහා පමණක් විදුලිය සපයන බැවින් එම නිර්මාණය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉදිකරන විදුලිවැටවලට ප්‍රමාණවත් නැත. ඔහු විසින් නිෂ්පාදනය කර ඇති මෙම එනජයිසරය වර්ග කිලෝමීටරයකට අඩු තාවකාලික හා ස්ථිර වගාවන් වන අලින්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා පුද්ගලිකව ඉදි කරනු ලබන විදුලිවැටවල් සඳහා යොදා ගැනීම ප්‍රචලිත කිරීමට සුදුසු වේ.

(ii) දැනට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමත පිරිවිතරයන් හා එම පිරිවිතරයන් අනුව මිල දී ගෙන ඇති එනජයිසරවල විස්තර පිළිබඳව වෛද්‍ය සරත් විමලසූරිය මහතා දැනුවත් කර, එම මට්ටමට එනජයිසරයක් වැඩි දියුණු කර ගන්නා ලෙස ඔහු වෙත දැනුම් දී ඇත.

(ඈ) අදාළ නොවේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳව ගරු ඇමතිතුමාට මා ස්තුතිවන්ත වෙනවා. මගේ පළමු වන අතුරු ප්‍රශ්නය මෙයයි. අලි මිනිස් ගැටුම නිසා පසු ගිය අවුරුද්දේ මිය ගිය අලි ගහනය කොපමණද, මිනිස් සංඛ්‍යාව කොපමණ ද කියා ගරු ඇමතිතුමාට කියන්නට පුළුවන් ද?

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
සාමාන්‍යයෙන් අලි මිනිස් ගැටුම් නිසා වාර්ෂිකව මිය යන අලි ගහනය 250ක් පමණ වෙනවා. 2013 වර්ෂයේ දළ වශයෙන් මිනිසුන් 70ක් පමණ මිය ගිහින් තිබෙනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

සමහර වනාන්තර අයිති වන්නේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට. තවත් සමහර වනාන්තර අයිති වන්නේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට. එතකොට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙන වෙනම අලි වැටවල් ඉදි කෙරුවාම ප්‍රශ්නයක් ඇති වනවා. සමහර ප්‍රදේශවල පාරේ එක පැත්තක කැලෑ අයිති වන්නේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට. අනෙක් පැත්තේ කැලෑ අයිති වන්නේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට. මේ දෙකේ වෙනස අලි දන්නේ නැහැ. ඒක දන්නේ අපි නේ. අලි වැටවල් ඉදි කිරීමේදී මේ දෙපාර්තමේන්තු දෙක අතර යම් කිසි ඒකමතිකත්වයක්, ඒකාබද්ධතාවක් හෝ සම්බන්ධීකරණ වැඩ පිළිවෙළක් තිබෙනවාද?

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව කිසි විටෙකත් අලි වැටක් නිර්මාණය කරන්නේ නැහැ. ගරු කථානායකතුමනි, අලි වැටක් ඉදි කිරීමේදී අපේ නව ප්‍රතිපත්තිය වන්නේ ප්‍රජාව සම්බන්ධ කර ගෙන එම කටයුත්ත කිරීමයි. ඒ ගමට; ගම්වාසීන්ට පරිපාලනය කර ගැනීමට හැකි වන ආකාරයෙන් ගමට කිට්ටුවෙන් තමයි අපි ඒ අලි වැට ඉදි කරන්නේ. එහිදී අපි ඉඩම් මායිම් පිළිබඳව සැලකිල්ලක් දක්වන්නේ නැහැ. මොකද, වන අලියා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයිති බල ප්‍රදේශයේත්, ඒ වාගේම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයිති බල ප්‍රදේශයේත් ජීවත් වනවා. ඊට පරිබාහිරව සංවර්ධිත කලාපයේත් වන අලියා ජීවත් වනවා. ඒ නිසා මේ මොන කලාපයේ වන අලියා හිටියත්, ඒ වන අලියාගේ අයිතිය සහ ඒ වන අලියා ආරක්ෂා කිරීමේ වගකීම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉතා පැහැදිලිව ඉටු කරනවා, ගරු කථානායකතුමනි. අලි වැටක් ඉදි කිරීමේදී ජනතාවගේ කැමැත්ත සහ අනෙක් අමාත්‍යාංශ හා ඒකාබද්ධවයි අපි ක්‍රියා කරන්නේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

හක්කපටස් පිළිබඳ ප්‍රශ්නය සම්බන්ධයෙන් වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයට යලි හිතන්නට සිද්ධ වෙයි. ගරු ඇමතිතුමනි, හක්කපටස් නිසා අලි පමණක් නොවෙයි, තවත් බොහෝ සතුන් මිය යන බව ඔබතුමාත් දන්නවා. හැබැයි, ළඟකදී ඉඳලා අලි ගහනයට ඉතා බරපතළ විධියට හක්කපටස් අභියෝගයක් වෙලා තිබෙනවා. ඒ නිසා හක්කපටස් නිසා අලි මිය යෑම හෝ අලින්ට සිදු වන බරපතළ අනතුරු අවම කරන්න වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ මොකක්ද?

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු කථානායකතුමනි, හක්කපටස් පමණක් නොවෙයි, ඇණ තට්ටු දැමීම, බොරු වළවල් කැපීම, වෙඩි බැඳීම වාගේම, ධාවනය වන ශීඝ්‍රගාමී දුම්රියවල හැපීම නිසාත් අලි මරණ සිදු වෙනවා. මේ සියල්ලටම පිළියම් යෙදීම සඳහා අපි වෙන වෙනම, එක එක විෂයයන් සඳහා අවශ්‍ය අපේ නිලධාරීන් යොදවා තිබෙනවා. දුම්රියෙන් සිදු වන අලි මරණ පිළිබඳව ගරු කුමාර වෙල්ගම ඇමතිතුමා එක්කත් අපි කථා කරලා එම දුම්රියවල ගමන් කරන්න අපේ නිලධාරීන් යොදවනවා. හක්කපටස් වාගේ දේවල්- [බාධා කිරීමක්] හැබැයි, අපි සතුටු වෙනවා, මොනරාගල, හම්බන්තොට වාගේ පැතිවල මෙවැනි තත්ත්වයක් නැති එක ගැන. ගරු කථානායකතුමනි, ටිකක් උඩහට වෙන්න වාගේ තමයි මෙවැනි තත්ත්වයන් තිබෙන්නේ. එවැනි ප්‍රදේශවල ඒ වාගේ දේවල් සිදු කරන අයට දැඩි දඬුවම් පමුණුවන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම, අපට තිබෙන නිලධාරි ඌනතාව මඟ හැරවීම සඳහා නිලධාරීන් 200 දෙනෙකු බඳවා ගැනීමට මේ වන විට අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් විභාගයක් පවත්වා, එම ප්‍රතිඵල ලබා ගෙන ඉදිරියේදී එම කටයුතු කරනවා.

අනෙකුත් කාරණා සඳහාත් අපි අවධානය යොමු කරනවා. විශේෂයෙන්ම හම්බන්තොට සිදු වන්නේ, පෞද්ගලික විදුලි වැටවල් නිසා සිදු වෙන ජීවිත හානියි. අපි ඒ ගැනත් අවධානය යොමු කර තිබෙනවා. ඒ අනුව ඒවා පරීක්ෂා කිරීම, අනවසර ඉදි කිරීම් නවත්වා දැමීම ආදී විශේෂ කාර්ය භාරයක් අපි ඉටු කර තිබෙනවා. මේ හැම එකකටම හේතුව, වන අලියා වනාන්තරයෙන් එළියට ඒමයි. එම නිසා අපි ඒ සතුන් වනාන්තරය ඇතුළේ රැඳවීමට, වනජීවී සංරක්ෂණ බල ප්‍රදේශය තුළ සුපෝෂණ ක්‍රියාවලිය ආරම්භ කර තිබෙනවා. ඒ අනුව ආක්‍රමණික ශාඛ ඉවත් කර පිට්ටනි සහ විල්ලු නිර්මාණය කරන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කර ගෙන යනවා, ගරු කථානායකතුමනි.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

හම්බන්තොට එහෙම සිදු වෙලා තිබෙනවා ද, ගරු කථානායකතුමනි?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු ඇමතිතුමනි, ඔය හේතුව නිසා හම්බන්තොට නගරයේ ජීවත් වෙන අයටත් ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

එහෙමයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

එම නිසා ඒ ගැනත් පොඩ්ඩක් බැලුවොත් හොඳයි.

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

හොඳයි, ගරු කථානායකතුමනි. [බාධා කිරීමක්] සමහරවිට ඒ අපේ සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා වැනි අයගෙන් වෙන්න ඇති.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

මුලින්ම දෙක සහ හතර හඳුනා ගන්න පුරුදු වෙන්න ඕනෑ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

අන්න. දෙක සහ හතර හඳුනා ගන්න පුරුදු වෙන්න.

ත්‍රිකුණාමලය ප්‍රදේශයේ පානීය ජල හිඟය: ක්‍රියා මාර්ග

திருகோணமலைப் பிரதேச குடிநீர்ப் பற்றாக்குறை: நடவடிக்கை

SHORTAGE OF DRINKING WATER IN TRINCOMALEE : MEASURES TAKEN

4296/'13

4. ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය -
(1) :

(අ) (i) ත්‍රිකුණාමලය ප්‍රදේශයේ ජනතාවට පානීය ජලය සපයනු ලබන ජල මූලාශ්‍රය කවරේද;

(ii) එකී ජල මූලාශ්‍රයෙන් ජලය සපයනු ලබන ආයතනය කවරේද;

(iii) 2013 වර්ෂයේ ජූනි මාසයේ සිට ත්‍රිකුණාමලය ප්‍රදේශයේ ජනතාව මුහුණ දුන් පානීය ජල හිඟයට හේතු කවරේද;

(iv) එම පානීය ජල හිඟය මහහැරවීම සඳහා ගත් කඩිනම් ක්‍රියා මාර්ග කවරේද;

(v) ත්‍රිකුණාමලය ප්‍රදේශයේ පවතින පානීය ජලය හිඟවීමේ ගැටලුව විසඳීම සඳහා අමතර ජල සැපයුම් මූලාශ්‍රයක් යොදා ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

நீர் வழங்கல், வடிகாலமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) திருகோணமலை பிரதேச மக்களுக்கு குடிநீரை வழங்குகின்ற நீர் மூலங்கள் யாவை என்பதையும்;

(ii) மேற்படி நீர் மூலங்களிலிருந்து நீரை வழங்குகின்ற நிறுவனம் யாதென்பதையும்;

(iii) 2013 ஜூன் மாதம் முதல் திருகோணமலை பிரதேச மக்கள் எதிர்நோக்கிய குடிநீர்ப் பற்றாக்குறைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(iv) மேற்படி குடிநீர்ப் பற்றாக்குறையைத் தவிர்ப்பதற்காக மேற்கொள்ளப்பட்ட துரித நடவடிக்கைகள் யாவை என்பதையும்;

(v) திருகோணமலை பிரதேசத்தில் காணப்படுகின்ற குடிநீர்ப் பற்றாக்குறைப் பிரச்சினையைத் தீர்த்து வைப்பதற்காக மேலதிக நீர் வழங்கல் மூல மொன்று பயன்படுத்தப்படுமா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Water Supply and Drainage:

(a) Will he inform this House -

(i) the name of the source of water from which drinking water is supplied to the people of Trincomalee area;

(ii) the name of the institution which supply water from that source,

(iii) the reasons for the shortage of drinking water that the people of Trincomalee area had to face since June 2013;

(iv) the urgent measures that were taken to overcome that shortage of drinking water; and

(v) whether an additional source of water will be used to address the shortage of drinking water in Trincomalee area?

(b) If not, why?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) කන්තලේ වැව සහ මහවැලි ගඟ ජල මූලාශ්‍රය කොටගෙන ත්‍රිකුණාමලය ප්‍රදේශයේ ජනතාවට පානීය ජලය සපයනු ලැබේ.

- කන්තලේ වැව ජල මූලාශ්‍ර කොට ඇරඹී විසල් ත්‍රිකුණාමලය ජල සම්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පෙර ජල සම්බන්ධතා 36,305ක් ලබා දී තිබූ කන්තලේ, තඹලගමුව, කඩවත්සතර, කින්නියා, කුච්චවේලි යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහා එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් පසු නව ජල සම්බන්ධතා 28,700ක් ලබා දීමේ හැකියාව වැඩි කරන ලදී. ඒ අනුව යෝජිත මුළු ජල සම්බන්ධතා ප්‍රමාණය 65,005ක් පමණ වන අතර, දැනට එම සම්බන්ධතා ප්‍රමාණයෙන් 41,588ක් ලබා දී ඇත.

- එම විසල් ත්‍රිකුණාමලය ජල සම්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් පසු ආරම්භ කරන ලද මුතූර්, ඊච්චලම්පත්තු, සේරුනුවර, අග්බෝපුර, වාන්ඇළ, පේරාරු යන පරිවාර ජල සම්පාදන ව්‍යාපෘති මඟින් නාගරික වශයෙන් ජල සම්බන්ධතා 25,500ක් ලබා දීමට යෝජිතව ඇති අතර, දැනටමත් ඉන් ජල සම්බන්ධන 1,300ක්ලබා දී ඇත.

  ග්‍රාමීය වශයෙන් මහදිවුල්වැව, නාමල්වත්ත, නාවච්චෝලෙයි, කිලිවෙඩ්ඩි, ගෝමරන්කඩවල යන නව ග්‍රාමීය ජල සම්පාදන ක්‍රම මඟින් සම්බන්ධන 2,043ක් ලබා දීමට යෝජිතව ඇති අතර, දැනට ජල සම්බන්ධන 834ක් ලබා දී ඇත.

(ii) ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය පමණක් එකී ජල මූලාශ්‍රවලින් ජලය සපයනු ලැබේ.

- මීට අමතරව ප්‍රජා මූල ජල සම්පාදන ව්‍යාපෘති 13ක් ක්‍රියාත්මක වන අතර, එමඟින් ප්‍රතිලාභීන් 2,000කට පමණ පානීය ජල අවශ්‍යතාව සපුරන අතර, එකී වර්තමාන රාජ්‍ය ස්වාමීත්වය අප අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව සතු වේ.

(iii) වියළි කලාපීය ප්‍රදේශයක් වන ත්‍රිකුණාමලයට සැලකිය යුතු වර්ෂාපතනයක්

ලැබෙන්නේ වසර අග භාගයේදීය. වසරේ මුල් භාගයේදී කඩින් කඩ තරමක වර්ෂාපතනයක් ලැබෙන අතර, 2013 වසරේදී නිසි පරිදි වර්ෂාවක් මෙම ප්‍රදේශයට නොලැබුණි. නියං කාලගුණික තත්ත්වය මෙම ප්‍රදේශයට දැඩි ලෙස බලපෑම් එල්ල කරන ලද බැවින්, ජල මූලාශ්‍රවල ජල මට්ටම් පහළ බසින ලදී. මෙම හේතුව නිසාවෙන් පානීය ජල හිඟයකට මුහුණ දීමට මෙම ප්‍රදේශයේ ජනතාවට සිදු වුණි.

(iv)
- කන්තලේ වැවේ ජල මට්ටම පහත වැටීම හේතුවෙන් ජලය ලබා ගන්නා තුළු මුවෙහි පහළ කොටසේ ජල දොරටු දෙක සවිකර ජලය ලබා ගැනීමට කටයුතු කිරීම.
- දැඩි නියහය නිසා දෛනික ජල පරිභෝජනය වැඩි වීම හේතුවෙන් නියමිත කාල සටහනකට අනුව සෑම ප්‍රදේශයක්ම ආවරණය වන පරිදි උස්බිම් ප්‍රදේශවලට වෙනමත්, බෑවුම් සහිත ප්‍රදේශවලට වෙනමත් ජලය ලබා දීමට කටයුතු කරන ලදී.
- පානීය ජලය අරපිරිමැස්මෙන් යුතුව පරිහරණය කරන ලෙස නිරන්තරයෙන් පාරිභෝගික ජනතාව දැනුවත් කිරීම.

  මහවැලි ගඟේ ජල මට්ටම පහළ බැසීම හේතුවෙන් අදාළ තුළු මුව අසල මහවැලි ගඟ හරස්කොට වැලි කොට්ට දමා ජල මට්ටම අවශ්‍ය මට්ටමට පවත්වා ගැනීම.
- අඩු පීඩන තත්ත්වයන් යටතේ ජලය නොලැබෙන උස් බිම් ප්‍රදේශවල ජීවත් වන පාරිභෝගික ජනතාව වෙනුවෙන් බවුසර් මඟින් නිරන්තරයෙන්ම පිරිසිදු පානීය ජලය බෙදා හැරීම.
- නළ ජල නොමැති නියඟයෙන් පීඩා විඳි ප්‍රදේශවලට විශේෂ බවුසර් මඟින් පානීය ජලය සැපයීම.

(v) කන්තලේ වැව හා මහවැලි ගඟ යන ජල මූලාශ්‍ර දෙකට අමතරව ශක්‍යතාවක් සහිත වෙනත් ජල මූලාශ්‍රයන් සොයා ගැනීමට මෙතෙක් හැකි වී නොමැති වුණත් දිගටම ඒ අධ්‍යයනයන් කර ගෙන යනු ලැබේ.

(ආ) අදාළ නොවේ.

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමාගෙන් මේ ප්‍රශ්නය ඇසිය යුතු ද කියලා මම දන්නේ නැහැ. මොකද, 2013 දී පානීය ජල හිඟය විශාල ප්‍රශ්නයක් බවට පත් වුණේ අවුරුදු 40ක් පමණ වතුර සැපයූ රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා හදපු කන්තලේ ජල පොම්පාගාරයේ කළමනාකරණයේ අඩුකම හා දැඩි දුබලතාවට පත් වී තිබෙන යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියා නොකිරීම, නවීන තාක්ෂණය භාවිතා නොකිරීම නිසායි. ඒ හේතුවෙන් විශාල අර්බුදයකට මුහුණ දුන්නා. එසේ මුහුණ දීමත් එක්කම ප්‍රංශ රජයේ ආධාර යටතේ Greater Trincomalee Integrated Water Supply Project එකක් ආරම්භ කළා. ඒ යටතේ ප්‍රංශ රජයෙන් යුරෝ මිලියන 22ක් සහ අපේ රජයෙන් රුපියල් මිලියන 1003ක් වැය කරලා 2013 අලුත් ජල පොම්පාගාරයක් හැදුවා. නමුත් මාස 6ක් යන්න ඉස්සෙල්ලා, ජූනි මාසය වනකොට මේ ජල පොම්පාගාරය නැවත වාරයක් කැඩිලා වතුර දෙන්න බැරි තත්ත්වයකට පත් වුණා. මේකට හේතුව මොකක්ද ගරු ඇමතිතුමනි?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, විසල් ත්‍රිකුණාමල ජල සම්පාදන යෝජනා ක්‍රමයෙන් අලුතින් ජලය ලබා දීමට යෝජිත ජල සම්බන්ධිත පවුල් සංඛ්‍යාව 28,700යි. විසල් ත්‍රිකුණාමල ජල සම්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පෙර ජලය ලබා දුන්නේ පවුල් 36,000කටයි. දැන් අපි අතිරේක ප්‍රමාණයකට ජල සම්බන්ධතාවන් ලබා දීගෙන යනවා. ගරු රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ කාලයේ හදපු ජල පොම්පාගාරයට අවුරුදු 25කට වැඩි කාලයක් ගත වෙලා ඉවරයි. මේ විසල් ජල යෝජනා ක්‍රමය යටතේ මේ ව්‍යාපෘතිය වැඩිදියුණු කොට සංචාරක ප්‍රදේශවලට, නාවික හමුදා ප්‍රදේශවලට ජලය ලබා දෙනවා. ත්‍රිකුණාමලය දක්වා දැන් ජලය ලබා දීම කරගෙන යනවා. [බාධා කිරීමක්] නැහැ. මම ඔබතුමියගේ ප්‍රශ්නයට උත්තර දෙන්නම්. ඔබතුමිය සතියක් පොම්පයක් වැඩ කරන්නේ නැහැ කියලා ඒක ලොකු ප්‍රශ්නයක් කර ගන්න එපා. ගරු කථානායකතුමනි, මහවැලි ගඟ කියන්නේ සිංහල අර්ථයෙන්ම මහ-වැලි කියන එකයි. සමහර අවස්ථාවල ජලයට වැඩිය වැලි එනවා. ඒ නිසා මහවැලි ගඟෙන් ජලය ලබා ගන්නා අතිරේක පොම්ප intake එක සමහර අවස්ථාවල වැඩ කරන්නේ නැහැ. ප්‍රංශ ආයතනයත් පිළිඅරගෙන තිබෙනවා මේවාට විශේෂ ආවරණයක් අවශ්‍යයි කියලා. දැන් ඒ ආවරණය යොදලා තිබෙනවා.

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

ගරු කථානායකතුමනි, මම අහපු ප්‍රශ්නයට වටින් ගොඩින් මොනවා කිව්වත්, මේ පොම්පාගාරය අලුත්වැඩියා නොකිරීමයි මෙතැන ප්‍රශ්නය තිබෙන්නේ. රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා අපිට අහිමි වෙලා වසර ගණනක් ගත වෙලා. මම ඒකයි කිව්වේ. යුරෝ මිලියන 22කුත් අපේ රුපියල් මිලියන 1003කුත් පාවිච්චි කරලා හදපු අලුත් බලාගාරයට මොකක්ද වුණේ? මෙහි වැලි හිරවෙන්න හේතුව මොකක්ද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
වැඩ කරනවා.

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
නැහැ, වැලි හිර වෙලා. ඒකයි නැවතුණේ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු මන්ත්‍රීතුමිය, වැඩ කරනවා. ලබන සතියේ මම ත්‍රිකුණාමලයට යනවා. අතිගරු ජනාධිපතිතුමාත් යනවා. ඔබතුමියට බලන්න ඕනෑ නම් එන්න පුළුවන්, රෝමයට ගියා වාගේ. අපි පෙන්වන්නම් වැඩ කරන බව.

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
මම රෝමයට ගියේ නැහැ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
28,000කට අලුතෙන් ජලය දීලා තිබෙනවා. ඔබතුමිය පරණ කථාවකුයි මේ කියන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
රෝමයට නොගියාට කමක් නැහැ. ලංකාවේම කොහේ හරි යනවා නම් හොඳයි.

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු කථානායකතුමනි, අලුතෙන් හදන- [බාධා කිරීමක්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු මන්ත්‍රීතුමිය, මෙය හදලා ඉවරයි. අවුරුදු එකහමාරකට පෙර විවෘත කරලාත් ඉවරයි. ගරු සම්පන්දන් මන්ත්‍රීතුමාත් ආවා. අපි ඔක්කෝම ගිහින් විවෘත කළා. ඉස්සර ත්‍රිකුණාමල නගරයට පැය කීපයයි වතුර ලැබුණේ. දැන් පැය 24ම ජලය දෙනවා. ඔබතුමියට ඒ සම්බන්ධව නිවැරදි තොරතුරු ලබා දීලා නැහැ. ඒ ගැන කනගාටුයි.

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
අවුරුදු එකහමාරකට ඉස්සෙල්ලා වෙන්න ඇති විවෘත කළේ. මොකද, මම ප්‍රශ්නය ඉදිරිපත් කරලා මාස 6කටත් වැඩියි. ගරු කථානායකතුමනි, මම අහන්න කැමැතියි වැලි හිර වෙන තත්ත්වයකට පත් වෙන විධියට මේක හදන්න මේ කොන්ත්‍රාත්තුව දුන්නේ කාටද කියලා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ජාත්‍යන්තර ටෙන්ඩරයක් යටතේ ප්‍රංශ සමාගමකටයි ඒ කොන්ත්‍රාත් එක දීලා තිබෙන්නේ. ඔබතුමියටයි මටයි ඕනෑ කෙනෙකුට නොවෙයි දීලා තිබෙන්නේ. ඔබතුමිය අහන්නේ අදාළ නැති අතුරු ප්‍රශ්නයක්. කොන්ත්‍රාක්කරුවයි, මීල ගණුනුයි ගැන වෙනම ප්‍රශ්නයක් අහන්න. මේ ප්‍රශ්නයෙන් අහලා තිබෙන්නේ පානීය ජලය දුන්නු තැන් ගැනයි, නැති තැන් ගැනයි, ජල හිඟය ගැනයි.

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු කථානායකතුමනි, වැලි හිර වීම නිසා සතියක් පානීය ජලය දෙන්න බැරි- [බාධා කිරීමක්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒ පරණ කථාවක්. අවුරුද්දකට විතර කලින් තොරතුරක් ඔබතුමියට දීලා තිබෙන්නේ. දැන් පානීය ජලය දීලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමිය, අතිගරු ජනාධිපතිතුමා 28වැනි දා ත්‍රිකුණාමලයට යනවා. ඔබතුමියට බලා ගන්න ඕනෑ නම් අපත් එක්ක යන්න එන්න. ඒ සත්‍ය ඔබතුමියට ඇස් දෙකෙන් බලා ගන්න පුළුවන්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සාමාන්‍යයෙන් හිර වන එක ස්වාභාවිකයි. නමුත් කොච්චර කාලයකට හිර වුණාද කියන එකයි අහලා බලා ගන්න ඕනෑ.

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු කථානායකතුමනි, දැන් මේ වන කොට ඒ ප්‍රශ්නය විසඳලා ඉවරයි. මොකද, මම මේ ප්‍රශ්නය යොමු කළේ දැනට මාස හය හතකට ඉස්සර වෙලා. දැන් ප්‍රශ්නය ඉවරයි. මම ඔබතුමාගෙන් නිකම් අතුරු ප්‍රශ්නයක් ඇහුවේ. ඔබතුමා කලබල වුණා. කලබල වෙලා, ටෙන්ඩරය කාටද දුන්නේ කියන එක කියා ගන්න බැරුව විවිධ කථා කිව්වා. මම බලන්න යන්න එන්නම්. ඔබතුමා එක්ක ත්‍රිකුණාමලයේ යන්න මම එන්නම්. [බාධා කිරීම්]

2014 දැයට කිරුළ සංවර්ධන වැඩසටහන : ඉදි කිරීම්

தேசத்துக்கு மகுடம் 2014 அபிவிருத்தி நிகழ்ச்சித்திட்டம் : நிர்மாணங்கள்

DEYATA KIRULA DEVELOPMENT PROGRAMME 2014: CONSTRUCTIONS

4443/'13

5. ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
විදුලි සංදේශ සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (4):

(අ) (i) 2014 දැයට කිරුළ සංවර්ධන වැඩසටහන යටතේ නව නිවාස ඉදි කර දීම සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ හඳුනා ගෙන තිබූ නිවාස නොමැති පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පවුල් වෙනුවෙන් නිවාස ඉදි කිරීම සඳහා රජය මගින් ලබා දීමට අපේක්ෂා කළ ප්‍රතිපාදන කවරේද;

(iii) එකී ප්‍රතිපාදන මත සිදු කළ නිවාස ඉදිකිරීම් කටයුතු 2014 දැයට කිරුළ ප්‍රදර්ශනය ආරම්භ කිරීමට පෙර නිම කර ජනතා අයිතියට පත් කරනු ලැබුවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

තොලෙත්තොடර්පුකළ්, තකවල් තොழිල්නුට්පවියල් අමෙච්චරෙක් කේට්ට විනා:

(அ) (i) 'தேசத்துக்கு மகுடம்' 2014 அபிவிருத்தி நிகழ்ச்சித் திட்டத்தின்கீழ் புதிய வீடுகளை நிர்மாணித்துக் கொடுப்பதற்காக குருநாகல் மாவட்டத்தினுள் இனங்காணப்பட்ட வீடுகளற்ற குடும்பங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி குடும்பங்களுக்கு வீடுகளை நிர்மாணிப் பதற்காக அரசாங்கத்தினால் வழங்க உத்தேசிக் கப்பட்ட நிதி ஏற்பாடுகள் யாது என்பதையும்;

(iii) மேற்படி நிதி ஏற்பாடுகளின்கீழ் மேற்கொள்ளப் பட்ட வீடுகளை நிர்மாணிக்கும் பணிகள் 2014 'தேசத்துக்கு மகுடம்' கண்காட்சி ஆரம்பிக்கப்பட முன்னர் பூர்த்தி செய்யப்பட்டு பொதுமக்களுக்கு வழங்கப்பட்டுள்ளதா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Telecommunication and Information Technology:

(a) Will he inform this House -

(i) the number of homeless families identified within the Kurunegala District for the construction of new houses for them under 2014 Deyata Kirula Development Programme;

(ii) the provisions expected to be made by the Government for the construction of houses for those families; and

(iii) whether construction of houses with the said provisions were completed and the said houses were commissioned to public prior to the commencement of Deyata Kirula Exhibition of 2014?

(b) If not, why?

ගරු ප්‍රභා ගනේසන් මහතා (විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பிரபா கணேசன் - தொலைத் தொடர்புகள், தகவல் தொழில்நுட்பவியல் பிரதி அமைச்சர்)
(The Hon. Prabha Ganesan - Deputy Minister of Telecommunication and Information Technology)

Sir, on behalf of the Minister of Telecommunication and Information Technology, I answer the Question.

(a) (i) Number of families without permanent houses - 17,866.

(ii) The implementation of the housing project within Kurunegala District under Deyata Kirula Development Programme 2014 is expected to be completed under 05 phases.

At present phases 01 and 02 are already being implemented and action has been taken to implement phases 03, 04 and 05 in future.

- Phase 01 - Programme for providing roofing tiles to permanent houses without a permanent roof.

  Accordingly roofing tiles are provided to each house subject to the maximum of 1,000 roofing tiles.

- Phase 02 - Programme for providing roofing tiles, making the roofs of houses of which walls have been constructed but, roof has not been made. Accordingly it is implemented subject to an amount of Rs. 50,000 to each family.

- Phase 03 - Programme for providing roofing tiles where construction of walls and roofs have been completed.

- Phase 04 - Programme for improvement of houses.

- Phase 05 - Programme for providing lavatory facilities to houses. Allocation made for the 5 phases in the Kurunegala District for the housing project is Rs. 1,063.75 million.

(iii) This programme has been commenced concurrently with the Deyata Kirula Development Exhibition and further necessary financial provision and materials are provided to identified houses under 5 phases.

At present,

1. Work of 3,121 houses identified under Phase 01 have been concluded by way of providing roofing tiles. Only Phase 01 has been handed over to the people before the Deyata Kirula Development Exhibition.

2. Provision of roofing tiles has been concluded by making roofs of 972 houses identified under Phase 02.

3. For Phases 03, 04 and 05, provision has been requested from the Ministry of Economic Development after preparing the necessary documents.

The Development programme is continued concurrently with the Deyata Kirula Development Exhibition and it will be carried out until the housing issues identified in the District are completely solved.

(b) Not relevant.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. 2014 දැයට කිරුළ වැඩසටහන යටතේ අභ්‍යන්තර මාර්ග සඳහා රුපියල් මිලියන 443ක් වියදම් කර තිබුණා. ඒ අභ්‍යන්තර මාර්ගවලින් බහුතරයක් තාවකාලික මාර්ග. ඒ වාගේම දැයට කිරුළ වැඩ සටහනෙන් පසුව ඒ මාර්ගවලින් බහුතරයක් ගලවා ඉවත් කළා. උදාහරණයක් විධියට කාර්මික විද්‍යාලයේ අභ්‍යන්තර මාර්ග ඒ ground එකේත් හදා තිබුණා. ඒවා ගලවා ඉවත් කළා. ඒවාට රුපියල් මිලියන 443ක් වියදම් කර තිබුණා. එවැනි තාවකාලික වැඩ සඳහා රුපියල් මිලියන 443ක් වියදම් කළත්, දරුණු විධියට නිවාස අවශ්‍යතාවය තිබෙන, පැල්පත් වාසීන් ඉන්න කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිවාස අවශ්‍යතාවය වෙනුවෙන් වෙන් කර තිබුණේ රුපියල් මිලියන 163යි. මෙකට හේතුව කුමක්ද කියා මා ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහනවා.

ගරු ප්‍රභා ගනේසන් මහතා
(மாண்புமிகு பிரபா கணேசன்)
(The Hon. Prabha Ganesan)

ප්‍රශ්නය තේරුණේ නැහැ.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

දැයට කිරුළ වැඩසටහනේදී ඔබතුමන්ලා තාවකාලික අභ්‍යන්තර මාර්ග සඳහා රුපියල් මිලියන 443ක් වියදම් කර තිබුණා. හැබැයි, ඔබතුමාගේ සංඛ්‍යා ලේඛන අනුව නිවාස හදන්න වෙන් කර තිබුණේ රුපියල් මිලියන 163යි. තාවකාලික වැඩ සඳහා ලොකු වියදමක් දරා අත්‍යවශ්‍ය කටයුත්තක් වන නිවාස ඉදි කිරීම සඳහා රුපියල් මිලියන 163ක් වැනි සොච්චම් මුදලක් වෙන් කළේ ඇයි කියා මම අහනවා.

ගරු ප්‍රභා ගනේසන් මහතා
(மாண்புமிகு பிரபா கணேசன்)
(The Hon. Prabha Ganesan)

ගරු මන්ත්‍රීතුමනි, ඒක වෙනම ප්‍රශ්නයක් විධියට අහන්න.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

අපේ නියෝජ්‍ය අමාත්‍යතුමා ඊයේ පෙරේදා තමයි ඒ තනතුර සඳහා පත් වුණේ. ඒ නිසා මම එතුමා අපහසුතාවට පත් කරන්නේ නැහැ. මේක ඇමතිතුමා එක්කම විසඳා ගන්න තිබෙන ප්‍රශ්නයක්. ඒ නිසා අතුරු ප්‍රශ්නයක් විධියට මම ඒක වෙන දවසක ගරු ඇමතිතුමාගෙන්ම අහන්නම්, ගරු කථානායකතුමනි.

පුද්ගලයින් ලියා පදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව: උපකරණ අතුරුදහන් වීම
ஆட்பதிவுத் திணைக்களம்: உபகரணங்கள் காணாமற்போனமை
REGISTRATION OF PERSONS DEPARTMENT : DISAPPEARANCE OF EQUIPMENT

4464/'13

6. ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2013 වර්ෂය තුළ දී පුද්ගලයින් ලියා පදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ හැඳුනුම් පත් සකස් කිරීම සඳහා යොදා ගනු ලබන ආරක්ෂිත කාඩ්පත් 11ක් සහ මල්ටිමීඩියා යන්ත්‍ර 02ක් අතුරුදහන් වී තිබේද;

(ii) එසේ නම්, එම අතුරුදහන් වීම් පිළිබඳව දෙපාර්තමේන්තු මට්ටමින් පරීක්ෂණ පවත්වා ඊට වග කිව යුත්තන් හඳුනා ගනු ලැබ තිබේද;

(iii) සිදුවී ඇති අලාභය ඔවුන්ගෙන් අය කර ගනු ලැබුවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අ (i) හි සඳහන් සිද්ධියට අදාළව කුරුවිටත්ත පොලීසිය විසින් කර ගෙන යනු ලබන පරීක්ෂණ මඟින් අදාළ උපකරණ හා ද්‍රව්‍ය සොයා ගනු ලැබ හෝ වරදකරුවන් හඳුනා ගනු ලැබ තිබේද;

(ii) ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් වග කිව යුතු ආයතනයක සිදු වූ මෙම සිදුවීම පිළිබඳව රජයේ ස්ථාවරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2013 ஆம் ஆண்டில் ஆட்பதிவுத் திணைக் களத்தில் அடையாள அட்டைகளைத் தயாரிப்ப தற்குப் பயன்படுத்தப்படும் 11 பாதுகாப்பு அட்டைகளும் 02 மல்டி மீடியாக் கருவிகளும் காணாமற்போயுள்ளதா என்பதையும்;

(ii) அவ்வாறாயின் இது தொடர்பாக திணைக்கள மட்டத்தில் விசாரணைகளை மேற்கொண்டு இதற்குப் பொறுப்புக் கூறவேண்டியவர்கள் இனங்காணப்பட்டுள்ளனரா என்பதையும்;

(iii) இந்நபர்களால் ஏற்பட்டுள்ள நட்டம் அறவிடப் பட்டுள்ளதா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேலே அ(i) இல் குறிப்பிடப்பட்ட சம்பவம் தொடர்பாக கறுவாத்தோட்டம் பொலிசாரினால் மேற்கொள்ளப்படும் விசாரணைகளின்மூலம் உரிய உபகரணங்கள் மற்றும் பொருட்கள் கண்டுபிடிக்கப்பட்டு அல்லது குற்றவாளிகள் இனங்காணப்பட்டுள்ளனரா என்பதையும்;

(ii) தேசிய பாதுகாப்புத் தொடர்பில் பொறுப்புடைய தொரு நிறுவனத்தில் நடைபெற்ற இச்சம்பவம் தொடர்பான அரசின் நிலைப்பாடு யாதென்ப தையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல் ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he inform this House -

(i) whether 11 secured cards and 02 multimedia equipments used to prepare identity cards in the Department of Registration of Persons have disappeared in the year 2013;

(ii) if so, whether persons responsible have been identified by conducting an investigation in the departmental level with regard to the disappearance; and

(iii) whether the loss has been recovered from them?

(b) Will he state -

(i) whether the investigations that are being carried out by the Cinnamon Gardens Police has been able to find out the aforesaid lost materials and equipment or identify the culprits; and

(ii) the stance of the Government with regard to that incident that took place at an institution that is responsible for national security?

(c) If not, why?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්දන)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ආනයනය කරන ලද තොගයෙහි ආරක්ෂිත කාඩ් පත් 11ක හිඟයක් තිබුණි. මල්ටිමීඩියා යන්ත්‍ර 2ක් නැති වී ඇත.

(ii) ආරක්ෂිත කාඩ් පත් නැති වීම පිළිබඳව දෙපාර්තමේන්තු මට්ටමින් පරීක්ෂණ පවත්වා ඇති අතර එම පරීක්ෂණ වාර්තාව පරිදි ආනයනය කරන අවස්ථාවෙහි ඇති වන එවැනි අඩු පාඩු නිවැරදි කිරීමට අදාළ ක්‍රියා මාර්ගයන් ගෙන ඇති අතර ඒ අනුව කටයුතු කරනු ලබයි.

මල්ටිමීඩියා යන්ත්‍ර අතුරුදහන් වීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු මට්ටමින් පරීක්ෂණ පවත්වා ඇති අතර පොලිස් පරීක්ෂණ ආරම්භකොට ඇත.

(iii) පොලිස් පරීක්ෂණවල සොයා ගැනීම් අනුව අලාභය අය කර ගැනීමට කටයුතු කෙරෙනු ඇත.

(ආ) (i) මෙතෙක් හඳුනාගෙන නැත.

(ii) වැරදිකරුවන්ට එරෙහිව විනයානුකූල සහ නීත්‍යානුකූල ක්‍රියා මාර්ග ගන්නවා ඇත. මීන් ඉදිරියට දෙපාර්තමේන්තුවේ එවැනි අවස්ථා ඇති නොවීමට ක්‍රියා මාර්ග ගෙන ඇත.

(ඇ) පැන නොනඟී.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය මතු වී තිබෙන්නේ, සතොස කාර්යාලයක හෝ එහෙම නැත්නම් supermarket එකක හෝ නොව පුද්ගලයන් ලියා පදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේයි. ඒ දෙපාර්තමේන්තුවේ ආරක්ෂක කාඩ් පත් 11ක් තමයි මේ අතුරුදහන් වී තිබෙන්නේ. ඒ වාගේම, එම දෙපාර්තමේන්තුවේ මල්ටිමීඩියා යන්ත්‍ර තමයි මේ අතුරුදහන් වී තිබෙන්නේ. ඒ නිසා, ජාතික ආරක්ෂාව පිළිබඳ වග කිව යුතු මෙවැනි ආයතනයක වූ මේ සිදු වීම ඔබතුමා අනුමත කරනවාද ගරු ඇමතිතුමනි?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්දන)
(The Hon. Dinesh Gunawardena)

එවැනි වැරදි තිබෙනවා නම් කිසි ලෙසකින් අනුමත කරන්නේ නැහැ. අදාළ පියවර ගෙන තිබෙනවා, ඒවා සම්බන්ධ වැරදිකරුවන් ගැන පරීක්ෂා කොට කටයුතු කිරීමට හා අධිකරණය වෙත ද ඉදිරිපත් කිරීමට.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)

ඒක තමයි ඉස්සර වෙලාම මට දැන ගන්න ඕනෑ වුණේ. ගරු ඇමතිතුමනි, ඒ ප්‍රශ්නයට උත්තරය දුන්නු විධියට මට තේරුණේ ඔබතුමා එය අනුමත කරනවා කියලායි. ගරු කථානායකතුමනි, මේ සිදු වීම සිදු වෙලා දැනට අවුරුදු එකහමාරකට වඩා වැඩි කාලයක් ගතවී තිබෙනවා. නමුත් තවම ඒ පුද්ගලයන් හඳුනාගෙන නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමා කියනවා වන්දි ගන්න කටයුතු කරනවා කියලා. නමුත් මේකට හවුල් වූවන් කවුද, මේ ද්‍රව්‍ය කොහේද ආදී කිසිවක් හඳුනාගෙන නැහැ. ඒ නිසා මෙවැනි ආරක්ෂිත කාඩ් පත් අතුරුදහන් වීම හා සම්බන්ධ වග කිව යුත්තන් හඳුනාගැනීමට මෙතරම් කාලයක් -අවුරුදු එකහමාරකට අධික කාලයක්- ගත වීම කිසිසේත් යෝග්‍ය තත්ත්වයක් නොවෙයි. ගරු කථානායකතුමනි, මා ළඟ මුළුමනින් එහි සාක්ෂි නැහැ. මට ලැබෙන තොරතුරු අනුව මා දන්නා පරිදි හිතා මතාම මෙම පරීක්ෂණ කටයුතු අඩාළ කිරීමේ කුමන්ත්‍රණයක් දියත් වෙමින් තිබෙනවා. මොකද, ඊට හවුල් වූවන්ගේ යම් යම් දේශපාලන සම්බන්ධතාවන් තිබෙනවා. ඒ නිසා ඔවුන් ආරක්ෂා කර ගැනීමේ වුවමනාව මත තමයි මේ කාඩ් පත් අතුරුදහන් වීම පිළිබඳ පරීක්ෂණ කටයුතු ඉතාමත් දියාරු මට්ටමක පවතින්නේ. මේ පිළිබඳ පරීක්ෂණ කටයුතු කවදා වෙනකොට අවසන් කරන්න පුළුවන් ද කියලා ඔබතුමාට අදහසක් දෙන්න පුළුවන්ද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්දන)
(The Hon. Dinesh Gunawardena)

පරීක්ෂණයක් කරගෙන යද්දී ඒ පිළිබඳව දැනුමක් ඇති අයගේ ක්‍රියා කලාපය පිළිබඳ දිනයන් කීමට මට මේ අවස්ථාවේදී හැකියාවක් නැහැ. මේ පිළිබඳව දැනට කරන ලද මූලික පරීක්ෂණයෙන් යම් කිසි නිර්දේශ කිහිපයක් ඉදිරිපත් කර තිබෙනවා. [බාධා කිරීමක්] අනාගතයේදී ඇති නොවෙන්න.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
මම අහන්නේ දැනට සිද්ධ වෙලා තිබෙන එකටයි

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්දන)
(The Hon. Dinesh Gunawardena)

(1) අස්ථානගතවීම අනාවරණය කර ගැනීමට පොලිස් පරීක්ෂණය අසමත් වෙයි නම්, එය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කළ යුතු බව,

(2) අස්ථානගත වූ විද්‍යුත් උපකරණ තිබෙන ස්ථාන අනාවරණය කර ගැනීමට කේතාංක මඟින් ග්‍රහණය හෝ එවැනි ස්වභාවයේ වෙනත් උපක්‍රම ඇන්දැයි සොයා බැලීම.

(3) සාමූහික වගකීමක් යටතේ දෙපාර්තමේන්තුවේ සියලු දෙනා වෙතින් මල්ටිමීඩියා යන්ත්‍ර දෙක අභිමීවීමෙන් රජයට සිදු වී ඇති අලාභය අය කර ගැනීම.

(4) දෙපාර්තමේන්තුවේ මතු ආරක්ෂාව පිණිස නව ආරක්ෂක කැමරා පද්ධති සවි කිරීම.

මේ වාගේ පියවරවල් දැනට මූලික පරීක්ෂණ නිලධාරීන් විසින් නිර්දේශ කර තියෙනවා. ඒ අනුව කටයුතු කරගෙන යනවා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)

ගරු ඇමතිතුමනි, මගේ මේ ප්‍රශ්නය නිසා හැම දෙනාගෙන්ම අය කර ගන්න යන්න එපා. ඒ අදාළ වැරදිකරුවන්ගෙන් තමයි අය කර ගන්න ඕනෑ. දැන් මේ හැමෝගේම පඩි කපන්න හදනවා, සාමූහිකව වග කියන්න ඕනෑ කියලා. හරි සාමූහිකත්වයක් තමයි ඒක. [බාධා කිරීමක්] ඔව්. කැබිනට් මණ්ඩලය වාගේ. ඒකේ නම් සාමූහිකත්වය නැහැ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්දන)
(The Hon. Dinesh Gunawardena)
නිර්දේශ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නිර්දේශ. හොඳයි.

ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. දැන් අපේ රටේ phone කඩේක phone එකක් හොරෙන් ගත්තත් ඒවා අත් අඩංගුවට ගැනීම සඳහා තාක්ෂණික මෙවලම් උපයෝගී කොටගෙන තිබෙනවා. ඒ වාගේම අප දැකලා තිබෙනවා, සමහර අවස්ථාවලදී රත්රන් බඩු කඩයකින් මොනවා හෝ හොරකම් කළත් ඒ හොරා කෙටි කාලයක් ඇතුළත අල්ලනවා. හැබැයි, අපේ රටේ ජාතික ආරක්ෂාව පිළිබඳව වග කිව යුතු පුද්ගලයින් ලියා පදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ආරක්ෂක කාඩ් පත් 11ක් අතුරුදන් වීමට අවුරුදු එක හමාරකට වඩා වැඩි කාලයක් ගත වී තිබුණත් තවම පොලීසියට ඒවා හොයා ගන්න බැරි වෙලා තිබෙනවා.

ගරු ඇමතිතුමා කියන පරිදි පොලීසියට හොයා ගන්න බැරි යැයි කිව්වොත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට බාර දෙනවා ලු. තවම ඒගොල්ලන් පුළුවන් ද බැරි ද කියලාවත් දන්නේ නැහැ. මොකක්ද මේ? ඔබතුමා ලබා දෙන පිළිතුරුවලින්ම පෙන්නුම් කරනවා, මේ අතුරුදන් වීම් පිළිබඳව, මේ සොරා ගැනීම් පිළිබඳව යම් ප්‍රමාණයක යට ගැසීමේ වුවමනාවක් අනුව කටයුතු කරන බව. උත්තරයත් යම් ප්‍රමාණයකට යට ගහන විධියෙන් තමයි ඔබතුමා සිංහල භාෂාව ව්‍යක්ත ලෙස උපයෝගී කර ගනිමින් ඉදිරිපත් කරන්නේ. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ මෙයයි. මේක බරපතළ ප්‍රශ්නයක්. ඒ නිසා මේ සඳහා වග කිව යුත්තන් අත් අඩංගුවට ගත යුතුයි. ඇත්තටම මේ ආරක්ෂක කාඩ් පත් ලබා ගත්තේ ඇයි කියන කාරණය හරි වැදගත්. ඒ පිළිබඳව පරීක්ෂණයක් කළ යුතුයි. ඒ පිළිබඳව ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරලා ඉක්මන් ක්‍රියා මාර්ගයක් ගන්න කියලා ඉල්ලනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු මන්ත්‍රීතුමාගේ අතිරේක ප්‍රශ්නයට අවධානය යොමු කරලා තව දීර්ඝ කාලයක් යන්නේ නැතිව -කෙටි කාලයකදී- ඔවුන් අත් අඩංගුවට ගන්න කියලා මම වාර්තා කරන්නම්.

කෘෂි රසායන ද්‍රව්‍ය ආනයනය : ලියා පදිංචි සමාගම්
விவசாய இரசாயனப் பொருள் இறக்குமதி : பதிவுபெற்ற கம்பனிகள்
IMPORT OF AGRO-CHEMICALS : REGISTERED COMPANIES

4640/'13

7. ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කෘෂි රසායන ද්‍රව්‍ය ආනයනය සඳහා ශ්‍රී ලංකාවේ ලියා පදිංචි වී ඇති සමාගම් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත සමාගම් අතරින් කෘෂි රසායන ද්‍රව්‍ය මහා පරිමාණයෙන් ආනයනය කරන ආයතන කවරේද;

(iii) මේ වන විට ශ්‍රී ලංකාවට ආනයනය කිරීම තහනම් කරනු ලැබ ඇති කෘෂි රසායන වර්ග සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සමාගම්වල නම්, ලිපිනයන් හා ලියා පදිංචි වූ දිනයන්;

(ii) තහනමට ලක් වන තෙක් එම කෘෂි රසායන ද්‍රව්‍ය මෙරටට ගෙන්වනු ලැබූ සමාගම්වල නම්;

(iii) තහනම් කරන ලද කෘෂි රසායන ද්‍රව්‍ය ලංකාවට ගෙන්වීම නිසා අසාධු ලේඛනගත (Blacklist) කර ඇති ආයතනවල නම්;

එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) අසාධු ලේඛනගත කිරීමට ලක් වූ ආයතනවල අධ්‍යක්ෂවරුන් වෙනත් නම්වලින් ආයතන ලියා පදිංචි කර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, ඒ අය සම්බන්ධයෙන් ගනු ලබන නීතිමය පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) விவசாய இரசாயனப் பொருட்களை இறக்குமதி செய்வதற்காக இலங்கையில் பதிவு செய்யப் பட்டுள்ள கம்பனிகளின் எண்ணிக்கை எவ்வளவு;

(ii) மேற்படி கம்பனிகளில் பாரியளவில் விவசாய இரசாயனப் பொருட்களை இறக்குமதி செய்கின்ற நிறுவனங்கள் யாவை;

(iii) தற்போது இலங்கைக்கு இறக்குமதி செய்தல் தடைசெய்யப்பட்டுள்ள விவசாய இரசாயனப் பொருட்கள் வகைகளின் எண்ணிக்கை எவ்வளவு

என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி அ(i) இல் குறிப்பிட்ட கம்பனிகளின் பெயர்கள், முகவரிகள் மற்றும் பதிவு செய்யப்பட்டுள்ள திகதிகள்;

(ii) தடைசெய்யப்படும்வரை மேற்படி விவசாய இரசாயனப் பொருட்களை இந்நாட்டுக்கு இறக்குமதி செய்த கம்பனிகளின் பெயர்கள்;

(iii) தடைசெய்யப்பட்ட விவசாய இரசாயனப் பொருட்களை இலங்கைக்கு இறக்குமதி செய்ததன் காரணமாக கறைநிரல் படுத்தப்பட்டுள்ள (Blacklist) நிறுவனங்களின் பெயர்கள்

என்பவற்றை அவர் சபையில் சமர்ப்பிப்பாரா?

(இ) (i) கறைநிரல்படுத்தலுக்கு உள்ளாகிய நிறுவனங் களின் பணிப்பாளர்கள் வேறு பெயர்களில் நிறுவ னங்களைப் பதிவு செய்துள்ளார்கள் என்பதை அறிவாரா;

(ii) ஆமெனில், இவர்கள் தொடர்பாக எடுக்கப்படும் சட்ட நடவடிக்கைகள் யாவை

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture:

(a) Will he inform this House -

(i) the number of companies registered in Sri Lanka for the importation of agro-chemicals;

(ii) the names of companies that import agro-chemicals at a large scale out of the aforesaid companies; and

(iii) the number of agro-chemicals that have been banned from being imported to Sri Lanka at present?

(b) Will he table -

(i) in relation to (a)(i) above, the names of such companies, their addresses and the dates on which they have been registered; and

(ii) the names of the companies that imported the banned agro-chemicals until the time of their ban;

(iii) the names of institutions which have been blacklisted due to the importation of banned agro-chemicals?

(c) Will he state -

(i) whether he is aware that the directors of the blacklisted companies have registered companies in other names; and

(ii) if so, the legal action that will be taken against such individuals?

(d) If not, why?

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன - கமத்தொழில் அமைச்சர்)
(The Hon. Mahinda Yapa Abeywardena - Minister of Agriculture)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) කෘෂි රසායන ද්‍රව්‍ය ගෙන්වන සමාගම් තිස් දෙකක් (32) ඇති නමුදු මේ වන විට කෘෂි රසායනික ආනයනය කිරීම සඳහා කිසිදු සමාගමක් ලියාපදිංචි වී නොමැත. (මෙම සමාගම් ලියාපදිංචි කරන ලෙස දන්වා ඇත්තේ 2014 ජූලි මස සිට මාස හයක් (06) ඇතුළතදීය)

එහෙම ක්‍රමවේදයක් තිබුණේ නැහැ ගරු කථානායකතුමනි. තිබුණේ කෘෂි රසායන ද්‍රව්‍ය ගෙන්වීම සඳහා අනුමැතිය ලබා ගැනීමක් පමණක්. එපමණයි නීතියකට තිබුණේ.

එම සමාගම්වල ලැයිස්තුව ඇමුණුම 1 හි දැක්වේ. ඇමුණුම **සභාගත*** කරනවා.

(ii) ඉහත සමාගම් අතරින් මහා පරිමාණයෙන් පළිබෝධනාශක ගෙන්වන සමාගම් ලෙසට, A. Baur & Co. (Pvt.) Limited, CIC Crop Guard (Pvt.) Limited, Plantchem (Pvt.) Limited, Harrisons Chemical (Pvt.) Limited, Hayleys Agro Products Limited දැක්විය හැකිය.

(iii) ශ්‍රී ලංකාවට ආනයනය තහනම් කර ඇති පළිබෝධනාශක සංඛ්‍යාව තිහකි.

ඒ පළිබෝධ නාශකවල නම් ලැයිස්තුව ඇමුණුම 2 හි දැක්වේ. ඇමුණුම **සභාගත*** කරනවා.

(ආ) (i) එම සමාගම් තිස්දෙකෙහි නම් සහ ලිපින ඉහත සඳහන් කර ඇති අතර, එම කිසිදු සමාගමක් කෘෂි රසායනික ආනයනය කිරීම සඳහා ලියාපදිංචි වී නොමැති හෙයින්, ලියාපදිංචි කළ දින ඇතුළත් නොවේ.

(ii) තහනමට ලක් වන අවස්ථාව එළැඹෙන තුරු එම පළිබෝධනාශක සියලු සමාගම් විසින් ආනයනය කරන ලදී.

මේවාට chemical name එකක් තිබෙන්නේ ගරු කථානායකතුමනි. ඒ chemical name එකෙන් හැම සමාගමම ඒවා ආනයනය කරනවා. එහෙම ආනයනය කරලා වෙන වෙන නම්වලින් වෙළෙඳ පොළට නිකුත් කරනවා. ඒක තමයි කරලා තිබෙන්නේ.

(iii) තහනම් කරන ලද පළිබෝධනාශක ගෙන්වීම හේතු කරගෙන කිසිදු සමාගමක් අසාධු ලේඛන ගතකර නොමැත.

(ඇ) (i) අදාළ නොවේ.

(ii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

**සභාමේසය මත තබන ලද ඇමුණුම්:*
**சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
**Annex tabled:*

ඇමුණුම 1

	සමාගමේ නම	ලිපිනය
01	A.Bour & company Ltd	5, Upper Chatham Street, Colombo 01
02	Agro Technica Ltd	25,Foster Lane, Colombo 10
03	Agstar Chemicals (pvt) Ltd	1/44, New Nuge Road, Peliyagoda
04	BASF Finlay (pvt) Ltd	186, Vauxhall street, Colombo 02
05	Ceylon Petroleum Corporation (Chemical Division)	Zone 3, Oil Installation, Kolonnawa, Wellampitiya
06	Chemical Industries (Colombo) Ltd	199, CIC House, Kew Road, Colombo 02
07	CIC Crop Guard (pvt) Ltd	CIC House, Kew Road, Colombo 02.
08	Cropbeat (pvt) Ltd	G17, Lucky Plaza, St. Anthony's Mawatha, Colombo 03
09	Plantcchem (pvt) Ltd	374/5 A, Robert Gunawardana Mawatha, Battaramulla
10	Harrisons Chemical (pvt) Ltd	330, T.B. Jaya Mawatha, Colombo 10
11	Hayleys Agri Products Ltd.	400, Deans Road, Colombo 10
12	Innovative Pesticide Marketing (pvt) Ltd	2nd Floor, IBM Building, Nawam Mawatha, Colombo 02
13	J.A. Morrisons son & Jones Ceylon ltd.	620, Biyagama Road, Pethiyagoda
14	Kemtek (pvt) Ltd	29/5, C.W.W. Kannangara Mawatha, Colombo 07
15	Lankem Ceylon ltd	98, Sri Sangaraja Mawatha, Colombo 10
16	M Chems (pvt) Ltd	146, Dawson Street, Colombo 02
17	Mackwood Ltd	10, Gnanartha Pradeepa Mawatha, Colombo 08

[ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා]

	සමාගමේ නම	ලිපිනය
18	Oasis Marketing Company (pvt) Ltd	3, Kotagedara Junction, Madapatha Road, Piliyandala
19	Opex Holding (pvt) Ltd	127, W.A.D.Ramanayake Mawatha, Colombo 10
20	Polychemex (pvt) Ltd	271, Galle Road, Mt Lavinia
21	Sabaragamuwa Fertilizers (pvt) Ltd	Industrial City Paradise, Kuruvita, Ratnapura
22	Unipower (pvt) Ltd	23-1/1, Siridamma Mawatha, Colombo 10
23	Agrium (pvt) Ltd	269 B, 4th Lane, Shanthipura, Talawathugoda
24	Hunter & Company Ltd	130, Front Street, (P.O.Box 214) Colombo 11
25	Grand Cropcare Solution (pvt) Ltd	201/2, Halnulla Church Road, Wellampitiya
26	International Crop Sciences (pvt) Ltd	75/1, Pahala Bomiriya, Kaduwela.
27	Sunagro Life Science Ltd.	98, Sri Sangaraja Mawatha, Colombo 10
28	Hextar (pvt) Ltd	271, Galle Road, Mt. Lavinia.
29	Jagro (pvt) Ltd	131, Wijaja Kumarathunga Mawatha, Polhengoda Road, Colombo 05
30	Sujeewa Enterprises.	146/A, Vihara Mawatha, Mulgampola, Kandy
31	Slagro Seeds (pvt) Ltd	30, Thalawa Road, Mahailuppallama.
32	Robin Agro Chemicals	3/16, Bakers Farm, Mahagastota, Nuwara Eliya

ඇමුණුම 2

Given below are the Pesticides Prohibited for Importing to Sri Lanka.

S/N	Name of Pesticide
01	Endrin
02	DDT
03	Chlordimeform
04	Dieldrin
05	Phosphsmidon
06	Thalium sulphate
07	2,4,5-T
08	Ethyl parathion
09	Methyl parathion
10	Aldrin
11	Lindane
12	HCH (mixed isomers)
13	Mercury compounds
14	Arsenic (arsenates and arsenates)
15	Heptachlor
16	Leptophos
17	Captafol
18	Dichloropropane
19	Aldicarb
20	Quintozene (PCNB)
21	Pentachlorophenol
22	Methamidophos
23	Monocrotophos (restricted to coconut)
24	Chlordane
25	Endosulfan
26	Paraquat (restricted to plantation crops)
27	Dimwthoate
28	Fenthion
29	Cyromazin
30	Alchlor

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය. ගරු ඇමතිතුමා ප්‍රශ්නයේ (අ) (ii) කොටසට පිළිතුරු දීමේදී, මහා පරිමාණයෙන් කෘෂි රසායන ද්‍රව්‍ය ගෙන්වන සමාගම් හතරක් ගැන සඳහන් කළා. ගරු ඇමතිතුමනි, මා ඔබතුමාගෙන් කාරණයක් අහන්න කැමැතියි. කෘෂි රසායන ද්‍රව්‍ය ගෙන්වීම පිළිබඳ නීති කඩ කරලා තහනම් කෘෂි රසායන ද්‍රව්‍ය ගෙන්වූවාය කියලා සමාගම් හතරකට Sri Lanka Customs එකෙන් දඩ මුදලක් ගැහුවා. තහනම් කෘෂි රසායන ද්‍රව්‍ය ගෙනාවාය කියලා Sri Lanka Customs එකෙන් දඩත් ගහලා තිබියදී, ඒ සමාගම් අසාධු ලේඛනයට ඇතුළත් නොකර, නැවත වතාවක් ඒ සමාගම්වලට ඒ රසායන ද්‍රව්‍ය ගෙන්වීමට අවසර දීලා තිබෙන්නේ ඇයි?

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

ගරු මන්ත්‍රීතුමනි, ඒවා ගෙන්වූවාට පසුවයි අපි තහනම් කළේ. ඒවා ගෙන්වන්න කලින් තහනම් කළා නොවෙයි. ගරු කථානායකතුමනි, වකුගඩු රෝගය පිළිබඳව යම් යම් මතවාද, ගැටුම් ඇති වුණු වෙලාවේ ඒකට මේ රසායන ද්‍රව්‍ය හේතු වනවාය කියලා - ඒ ගැන නිශ්චිත තීරණයක් තිබුණේත් නැහැ- අදහසක් ආපු නිසා වරායට ගෙනැල්ලා තිබුණු ටික අපි තහනම් කළා. ඒක අසාධු ලේඛන ගත කිරීමට තරම් වරදක් නොවෙයි.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු කථානායකතුමනි, ඇමතිතුමාට මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය හරියට තේරුණේ නැහැ. Sri Lanka Customs එකෙන් ඒ සමාගම් හතරට දඩ ගැහුවා, විෂ අධික රසායන ද්‍රව්‍ය ගෙනාවාය කියලා. ගරු ඇමතිතුමනි, ඒ සමාගම් හතරම ඒ දඩ ගෙව්වා. එහෙම දඩයක් ගැහුවේ වරදකරුවන් නිසා. ඇයි, ඔබතුමන්ලා ඒ ගැන පියවරක් ගත්තේ නැත්තේ?

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

ගරු කථානායකතුමනි, දඩයක් ගහන්න හේතු වුණ කාරණය මේකයි. ඒ රසායන ද්‍රව්‍ය generic name එකෙන් ගෙන්වලා තිබුණේ. ඒ ගෙන්වලා තිබුණු රසායන ද්‍රව්‍ය මතභේදයකට ලක් වුණ රසායන ද්‍රව්‍ය. ඒ ගෙන්වපු ඒවාට දඩ ගහලා, ආපහු ඒවා පිට රටට යවන්න කියලා තීන්දුව කළා මිස, ඒ සමාගම් අසාධු ලේඛනගත කළේ නැහැ.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ඒවා ආපහු මේ රටටම නිදහස් කළා, ගරු ඇමතිතුමා.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

එහෙම තහනමක් වුණේ නැහැ, ගරු කථානායකතුමනි. එහෙම නීතියක් තිබුණේ නැහැ, ඒ වෙලාවේ.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු කථානායකතුමනි, මෙතුමා කියන ඒ සමාගම් හතරට Sri Lanka Customs එකෙන් දඩ ගැහුවාට පස්සේ, ඔවුන් ඒ දඩය ගෙවලා ආපහු රට ඇතුළට ඒ විෂ රසායන ද්‍රව්‍ය ටික ගත්තා. ඊට පස්සේ ඒවා මේ රටේ විකිණුවා. කෘෂිකර්ම ඇමතිතුමා වශයෙන් ඉන්න ගරු ඇමතිතුමා මොකක්ද මේ කරන්නේ?

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

ඔබතුමාට ඒක පැටලිලා තිබෙන්නේ. Generic name එකෙන් ගෙන්වපු ඒ රසායන ද්‍රව්‍ය අපේ රටේ තහනම් කරලා තිබුණු ඒවා

නොවෙයි. නමුත් සැකයක් ඇති වුණා, ඒ රසායන ද්‍රව්‍ය මේ රෝගවලට හේතුවෙයි කියලා. ඒ අනුව තමයි අපි ඒවා නතර කළේ. ඒකයි වුණේ.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
එහෙම නම් Sri Lanka Customs එකෙන් ඇයි ඒ ගොල්ලන්ට දඩ ගැහුවේ? එහෙම නම් ඔබතුමන්ලා වැරැදි තීන්දුවක් නේ අරගෙන තිබෙන්නේ.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ඒකේ නීතිය ගැන කියන්න -

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු කථානායකතුමනි, "මෙහෙම වෙන්න ඇති" කියලා හිතලා සැකයට දඩ ගහන රටක් තිබෙනවාද? Sri Lanka Customs එකෙන් දඩ ගැහුවා, මේවා නීති විරෝධී විෂ අධික රසායන ද්‍රව්‍ය කියලා. ඒ දඩය ගෙව්වාට පස්සේ තමුන්නාන්සේලා ඒ වස ටික ආපහු රටට නිදහස් කළා.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
Sri Lanka Customs එකෙන් දඩ ගහනවා, විවිධ හේතු නිසා. ඒ කුමන හේතුවක් නිසා දඩ ගැහුවාද කියන එක අපට දන්වලා නැහැ. නමුත්, generic name එකෙන් ගෙන්වපු මේ රසායනික ද්‍රව්‍යවල යම් යම් සංඝටක තිබෙන නිසා ඒවා තහනම් කරනවා කියලා තමයි අපි කිව්වේ. ඒවා තහනම් කරනවා කියලා කිව්වා මිසක්, එහෙම තහනම් කරන්න නීතියක් තිබුණේ නැහැ.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ඒ සමාගම් හතරට දඩ ගැහුවා නේ, ගරු ඇමතිතුමා.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ඒ දඩ ගහපු හේතුව මොකක්ද කියන්න මම දන්නේ නැහැ.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ඔබතුමාගේ අමාත්‍යාංශයට අයිති කාරණයක් සම්බන්ධයෙන් Sri Lanka Customs එකෙන් දඩ ගහපු එක කෘෂිකර්ම ඇමතිතුමා හැටියට ඔබතුමා දන්නේ නැහැ කියන එක ගැන මම කනගාටු වෙනවා.

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි.

ජනාධිපතිතුමා ගිය අප්‍රේල් මාසයේ 2වැනි දා අනුරාධපුරයට ගිහිල්ලා ශ්‍රී මහා බෝධීන් වහන්සේ ළඟ පැවැති අලුත් සහල් මංගල්‍යයේදී පොරොන්දු වුණා, ග්ලයිෆොසේට් කියන රසායන ද්‍රව්‍ය ගෙන්වන එක තහනම් කරනවා කියලා. ඒ වාගේම ඔබතුමා 2011 අප්‍රේල් මාසයේ 10 වැනි දා තිබුණු Consultative Committee එකේදී කිව්වා, කෘෂි රසායන වර්ග හතරක් තහනම් කරනවා කියලා. ඒ ගැන ඔබතුමා ලොකු නිවේදනයකුත් දැම්මා. ඒ වාගේම දැනට සති හයකට උඩදීත් ඔබතුමා ඉංග්‍රීසි පුවත් පතකට ප්‍රකාශයක් කරලා තිබුණා, අපි මේවා තහනම් කරලා ගැසට් එකක් නිකුත් කරනවා කියලා. හැබැයි ගරු ඇමතිතුමනි, අද වන තෙක් මේ ගැසට් එක නිකුත් කරලා නැහැ.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
මම ගැසට් නිවේදනයට අත්සන් කළා.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
අත්සන් කළාට නිකුත් වෙලා නැහැ. ඔබතුමා ඒක කියලා මාස එක හමාරක් - සති 6ක්- වෙනවා. අපට නම් තවම දැන ගන්නට ලැබුණේ නැහැ, ඔබතුමා අත්සන් කරපු ගැසට් එකක් එළියට ආවා කියලා. ඔබතුමා කියන මේ ග්ලයිෆොසේට් කියන කෘෂි රසායන ද්‍රව්‍ය මුළු රට පුරාම ව්‍යාප්ත වෙලා තිබෙනවා. අද තවමත් වෙළෙඳ පොළේ බහුලව ඒවා ගන්න තිබෙනවා. ඉතින් මේක කවදාද නවත්වන්නේ? ජනාධිපතිතුමා කිව්වාමත් නවත්වන්න බැරි නම්, තමුන්නාන්සේ කිව්වාමත් නවත්වන්න බැරි නම් කාට කියලාද අපි මේක නවත්වා ගන්නේ?

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ගරු කථානායකතුමනි, එතුමා කියන ඒ කාරණය සියයට 100ක්ම නිවැරදියි කියලා මම කියන්නේත් නැහැ, සියයට 100ක්ම වැරදියි කියලා මම කියන්නේත් නැහැ. ග්ලයිෆොසේට් කියන මේ රසායනික ද්‍රව්‍ය අපි දැනට ගැසට් නිවේදනයකින් තහනම් කරලා තිබෙනවා. නමුත් මේවා විවිධ අවස්ථාවල මේ රටට ගෙන්වලා තිබෙනවා. එහෙම ගෙන්වලා විවිධ නම්වලින් තමයි වෙළෙඳ පොළේ විකුණන්නේ. එකක් 'පටාස්' කියයි, තව එකක් 'රවුන්ඩ්අප්' කියයි. ඒ විධියට එක එක වෙළෙඳ නම්වලින් මේ රසායනික ද්‍රව්‍ය තිබෙනවා. මේ ග්ලයිෆොසේට් නිසාම මේ වකුගඩු රෝගය හැදෙනවාය කියලා සාධක ඇතිව විද්‍යාත්මකව කොහේදිවත් ඔප්පු වෙලා නැහැ. නමුත්, වකුගඩු රෝගය බහුලව තිබෙන දිස්ත්‍රික්ක හයක විතරක් මේ රසායන ද්‍රව්‍ය තාවකාලිකව තහනම් කරන්න තමයි අපි ගැසට් නිවේදනය නිකුත් කළේ. මම ඒ ගැසට් නිවේදනයට අත්සන් කළා. මම වගකීමෙන් කියනවා මම ඒක අත්සන් කරලා පිටකළා කියලා. නමුත් මුද්‍රණය කළාද කියලා මම දන්නේ නැහැ.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය.

මේ වකුගඩු රෝගය ඔබතුමා නියෝජනය කරන පළාතේත් විශාල වශයෙන් ව්‍යාප්ත වෙලා තිබෙනවා. ඒ වාගේම දිස්ත්‍රික්ක ගණනාවක මේ රෝගය තදින් ව්‍යාප්ත වනවා විතරක් නොවෙයි, දැන් 25,000ක් 30,000ක් දෙනා මැරිලා තිබෙනවා. තව 25,000ක් විතර රජයේ රෝහල්වලින් බෙහෙත් ගන්නවා. මේ ගැන රජයේ අවධානය යොමු කරවන්න අපිත් අවස්ථා කීපයකදී මැදිහත් වුණා. Consultative Committee එකේත් මේ ගැන කථා කළා. ඒ වාගේම මේ ගැන සොයන්න වෙනම කැබිනට් අනුකාරක සභාවකුත් පත් කළා. ඇමතිතුමාත් කියනවා, ගැසට් එකත් පළ කළා කියලා. කවුද, මේවාට උපදෙස් දෙන්නේ? මේ රසායන ද්‍රව්‍ය තහනම් කරලා ගැසට් එකත් පළ කරලා නම්, ඒත් වෙළෙඳ පොළේ තවමත් ඒවා තිබෙනවා නම්, මේ සමාගම් එක්ක ගනුදෙනු

[ගරු පී. හැරිසන් මහතා]

කරන මිනිහා කවුද? ජනාධිපතිතුමා කියලාවත් මේවා නවත්වන්න බැරි නම් කාටද අපි මේවා කියන්නේ? මට ඇහුණා, අර දේවාලෙන් අහලා මේකට තීන්දුවක් ගන්නම් කියලා සමහරු කියනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය ඇහුවාම ඇති.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් මතභේද රාශියක් තිබෙනවා. ඒක ඇත්ත. නමුත් වකුගඩු රෝගයට හේතු කාරකවන විද්‍යානුකූල නිශ්චිත කාරණයක් අපට තවමත් දන්වලා නැහැ. අපට ඒ කරුණු දැන ගන්න, සොයා ගන්න තවමත් බැරි වුණා. විවිධ හේතු මේකට බලපාලා තිබෙනවා. නමුත් කෘෂි රසායන ද්‍රව්‍ය මේ රෝගයට බල නොපෑවාය කියලා ලෝකයේ කාටවත් කියන්න බැහැ. මේ සම්බන්ධයෙන් කෘෂිකර්ම අමාත්‍යාංශය වශයෙන් අපට ගන්න පුළුවන් පියවර සියල්ලම අපි අරගෙන තිබෙනවා. පසු ගිය දිනක ජනාධිපතිතුමා සමඟ පැවැති සාකච්ඡාවේදීත් කෘෂිකර්ම අමාත්‍යාංශය අරගෙන තිබෙන පියවර ගැන සෑහීමකට පත් වෙලා, ඒ ගැන සතුට ප්‍රකාශ කළා, ගන්න පුළුවන් සෑම පියවරක්ම මේ සම්බන්ධයෙන් අරගෙන තිබෙනවාය කියලා.

මුලදී, ආසනික් ගැන කථා කළා; ඒ වාගේ විවිධ දේවල් ගැන කථා කළා. දැන් ඒ ප්‍රශ්නය එතැනිනුත් එහාට ගිහින්. ගරු කථානායකතුමනි, තවමත් අපට මේ සම්බන්ධයෙන් නිශ්චිත තීරණයක් දීලා නැහැ. නමුත් මේ වෙනකම් අපි කියන කියන දේ කළා. "මෙන්න මේක කරන්න" කිව්වාම ඒක කළා. "ඒක කරන්න" කිව්වාම ඒකත් කළා. නමුත් ලෙඩේ තවම තිබෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අතුරු ප්‍රශ්න අවසානයි. මෙය සියලු දෙනාගේම අවධානය යොමු විය යුතු ප්‍රශ්නයක්. දැන් අතුරු ප්‍රශ්න තුන අවසානයි.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
සමාවන්න ගරු කථානායකතුමනි, මේක වැදගත් ප්‍රශ්නයක්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
වැදගත් ප්‍රශ්නයක් නිසා තමයි කිව්වේ අපි කාගේත් අවධානය යොමු විය යුතුයි කියලා.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ඒ නිසායි අනෙක් අමාත්‍යාංශවලත් අවධානය යොමු කළේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ නිසා තමයි මම කිව්වේ විශේෂ අවධානයක් යොමු විය යුතු බව. මම සෙවනගල, අම්බෙගමුව පළාත්වල හිටියා. ඒ ප්‍රදේශවල වකුගඩු රෝගය නිසා විශාල වශයෙන් ජීවිත විනාශ වෙලා තිබෙනවා. මේ ප්‍රදේශයකට පමණක් සීමා වුණු ප්‍රශ්නයක් නොවෙයි. ඒ නිසා අපි කාගේත් අවධානය යොමු කර ඒ සම්බන්ධයෙන් පියවරක් ගත යුතුයි.

නොරොච්චෝලේ ගල් අඟුරු තාප බලාගාරය : අක්‍රිය වීම සහ අලුත්වැඩියාව
நுரைச்சோலை நிலக்கரி அனல் மின் உற்பத்தி நிலையம் :செயலிழப்புகள் மற்றும் திருத்தங்கள்
NORACHCHOLAI COAL POWER PLANT: BREAKDOWNS AND REPAIRS

4798/'14

10. ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (3) :

(අ) (i) නොරොච්චෝලේ ගල් අඟුරු තාප බලාගාරයේ විදුලි උත්පාදනය ආරම්භ කළ දින සිට මේ දක්වා එය අක්‍රිය වූ වාර ගණන සහ එක් එක් අවස්ථාවේදී අක්‍රියව තිබූ කාල සීමාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) මේ දක්වා එය අක්‍රිය වූ අවස්ථාවන්හිදී එහි අලුත්වැඩියා කිරීම සඳහා වැය වූමුළු මුදල කොපමණද;

(iii) එම අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් වැය වූ මුදල බලාගාරය අක්‍රිය වූ එක් එක් අවස්ථාව අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම අක්‍රියවීම් අදාළ උපකරණවල වගකීම් කාලය තුළ සිදු වූයේ නම්, ඉහත පරිදි මුදල් වැය කිරීමට හේතු කවරේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නොරොච්චෝලේ තාප විදුලි බලාගාරයේ සිදුවූ අක්‍රියවීම් හේතුවෙන් එම කාල සීමාවන් තුළ වෙනත් බලාගාර ඔස්සේ ජාතික විදුලිබල පද්ධතියට විදුලිය එක් කිරීම සඳහා වැය කළ අතිරේක මුදල කොපමණද;

(ii) ඉහත තාප විදුලි බලාගාරයේ බිඳ වැටීම් හේතුවෙන් වැය වූ අතිරේක මුදල එකතු කළවිට විදුලි ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා කොපමණ මුදලක් වැය වීතිබේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

වලු, සක්ති අමෙච්සරෙක් කේට්ට විනා:

(அ) (i) நுரைச்சோலை நிலக்கரி அனல் மின் உற்பத்தி நிலையத்தின் மின்சார உற்பத்தி ஆரம்பிக்கப்பட்ட நாள் தொடக்கம் அது செயலிழந்த தடவைகளின் எண்ணிக்கை மற்றும் ஒவ்வொரு சந்தர்ப்பத்திலும் செயலிழந்து காணப்பட்ட காலகட்டம் வெவ்வேறாக யாது;

(ii) இதுவரை அது செயலிழந்து காணப்பட்ட சந்தர்ப்பங்களில் அதனை திருத்துவதற்காக செலவான மொத்தப் பணத்தொகை எவ்வளவு;

(iii) மேற்படி திருத்தத்திற்காக செலவான பணத்தொகை மின் உற்பத்தி நிலையம் செயலிழந்த ஒவ்வொரு சந்தர்ப்பத்திற்கமைய வெவ்வேறாக எவ்வளவு;

(iv) மேற்படி செயலிழப்பானது ஏற்புடைய உபகரணங்களின் உத்தரவாத காலத்தினுள் இடம்பெற்றிருப்பின் மேலே குறிப்பிட்டவாறு பணம் செலவிடப்பட்டமைக்கான காரணங்கள் யாவை

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) நுரைச்சோலை அனல் மின் நிலையத்தில் ஏற்பட்ட செயலிழப்பு காரணமாக மேற்படி காலகட்டங்களினுள் வேறு மின் உற்பத்தி நிலையங்களிலிருந்து தேசிய மின்சார முறைமைக்கு மின்சாரத்தை பெறுவதற்காக செலவிடப்பட்ட மேலதிகப் பணத்தொகை எவ்வளவு;

(ii) மேற்படி மின் உற்பத்தி நிலையத்தின் செயலிழப்பு காரணமாக செலவான மேலதிகப் பணத்தொகையை கூட்டுகின்றபோது ஓர் அலகு மின்சாரத்தை உற்பத்தி செய்வதற்காக செலவிடப்பட்ட பணத்தொகை எவ்வளவு

என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Energy:

(a) Will she state -

(i) the number of breakdowns that the Norachcholai Coal Power Plant suffered up to now since the date on which it began generating electricity and the periods of time that it was not functional during each of the aforesaid instances;

(ii) the total amount of money that has been spent up to now for repair work in the aforesaid plant in the aforesaid instances of breakdown;

(iii) separately, the amount of money that was spent for repairs on each of the aforesaid instances of breakdown of the power plant;

(iv) the reasons for spending money as mentioned above, if the aforesaid breakdowns occurred during the warranty period of the relevant equipment?

(b) Will she inform this House -

(i) the additional sum of money that was spent for obtaining electricity from other power plants to be added to the national grid during the aforementioned periods of time in which breakdowns occurred in the Norachcholai Power Plant;

(ii) the total cost that has been incurred for the production of one unit of electricity after adding the additional cost incurred as a result of the breakdowns in the aforesaid Power Plant?

(c) If not, why?

ගරු පවිත්‍රාදේවී වන්නිආරච්චි මහත්මිය (විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමිය)

(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி - வலு, சக்தி அமைச்சர்)

(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi - Minister of Power and Energy)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) නොරොච්චෝලේ ගල් අඟුරු තාප බලාගාරයේ විදුලි උත්පාදනය ආරම්භ කළ දින සිට මේ දක්වා එය අක්‍රිය වූ වාර ගණන (24) විසි හතරකි. එම එක් එක් අවස්ථාවේදී අක්‍රිය වී තිබූ කාල සීමාවන් පහත සඳහන් පරිදි වේ.

අක්‍රිය වූ වාරය	බලාගාරය අක්‍රිය වූ දිනය	අලුත්වැඩියා කටයුතුවලින් පසු නැවත බලාගාරය පණගැන්වූ දිනය	බලාගාරය අක්‍රිය වී තිබූ කාල සීමාව (දින)
1	2011 ජුනි 7	2011 ජූලි 10	33
2	2011 නොවැම්බර් 4	2011 නොවැම්බර් 6	2
3	2011 නොවැම්බර් 21	2011 නොවැම්බර් 22	1
4	2011 නොවැම්බර් 29	2011 නොවැම්බර් 30	1
5	2012 ජනවාරි 5	2012 ජනවාරි 10	6
6	2012 ජනවාරි 18	2012 පෙබරවාරි 16	29
7	2012 පෙබරවාරි 17	2012 පෙබරවාරි 20	4
8	2012 අප්‍රේල් 26	2012 අප්‍රේල් 28	2
9	2012 ජූලි 21	2012 ජූලි 26	5
10	2012 අගෝස්තු 8	2012 අගෝස්තු 26	19
11	2012 අගෝස්තු 26	2012 සැප්තැම්බර් 7	11
12	2012 නොවැම්බර් 7	2012 නොවැම්බර් 9	2
13	2013 ජනවාරි 29	2013 ජනවාරි 30	1
14	2013 අප්‍රේල් 7	2013 අප්‍රේල් 9	2
15	2013 අප්‍රේල් 19	2013 අප්‍රේල් 19	(පැය 14)
16	2013 මැයි 6	2013 මැයි 7	1
17	2013 ඔක්තෝබර් 15	2013 ඔක්තෝබර් 16	1
18	2013 ඔක්තෝබර් 29	2013 ඔක්තෝබර් 29	(පැය 8)
19	2013 දෙසැම්බර් 13	2013 දෙසැම්බර් 30	16
20	2014 ජනවාරි 5	2014 ජනවාරි 9	4
21	2014 ජනවාරි 10	2014 පෙබරවාරි 9	30
22	2014 මාර්තු 7	2014 මාර්තු 7	(පැය 3)
23	2014 ජුනි 22	2014 ජුනි 23	(පැය 18)
24	2014 ජුනි 23	2014 ජුනි 23	(පැය 2)

(ii) මේ දක්වා එය අක්‍රිය වූ අවස්ථාවන්හිදී එහි අලුත්වැඩියා කිරීම සඳහා වැය වූ මුළු මුදල රුපියල් මිලියන 9,751,717.00 (රුපියල් මිලියන 9.8) කි.

(iii) එම අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් වැය වූ මුදල බලාගාරය අක්‍රිය වූ එක් එක් අවස්ථාව අනුව වෙන් වෙන් වශයෙන් පහතින් දක්වා ඇත.

[ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය]

අක්‍රීය වූ වාරය	බලාගාරය අක්‍රීය වූ දිනය	බලාගාරය අක්‍රීය වූයේ උපකරණවල වගකීම් කාලය වන **2011.07.01** සිට **2013.06.30** තුළදීද/ නැද්ද යන වග	බලාගාරය අක්‍රීය වී තිබූ කාල සීමාව (දින)
1	2011 ජුනි 7	උපකරණවල වගකීම් කාලයට යටත් වේ.	0.00
2	2011 නොවැම්බර් 4		0.00
3	2011 නොවැම්බර් 21		0.00
4	2011 නොවැම්බර් 29		0.00
5	2012 ජනවාරි 5		0.00
6	2012 ජනවාරි 18		0.00
7	2012 පෙබරවාරි 17		0.00
8	2012 අප්‍රේල් 26		0.00
9	2012 ජූලි 21		0.00
10	2012 අගෝස්තු 8		0.00
11	2012 අගෝස්තු 26		0.00
12	2012 නොවැම්බර් 7		0.00
13	2013 ජනවාරි 29		0.00
14	2013 අප්‍රේල් 7		0.00
15	2013 අප්‍රේල් 19		0.00
16	2013 මැයි 6	උපකරණවල වගකීම් කාලයට යටත් නොවේ.	0.00
17	2013 ඔක්තෝබර් 15		0.00
18	2013 ඔක්තෝබර් 29		0.00
19	2013 දෙසැම්බර් 13		0.00
20	2014 ජනවාරි 5		0.00
21	2014 ජනවාරි 10		9,751,717.00
22	2014 මාර්තු 7		0.00
23	2014 ජුනි 22		0.00
24	2014 ජුනි 23		0.00
ලංකා විදුලිබල මණ්ඩලය විසින් දරන ලද සම්පූර්ණ වියදම			9,751,717.00

(iv) උපකරණවලට අදාළ වගකීම් කාලය අවුරුදු (2) දෙකක් වන අතර, එය 2011.07.01 දින සිට ආරම්භ වී 2013.06.30 දින අවසන් විය. එම කාලය තුළදී විදුලි බලාගාරය අක්‍රීය වී ඇති වාර ගණන 16ක් වන අතර, අදාළ අලුත්වැඩියා කටයුතු සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් කිසිදු වියදමක් දරා නැත.

(ආ) (i) නොරොච්චෝලේ තාප බලාගාරයේ සිදුවූ අක්‍රිය වීම් හේතුවෙන් එම කාල සීමාවන් තුළ වෙනත් බලාගාර ඔස්සේ ජාතික විදුලිබල පද්ධතියට විදුලිය එක් කිරීම සඳහා වැය කළ අතිරේක මුදල රු. මිලියන 18,194 කි.

(ii) ඉහත තාප බලාගාරයේ බිඳවැටීම් හේතුවෙන් වැය වූ අතිරේක මුදල එකතු කළ විට අදාළ කාලය තුළ විදුලි ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා රු. 18ක පමණ මුදලක් (18 Rs/kWh) වැය වී ඇත.

(ඇ) පැන නොනඟී.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමනි, මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමියනි, පසු ගිය දවස්වල නියෝජ්‍ය පෙන්වලා, ඒ වාගේම නොරොච්චෝලේ විවෘත කරන තුරු පෞද්ගලික බලාගාරවලින් මිලට ගන්න තිබෙනවා කියලා, තාවකාලිකව සියයට 40 ක ඉන්ධන ගැලපුම් ගාස්තුවක් ජනතාවගෙන් අය කරන්න පටන් ගත්තා. දැන් නියෝජ්‍ය ඉවර වෙලා ජලාශ පිරිල ඉතිරිලා ගිහින් තියෙනවා. දැන් ඒක ඉවත් කරනවාද? ඉවත් කරනවා නම් කොයි කාලයේද කියලා දැනගන්න කැමතියි?

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
ඒ සඳහා අපි ඉදිරියේදී පියවර ගන්න බලාපොරොත්තු වෙනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
කවදද කියන එක?

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
දින වකවානු කීම අපහසුයි, ගරු කථානායකතුමනි. ඒ සඳහා අවශ්‍ය පියවර ඉදිරියේදී අපි ගන්නට බලාපොරොත්තු වෙනවා, වැඩි කාලයක් නොගොසින්. අපි අවුරුද්දක් කියමු.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
පසු ගිය දවස්වල දිගටම කිව්වා, ඡන්ද කාලයේ විදුලි බිල අඩු කරන කොටත් කිව්වා, දැන් විදුලි බල මණ්ඩලය ලාභ ලබනවා කියා. ඔය කියන ලාභය ලබන්නේ 24 වතාවක් අක්‍රිය වෙච්ච නොරොච්චෝලේ බලාගාරයෙන් ලැබූ ලාභයක්ද, එහෙම නැත්නම් ජනතාවගෙන් අසීමිත විදුලි බිලක් අය කරලා ලබපු ලාභයක්ද කියලා ඔබතුමියට කියන්න පුළුවන්ද?

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
ගරු කථානායකතුමනි, අවුරුද්ද අවසානයේදී විදුලි ක්ෂේත්‍රයේ ලාභ පාඩු අපට බලන්න පුළුවන්. හැබැයි, විදුලිය මිලදී ගැනීම් විදුලිබල මණ්ඩලයෙන් සිද්ධ කරන එක, දවසේ පැය ගණනින් පැය ගණනට වෙනස් වෙනවා. සමහර වෙලාවට අධික ලෙස විදුලිය පාවිච්චි කරන පැය ගණන්, ඒ කියන්නේ රෑ හයේ ඉඳලා අට වාගේ දක්වා කාලය, එහෙම නැත්නම් දහය විතර වෙනකල් කාලයේ අපි වැඩිපුර ජල විදුලිය පාවිච්චි කරනවා. සමහර වෙලාවල්වලට අප දවසින් දවසට, පැය ගණින් පැය ගණනට මිල මත පදනම් වෙච්ච, එක එක බලාගාරවලින් ගන්න විධිය වෙනස් වෙනවා. ඒක නිසා නිශ්චිතම උත්තයක් ඔබතුමාට දීගන්න අමාරුයි. ඔබතුමා Consultative Committee එකට ආවොත් අපට ඒ සම්බන්ධයෙන් දීර්ඝව කථා කරන්න පුළුවන්.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මගේ අවසන් අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි. ලංකාවේ ඉදි කරපු පළමුවැනි ජල විදුලි බලාගාරය ඉදි කළෙත් අපේ ලාංකීය ඉංජිනේරුවෙක් වන විමලසුරේන්ද්‍ර මැතිතුමා වාගේ උදවිය.

දැන් මේ දවස්වල හැමෝම කථා වෙනවා, නොරොච්චෝලේ පැත්තේ උදේට සවසට බාර් ළඟ වැඩි හරියක් ඉන්නේ චීන්නුය කියා. ඒ වාගේම ගෙම්බෝ, දිය නයි අල්ලන තැන්වලත් වැඩිපුර චීන ජනතාව ඉන්නවා. කොළඹියක් වාගේ වෙලා. චීන උදව්ය මෙච්චර මේකට යොදාගෙන මේ ලැහැස්ති වෙන්නේ, වෘත්තීය සමිති සේවකයෝ ඒ වාගේම විදුලිය සුරකින්නන්ගේ සංගමය ආදිය සැක පළ කරන විධියට චීනයටම මේ බලාගාරය දෙන්න ද හදන්නේ කියන එක ගරු ඇමතිතුමියගෙන් දැන ගන්නට කැමැතියි.

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
ගරු මන්ත්‍රීතුමනි, රටට ජාතික සම්පතක් වෙච්ච නොරොච්චෝලේ විදුලි බලාගාරය කිසිසේත් ම චීනයට හෝ වෙනත් රටකට විකුණන්නේත් නැහැ; විකුණන්නට තීරණයක් අරගෙනත් නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 14-5199/'14-(1), ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 15-5259/'14-(1), ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

සමෘද්ධි ප්‍රතිලාභීන් : විස්තර
சமூர்த்தி பயனாளிகள் : விபரம்
SAMURDHI BENEFICIARIES: DETAILS

3270/'12

2. ගරු ජෝන් අමරතුංග මහතා (ගරු රවි කරුණානායක මහතා වෙනුවට)
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு ரவி கருணாநாயக்க சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. Ravi Karunanayake)
ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) (i) අද වන විට දිවයිනේ සිටින සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2011 සහ 2012 වසරවල දෙසැම්බර් 31 දින වන විට සිටි සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(iii) එබඳු සමාජ සහනාධාරයක් ලබාදීම පිණිස සලකා බලන නිර්ණායක කවරේද;

(iv) 2010, 2011 සහ 2012 වර්ෂවලදී මාසිකව සහ වාර්ෂිකව ඔවුන්ට ලැබුණු දීමනාව මත පදනම්ව සමෘද්ධිලාභී පවුල් සංඛ්‍යාවේ ප්‍රභේදනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) මිලදී ගැනීමේ ශක්තිය හෝ ක්‍රය ශක්තිය හෝ උද්ධමන ප්‍රවණතාවන්ට සාපේක්ෂව සමෘද්ධි ප්‍රතිලාභීන් සඳහා අරමුදල් නැවත වෙන්කිරීමක් සිදුකර තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இன்று உள்ளவாறு நாட்டில் உள்ள சமூர்த்தி பயனாளிகளின் எண்ணிக்கையையும்;

(ii) 2011, 2012 ஆகிய வருடங்களில் டிசம்பர் 31ஆம் திகதியிலுள்ளவாறு சமூர்த்தி பயனாளிகளின் எண்ணிக்கையையும்;

(iii) அத்தகைய உதவிக்கொடுப்பனவு ஒன்றைப் பெற்றுக்கொள்வதற்கு கருத்திற்கொள்ளப்பட்ட மூலப் பிரமாணங்களையும்;

(iv) 2010, 2011, 2012 ஆகிய வருடங்களில் மாதாந்தம் மற்றும் வருடாந்தம் பெற்றுக்கொண்ட உதவித் தொகைகளின் அடிப்படையில் சமூர்த்தி கிடைக்கப்பெறும் குடும்பங்களின் விபரங்களையும் வெவ்வேறாகவும்

அவர் கூறுவாரா?

(ஆ) விலைக்கு வாங்கும் ஆற்றல் அல்லது கொள்வனவு செய்யும் ஆற்றல் அல்லது பணவீக்கம் சார் போக்குகள் தொடர்பாக சமூர்த்தி பெறுநர்களுக்கு நிதியங்களின் மீள் ஒதுக்கீடொன்று உள்ளதா என்பதை அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Economic Development:

(a) Will he state -

(i) the number of Samurdhi beneficiaries in the country as at today;

[ගරු ජෝන් අමරතුංග මහතා]

(ii) the number of Samurdhi beneficiaries as at 31st December of the years 2011 and 2012;

(iii) the criterion considered to receive such a dole; and

(iv) the break up of the Samurdhi recipient families based on the allowance they received per month and per year in 2010, 2011 and 2012?

(b) Will he inform this House whether there is a reallocation of funds to the Samurdhi recipients in relation to buying power or purchasing power or inflationary tendencies?

(c) If not, why?

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Susantha Punchinilame - Deputy Minister of Economic Development)

ගරු කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) අද වන විට දිවයිනේ සිටින සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව 1,483,272 කි.

මුළු දිවයින පුරා වෙසෙන අඩු ආදායම්ලාභීන් උදෙසා වර්තමානයේ ක්‍රියාත්මක වන වැඩසටහන් අතුරින් ප්‍රමුඛතම සංවර්ධන හා සුභසාධන වැඩසටහන ලෙස සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක වේ.

දිළිඳු ජනතාව ඔවුන්ගේ එදිනෙදා ජීවිතයේදී මුහුණ දෙන දුෂ්කර අවස්ථාවන්හි ඔවුන්ට පිළිසරණක් වෙමින් හා ඔවුන්ගේ පවුල් ඒකක මුහුණදෙන ආර්ථික කඩා වැටීම්වල දී ඔවුන්ට පිළිසරණක් වෙමින් ආර්ථික සංවර්ධනය සඳහා ඔවුන්ගේ දායකත්වය නොකඩවා ලබා දිය හැකි තත්ත්වයෙන් ඔවුන්ගේ ජීවන තත්ත්වයන් පවත්වා ගැනීමට සුවිශේෂී දායකත්වයක් සමෘද්ධි ව්‍යාපාරය මඟින් ලබා දී ඇත.

සමෘද්ධි මුදල් සහනාධාරය යනු පුද්ගලයාගේ වර්තමාන සංවර්ධන ප්‍රවේශයේ එක් ප්‍රරූපක බවට තහවුරු කරන නාමික අගයක් පමණි. එය, සමෘද්ධි සහනාධාරය හා බද්ධව පවතින අනෙකුත් වැඩසටහන් මඟින් ආර්ථික වශයෙන් දිළිඳු ප්‍රජාව හඳුනාගෙන ඔවුන් ආර්ථික, සමාජීය හා සංස්කෘතික වශයෙන් සවිමත් කරමින් තම දෙපයින් නැඟී සිටීමට හැකි පුරවැසියන් බවට පත් කරන පුළුල් වැඩසටහනකි.

පුද්ගලයාගේ සමාජ සුරක්ෂිතභාවය තහවුරු කරන මෙම වැඩසටහන රක්ෂණ ක්‍රියාවලියක, ඉතිරි කිරීමට හුරුවක්, ආදායම් උත්පාදන ක්‍රියවලියක්, පුද්ගල සංවර්ධනය, ඉහළ අධ්‍යාපනයක්, සරුසාර ගෙවත්තක් වැනි අනේක විධ වැඩසටහන් රාශියක එකමුතුවකි.

සමෘද්ධි සහනාධාර වැඩසටහන තවදුරටත් පුළුල් කරමින් ප්‍රතිලාභීන් ඉතිරි කිරීමට හා ඒ තුළින් ඉදිරි ආයෝජනයට පෙළඹවීමේ අරමුණින් සමෘද්ධි මුද්දරය වෙනුවට ඔවුනට හිමි මුදල් සමෘද්ධි බැංකුවල ප්‍රතිලාභීන්ගේ ගිණුම්වලට බැර කිරීමේ ක්‍රමයක් 2012 අප්‍රේල් මස සිට හඳුන්වා දෙන ලදි.

සමෘද්ධි ප්‍රතිලාභියා හෝ ඔහුගේ/ඇයගේ පවුලේ සාමාජිකයන් ඔවුන්ගේ ආර්ථික හා සාමාජික කාර්යයන්හි පූර්ණ ලෙස කැපවීමට අවශ්‍ය රැකවරණය, සමාජීය ආරක්ෂාව සහතික කිරීම හා ස්වශක්තියෙන් නැඟී සිටීමට අවශ්‍ය උපකාර ලබා දීමේ අරමුණින් සමෘද්ධි සහනාධාර වැඩසටහනේ එක් අංගයක් ලෙස සමාජ ආරක්ෂණ වැඩසටහන ආරම්භ කරන ලදි. සාමාජිකයින් දෙදෙනෙකුට වඩා සිටින පවුල් මේ සඳහා දායක කර ගනු ලබන අතර දරු උපකකදී, විවාහයකදී, මරණයකදී, රෝහල් ගතවීමකදී හා උසස් අධ්‍යාපනයේදී යනාදී විශේෂ අවස්ථාවන් සඳහා සමාජ ආරක්ෂණ වැඩසටහන මඟින් ප්‍රතිලාභ ලබා දී ඇත.

එදා සිට අද දක්වා ගමන් මග ගෙනහැර බැලුවහොත් සමෘද්ධිය යනු දිළිඳුකම පිටු දැකීමේ වැඩසටහන්වල ඉතා සාර්ථකම වැඩසටහන බව සමෘද්ධිය ආරම්භ කරන විට තිබූ ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය වූ 22.5% අගය අද වන විට 6.5% කට ආසන්න අගයකට අඩු වීම තුළින් පැහැදිලි වේ.

(ii) 2011 වසර දෙසැම්බර් 31 දිනට සිටි සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව - 1,540,019කි.

2012 වසර දෙසැම්බර් 31 දිනට සිටි සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව - 1, 516,543කි.

(iii) සමෘද්ධි සහනාධාරය ලබා දීමේදී ප්‍රතිලාභීන් සංඛ්‍යාව තීරණය කිරීමට පොදුවේ දරිද්‍රතා මට්ටම සලකා බලනු ලැබේ.

ඊට අමතරව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ඒවාට අනන්‍ය වූ පහත සඳහන් නිර්ණායක මූලික වශයෙන් පාදක කර ගනු ලැබේ.

* ආදායම් සීමාව
* නිවසේ තත්ත්වය/ ඉඩකඩම් පිළිබඳ විස්තර
* දරුවන් සංඛ්‍යාව
* ආබාධිත දරුවන් සිටී ද යන වග
* අධ්‍යාපනය ලබන දරුවන් සිටී ද යන වග
* පවුලේ සාමාජිකයන් ස්ථීර රැකියාවේ නිරත වන්නේද යන වග
* වැන්දඹු බව
* ස්වෝත්සාහයෙන් දියුණු වීමට උත්සාහ දරන්නේ ද යන වග

(iv) පිළිතුර ඇමුණුමෙහි හි දැක්වේ.

Annex:

Samurdhi Stamps Final Report
District Summary
2010 January - December

District	*Rs.615*	*Rs.350*	*Rs.250*	*Rs.415*	*Rs.1500*	*Rs.900*	*Rs.525*	*Rs.375*	*Rs.210*	*Total*	*Monthly Allocation (Rs.)*
Colombo	19,766	13,293	12,049	8,243	225	0	0	0	2,025	55,601	24,004,485
Gampaha	42,961	34,338	26,342	13,510	330	4,331	1,753	1,816	9,520	134,901	58,624,890
Kalutara	16,511	9,598	8,536	5,677	118	12,520	4,745	5,652	7,784	71,141	35,693,785
Kandy	10,135	8,406	6,645	12,187	149	22,305	20,035	13,475	10,888	104,225	54,049,960
Matale	15,417	6,109	5,925	8,979	204	3,660	2,252	2,037	4,249	48,832	23,265,605
Nuwara-Eliya	1,414	1,802	1,559	12,003	15	6,595	4,436	7,228	9,444	44,496	19,851,945
Galle	23,882	12,580	10,283	7,375	56	9,724	4,963	3,397	9,906	82,166	39,517,115
Matara	20,614	10,204	8,345	6,351	33	13,755	5,287	4,464	6,196	75,249	39,150,760
Hambantota	4	0	1	10,290	6	22,525	11,059	8,788	8,307	60,980	35,400,505
Jaffna	27,063	2,695	5,902	0	4,528	9,608	1,182	1,863	0	52,841	35,820,870
Vavuniya	301	532	370	5,534	1	414	695	563	2,835	11,245	4,305,875
Batticaloa	395	8,583	7,779	47,936	2	71	1,487	1,216	19,023	86,492	30,383,570
Ampara	13,563	1,818	4,725	39,841	104	2,894	764	699	15,278	79,686	33,325,015
Trincomalee	49	48	533	30,109	14	22	0	1	10,788	41,564	14,982,075
Kurunegala	51,498	23,705	15,591	17,703	516	20,861	9,279	6,600	11,664	157,417	80,557,330
Puttalama	13,106	6,684	7,575	6,179	18	16,375	4,578	3,447	2,406	60,368	33,823,460
Anuradhapura	18,626	8,152	6,881	12,094	514	9,149	4,320	2,915	7,396	70,047	34,966,835
Polonnaruwa	9,581	3,136	2,291	6,813	123	3,196	713	423	5,383	31,659	15,114,340
Badulla	747	744	922	5,964	51	23,680	11,875	10,323	8,519	62,825	36,708,355
Monargala	11,345	2,396	1,681	8,077	171	9,627	4,601	3,776	7,693	49,367	25,955,835
Ratnapura	5,831	5,138	1,883	13,691	109	42,806	22,833	10,498	14,130	116,919	69,117,155
Kegalle	2	1	0	10,097	37	22,323	19,075	13,088	10,945	75,568	41,558,860
Grand Total	302,811	159,962	135,818	288,653	7,324	256,441	135,932	102,269	184,379	1,573,589	786,178,625

Thursday, July 03, 2014

Report Name :- *Samurdhi Stamps Final Report - Disrtict (Since 2010)*

Samurdhi Stamps Final Report
District Summary
2011 January - December

District	*Rs.615*	*Rs.350*	*Rs.250*	*Rs.415*	*Rs.1500*	*Rs.900*	*Rs.525*	*Rs.375*	*Rs.210*	*Total*	*Monthly Allocation (Rs.)*
Colombo	19,254	13,189	11,901	7,951	229	0	0	0	1,903	54,427	23,475,405
Gampaha	42,961	34,041	25,846	13,214	333	4,308	1,803	1,877	8,626	133,009	58,119,285
Kalutara	16,363	9,562	8,503	5,508	114	12,323	4,668	5,557	7,113	69,711	35,111,520
Kandy	9,652	7,965	6,344	11,338	149	21,681	19,385	13,206	9,205	98,925	51,813,825
Matale	14,986	5,971	5,779	8,690	201	3,597	2,194	1,964	3,764	47,146	22,574,930
Nuwara-Eliya	1,416	1,801	1,551	11,942	15	6,548	4,399	7,176	9,350	44,198	19,724,545
Galle	23,897	12,496	10,261	7,078	54	9,540	4,887	3,333	9,084	80,630	38,963,065
Matara	19,994	10,046	8,311	5,825	33	13,501	5,202	4,381	5,493	72,786	38,035,390
Hambantota	6	0	1	9,899	6	22,427	10,957	8,779	7,635	59,710	34,953,225
Jaffna	26,657	2,616	5,853	0	4,519	9,608	1,182	1,863	0	52,298	35,517,780
Vavuniya	301	532	370	5,534	1	417	696	562	2,835	11,248	4,308,725
Batticaloa	559	8,598	7,778	47,732	2	85	1,485	1,206	19,051	86,496	30,418,450
Ampara	13,538	1,819	3,272	39,754	105	2,917	764	2,140	15,146	79,455	33,445,490
Trincomalee	48	50	520	29,075	20	169	25	9	9,040	38,956	14,340,145
Kurunegala	50,604	23,522	15,617	16,556	495	20,617	9,133	6,823	10,118	153,485	78,905,180
Puttalama	11,908	6,545	7,507	5,231	16	15,917	4,571	3,588	2,045	57,328	32,185,810
Anuradhapura	18,319	8,077	6,951	11,874	500	8,882	4,228	2,940	6,628	68,399	34,216,475
Polonnaruwa	9,424	3,228	2,303	6,758	117	3,227	725	425	4,911	31,118	14,956,990
Badulla	745	744	922	5,804	50	23,615	11,901	10,430	8,074	62,285	36,541,050
Monargala	11,276	2,426	1,738	8,005	172	9,637	4,585	3,744	7,589	49,172	25,876,530
Ratnapura	5,791	5,117	1,880	13,432	107	42,786	22,778	10,485	13,159	115,535	68,718,310
Kegalle	0	0	0	9,657	35	22,228	18,920	12,979	9,883	73,702	40,940,910
Grand Total	297,699	158,345	133,208	280,857	7,273	254,030	134,488	103,467	170,652	1,540,019	773,143,035

Thursday, July 03, 2014

Report Name :- *Samurdhi Stamps Final Report - Disrtict (Since 2010)*

[ගරු සුසන්ත පුංචිනිලමේ මහතා]

Samurdhi Stamps Final Report
District Summary
2012 January - February-March

District	*Rs.615*	*Rs.350*	*Rs.250*	*Rs.415*	*Rs.1500*	*Rs.900*	*Rs.525*	*Rs.375*	*Rs.210*	*Total*	*Monthly Allocation (Rs.)*
Colombo	19,254	13,189	11,901	7,951	229	0	0	0	1,903	54,427	23,475,405
Gampaha	42,961	34,041	25,846	13,214	333	4,308	1,803	1,877	8,626	133,009	58,119,285
Kalutara	16,363	9,562	8,503	5,508	114	12,323	4,668	5,557	7,113	69,711	35,111,520
Kandy	9,652	7,965	6,344	11,338	149	21,681	19,385	13,206	9,205	98,925	51,813,825
Matale	14,986	5,971	5,779	8,690	201	3,597	2,194	1,964	3,764	47,146	22,574,930
Nuwara-Eliya	1,416	1,801	1,551	11,942	15	6,548	4,399	7,176	9,350	44,198	19,724,545
Galle	23,897	12,496	10,261	7,078	54	9,540	4,887	3,333	9,084	80,630	38,963,065
Matara	19,994	10,046	8,311	5,825	33	13,501	5,202	4,381	5,493	72,786	38,035,390
Hambantota	6	0	1	9,899	6	22,427	10,957	8,779	7,635	59,710	34,953,225
Jaffna	26,657	2,616	5,853	0	4,519	9,608	1,182	1,863	0	52,298	35,517,780
Vavuniya	301	532	370	5,534	1	417	696	562	2,835	11,248	4,308,725
Batticaloa	559	8,598	7,778	47,732	2	85	1,485	1,206	19,051	86,496	30,418,450
Ampara	13,538	1,819	3,272	39,754	105	2,917	764	2,140	15,146	79,455	33,445,490
Trincomalee	48	50	520	29,075	20	169	25	9	9,040	38,956	14,340,145
Kurunegala	50,604	23,522	15,617	16,556	495	20,617	9,133	6,823	10,118	153,485	78,905,180
Puttalama	11,908	6,545	7,507	5,231	16	15,917	4,571	3,588	2,045	57,328	32,185,810
Anuradhapura	18,319	8,077	6,951	11,874	500	8,882	4,228	2,940	6,628	68,399	34,216,475
Polonnaruwa	9,424	3,228	2,303	6,758	117	3,227	725	425	4,911	31,118	14,956,990
Badulla	745	744	922	5,804	50	23,615	11,901	10,430	8,074	62,285	36,541,050
Monargala	11,276	2,426	1,738	8,005	172	9,637	4,585	3,744	7,589	49,172	25,876,530
Ratnapura	5,791	5,117	1,880	13,432	107	42,786	22,778	10,485	13,159	115,535	68,718,310
Kegalle	0	0	0	9,657	35	22,228	18,920	12,979	9,883	73,702	40,940,910
Grand Total	297,699	158,345	133,208	280,857	7,273	254,030	134,488	103,467	170,652	1,540,019	773,143,035

Samurdhi Stamps Allocation Report
District Summary
2012 – April to December

District	*No of Family*				*Total*	*Monthly*
	Rs.1500	*Rs.1200*	*Rs.750*	*Rs.210*	*Family*	*Allocation (Rs.)*
Colombo	229	0	52,270	1,905	54,404	39,946,050
Gampaha	333	4,302	119,684	8,616	132,935	97,234,260
Kalutara	115	12,424	50,171	6,959	69,669	54,170,940
Kandy	149	21,679	67,803	9,180	98,811	79,018,350
Matale	201	3,599	39,575	3,761	47,136	35,091,360
Nuwara-Eliya	15	6,557	28,158	9,249	43,979	30,951,690
Galle	56	9,530	61,894	9,083	80,563	59,847,930
Matara	33	13,489	53,673	5,469	72,664	57,639,540
Hambantota	12	22,517	30,102	7,571	60,202	51,204,810
Jaffna	4,526	9,608	38,685	0	52,819	47,332,350
Vavuniya	1	415	7,999	2,835	11,250	7,094,100
Batticaloa	2	85	67,308	18,932	86,327	54,561,720
Ampara	103	2,917	61,286	15,147	79,453	52,800,270
Trincomalee	20	168	29,711	9,035	38,934	24,412,200
Kurunegala	495	20,599	122,109	10,104	153,307	119,164,890
Puttalama	16	16,054	39,367	2,147	57,584	49,264,920
Anuradhapura	503	9,076	52,478	6,540	68,597	52,377,600
Polonnaruwa	118	3,228	22,866	4,911	31,123	22,231,410
Badulla	50	23,605	30,517	8,070	62,242	52,983,450
Monargala	172	9,644	31,752	7,586	49,154	37,237,860
Ratnapura	107	42,772	59,481	13,155	115,515	98,860,200
Kegalle	35	22,225	41,472	9,868	73,600	59,898,780
Grand Total	7,291	254,493	1,108,361	170,123	1,540,268	1,183,324,680

(ආ) ඔව්.

2012 වර්ෂයේ අය වැය යෝජනා අනුව මිලදී ගැනීමේ ශක්තිය -ක්‍රය ශක්තිය- හා උද්ධමන ප්‍රවණතාවන්ට සාපේක්ෂව සමෘද්ධි සහනාධාර 2012 අප්‍රේල් මස සිට පහත සඳහන් පරිදි වැඩි කර ඇත.

පෙර ලබාදුන් සහනාධාර වටිනාකම	2012 අය වැය යෝජනා අනුව වැඩි කළ පසු නව සහනාධාර වටිනාකම
1500/-	1500/-
900/-	1200/-
615/-	750/-
525/-	750/-
415/-	750/-
375/-	750/-
350/-	750/-
250/-	750/-
210/-	210/-

(ඇ) අදාළ නොවේ.

කුකුළු ගොවිපළ සංවර්ධන වැඩසටහන්: විස්තර
கோழிப் பண்ணை அபிவிருத்தி வேலைத் திட்டங்கள் : விபரம்
POULTRY FARM DEVELOPMENT PROGRAMME: DETAILS

4761/'14

8. ගරු ජෝන් අමරතුංග මහතා (ගරු අශෝක් අබේසිංහ මහතා වෙනුවට)

(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு அசோக் அபேசிங்க சார்பாக)

(The Hon. John Amaratunga on behalf of the Hon. Ashok Abeysinghe)

පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) (i) සුළු හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපළ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා 2012 වර්ෂයේ වෙන් කළ මුදල කොපමණද;

(iii) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ලියාපදිංචි කර ඇති කුකුළු ගොවිපළ සංඛ්‍යාව කොපමණද;

(iv) ස්වයං රැකියාවක් ලෙස සුළු පරිමාණ කුකුළු ගොවිපළ සංවර්ධනය සඳහා වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

කෘෂිකාර්මික සංවර්ධන හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍ය ගරු (ආචාර්ය) රාජිත සේනාරත්න මහතා (කෘෂිකාර්මික සංවර්ධන හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍ය ගරු (ආචාර්ය) රාජිත සේනාරත්න මහතා)

(கமத்தொழில் அபிவிருத்தி மற்றும் கிராமிய சன சமூக அபிவிருத்தி அமைச்சர் மாண்புமிகு (கலாநிதி) ராஜித சேனாரத்ன)

(Minister of Agricultural Development and Rural Community Development (Dr.) the Hon. Rajitha Senaratne)

කාල්නඩෙ වලර්ප්පු, කිරාමිය සන සමූග අපිවිරුත්ති අමෛච්චරෙක් කේට්ට විනා:

(අ) (i) සිරිය මට්රුම් නඩුත්තර අළවිලාන කෝලිප් පණ්ණෙකළ් අපිවිරුත්ති වේලෛත් තිට්ටංකළ් සෙයර්පඩුත්තප්පඩුකින්රනවා එන්බතෙයුම්;

(ii) අව්වාරායින් 2012ආම් ආණ්ඩිල් ඉදර්කෙන ඔදුක්කප්පට්ට පණත්තොකෙ එව්වළවු එන්බතෙයුම්;

(iii) කුරුනාකල් මාවට්ටත්තිල් පතිවු සෙය්යප්පට්ටුළ්ළ කෝලිප් පණ්ණෙකළින් එණ්ණික්කෙ යාදු එන්බතෙයුම්;

(iv) සුයතොළිලාක සිරිය අළවිලාන කෝලිප්පණ්ණෙකළෙ අපිවිරුත්ති සෙය්වතර් කානතොරු වේලෛත්තිට්ටම් සෙයර්පඩුත් තප්පට්ටුළ්ළතා එන්බතෙයුම්

අවර් ඉච්චපෙක්කු අරිවිප්පාරා?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minster of Livestock and Rural Community Development:

(a) Will he inform this House -

(i) whether small and medium scale poultry farm development programmes are in operation;

(ii) if so, the amount allocated for the said programmes in the year 2012;

(iii) the number of poultry farms that has been registered within the Kurunegala District; and

(iv) whether a programme to develop small scale poultry farming as a form of self employment, has been implemented?

(b) If not, why?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

(மாண்புமிகு தினேஷ் குணவர்தன)

(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත** *කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) 2012 සඳහා රුපියල් මිලියන 30ක් වෙන් කර ඇත.

(iii) 1799කි.

(iv) ඔව්.

(ආ) අදාළ නොවේ.

ඉතාලියේ හෝටල් ක්ෂේත්‍රයේ රැකියා සඳහා තොරාගත් ශ්‍රී ලාංකීකයන්: පදනම
இத்தாலியில் ஹோட்டல் துறை தொழில்களுக்குத் தெரிவுசெய்யப்பட்ட இலங்கையர் : அடிப்படை
SRI LANKANS SELECTED FOR HOTEL SECTOR JOBS IN ITALY: BASIS

4796/'14

9. ගරු ජෝන් අමරතුංග මහතා (ගරු අජිත් පී.පෙරේරා මහතා වෙනුවට)

(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு அஜித் பீ. பெரேரா சார்பாக)

(The Hon. John Amaratunga on behalf of the Hon. Ajith P. Perera)

විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (3):

[ගරු ජෝන් අමරතුංග මහතා]

(අ) (i) 2013 වර්ෂයේදී විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යාංශය මගින් ඉතාලියේ හෝටල් ක්ෂේත්‍රයේ රැකියා සඳහා ශ්‍රී ලාංකිකයින් යොමු කරනු ලැබුවේද;

(ii) එසේ නම්, යොමු කරන ලද පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඔවුන්ගේ නම් සහ ලිපිනයන් එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) එම පිරිස තෝරා ගත් පදනම කවරේද;

(ii) එම පිරිස තෝරා ගැනීම සඳහා පුවත්පත් දැන්වීම් පළකිරීම හෝ වෙනත් ප්‍රචාරණ විධි ක්‍රමයක් අනුගමනය කරනු ලැබුවේද;

(iii) එසේ නම්, ඒ කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

වෙළිනාට්ටු වේලෙවාය්ප්පු ඌක්කුවිප්පු, නලනෝම්පුකෙ අමෙච්චරෙක් කේට්ට විනා:

(அ) (i) 2013ஆம் ஆண்டு வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சினால் ஹோட்டல் துறையில் தொழில் வாய்ப்புக்களுக்காக இத்தாலிக்கு இலங்கையர்கள் அனுப்பப்பட்டார்களா என்பதையும்;

(ii) ஆமெனில், அவ்வாறு அனுப்பப்பட்ட ஆட்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இவர்களின் பெயர்கள் மற்றும் முகவரிகள் யாவையென்பதை அவர் சமர்ப்பிப்பாரா?

(இ) (i) மேற்படி குழுவினர் தேர்ந்தெடுக்கப்பட்ட அடிப்படை யாதென்பதையும்;

(ii) மேற்படி குழுவினரைத் தேர்ந்தெடுப்பதற்காக பத்திரிகை விளம்பரங்கள் அல்லது வேறு பிரச்சார வழிமுறைகள் பின்பற்றப்பட்டனவா என்பதையும்;

(iii) ஆமெனில் அவை யாவையென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Employment Promotion and Welfare:

(a) Will he state -

(i) whether the Ministry of Foreign Employment Promotion and Welfare sent Sri Lankans to jobs in the hotel sector in Italy in the year 2013; and

(ii) if so, the number of persons so sent?

(b) Will he table their names and addresses?

(c) Will he also state -

(i) the basis on which they were selected;

(ii) whether publishing of advertisements in newspapers or other modes of disseminating was followed in selecting these persons; and

(iii) if so, what they are?

(d) If not, why?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යතුමා වෙනුවෙන් මෙම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත** *කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) නැත.
(ii) 2013 වර්ෂයේදී ඉතාලියේ හෝටල් ක්ෂේත්‍රයේ රැකියා සඳහා යොමු කිරීමේ අපේක්ෂාවෙන් 512 දෙනෙකු සම්මුඛ පරීක්ෂණය සඳහා යොමු වූ අතර, ඉන් 304 දෙනෙකු පුහුණුව සඳහා යොමු කරන ලදි. එහිදී 45 දෙනෙකු පමණක් ඉතාලි භාෂා ප්‍රවීනතා විභාගයෙන් සමත් වී ඇත.

(ආ) මෙතෙක් කිසිදු පුද්ගලයෙක් හෝටල් ක්ෂේත්‍රය සඳහා ඉතාලිය වෙත විදේශ ගත කර නොමැත.

(ඇ) (i) විදේශ රැකියා අපේක්ෂිතයින්ගේ නාම ලේඛනය රැකියා දත්ත බැංකුවේ ලියාපදිංචි කර ඇත.
(ii) අදාළ නොවේ.
(iii) අදාළ නොවේ.

(ඈ) පැන නොනඟී.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 11-4941/'14-(1), ගරු අනෝමා ගමගේ මහත්මිය.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු කථානායකතුමනි, ගරු අනෝමා ගමගේ මහත්මිය වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 12-5027/'14-(2), ගරු අකිල විරාජ් කාරියවසම් මහතා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, ගරු අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ගරු අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමා සභාවට පැමිණීමට බලාපොරොත්තු වන දිනට ඉඩ තබා, සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා වෙනුවෙන් මෙම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 13-5072/'14-(1), ගරු තිස්ස අත්තනායක මහතා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, ගරු තිස්ස අත්තනායක මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්නය, ගරු අනුර දිසානායක මහතා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

ශ්‍රී ලාංකීය සිනමාව මුහුණ දී තිබෙන අර්බුදකාරී තත්ත්වය
இலங்கை சினிமாத்துறை எதிர்நோக்கும் நெருக்கடிகள்
CRISIS FACED BY SRI LANKAN CINEMA

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, 1947න් ආරම්භ වී එතැන් පටන් අද වන විට හැටහත් වසරක් පිරෙන ශ්‍රී ලාංකීය සිනමාව මුහුණ දී තිබෙන දැඩි අර්බුදකාරී තත්ත්වය පිළිබඳව මා මෙම සභාවේ අවධානය යොමු කරනු කැමැත්තෙමි.

1947 සිට 1972 දක්වා පෞද්ගලික අංශය විසින්ම පරිපාලනය කළා වූ ලාංකීය සිනමාව එකී කාලය තුළදී ඇති වූ විවිධ ගැටලු හා බාධක දුරලනු වස් සාධාරණ සිනමා ක්‍රමවේදයක් සඳහා මූලික අඩිතාලමක් ලෙසට වසර 1972 දී සිනමාකරුවන් මූලිකව එවකට පැවති රජය මඟින් ජාතික චිත්‍රපට සංස්ථාව ආරම්භ කොට ගන්නා ලදී. එනමුත්, එකී රාජ්‍ය ආයතනය තම අරමුණු කරා ගමන් ගැනීමේදී ජාතික ප්‍රතිපත්තියක් යටතේ නොපිහිටා පෞද්ගලික හා දේශපාලන බලඅධිකාරය යටතේ ක්‍රියා කිරීම හා එදවස රාජ්‍ය පරිපාලකයන්ගේ සිනමාව පිළිබඳව පුළුල් දැක්මකින් තොරව ක්‍රියා කිරීම හේතු කොටගෙන නැවත වරක් මෙකී ජාතික චිත්‍රපට සංස්ථාවේ බලතල වසර 1999 දී එවකට පැවති පොදු පෙරමුණු රජය විසින් නැවතත් ඩික්සන් නිලවීර වාර්තාවට අනුව යමින් පෞද්ගලික අංශයටම වැඩි ඉඩකඩ හා බලතල සහිතව නැවතත් පැවරීම සිදු කරන ලදී.

ජාතික චිත්‍රපට සංස්ථාවේ මේ වන විට ආයු කාලය වසර 42කි. කෙසේ නමුත් මේ මොහොත වන විට ලාංකික සිනමාව පැටලී ඇත්තේ පඹගාලකය. තත්ත්වය එසේ හෙයින් මේ සඳහා වූ මැදිහත් වීමක් කිරීම තව තවත් කල් නොදැමිය යුතුය. මේ සඳහා අවශ්‍ය ක්ෂණික විසඳුම් ලබා දීමට රජය මේ මොහොතේ අසමත් වන්නේ නම්; කල් අරින්නේ නම්; මහ හරින්නේ නම්; සිනමාව හා එහි නියැළි සියලු දෙනා ඉදිරි වසර තුළදී දැඩි අභියෝගයන්ට මුහුණ දෙමින් සිනමා ක්ෂේත්‍රයෙන් සමු ගනු නිසැකය.

මෙම තත්ත්වය තුළ පැන නඟින පහත ගැටලුවලට පිළිතුරු අදාළ අමාත්‍යවරයා විසින් ගරු සභාව හමුවේ තබනු ඇතැයි අපේක්ෂා කරමි.

01. ඩිජිටල්කරණ ක්‍රියාවලියට අනුගත නොවීම නිසා දැනටත් සිනමාපට විශාල ප්‍රමාණයක ප්‍රදර්ශන අයිතිය එහි ශිල්පීන්ට හා නිෂ්පාදකවරුන්ට අහිමිව ඇත. එය ඒ මොහොතේ එක් එක් අය විසින් අත් පත් කර ගෙන තිබෙනවා. දැනටමත් චිත්‍රපට පනහක පමණ (2005 සිට) ප්‍රදර්ශන පෝලිමක් නිර්මාණය වී ඇත. වසර සියයකට වඩා පැරණි පටලපට (35mm negative) ප්‍රදර්ශන ක්‍රමවේදය මුළුමනින්ම ලෝකයෙන් ඉවත් වෙමින් තිබෙන මොහොතක ලාංකීය සිනමාව ඩිජිටල්කරණ ප්‍රදර්ශන ක්‍රමවේදයට ගමන් නොකරන්නේ මන්ද, එකී ඩිජිටල් ප්‍රදර්ශනය full HD එනම්, High-Definition (1920 x 1080) හෝ 35mm ප්‍රදර්ශනයට සමගාමීව යන 2K ප්‍රභේදයේ එනම්, 2048 x 1080 යන ප්‍රභේදයන්ට අනුගත නොවන්නේ ඇයි? මෙම ක්‍රමවේදයන් දෙකම සඳහා සිනමාකරුවන් හා සිනමා සංගම් වාචිකව හා ලිඛිතව තම කැමැත්ත ප්‍රකාශකොට සිටිය දී ඒ සඳහා ස්ථිර විසඳුම් ලබා දීමට රජය මැදිහත් නොවන්නේ ඇයි?

02. එකී ඩිජිටල් ප්‍රදර්ශනය සඳහා සිනමාකරුවන් එක්ව රජයට බලපෑමක් ලෙස 2013.01.16 දින පැවැත් වූ පා ගමනට සාපේක්ෂව කලබල වූ රජය විසින් කලාකරුවන් අරලියගහ මන්දිරයට එක්රැස්කොට සංග්‍රහකොට 2013.02.18 දින ජනාධිපතිවරයා මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබූ ඩිජිටල්කරණ ක්‍රියාවලියට සිදු වූයේ කුමක් ද?

එකඟතාවකට ආවා. එතුමා ප්‍රකාශ කරලාත් තිබුණා, මෙය කරනවා කියලා. දැන් සිදුවෙලා තිබෙන්නේ කුමක් ද?

03. ශ්‍රී ලාංකීය සිනමාවට 67 වසරක් සපිරෙන මොහොතේ (2013.01.21) එහි ප්‍රධාන ආරාධිතයා වූ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් ජාතික චිත්‍රපට සංස්ථාවේ තරංගනී ශාලාවේදී ප්‍රකාශයට පත් කරන ලද මාස 06ක් තුළ මෙකී ඩිජිටල්කරණ ක්‍රියාවලිය සිදු කරන බවට දුන් පොරොන්දුව ඉටු වන්නේ කවදා ද?

[ගරු අනුර දිසානායක මහතා]

04. සිනමාවේ දිගු කලක් භාවිත පටල පටය ඉදිරි වසර දෙක හෝ තුන තුළ දැවැන්ත අර්බුදයකට ගමන් කරන හෙයින් රජය විසින් ලාංකීය සිනමාව ඉදිරියට පවත්වා ගෙන යනු ලබන බවට වන පොරොන්දුව කවරේ ද?

05. මේ රජය විසින්ම වසර 2010 දී පත් කළ ඩී.බී. නිහාල්සිංහ මහතා, සුමිත්‍රා පීරිස් මහත්මිය, සෝමරත්න දිසානායක මහතා යන අයගේ ප්‍රධානත්වයෙන් පත් කළ කොමිසමට සිදු වූයේ කුමක් ද?

06. රජය විසින් ජාතික චිත්‍රපට සංස්ථාව නැවත බලාත්මක කොට, එහි පරිපාලනය විධිමත් කොට පෞද්ගලික අංශයට පමණක් බෙදා හැරීමේ අයිතිය නොදී චිත්‍රපට ප්‍රදර්ශන ක්‍රියාවලිය සිනමාකරුවන්ගේ සම අයිතියක් ලෙස පිළිගෙන ක්‍රියාකාරිවීමට කටයුතු නොකරන්නේ මන්ද?

ඉහත දැක්වූ කරුණු පිළිබඳව ගරු ඇමතිතුමා මේ ගරු සභාව දැනුවත් කරනු ඇතැයි බලාපොරොත්තු වෙනවා. බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු කෙහෙළිය රඹුක්වැල්ල ඇමතිතුමා.

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා (ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல - வெகுசன ஊடக, தகவல் அமைச்சர்)
(The Hon. Keheliya Rambukwella - Minister of Mass Media and Information)

ගරු කථානායකතුමනි, ගරු අනුර දිසානායක මහතාගේ ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

01. චිත්‍රපට ඩිජිටල්කරණ ක්‍රියාවලියට අනුගතවීම සඳහා දැනටමත් අවශ්‍ය නීතිරීතීන් හා ක්‍රියාපටිපාටීන් මෙම අමාත්‍යාංශය විසින් සකස් කොට ඇත. ඒ අනුව, 1971/ අංක 47 දරන ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 60 (1) සහ 60 (2) වගන්තිවලින් අමාත්‍යවරයාට පැවරී ඇති බලතල යටතේ 2014.02.18 වන දින සිට දේශීය චිත්‍රපට ප්‍රක්ෂේපණ ක්‍රමවේදය සඳහා පහත පරිදි රීතීන් ප්‍රකාශයට පත් කොට ඇත.

"ශ්‍රී ලංකා සිනමාශාලා තුළ චිත්‍රපට ප්‍රක්ෂේපණ මිමි 35 සහ මිමි 70 වෙනුවට හෝ ඊට විකල්ප වශයෙන් ඩිජිටල් ප්‍රක්ෂේපණ ක්‍රමය මත ප්‍රක්ෂේපණ භාවිතා කිරීමට භාවිතා කරන අවස්ථාවලදී චිත්‍රපට ප්‍රක්ෂේපණය සඳහා දැනට භාවිත වන මිමි 35 සහ මිමි 70 සෙලියුලොයිඩ් ප්‍රක්ෂේපණ ක්‍රමයට සමාන වූ හෝ වඩා ඉහළ ප්‍රමිතියක් සහිත ඉලෙක්ට්‍රෝනික ක්‍රමයෙන් ප්‍රක්ෂේපණය කරන ඩිජිටල් ප්‍රක්ෂේපණ ක්‍රමය සිනමා ශාලාවක ප්‍රදර්ශනය සඳහා භාවිත කිරීම සඳහා අවසර ලබා දෙනු ලැබේ."

මේ යටතේ දේශීය සිනමාවේ චිත්‍රපට ප්‍රක්ෂේපණය සඳහා 2K තාක්ෂණය (2048 x 1080 pixel) යොදා ගැනීම සඳහා ආචාර්ය ඩී.බී. නිහාල්සිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වූ උපදේශන කමිටුව විසින් නිර්දේශ කර ඇති අතර, මේ සඳහා ඔබ විසින් සඳහන් කර ඇති HD තාක්ෂණය, එනම් High Definition (1920x1080) තාක්ෂණය කිසිසේත්ම යොදා ගැනීමට අදාළ කමිටුව විසින් නිර්දේශ කර නොමැත. මෙය සිනමා ප්‍රක්ෂේපණයට සුදුසු තාක්ෂණ ක්‍රමවේදයක් නොවන බවත්, එය රූපවාහිනී විකාශය සඳහා උචිත ක්‍රමයක් බවත් අදාළ කමිටුව විසින් පෙන්වා දී ඇත.

02. මෙහි සඳහන් කර ඇති පරිදි 2013.01.16 වන දින අමාත්‍යාංශය වෙත පා ගමනකින් පැමිණ විරෝධතාවක් දක්වා නොමැති අතර, අතිගරු ජනාධිපතිතුමා විසින් 2014.02.18 වන දින අරලියගහ මන්දිරය වෙත කලාකරුවන් කැඳවා මෙම 2K තාක්ෂණය යටතේ චිත්‍රපට ඩිජිටල්කරණය කිරීමේ දැනුම් දීම නිල වශයෙන් සිදු කරන ලද අතර ඒ අනුව කලාකරුවන්ට තම ඉදිරි ආයෝජන කටයුතු සඳහා දැනුවත් කිරීමක් මේ මඟින් සිදු කෙරිණි.

03. ශ්‍රී ලංකා සිනමාවට වසර 67ක් සපිරීම හා ගරු අමාත්‍යවරයා විසින් ඩිජිටල්කරණ ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කරන ලද බව දැනුම් දීම සිදු කරන ලද්දේ 2013 ජනවාරි 21 දින නොව, 2014 ජනවාරි මස 21 වන දිනය.

04. චිත්‍රපට ඩිජිටල්කරණය සඳහා අදාළ තාක්ෂණය ප්‍රකාශයට පත් කිරීමෙන් පසු සිනමා ශාලා හිමියන් සහ බෙදා හැරීමේ මණ්ඩල සමඟ දිගින් දිගටම පවත්වන ලද සාකච්ඡාවලින් පසුව මේ සඳහා එකඟතාවන් ඇති කරගෙන එකී මණ්ඩල ප්‍රධාන ධාරාවන් 03ක් යටතේ ක්‍රියාත්මක වීම මඟින් දිවයිනේ සියලුම සිනමා ශාලා ඩිජිටල්කරණය කිරීම සඳහා කටයුතු මේ වන විට ආරම්භ කොට ඇත. ඒ අනුව, එම්පීඅයි මණ්ඩලය විසින් පාමංකඩ - රීරෝස්, මාලිගාවත්ත - රූබි, ත්‍රිකුණාමලය - නෙල්සන්, කළුතර - නිව් මිනර්වා ඇතුළු සිනමා ශාලා 24ක් දැනටමත් ඩිජිටල්කරණය කිරීමේ කටයුතු නිම කර ඇති බව දැනුම් දී ඇත.

05. සිනමා කර්මාන්තයේ උන්නතිය උදෙසා සහ අවශ්‍ය ප්‍රතිසංස්කරණයන්ට අදාළ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වූ මෙම කමිටුව මඟින් ඩිජිටල්කරණය සඳහා වූ තාක්ෂණික පිරිවිතරයන් සඳහා නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව චිත්‍රපට සංස්ථා පනතේම අවශ්‍ය සංශෝධනයන් ඉටු කිරීම සඳහා වූ නීතිරීති නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව සහ නීතිපති සමඟ සාකච්ඡා කොට ඇති අතර, එකී පනතේ සංශෝධනයකින් තොරව මෙම කටයුතු කිරීමේ හැකියාව සොයා බලා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා.

06. දැනටමත් පෞද්ගලික අංශය මඟින් සිදු කරනු ලබන චිත්‍රපට බෙදා හැරීමේ ක්‍රමවේදය පිළිබඳව අධ්‍යයනය කර තිබෙන අතර ඒ අනුව යුක්ති සහගත හා සාධාරණ බෙදා හැරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ පාර්ශ්ව සමඟ සාකච්ඡා සිදු කරමින් පවතිනවා.

ගරු කථානායකතුමනි, මේ මොහොතේයි මම මෙතැනට පැමිණියේ. මෙතුමා කියලා තිබුණා 50ක් කියලා. 50ක් නොවෙයි, හරියටම 38 දෙනායි. මා මෙතැනට පැමිණෙන්නට පෙර ඒ අදාළ 38 දෙනාම මගේ කාර්යාලයේ හිටියා. ඒ 38 දෙනා සමඟම සාකච්ඡා කරලා, 38 දෙනාටම සාධාරණයක් වන විධියේ එකඟතාවකට සහ ක්‍රමවේදයකට මේ වන විටත් ඇවිල්ලා තිබෙනවා. 2K කියන එකෙන් බැහැරව 1900 කියන ක්‍රමවේදය අද ක්‍රියාවට නැංවීමට නොහැකියි. චිත්‍රපට කර්මාන්තය සම්බන්ධයෙන් ඔබතුමා දන්නවා. 1981දී රූපවාහිනිය පැමිණීමත්, 1983 දී ඇති වුණු ප්‍රශ්නත් නිසා ඒ කාලය තුළ සිනමාශාලාවල අවපාතයක් ඇති වුණු බව සැබෑවක්. හැබැයි, මේ මොහොත වන විට ඒක සම්පූර්ණයෙන්ම වෙනස් වෙලා. අද චිත්‍රපටශාලාවලට විශාල සෙනඟක් පැමිණෙමින්, චිත්‍රපට ගණනාවක් වාර්තා තබමින් ප්‍රදර්ශනය වන වන බව සඳහන් කරන්නට ඕනෑ. ඒ වාර්තා දෙන්න පුළුවන්. ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට ඩොලර් මිලියන 4ක ආදායමක් ඉපයූ සිංහල චිත්‍රපටයක් මේ දවස්වල ප්‍රදර්ශනය වෙමින් පවතිනවා. මේ වැඩ පිළිවෙළ ආවාට ගියාට කරන්න පුළුවන් දෙයකුත් නොවෙයි. ඔබතුමා කිව්වා මාස 6ක් ඇතුළත

කියලා. මේක 2013 කියලා ගත්තොත් මාස හයක් නැහැ. හැබැයි, මේක දෙන්නේ 2013 නොවෙයි, 2014. 2014 සිට එන කොට මාස හයකටත් පෙර ඒ ක්‍රියාවලිය ආරම්භ කරලා ලබන අවුරුද්දේ මාර්තු 31වැනිදා වන විට අවසාන වෙන්න, ඒ බෙදා හැරීමේ මණ්ඩල සියල්ලටම උපදෙස් ලබා දී තිබෙනවා. මම නම් වශයෙන් සඳහන් කරනවා නම්, මේ වන විට අපි ඊඒපී මණ්ඩලයත් එක්ක සාකච්ඡා කරමින් යනවා. ඔබතුමා සඳහන් කළ ඩික්සන් නිලවීර වාර්තාව හරහා ගත් තීරණය සුදුසු නැහැයි කියලා අපි පිළිගන්නවා. ඒ නිසා ඒ මණ්ඩලත් සමඟ සාකච්ඡා කරලා නිසි පියවරක් ගන්න බලාපොරොත්තු වෙනවා. නමුත් රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව වර්තමානයේ ඒ අය ක්‍රියාත්මක වෙලා තිබෙන ආකාරයට චිත්‍රපට ක්ෂේත්‍රයේ සිටින සියලුම දෙනා මේ වන විට මේ සම්බන්ධව දැනුවත් වෙලා තිබෙනවා. මම හිතන විධියට ඔබතුමාට දී තිබෙන තොරතුරු සත්‍යතාවයෙන් තොරයි. රටේ ස්වාධීනත්වය රැක ගත්ත එක්සත් ජාතික පක්ෂයේ අපි ලෑස්තියි, කොටි ත්‍රස්තවාදීන්ට විරුද්ධව පනවා තිබුණු තහංචිය නැවත වරක් පනවන්නය කියලා ඒකමතික යෝජනාවක් මේ උත්තරීතර සභාවේ සම්මත කර ගන්නට.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම හොඳයි.

ගරු වාසුදේව නානායක්කාර මහතා (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - Minister of National Languages and Social Integration)
එක්සත් ජාතික පක්ෂය ගැන කියපු ඒවාට අපට ඒකමතික වෙන්න බැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ කියන්නේ, ඔබතුමා ඒකට පක්ෂද? යුරෝපා හවුල කොටි තහංචිය ඉවත් කිරීම ගැන ඔබතුමා පක්ෂද? ඔබතුමා පක්ෂද? උත්තරයක් දෙන්න.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
එක්සත් ජාතික පක්ෂය ගැන කියපු ඒවා මම පිළිගන්නේ නැහැ. එක්සත් ජාතික පක්ෂය මේ රටට නිදහස අරගෙන දුන්නේ නැහැ. අධිරාජ්‍යවාදීන්ගේ සපත්තු ලෙව කෑවා. එතකොට කොහොමද තමුන්නාන්සේලාගේ පක්ෂය මේ රටට නිදහස ලබා දුන්නාය කියන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හරි, තමුන්නාන්සේ විරුද්ධද මේ යෝජනාවට?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
එක්සත් ජාතික පක්ෂය ගැන කිව්ව ඒවාට ඒකමතිකත්වයක් නැහැ. ඒ විවිචූර්ණ නැතුව යෝජනාව විතරක් ඉදිරිපත් කරන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඇයි, භයද? ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමනි, ඔබතුමා විරුද්ධද? මේක රට වෙනුවෙන් ගෙනෙන යෝජනාවක්. ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමා, තමුන්නාන්සේ නිකම් උඩ පනින්න එපා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා, දැන් වාඩි වෙන්න. [බාධා කිරීම්] නිදහස ලබා ගැනීමට එක් පක්ෂයක් විතරක් නොවෙයි, එදා තිබුණු සියලුම පක්ෂ දායක වුණා.

දැන් අපි ප්‍රධාන කටයුතුවලට යමු. යෝජනා පිළිබඳ දැනුම්දීම්. යෝජනා අංක 1.

පාර්ලිමේන්තුවේ කටයුතු
பாராளுமன்ற அலுவல்
BUSINESS OF THE PARLIAMENT

I

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"නාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 2 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
Sir, I rise to a point of Order.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මොකක්ද point of Order එක?

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ යෝජනාව - [බාධා කිරීමක්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නැහැ, ඒක අදාළ නැහැ. ඒක point of Order එකක් නොවෙයි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
It should be expunged. It is not a point of Order. You cannot make a proposal by a point of Order.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අංක 2 යෝජනාව.

II

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2014 ඔක්තෝබර් මස 25 වැනි සෙනසුරාදා, 27 වැනි සඳුදා, 28 වැනි අඟහරුවාදා, 29 වැනි බදාදා, 30 වැනි බ්‍රහස්පතින්දා, 31 වැනි සිකුරාදා සහ නොවැම්බර් මස 01 වැනි සෙනසුරාදා "විසර්ජන පනත් කෙටුම්පත (2015)" සලකා බැලීම සඳහා වෙන් කළ දිනයන් විය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු කථානායකතුමනි,- [බාධා කිරීම්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කලබල වෙන්න එපා. ඒ දෙකම වැරදියි. [බාධා කිරීම්]
අංක 3 යෝජනාව.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

I

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ස්ථාවර නියෝග අංක 70(2) හි කුමක් සඳහන් ව තිබුණද, "විසර්ජන පනත් කෙටුම්පත (2015)" සලකා බැලීම සඳහා 2014 ඔක්තෝබර් මස 25 වැනි දින සිට ඔක්තෝබර් මස 31 වැනි දින දක්වා ඇති වෙන් කළ දිනයන්හි රැස්වීම් පැවැත්වෙන කාල වේලා පූ. හා. 9.30 සිට අ. හා. 12.30 දක්වා ද, අ. හා. 1.30 සිට අ. හා. 6.30 දක්වා ද විය යුතු ය. අ. හා. 6.00ට ස්ථාවර නියෝග අංක 7(5) සහ (6) ඡේදයන් ක්‍රියාත්මක විය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ස්ථාවර නියෝග අංක 70(2) හි කුමක් සඳහන් ව තිබුණද, "විසර්ජන පනත් කෙටුම්පත (2015)" සලකා බැලීම සඳහා වෙන් කළ, 2014 නොවැම්බර් මස 01 වැනි සෙනසුරාදා රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. හා. 9.30 සිට අ. හා. 12.30 දක්වා ද, අ. හා. 1.30 සිට අ. හා. 5.00 දක්වා ද විය යුතු ය. අ. හා. 5.00ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

III

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2014 ඔක්තෝබර් මස 23 වැනි බ්‍රහස්පතින්දා අ. හා. 1.00 වන තෙක් කල් තැබිය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දිනට නියමිත කටයුතු.
අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1. ඩීඑෆ්සීසී බැංකුව (ඉවත් කිරීමේ හා ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත දෙවන වර කියැවීම. ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා.

ඩීඑෆ්සීසී බැංකුව (ඉවත් කිරීමේ හා ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත
டிஎவ்சீசீ வங்கி (நீக்கல் மற்றும் விளைவாந்தன்மையினவான ஏற்பாடுகள்) சட்டமூலம்
DFCC BANK (REPEAL AND CONSEQUENTIAL PROVISIONS) BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

[අ.භා. 2.13]

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation and Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, ඩීඑෆ්සීසී බැංකුව (ඉවත් කිරීමේ හා ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත දෙවන වර කියවිය යුතු ය" යි මා යෝජනා කරනවා.

ගරු කථානායකතුමනි, අද දින න්‍යාය පත්‍රය අනුව මම ඩීඑෆ්සීසී බැංකුව (ඉවත් කිරීමේ හා ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත මේ ගරු සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනවා. අද මගේ කථාව කොටස් දෙකකින් කරන්න මම බලාපොරොත්තු වෙනවා. පළමුවෙන්ම, මේ පනත් කෙටුම්පතේ තිබෙන සුවිශේෂ ලක්ෂණ තේරුම් කරලා දෙන්න මම බලාපොරොත්තු වෙනවා. දෙවනුව, අද අපි ප්‍රතිපත්තියක් හැටියට සලකන බැංකු ඒකාබද්ධ කිරීමේ අවශ්‍යතාව ගැනත්, එහි ස්වරූපය ගැනත් වවන ස්වල්පයක් කථා කිරීමට බලාපොරොත්තු වෙනවා.

පළමුවෙන්ම ගරු කථානායකතුමනි, 2014 අය වැය කථාවේදී ලංකාවේ බැංකු ක්ෂේත්‍රය ඒකාබද්ධ කිරීමේ ප්‍රතිපත්තිය අතිගරු ජනාධිපතිතුමා මුදල් ඇමතිතුමා හැටියට ඉදිරිපත් කළා. මේ ගරු සභාවේ සභයෝගය ලැබී ඒක සම්මත කළා. මේ ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමේදී ජාතික සංවර්ධන බැංකුව - NDB එක -, ශ්‍රී ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව - DFCC එක - හා DFCC එක යටතේ සියයට 99ක කොටස් හිමි ඩීඑෆ්සීසී වර්ධන බැංකුව ඒකාබද්ධ කිරීමට යෝජනා කරනවා. මේ සඳහා පාදක වූ අදහස වන්නේ ශක්තිමත් වත්කම් පදනමක් ඇති කිරීමයි. එතකොට මේ නව බැංකුවේ සාමූහික වත්කම ඉස්සර තිබුණාට වඩා විශාල වශයෙන් වැඩි වෙනවා. පද්ධතියේ ස්ථාවරභාවය වැඩිදියුණු කිරීමත්, අරමුදල් සඳහා සමස්ත ප්‍රවේශය වැඩිදියුණු කිරීමත් මේ තුළින් සිදු වෙනවා. සංඛ්‍යා ලේඛන මම පසුව ඉදිරිපත් කරන්නම්. විශාල සංවර්ධන බැංකුවක් ස්ථාපනය කිරීමෙන් මේ අවස්ථාවේ මෙරට පවතින යටිතල පහසුකම් සංවර්ධනය වේගවත් කෙරෙනවා. බැංකු ක්ෂේත්‍රය ශක්තිමත් කිරීම උදෙසා කෙරෙන මෙවැනි වැඩිදියුණු කිරීමේ මාර්ග මඟින් ජාත්‍යන්තර වශයෙන් ශ්‍රී ලංකාවේ බැංකුවල සමස්ත තත්ත්වය අභිවෘද්ධියට ළඟ් කළ හැකියි.

මේ ඒකාබද්ධ කිරීම කරන්නේ කොහොමද කියන එක ගැන දැන් මම විස්තර ටිකක් ඉදිරිපත් කරන්න කැමැතියි. තනි, ශක්තිමත් ඒකකයක් වශයෙන් ඒකාබද්ධ කිරීමට යෝජිත බැංකු තුනෙහි වර්තමාන තත්ත්වය ගැන කියන්නම්. NDB බැංකුව හා DFCC බැංකු දෙක කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත වෙලා තිබෙනවා. ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ ණය පමණක් කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කර තිබෙනවා. දැනට ක්‍රියාත්මක වන මෙම ක්‍රියාවලියෙහි කොටසක් ලෙස 2014 ජනවාරි හා මාර්තු මාසවලදී මේ සම්බන්ධ මූලික දැනුම්දීම් දෙකක් කොළඹ කොටස් හුවමාරුව වෙත නිකුත් කරලා තිබෙනවා. DFCC බැංකුව, එය පිහිටුවන ලද පනත වන 1955 අංක 35 දරන ශ්‍රී ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේම පාලනය වනවා. NDB බැංකුව හා ඩීඑෆ්සීසී වර්ධන බැංකුව 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සමාගම් වශයෙන් සංස්ථාපනය කොට තිබෙනවා.

කොටසක් පනතක් යටතේ තවත් කොටසක් සමාගම් හැටියටත් සංස්ථාපනය වෙලා තිබෙනවා. මෙම බැංකු තුනම 1988 අංක 30 දරන බැංකු පනතේ විධිවිධාන අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද බලපත්‍ර යටතේ ක්‍රියාත්මක වෙනවා. එම පසු බිම තුළ එන්ඩීබී බැංකුව සහ ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වාණිජ බැංකු වශයෙන්ද, ඩීඑෆ්සීසී බැංකුව විශේෂිත බැංකුවක් වශයෙන්ද දැනට ශ්‍රී ලංකා මහ බැංකුවෙන් බලපත්‍ර ලබාගෙන කටයුතු කරනවා. යෝජිත ඒකාබද්ධතාව ක්‍රියාත්මක කිරීම සඳහා වඩාත්ම සුදුසු හා වේගවත්ම ක්‍රමය පිළිබඳව සුපරීක්ෂාකාරී තක්සේරුවකින් පසු ආරම්භක පියවර වශයෙන් 1955 අංක 35 දරන ශ්‍රී ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථා පනත අහෝසි කිරීමට ආනුෂංගික විධිවිධාන පනතක් සම්මත කරමින් ඩීඑෆ්සීසී බැංකුව සමාගම් පනත යටතේ සංස්ථාපිත සමාගමක් බවට පරිවර්තනය කිරීමට අපි යෝජනා කරනවා. එම බැංකුවත් මූලික පියවර වශයෙන් දැන් කොම්පැනියක්, නැත්නම් සමාගමක් බවට පත් වෙනවා.

පනතේ සඳහන් පරිදි සමාගම් පනත යටතේ සංස්ථාපනය කිරීමේ සහතිකයන් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරනු ඇත. 1979 අංක 2 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව පනත යටතේ පිහිටුවන ලද එන්ඩීබී බැංකුව 2005 අංක 1 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව (ආනුෂංගික විධිවිධාන) පනත මඟින් අහෝසි කිරීමේදීද මෙම ක්‍රමයම අනුගමනය කරන ලදී. බැංකුවක ස්වභාවය පාර්ලිමේන්තු පනතක් මඟින් පිහිටුවන ලද ආයතනයක ස්වරූපයෙන් සමාගම් පනත යටතේ සංස්ථාපිත සමාගමක් බවට මාරු කිරීමේදී අනිවාර්යයෙන් අවධානය යොමු කළ යුතු කරුණු සාමාන්‍ය විධිවිධාන හා ආනුෂංගික සංශෝධන මඟින් ආවරණය කෙරෙනු ඇත. ඒකාබද්ධ කිරීමට යෝජිත බැංකු දෙකෙහි තැන්පත් ඉල්ලුම් පදනම සැලකිල්ලට ගෙන නව ඒකාබද්ධිත ආයතනය සංවර්ධන බැංකුකරණය වෙත යොමු කිරීමේ පදනම මත ඒ සඳහා වාණිජ බැංකු බලපත්‍රයක් නිකුත් කිරීමටද බලාපොරොත්තු වෙනවා. ඉන් පසු බැංකු තුන සමාගම් පනත යටතේ සංස්ථාපනය කෙරෙන සමාගම වන අතර, ඒවා සමාගම් පනතෙහි විධිවිධාන ප්‍රකාරව සහ අනෙකුත් අදාළ නීති හා රෙගුලාසිවලට යටත්ව නව නාමයක් යටතේ නව ඒකකයක් වශයෙන් ඒකාබද්ධ කිරීමට/තනි ඒකකයක් ලෙස පිහිටුවීමට යෝජිතයි. ඒ නිසා මේ පනත් කෙටුම්පත මඟින් අපි බලාපොරොත්තු වෙන්නේ මේ ආයතන තුන නව බැංකුවක් හැටියට පත් කිරීම සඳහා මූලික පියවරයන් තැබීමයි. ඒ සඳහා තමයි අපි මේ ගරු සභාවේ අනුමැතිය ඉල්ලා සිටින්නේ. නමුත් මේකට බලපාන පළල් හේතු මොනවාද කියා අපි සොයා බලන්න ඕනෑ. ඒකයි මගේ කථාවේ දෙවැනි කොටසින් අවධානය යොමු කරන්නේ.

ඇයි, අපි මේ ප්‍රතිසංස්කරණ ඉදිරිපත් කරන්නේ? බැංකු ක්ෂේත්‍රය ප්‍රතිසංස්කරණය කිරීමට හේතු භූත වුණු කරුණු මොනවාද කියා මේ ගරු සභාවට දැන්වීමත් මගේ යුතුකමක්. අපි සියලු දෙනාම දන්නවා, දැනට අවුරුදු 4ක්, 5ක් තිස්සේ ලෝක මූල්‍ය ක්‍රමය ප්‍රතිසංස්කරණය වෙමින් පවතින බව. පසු ගිය ආර්ථික අවපාතය අරගෙන බැලුවොත්, අපි පිළිගන්නට ඕනෑ ඇමෙරිකාවෙන් පටන් ගෙන යුරෝපයට ගිහිල්ලා ගෝලීය වශයෙන්, විප්ලවීය වශයෙන් වෙනස් වුණු ඒ අවදානම හුඟක් දුරට හේතු වුණේ මූල්‍ය ආයතනවල ප්‍රශ්නයක් හැටියට බව. ඒක අපි දන්නවා. බැංකු කඩාගෙන වැටෙන්න පටන් ගත්තා. අපි දන්නවා, Lehman Brothers සමාගම කඩාගෙන වැටුණා; අහෝසි වුණා. ඊළඟට ඒ කඩාවැටීම Morgan Stanley වාගේ ආයතනවලට යන්න ලැහැස්ති වුණා. ඊට ඉස්සෙල්ලා වෙනත් insurance companies කඩාගෙන වැටුණා. ඊට පස්සේ ඇමෙරිකානු රජයට ඒ ගොල්ලන්ගේ ප්‍රතිපත්තියත් වෙනස් කරන්න සිද්ධ වුණා. පෞද්ගලික අංශයේ වැඩ ව්‍යාපාරවලට, විශේෂයෙන්ම මූල්‍ය අංශයේ ව්‍යාපාරවලට රජය අත ගසන්නේ නැහැ කියන ප්‍රතිපත්තිය තමයි ඉස්සර තිබුණේ. ඒක ඇමෙරිකානු මූල්‍ය ක්‍රමයේ ලොකු සිද්ධාන්තයක් හැටියට තමයි ඒ කාලයේ තිබුණේ.

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

නමුත් මේ ප්‍රශ්නය උද්ගත වෙලා සමාගමෙන් සමාගම බංකොලොත් වෙන්න, bankrupt වෙන්න පටන් ගත්තාම ඇමෙරිකන් රජය විශේෂයෙන්ම " Fed" කියන එක, දළ වශයෙන් කිව්වොත් මහ බැංකුව ඉතාම දුර දිග යන තීන්දුවක් ගත්තා. සමහරු කියනවා, කේන්ස්ගේ ආර්ථික න්‍යායට ආපසු යන්න සිද්ධ වුණාය කියා. වර්තමාන ලෝකය ඒ හා සමාන තීන්දුවක් ගත්තා, "නැහැ, අපි bailout එකකට යන්න ඕනෑ"යි කියා. රජයේ සල්ලි වියදම් කර මේ බංකොලොත්භාවය, සමාගමෙන් සමාගමට යන අර්බුදය නවත්වා ගන්න ඕනෑ. ඒ අනුව පළමුවන වතාවට මහා භාණ්ඩාගාරයෙන් විශාල කොම්පැනිවලට මුදල් දුන්නා. දැන් බොහෝ දෙනෙක් කියනවා, ඒ මඟින් තමයි ලෝක depression එක නවත්වා ගන්න පුළුවන් වුණේ කියා. එක පැත්තකින් ඇමෙරිකාව, අනික් පැත්තෙන් එංගලන්තය. දැන් තර්ක කරනවා, යුරෝපයෙන්. යුරෝපයේ මහ බැංකුවත් මේ විධියට මැදිහත් වෙලා බැංකුවල කඩා වැටීම නවත්වන්න කියා තමයි මෙතෙක් කල් තහනම් වුණු මුදල් ඒ බැංකුවලට දීලා තිබෙන්නේ. ඒ කාලයේ ඒ දර්ශනය සිද්ධ වුණු නිසා තමයි, ආර්ථිකයේ නැඟිටීම දැන් ඇති වෙලා තිබෙන්නේ.

අපි දන්නවා, අද ලෝකයේ මූල්‍ය ක්‍රම සියල්ලම එකට සම්බන්ධයි කියා. ඇමෙරිකානු මූල්‍ය ක්‍රමය කඩා වැටුණොත්, එය අනිවාර්යයෙන්ම චීනයට බලපානවා. චීනයේ ට්‍රිලියන 14ක් ඇමෙරිකාවේ සංචිතයේ තිබෙනවා. ඒ වාගේම ඒ කඩා වැටීම ඉන්දියාවේ වෙළ හෙළඳාම්වලටත් තර්ජනයක් වනවා. මෙය එක විධියකින් අපට සන්තෝෂ වන්න පුළුවන් කාරණාවක් නොවෙයි. නමුත් අපේ leverage එක, විශේෂයෙන් ඒ රටවලට විකුණන භාණ්ඩ විශාල ප්‍රමාණයක් නැති නිසා අපට කෙළින්ම ඒ උණ ගැනුණේ නැහැ. අපේ සංවර්ධන ක්‍රමයටම අපට යන්න පුළුවන් වුණා. මොකද, අපේ වෙළෙඳ ක්ෂේත්‍රයෙන් ඒ තරම් බලවත් පහරක් අපට වැදුණේ නැහැ.

ඇත්ත වශයෙන් මේ වෙලාවේ අපේ අපනයනකරුවන්ට - exportersලාට- අපි ප්‍රශංසා කරන්න ඕනෑ. ඒ ගොල්ලෝ කෙසේ හෝ ඇහලුම් කර්මාන්තය, තේ කර්මාන්තය රැක ගත්තා. අලුත් වෙළෙඳ පොළවල් සොයා ගෙන, upmarket ගිහිල්ලා කෙසේ හෝ ඒ ලබා ගන්න පුළුවන් මුදල් ප්‍රමාණය අපි ලබා ගත්තා. වෙනත් රටවල එහෙම සිද්ධ වුණේ නැහැ.

පාර්ලිමේන්තුවේ විවාදයකදී අපේ ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා වියට්නාමය ගැන ප්‍රශංසා මුඛයෙන් කථා කළා. අද වියට්නාමයේ ආර්ථිකය සම්පූර්ණයෙන් කඩා වැටිලා. මොකද, ඒ ගොල්ලෝ export economy එකට ගිහිල්ලා, ඒ market එක කඩා වැටුණාම මොනවාද කරන්නේ කියා දන්නේ නැහැ.

දැන් බලාගෙන ඉන්නවා. බටහිර වෙළෙඳ පොළ දියුණු වෙනකොට, සමහරවිට ඒ අයටත් නැඟිටින්න පුළුවන් වෙයි. මම පක්ෂග්‍රාහීව කථා කරනවා නොවෙයි; ආර්ථික විග්‍රහයක් කරන්නේ. එතකොට ප්‍රධාන සාධකය මොකක්ද? අද ලෝකයේ මුදල් පරිහරණය එක බොත්තමක් තද කරලා කරන්න පුළුවන්. එකින් එකට සම්බන්ධ වෙලා තිබෙනවා. මම තමුන්නාන්සේලාට මේ කාරණය කියන්නම්. හුඟ දෙනෙක් බලාපොරොත්තු තියාගෙන ඉන්න Indian Reserve Bank එකේ ලොක්කා Dr. Raghuram G. Rajan ලෝක ප්‍රසිද්ධ අර්ථ ශාස්ත්‍රඥයෙක්; ඉස්සර IMF එකේ පර්යේෂණ අංශයේ ප්‍රධානියා. දැන් ඒගොල්ලෝ ඔක්කොම එකතු වෙලා තම තමන්ගේ අභ්‍යන්තර මූල්‍ය ක්ෂේත්‍රය නැවත වරක් විමර්ශනයට ලක් කරනවා. මොකද, මූල්‍ය ක්ෂේත්‍රයේ එක තැනක අර්බුදයක් ඇති වුණොත් අනිවාර්යයෙන්ම ඒක අනික් අංශවලට යනවා. ඒ සඳහා අපි ලබා ගත යුතු ප්‍රතිපත්ති මොනවාද? ප්‍රතිසංස්කරණයක් කරන්න ඕනෑ කොයි විධියට ද කියන ඒ ප්‍රශ්නයට අපි මුහුණ දෙන්න ඕනෑ. කරුණු හයක් අපට ඉදිරිපත් කරන්න පුළුවන්. මම මේ සභාවට යෝජනා කරන්න කැමැතියි, කරුණාකරලා "Financial Sector Consolidation: Why and How?" කියන මේ පොත කියවා බලන්න කියලා. මේ පොතේ තිබෙන්නේ අපේ මහ බැංකුවේ 64වෙනි සංවත්සරය නිමිති කර ගෙන මහ බැංකුවේ Assistant Governor, Mr. C.J.P. Siriwardana කළ දේශනය - oration එක. මේ විධියේ වෙනස් වීමක් කළ යුත්තේ ඇයි කියලා එතුමා ඉතා නීක්ෂණ විධියට කරුණු දක්වනවා. ඒක තරමක් ශාස්ත්‍රීය අංශයක්. නමුත් මම හිතන හැටියට අපි මේවා හැන්සාඩ්ගත කරන්න ඕනෑ; යම් කිසි මට්ටමකට සාකච්ඡා කරන්න ඕනෑ. පළමුවෙන්ම එතුමා කියනවා, මේ ඒකාබද්ධ කිරීමට - financial sector consolidation සඳහා - හේතු. ඉන් එකක් තමයි, I quote:

> "Rapid Transformation of the Domestic Economy and the Need for a Strong and Stable Financial System to steer Future Economic Growth"

අවුරුදු 5කට පස්සේ අපේ ආර්ථිකය දැන් හොඳ මට්ටමකට ඇවිල්ලා තිබෙනවා. වර්ෂයෙන් වර්ෂය අපේ ආර්ථිකය දියුණු වෙලා. මම තමුන්නාන්සේලාට සංඛ්‍යා ලේඛන ටිකක් දෙන්නම්. මේ බලන්න අද අපේ තත්ත්වය.

අපේ ඉලක්කය 2016 වන කොට GDP per capita එක ඇමෙරිකානු ඩොලර් 4,000 අබිබවා යන්නයි. ඒ විතරක් නොවෙයි, 2020 වන කොට අපේ ආර්ථික උපාය මාර්ග තුළින් ඒක පුද්ගල ආදායම US Dollars 7,000කට සංක්‍රමණය වන්න අප බලාපොරොත්තු වනවා. ඒ විධියට තමයි රාජ්‍ය අංශයත්, පෞද්ගලික අංශයත් එක්කාසු වෙලා අපට සංවර්ධන මාවතේ යන්න පුළුවන් වන්නේ. අපේ ලොකු බලාපොරොත්තුවක් සහ අවශ්‍යතාවක් තිබෙනවා, මේ middle-income trap කියන එක සම්බන්ධයෙන්. ඒ කියන්නේ, සංවර්ධන මාවතේ තරමක් දුරට ගිහිල්ලා මධ්‍යම ගණයේ රැඳී ඉන්න. සාමාන්‍යයෙන් middle-income countries කොටස් තුනකට බෙදෙනවා: lower category, medium category and higher category. ඉදිරියට යන්න නම් ඒ කොටස් තුනටම සංක්‍රමණය වීමට අප සැලසුම් හදන්න ඕනෑ. එක කොටසකදී හිර වුණොත් ඒක ආර්ථිකයට බාධාවක් වනවා. හුඟක් රටවල් එහෙම හිර වෙලා තිබෙනවා. අප සැලසුම් හදලා තිබෙන්නේ ඉන් ඔබ්බට යන්නයි. ඒ සඳහා අප මූල්‍ය ක්ෂේත්‍රය සංවර්ධනය කරන්න අවශ්‍යයි. සිරිවර්ධන මහත්මාගේ දේශනයේදී කියලා තිබෙනවා, අප කරන්න ඕනෑ මොනවාද කියලා. He further states, I quote:

> "Meanwhile, a stronger capital base,..."

විශේෂයෙන්ම අපේ බැංකුවල තිබෙන ප්‍රාග්ධන ප්‍රමාණය - පදනම- අනිවාර්යයෙන් වැඩි කරන්න ඕනෑ. මම තමුන්නාන්සේලාට එය සංඛ්‍යා ලේඛනයකින් පෙන්වන්නම්. දැන් බැංකුවල ප්‍රාග්ධනය කොපමණ තිබෙනවාද, ඒවා ප්‍රමාණවත්ද, නැද්ද කියන කාරණය අපට පසුව සාකච්ඡා කරන්න පුළුවන්. නමුත් අප දළ වශයෙන් කියනවා, ඒ stronger capital base එක වැඩි කරන්න ඕනෑය කියලා. දැන් මේ capital එක ගත්තොත් -ඒ පිළිබඳව බොහෝ දෙනෙකු දන්නේ නැහැ. අපේ මන්ත්‍රීවරු නම් හුඟ දෙනෙක් ඒ පිළිබඳව දන්නවා කියලා මම හිතනවා- තනිකරම දේශීය ඉතිරි කිරීම්වලින් විතරක් නොවෙයි, බැංකු accountsවලින් විතරක් නොවෙයි, බොහෝ විට මේ බැංකු සහනදායක ක්‍රමවලට ලොකු බැංකුවලින් ණය ගන්නවා. මට මතකයි, මම මුදල් ඇමති වෙලා හිටපු කාලයේ ෆ්‍රැන්ක්ෆර්ට්වලට ගිහිල්ලා ජර්මන් බැංකුවලින් NDB එකට, DFCC එකට ණය අරගෙන දුන්නා.

ඒගොල්ලන් විවිධ ණය ක්‍රම මාර්ගයෙන් භාණ්ඩාගාරය හරහා ඒ බැංකුවලට සල්ලි දුන්නා. ඒ කාලයේ බැංකු හුඟක් ලාභත් ලැබුවා. මොකද, අපි ඒ බැංකුවලින් යම් කිසි ණය ප්‍රමාණයකට භාණ්ඩාගාරයෙන් සල්ලි අරගෙන, අපේ බැංකුවලට දුන්නාම, ඒගොල්ලන් තව වැඩියෙනුත් පොළියක් එකතු කරලා ණය දීලා, අන්තිමට අපට මෙච්චර විශාල ලාභයක් තිබෙනවාය කියලා පෙන්නුවා. එහෙම සිද්ධ වුණේ ඒ කාලයේ. දැන් ඒකට අපි විසඳුම් හොයනවා. ඒ කාලයේ තිබුණු තත්ත්වය ඒකයි. ඒ නිසා බැංකුවේ ප්‍රාග්ධනය මුළුමනින්ම දේශීය ගිණුම්වලින් -depositsවලින්- විතරක් එකතු කරන්න බැහැ. නමුත් අපි හුඟාක් විට බැංකු ගැන හිතන්නේ ඒ විධියටයි. බැංකු leverage කරනවා. තමන්ගේ තිබෙන balance sheet එක, තමන්ගේ ආදායම්, වියදම් සහ තමන්ගේ ප්‍රේෂණ අනුව, වෙනත් බැංකුවලින් සල්ලි ගන්නවා. ඒ සල්ලි අරගෙන ඒවාත් අපේ ගනුදෙනුවලට, සංවර්ධන වැඩවලට, ව්‍යවසායක වැඩවලට ණය දීලා, ප්‍රාග්ධනයත් වැඩි කර ගන්නවා.

අපේ NDB, DFCC කියන බැංකු දෙක සම්බන්ධයෙන් මම එක කාරණයක් කියන්නට ඕනෑ. අපේ මේ බැංකු දෙක පිළිබඳව ජාත්‍යන්තර ණය දෙන ලොකු බැංකුවල හොඳ ප්‍රවණතාවක් තිබෙනවා. මට මතකයි, නිහාල් ෆොන්සේකා මැතිතුමා සිටි කාලයේ ණය දෙන බැංකුවලට ගියාම ඔවුන් කියනවා "NDB, DFCC බැංකුවලට ණය දෙන්න අපේ කිසිම චකිතයක් නැහැ. අපි ආසයි ඒ අයට ණය දෙන්න. ඒගොල්ලන්ගේ වාර්තා නියම වේලාවට එවනවා. ඒ අයට ගෙවන්න තිබෙන දේවල් නියම වේලාවට ගෙවනවා" කියලා. NDB, DFCC බැංකු හොඳ ගනුදෙනුකරුවන් හැටියට ඒ ණය දෙන බැංකු පිළිගෙන තිබෙනවා. මට දැන් ඒ බැංකු මතක නැහැ. Frankfurtවල තිබෙන ජර්මන් බැංකු, එංගලන්තයේ බැංකු, ඇමරිකන් බැංකු ආදී ඒ බැංකු ණය දෙනකොට, එය ලබා ගන්නා NDB, DFCC කියන බැංකු දෙකෙහි වාර්තා ගැන හොඳ සෑහීමකට පත් වෙලා තිබෙනවා. නමුත් දැන් සෑහීමකට පත් වෙන්නේ ඒ ගනුදෙනු මත විතරක්ම නොවෙයි. ගරු කථානායකතුමනි, ඒගොල්ලන්ට ණය ලබා ගන්න පුළුවන් ශක්තිය හුඟාක් දුරට තිබෙන්නේ ඒ බැංකුවේ මුදල් සංචිතය - capital base එක - අනුවයි. පුංචි මුදල් සංචිතයක් තිබෙනවා නම්, ලොකු මුදලක් ගන්න බැහැ. ලොකු මුදල් සංචිතයක් තිබෙනවා නම්, අවදානම අඩු නිසා වැඩි මුදලක් ගන්න පුළුවන්. එතකොට අපිට පුංචි කුරුමිණි සෙල්ලම්වලට වඩා big player කෙනෙකු ලෙස ඉහළ මට්ටමේ බැංකු ගනුදෙනුවලට යන්න පුළුවන්. මේ අවස්ථාවේදී අපි ඉහළ මට්ටමේ බැංකු ගනුදෙනුවලට යන්න ඕනෑ. රට සංවර්ධනය කරනවා නම්, අපේ GDP එකෙන් සියයට 30ක් සංවර්ධනය සඳහා වැය කරන්න අවශ්‍ය නම් අපේ මුදල් පදනම අපි වැඩි කර ගන්න ඕනෑ. නැතිව නිකම් බණ කියලාවත්, වැරදි කියලාවත් වැඩක් නැහැ. හරියට යුද්ධයට යනවා නම්, කාලතුවක්කු තිබෙන්නට ඕනෑ. කැටපොල් අරගෙන යුද්ධයට යන්න බැහැ නේ. අන්න ඒක තමයි අපි කරන්න හදන්නේ. ලොකු ආර්ථික සංග්‍රාමයකට අවශ්‍ය capital base එක අපි හදා ගන්න ඕනෑ. ඒක හදා ගන්න පුළුවන් වෙන්නේ ඒ බැංකුවේ තිබෙන balance sheet එකේ ශක්තිමත්භාවය අනුවයි. ඒක අපට පෙනෙනවා. විශේෂයෙන් NDB, DFCC බැංකු එකතු වුණොත්, ඒ ගොල්ලන්ට වෙන වෙනම ගන්න පුළුවන් ප්‍රාග්ධන ප්‍රමාණයට වඩා විශාල ප්‍රමාණයක් ඒ එකතු කිරීමෙන් අපි ඇති කරන මේ නව සංවර්ධන බැංකුවට ලබා ගන්න පුළුවන්. ලංකාවේ සංසරණය සඳහා, ලංකාවේ ව්‍යවසාය සඳහා, ලංකාවේ සංවර්ධනය සඳහා, මිනිසුන්ට සහ ආයතනවලට ණය දීම සඳහා අපට විශාල සංචිතයක් ඒ අලුත් බැංකුවෙන් ගන්න පුළුවන්.

දැන් තමුන්නාන්සේලා බොහෝ විට විවේචනය කරනවා, මේවා ඔක්කෝම කරන්නේ ණයවලින් කියලා. ඊට වඩා වෙන වෙන විකල්පවලට අපි යන්න ඕනෑ. අපි කොහොමද මේ ද්විපාර්ශ්වීය ණයවලින් ඇතට ගිහිල්ලා අපට වඩාත් වාසිදායක උපක්‍රම යොදා ගන්නේ? වෙලාව තිබුණොත් පසුව මා ඒ ගැන විස්තර කරන්නම්. වෙන වෙන ක්‍රමවලින්, වඩා වාසිදායක ක්‍රමවලින් අපි ගන්න හදනවා. දැන් තමුන්නාන්සේලා කියනවා "මේ මේ බැංකුවලින් ණය ගත්තා, ඇයි මෙච්චර පොලියක් ගෙවන්නේ" කියලා. දැන් අපි මොකද කරන්න හදන්නේ? අපේම බැංකුවලින් ණය ගන්න හදනවා. අපේම බැංකුවලින් ණය අරගෙන, පිට රටවල බැංකුවලට ගෙවන පොලියම අපේ බැංකුවලට ගෙවන්න කටයුතු කරනවා. ඒක හොඳ ආර්ථික ක්‍රියාවක් නම්, අපේ බැංකුවලට ඒ පොලියේ වාසිය ලබා දෙන එක නරක වැඩක් කියලා කාටවත් කියන්න බැහැ. ඒ බැංකුවල ගොඩක් සල්ලි තිබෙනවා නම්, ඒ අයට සල්ලි ගන්න පුළුවන් නම්, එහෙම ගන්න පුළුවන් වාතාවරණයක් හදන්න තමයි අපි බලාපොරොත්තු වන්නේ. ඒකට ඉස්සෙල්ලාම තියෙන්න ඕනෑ capital base එකක්. High quality pool of human capital, good corporate governance, enhanced regulatory framework and a sustained growth, මේ සාධක අපි ඇතුළු කරගන්න ඕනෑ මේ ඉහළ පියවරට යන්න. ඒ පළමුවැනි කාරණාව.

දෙවැනි එක තමයි, necessity of maintaining stability in the local financial system කියන එක. මා කලිනුත් තේරුම් කළා, ඇමෙරිකාව සහ යුරෝපයේ ඉතාම දියුණු වුණු රටවල් ගැන. දැන් නම් ස්පාඤ්ඤය ටිකක් දියුණු වෙලා එළියට එනවා. නමුත් අවුරුදු දෙකකට පෙර සයිප්‍රස්, පෘතුගාලය, ස්පාඤ්ඤය, ප්‍රංශය පවා එන්න එන්නම අවදානම් තත්ත්වයකට මුහුණ පෑවා. ඒකට කියන්නේ "contagion" කියලා. බෝවන රෝගයක් වාගේ එක රටක ඇති වන බැංකු අර්බුදය, ණය ප්‍රශ්නය තව රටකට බලපානවා. දැන් බලන්න, ජර්මනිය. ගොඩක් ණය දුන්නා සයිප්‍රස්වලට; ගොඩක් ණය දුන්නා ස්පාඤ්ඤයට; ගොඩක් ණය දුන්නා පෘතුගාලයට. මොකක්ද වුණේ? ඒ රටවල ආර්ථිකය කඩාගෙන වැටුණාම ඒ මුලින් ණය දුන්නු බැංකුත් කඩා ගෙන වැටුණා.

අද බලන්න Citibank එකේ තත්ත්වය. Citibank එක බංකොලොත් වෙන්න පටන් ගත්තා. Citibank එක ලතින් ඇමෙරිකාවට ණය දීලා, දීලා, දීලා, ආපහු ගන්න බැරි වෙලා ඒ losses කොපමණ write-off කරන්න සිද්ධ වුණාද කිව්වොත්, අද වනකොට ඒ බැංකුවේ නමත් සවුත්තු වෙලා. කොච්චරද කිව්වොත් අන්තිමේදී Citibank එකේ logo එකත් වෙනස් කරන්න සිද්ධ වුණා. මිනිස්සු රවටන්න වෙන logo එකක් දමන්නත් සිද්ධ වුණා. කඩා වැටුණු, පරිපාලනයෙන් දුර්වල, දුප්පත් බැංකුවක් නොවෙයි, ඊට වඩා හොඳ නව පාලනයක් තිබෙන බැංකුවක් කියලා පෙන්වන්න logo එක පවා වෙනස් කරන්න සිද්ධ වුණා. ඒ විධියේ දේවල් සිද්ධ වෙනවා. ඒ නිසා අපේ බැංකුවල ස්ථාවර තත්ත්වය රැක ගැනීම ඉතා අවශ්‍යයි. ඒ අතින් අපේ රජයට අපි ස්තුතිවන්ත වෙනවා. අද අපේ කිසිම බැංකුවක් කඩා වැටුණේ නැහැ. වෙන රටවල්වල බැංකු වසා දමා තිබෙනවා. ඇමෙරිකාවේ Lehman Brothers වසා දැම්මා. BlackRock, AEG කියන ඒ ආයතන ඔක්කොම අර්බුදයට ගියා. ලංකාවේ එක බැංකුවක් විතරක් යම් යම් පරිපාලන ප්‍රශ්න නිසා බංකොලොත් වේගෙන යනකොට අපි මැදිහත් වුණා. දැන් ඒක හොඳ, ප්‍රසන්න බැංකුවක් හැටියට කටයුතු කරගෙන යනවා. ඒ නිසා වෙන රටවල වාගේ අර්බුදකාරී තත්ත්වයක් මේ රටේ ඇති වුණේ නැහැ. එකින් එකට knock-on effect එහෙම නැත්නම් contagion අපේ බැංකු ක්ෂේත්‍රයට ඇතුළු වුණේ නැහැ. හුඟක් දුරට එහෙම නොවුණේ මනා පාලනයක් පැවැති නිසායි.

අපි ඒවා එහෙම ආරක්ෂා කර ගන්නේ කොහොමද කියන එක මම දැන් තමුන්නාන්සේලාට කියන්න ඕනෑ. හදිසි තත්ත්වයක් ආවොත් තමන්ගේ බැංකුව රැක ගන්න, ඒ වෙනුවෙන් යොදා ගන්න රක්ෂණයක් තිබෙන්න ඕනෑ, there should be adequate capital buffers. ඇමෙරිකන් බැංකු මොකද කළේ? ඒ නීතිය

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

කැඩුවා. බැංකු ක්‍රමයේ තිබෙන 'අ' යන්න, 'ආ' යන්න තමයි, ඕනෑම අර්බුදයකට, ඕනෑම ඉල්ලුමකට මුහුණ දෙන්න අවශ්‍ය ඉතිරි කිරීම් තිබෙන්න ඕනෑය කියන එක. "සක්විතිට", ඒ වාගේම කඩා වැටුණු බැංකුවලට වුණේ මොකක්ද? ලොකු deposit දෙක, තුනක් එළියට ගියාම ඉතුරු ඒවා ගෙවන්න සල්ලි නැති වුණා. හැම දෙනාම සල්ලි දමාගෙන දමාගෙන යනකොට සල්ලි එකතු වෙනවා. ඒත් එළියට අදිනකොට දෙන්න සල්ලි නැහැ. ඒකට තමයි ponzi schemes කියන්නේ. ඇමෙරිකාවේ Bernie Madoff කියලා කෙනෙක් හිටියා. ඔහු කෝටි ප්‍රකෝටිපතියෙක්. එයා ලොකු මුදල් විශේෂඥයෙක් කියලා ඔක්කෝම අය කිව්වා. ඒත් දැන් අවුරුදු ගණනක් තිස්සේ එයා හිර ගෙදර. Bernie Madoff කියන ඒ පුද්ගලයාට ජීවිතාන්තය දක්වා හිර ගෙදරයි ඉන්න වෙන්නේ. ඇයි ඒ? එයා ළඟ තිබුණේත් ඒ ක්‍රමයමයි. එයා ළඟ ආරක්ෂක මුදලක් තිබුණේ නැහැ. ඒ වෙලාවට පමණක් ගනුදෙනු කරනවා. ඒකම තමයි, "සක්විති" කළේත්. එක අතකින් අරගෙන අනෙක් අතින් දෙනවා. නමුත් කිසි දෙයක් ඉතුරු වෙන්නේ නැහැ, අර්බුදයකට මුහුණ දෙනවා. නමුත් අපේ එකම බැංකුවක්වත් ඒ තත්ත්වයට ආවේ නැහැ. එක බැංකුවක පමණක් එහෙම ප්‍රශ්නයක් ඇතිවෙන්න ඇවිල්ලා රජය ඒකට මැදිහත් වුණා. අපට රජයක් වශයෙන් ප්‍රශ්නයක් නැහැ, ඒ විධියට මැදිහත් වන්න. විරුද්ධ පාර්ශ්වයේ තමුන්නාන්සේලාට ප්‍රශ්න තිබෙන්න පුළුවන්. නමුත් අපට නැහැ. ඒ නිසා ඒ වාගේ මැදිහත් වෙලා ඒ මූල්‍ය ආයතනයේ කඩාගෙන වැටීම අපට නවත්වා ගන්න පුළුවන් වුණා. ඒ හන්දා අපට අවශ්‍යයි, ලොකු බැංකු තිබීම. ලොකු බැංකුවල අවශ්‍ය මුදල් ප්‍රමාණයක් තිබෙන්න ඕනෑ; මුදල් අර්බුදයකට මුහුණ දෙන්න පුළුවන් විධියේ reserve එකක් තියා ගන්න ඕනෑ.

අද ලෝකයේම බැංකුකාරයෝ එකතුවෙලා ස්විට්සර්ලන්තයේ බාසල් නගරයේ -බාසල් නගරය ගැන කිව්වාම සියලු දෙනාම හිතන්නේ බැංකු ගැන- බැංකු මූලස්ථානයට ඇවිල්ලා සාකච්ඡා කරනවා. බැංකුවල කොයි තරම් reserve එකක් තියා ගන්න ඕනෑද කියලා ඒ ගොල්ලෝ සාකච්ඡා කරනවා. අවම ගණනක් තියා ගන්න ඕනෑ. ඒක ලොකු දෙයක් කියලා මම නම් හිතන්නේ නැහැ. මොකද, පොඩි මුදලාලි කෙනෙක් වුණත් ඒ දේ කරනවා. කවුරු වුණත් යම්කිසි සංචිතයක් ඉතුරු කර ගන්න ඕනෑ. නැත්නම් ඒ ගොල්ලන්ට අනාගතයට මුහුණ දෙන්න බැහැ.

දැන් බලමු, fragmentation issue in the financial sector සම්බන්ධයෙන්. අපේ මූල්‍ය අංශයේ තිබෙන එක්තරා ස්වරූපයක් තමයි මේවා බෙදී තිබෙන්නේ කොහොමද කියලා සොයා බැලීම. වැඩි මුදල් තිබෙන බැංකු මොනවාද, මධ්‍යම ගණයේ බැංකු මොනවාද, පුංචි බැංකු මොනවාද කියලා අපේ බැංකු ගැන අපි විග්‍රහ කර ගන්න ඕනෑ. තමුන්නාන්සේලාට ඒ ගැන පොඩි විග්‍රහයක් කරන්න මම දැන් කැමැතියි. අපි පාර්ලිමේන්තුවක් හැටියට මේවා දැන ගන්න ඕනෑ. නිකම්ම එහේට, මෙහේට අත උස්සන එක හෝ හූ කියන එක නොවෙයි අපි කළ යුත්තේ. අපි මේවා දැන ගන්න ඕනෑ.

දැන් මම තමුන්නාන්සේලාට කියන්නම්, අද අපේ රටේ බැංකුවල තත්ත්වය කොහොමද කියලා. අද අපේ රටේ බැංකු වර්ග 34ක් තිබෙනවා. එයින් 22ක් අපේ දේශීය බැංකු. 12ක් විදේශීය බැංකු. අපේ banking sector එකේ සම්පූර්ණ වටිනාකම Rs. 6.3 trillion, with only five banks each maintaining an asset base of over Rs. 500 billion. අපේ පොදු බැංකු සංචිතයේ, සම්පූර්ණ බැංකු සංචිතයේ සියයට 66ක් ක්‍රියාත්මක වෙන්නේ මේ බැංකු පහ තුළින්. ඒ අතරතුර අපට මධ්‍යම පරිමාණයේ බැංකු - medium-sized banks - හයක් තිබෙනවා. ඒ හය ඇතුළේ විදේශ බැංකු දෙකක් තිබෙනවා. ඒ ගොල්ලන්ගේ assets තිබෙනවා, Rs. 100 billion to Rs. 500 billion. ඒ සියල්ලම ගත්තාම ඒ කොටස සියයට 23ක්. අනෙක් බැංකු 23ම, නැත්නම් අපේ මුළු මුදල් ප්‍රමාණයෙන් සියයට 11ක් රුපියල් බිලියන 100ට අඩුයි. That is how the cookie crumbles. අපේ බැංකු බෙදෙන්නේ ඒ විධියට; ලොකු බැංකු මෙච්චරයි, මධ්‍යම බැංකු මෙච්චරයි, කුඩා බැංකු මෙච්චරයි කියලා. මෙයින් අපට ඒත්තු යන කාරණය තමයි, මහා පරිමාණයේ බැංකු අපි වැඩි කර ගත යුතු බව. මොකද, පුංචි බැංකු මම කලින් විස්තර කළ සියලු අවදානම්වලට ලක් වෙන නිසා. ඒ ගොල්ලන්ගේ asset base එක මදි. හදිසියක් වුණොත් ප්‍රශ්න ඇති වන්න පුළුවන්. ඒ විස්තර මම මෙතැන කියන්න ඕනෑ නැහැ. ඒ නිසා ඒකට විසඳුම තමයි, මේ පුංචි බැංකු පුළුවන් තරම් ඒකාබද්ධ කරලා ශක්තිමත් සංචිතයක් මුළු ආර්ථිකය වෙනුවෙන් ලබා දීම. දැන් තිබෙන හැටියට මේ රටේ තිබෙන බැංකුවලින් 23ක්ම රුපියල් බිලියන 100ට අඩු සංචිතයක් තිබෙන බැංකු.

ගරු කථානායකතුමනි, ඒ වාගේම අංශයක් තමයි, non-banking sector එක. අපට finance companies, financial institutions බොහොමයක් තිබෙනවා. ඒවායේත් යම්කිසි ප්‍රශ්න තිබෙනවා. බැංකු වාගේම non-banking financial institutions විශාල ප්‍රමාණයක් මේ රටේ ක්‍රියාත්මක වනවා. ඒවා බැංකු නොවෙයි. නමුත් සාමාන්‍ය වචන පාවිච්චි කරලා කියනවා නම්, ඒවා "ක්වේසායි" බැංකු, පුංචි බැංකු හැටියට, නාමික බැංකු හැටියට ක්‍රියාත්මක වන financial institutions. ඒක තමයි අපේ තිබෙන ස්වරූපය. ඒ නිසා අපට අවශ්‍ය වනවා, ලොකු බැංකුවක් අපේ සුරක්ෂිතභාවය රැක ගන්න.

ගරු කථානායකතුමනි, ඒක අපට විතරක් නොවෙයි, මුළු ලෝකයටම කරන නිර්දේශයක්. ආර්ථික අර්බුදයට, අවපාතයට පසුව බාසල්වලදී ඒ අය සාකච්ඡා කරලා කිව්වා, මේ විධියට නම් යන්න බැහැ. ඔයගොල්ල මේ විධියට දිගටම ගියොත් සල්ලි හම්බ කරන්න තිබෙන තිබෙන කෑදරකම - greed - නිසා අන්තිමට මුළු ක්‍රමයම කඩාගෙන වැටෙනවා කියලා. ඒ නිසා වෙනත් ශක්තිමත් විකල්ප ක්‍රමයක් හදන්න කියලා තමයි බාසල්වලදී තීරණය කළේ. ඒ එක හේතුවක්.

අනෙක් හේතුව තමයි cost effective කියන එක. ඒ කියන්නේ පුංචි බැංකුවලට වඩා ලොකු බැංකුවලට ගියාම, -ඇත්ත වශයෙන්ම වෙන වෙනත් සාධකත් තිබෙනවා- නව ක්‍රම සඳහා ආයෝජනය කරලා cost effective service එකක් දෙන්න පුළුවන්. තව මුදල් වැය කරලා අපට හොඳ අවස්ථා ලබා දෙන්නට පුළුවන්.

These are facts. එම වාර්තාවේ තවදුරටත් මෙහෙම තියෙනවා:

"Currently most financial institutions are dependent on short-term funding,..."

-ටික කාලයකට ගත්ත ණය, deposits, short-term funding වාගේ ඒවා.

"....which increases the rollover risks, and this has to be addressed with priority by gradually shifting to long-term funding, which provides greater stability to the entire industry".

අපි බලන්න ඕනෑ මේ තුළ මුදල් සංසරණය වන්නේ කොහොමද කියලා; පුංචි depositsවලින්ද, ලොකු depositsවලින්ද, කෙටි කාලීන ණයද, දීර්ඝ කාලීන ණයද කියලා. මේ සියල්ලම ඒ බැංකුවේ ස්ථාවර භාවය විග්‍රහ කරන සාධක.

එහි තවදුරටත් මෙහෙම කියනවා:

"Further, when financial institutions become larger and more stable, obtaining international ratings and raising low-cost funds from international capital markets would be easy".

ඒක මම ඉස්සෙල්ලාත් විස්තර කළා. පොඩි බැංකුවකට ජාත්‍යන්තරයට ගිහින් ණය ගන්න අමාරුයි. නමුත් ලොකු බැංකුවක් සමඟ ගනුදෙනු කරන්න කවුරුත් කැමැතියි. ජපානයේ මේ වන විට තිබෙන ප්‍රශ්නය දිහා බලන්න. ප්‍රශ්නයක් නොවෙයි ඒක අපට opportunity එකක්. නව ව්‍යාපෘතිය යටතේ ජපානය දැන් සල්ලි අලුතින් නිකුත් කරනවා. ඉතාම සරලව කියනවා නම් ජපන් රජය, ජපන් බැංකු තීරණය කළා තව තව යෙන් අව්වු ගහන්නට. යෙන් තව තව අව්වු ගහන්න ඕනෑ, මුද්‍රණය කරන්න ඕනෑ කියලා ඒ රට තීරණය කළා. ඊට ඉස්සෙල්ලා තිබුණේ tight monetary policy එකක්. සල්ලි විකාශනය කරන්නට ඉඩ දුන්නේ නැහැ. නමුත් ඇබේ කියන අලුත් අගමැතිතුමා වෙනත් විධියක් යෝජනා කළා. ඒකට කියන්නේ "Abeynomics" කියලා. එතුමා කිව්වා, "නැහැ, අපි සල්ලි දාමු, මිනිසුන්ට පිට රටවලට ගිහින් බිස්නස් කරන්න" කියලා. "Abeynomics" යටතේ තිබෙන එක් ලක්ෂණයක් තමයි ඒ අය පිට රටවලට සල්ලි දීම. දැන් Diva Securities එක ලංකාවට සල්ලි දෙන්නද කියලා අපෙන් ඉල්ලා සිටිනවා. ඒ අය බලන්නේ, හොඳ balance sheet එකක් තිබෙනවාද කියලා. හොඳ ඉතිරි කිරීම් තිබෙන, ඒ වාගේම හොඳ පාලනයක් තිබෙන බැංකු බලලා තමයි සල්ලි දෙන්නේ. ඒ අනුව ලංකාවට හොඳ අවස්ථාවක් තිබෙනවා. අපේ ආර්ථික සංවර්ධනයත් සමඟ අපේ ගනුදෙනු සඳහා විදේශ බැංකුවලින් සහන ක්‍රමයට, -එන්න එන්නම අඩු පොලියට- විශාල ප්‍රමාණයක ණය ගන්න පුළුවන් තත්ත්වයක් එනවා. ඒ අය බලන්නේ මේ ගැනයි. ආයතනය ස්ථාවරද, මේ අය ළඟ ඉතිරි කිරීම් තිබෙනවාද, පරිමාණය කොහොමද කියලායි. එහෙම වුණාම ඒ rating agencies ලකුණක් දෙනවා. ණය දෙන අය ඉස්සෙල්ලාම බලන්නේ මේ ගැනයි. ඒ වාගේම ජාත්‍යන්තර අරමුදල් ආයතන, ජාත්‍යන්තර බැංකු, ආසියානු සංවර්ධන බැංකුව වාගේ ආයතනත් ඒ ගැන බලා, ඒ අයත් කියනවා මේක ස්ථාවර රටක්; ආර්ථිකය දියුණු වෙන රටක්, ඒ නිසා ඒ අයට ණය දෙන්න කියලා. මම කියන්නට කැමැතියි, අපේ දේශපාලන වාද විවාද මොනවා තිබුණත් අද ඇත්ත වශයෙන්ම මේවා ගැන වටිනාකම තියන්නේ කවුද? Rating Agencies. ඒ වාගේම international banks, regional banks, IMF වාගේ ඒවා. මේ සියලු දෙනාම; එක් කෙනෙකු නොවෙයි.

ගරු කථානායකතුමනි, ඒ වාගේම ලොකු බැංකුවල අභ්‍යන්තර පර්යේෂණ තිබෙනවා. අපි Hong Kongවල HSBC බැංකුවට ගිහින් බැලුවොත් ලංකාවේ desk එක ජාත්‍යන්තර ආයතනයක තරම්. ඒ අය හැම දේම සොයලා බලනවා. දින පතා විස්තර ගන්නවා. Bloomberg එකෙන් ගන්නවා, Reuter එකෙන් ගන්වා, අපේ Central Bank එකේ පරිගණක පද්ධතියට සම්බන්ධ වෙනවා. ඒ අය හැම දාම data analyse කරනවා. මම ආඩම්බරයි කියන්නට, මේ පොඩි පොඩි වාද විවාද තිබුණාට ඒ අය හැම දෙනාම කියලා තිබෙනවා ලංකාවේ ආර්ථිකය ශීඝ්‍රයෙන් දියුණු වෙනවා කියලා.

ආසියාවේ තිබෙන ඉතාම වැදගත්, දියුණු වන ආර්ථිකයක් හැටියට ලංකාව මේ හැම ඒජන්සි එකක්ම පිළි අරගෙන තිබෙනවා. අපි දේශපාලන භේදයෙන් තොරව ඒක ගැන ආඩම්බර වෙන්න ඕනෑ කියලා මම කල්පනා කරනවා. එතකොට තව කරුණු බලන්න ඕනෑ. ඒ බැංකුවල කාර්ය මණ්ඩලය ගැනත් මම කියන්න ඕනෑ. අපි financial sector එකේ මේ විධියට විශාල බැංකු හැදුවාම, ඒ වෙනස තුළ එහි කාර්ය මණ්ඩලයට කිසි හානියක් කරන්න අපි බලාපොරොත්තු නැහැ. හොඳ කාර්ය මණ්ඩලයක් ඉන්නවා. NDB, DFCC කියන බැංකු දෙක ඉතා හොඳ නමක් තිබුණු බැංකු, නමක් තිබෙන බැංකු. හොඳ කාර්ය මණ්ඩලයක් ඉන්නවා. අපි ඒ ගොල්ලන්ගෙත් අයිතිවාසිකම් සුරක්ෂිත කරනවා. ඒ ගොල්ලන්ටත් හොඳ අවස්ථා දෙනවා. පොඩි බැංකුවක තනතුරක් දරනවාට වඩා ලොකු බැංකුවක විශාල වගකීම් තිබෙන තනතුරු අපට හදන්න පුළුවන්.

අවසාන වශයෙන් මම මෙයත් කියන්නට ඕනෑ. මේ රටේ සංසරණය වන මුදල් ප්‍රමාණය අපි වැඩි කර ගන්න ඕනෑ නම් තමුන්නාන්සේලා හැම දාම කියන විධියට ණය ගන්න එපා, ණය ගන්න එපා කියලා, බැංකුවලින්, චීනයෙන් අරහෙන්-මෙහෙන් ණය ගන්නවා කියන කැඩිච්ච තැටිය, පරණ තැටිය - cracked record, RPM record - හැම දාම ගහන්නේ නැතිව බලන්න ඕනෑ, මේ සංවර්ධනය වෙන කොට කොච්චර සල්ලි ඕනෑද කියලා. මේ ආණ්ඩුව ඒ සල්ලි ගන්න ක්‍රම සකස් කරනවා. ඒවා හොඳට විග්‍රහ කර බලන්න. පරණ තැටි හින්දා පරණ gramophone එක වැඩ කරන්නේ නැහැ. අලුතෙන් කල්පනා කරල බලන්න. අලුතෙන් කල්පනා කරලා මේ වෙනස් වීම, මේ ප්‍රතිසංස්කරණය තුළ අපි හදන්නේ අර වෙනත් අංශ, අපේ යටිතල පහසුකම් එහෙම දියුණු කරනවා වාගේම, අද මූල්‍ය ක්ෂේත්‍රයත් නවීකරණය කරලා මේ රටේ ඒ සියයට අටක සංවර්ධන වේගය, ඒ වාගේම ඒක පුද්ගල ආදායම ඇමෙරිකන් ඩොලර් 8,000 ක ඉලක්කයට යන්න අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමයි. එහි එක වෙඩි මුරයක් තමයි මේ අද යෝජනා කරන පනත් කෙටුම්පත. ඒකට තමුන්නාන්සේලාගේ -

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒකට පොලිය වැඩියි.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
නැහැ, පොලිය අඩුවෙනවා නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම ප්‍රශ්නයක් අහන්නද?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
අහන්න, අහන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු ඇමතිතුමා, ගිය අවුරුද්දේ මේ කාලය වෙන කොට විශ්‍රාමිකයන්, මම හිතන හැටියට ජ්‍යෙෂ්ඨ පුරවැසියන් හැම එක්කෙනාම සල්ලි තැන්පත් කළාම සියයට 14 ක් හම්බ වුණා. අද සියයට 6 යි හම්බ වෙන්නේ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඔබතුමා කියන දේ හරි. ඉන්න කෝ මම උත්තර දෙන්න.- [බාධා කිරීමක්] මට තේරෙනවා ඔබතුමා කියන දේ. - [බාධා කිරීමක්] මන්ත්‍රීතුමා, ඔබතුමා මගේ හොඳ යාළුවෙක් නිසා මම කියන්න ඕනෑ, ඒ ප්‍රශ්නය මේ ලොකු ප්‍රශ්නයේ පුංචි එකක් පමණක් බව. ඒකට අපට උත්තර දෙන්න- [බාධා කිරීමක්] මම මේ සාකච්ඡාව එක්තරා මට්ටමකට ගෙනියන්න හැදුවේ. කවුරුත් ලෝකයේ පිළිගන්නවා - [බාධා කිරීම්]

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

මම ඒකට උත්තරයක් දෙනවා. ඒ දෙක අතර ප්‍රති විරුද්ධතාවක් නැහැ. මම කියන්නේ ආයෝජනය සඳහා අඩු පොලියක් තියෙන්න ඕනෑ බවයි. අද කොළඹ නගරයට ගිහිල්ලා බලන්න, මිනිස්සු මොන තරම් අලුත් ව්‍යාපාර ආරම්භ කර තිබෙනවාද කියලා. ටිකක් ඇවිදින්න, මේ ඩුප්ලිකේෂන් රෝඩ් එක දිගේ; ටිකක් ඇවිදින්න, හයි ලේවල් පාරේ. ටිකක් ඇවිදින්න, ගාලු පාරේ. කොච්චර අලුත් ව්‍යවසායකයන් ඒ තැන්වලට එනවාද? ඒක එකක්. මොකද, අඩු පොලියක් දෙන්න දෙන්න මිනිස්සු ඒ මුදල් අරගෙන ආයෝජනය කිරීම සාමාන්‍ය දෙයක්. නමුත් එහෙම කිරීමේදී යම් යම් කොටස් අසහනයට පත් වෙනවා. කවුරුත් කියන්නේ නැහැ ලොකු ආර්ථිකයක් ගෙනියන්න පුළුවන් කියලා සියයට 15, සියයට 20 පොලියට; ඒ regime එකට. මොකද, එතකොට කිසි දේකට මුදල් වැය කරන්නේ නැහැ. නමුත් සමහර කොටස් ඉන්නවා. විශ්‍රාමිකයෝ ඉන්නවා, රජයේ සේවකයෝ ඉන්නවා. පොඩි මිනිස්සු මුදලක් තැන්පත් කරලා ඒකෙන් ජීවත් වෙන්නේ. දැන් ඒකට වෙනත් විසඳුමක් තව දින කීපයකින් ලැබෙයි. ඒකටත් අපි දෙනවා පිළිතුරක්. ඒක වෙනම දෙයක්. ඒකට සම්බන්ධයි, මම නැහැ කියන්නෙ නැහැ. නමුත් ඒකට අපි වෙනත් විසඳුමක් තව ටික දවසකින් දෙනවා. නමුත් ඒකෙන් අපට කියන්න බැහැ රටක් ඉහළ interest regime එකෙන් සමත් වෙයි කියලා. හැම ලෝකයේම "අ" යනු, "ආ" යනු ආර්ථිකය කියන්නේ මේ පොලී අනුපාතය පල්ලෙහාට ගෙනල්ලා, පොඩි මිනිසුන්ටත් ණය අරගෙන කටයුතු කරන්න පුළුවන් ආර්ථිකයක්. තමුන්නාන්සේලා හොඳට කල්පනා කරන්න බලන්න, අපේ අවුරුදු තුනක අය වැයෙන් මොකද අපි කියලා තිබෙන්නේ කියා?

මේ මුදල් Small and Medium Scale Enterprises මඟින් පුංචි පුංචි මිනිසුන්ගේ අතට දමලා ඒ මිනිස්සුන් දියුණු කරන්න ඕනෑ. ඒකට තමයි අපි දැන් family income යනුවෙන් අලුත් සංකල්පයක් හදන්න යන්නේ. තනිකරම එක මිනිසෙකු විතරක් රස්සාව කරගෙන ඇවිල්ලා පවුලම ජීවත් කරවන ආර්ථිකයෙන් අපි ඉවත් වෙන්න ඕනෑ. මුළු කුටුම්බයටම හම්බ කරන්න පුළුවන්.

මගේ මිත්‍ර ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ පඩියෙන් විතරක් ජීවත් වන්න බැහැ නේ. ඔබතුමාගේ මුළු පවුලටම ආදායම් මාර්ග තිබෙන නිසා හොඳ ආදායමක් හම්බ වෙනවා. ඔබතුමා, මැනිනිය, දරුවන් ආදි ඔක්කෝම හම්බ කරනවා**.** එහෙම නේද ගරු මන්ත්‍රීතුමනි? අපි ආඩම්බරයි ඒ ගැන. මේ රටේ ඔක්කෝම පොඩි කිරිඇල්ලලා වාගේ ඉන්න ඕනෑ. පවුලේ සියලුම දෙනා ආදායම් ලබනවා නම් තමයි අපට මේ ආර්ථික ප්‍රශ්නයට උත්තර ලැබෙන්නේ. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන් මම ඔබතුමාට ගෞරව කරනවා. තමන්ගේ දූ දරුවන්ට ඉගෙනගන්න ඉඩ දෙන්නේ නැති අය හුඟක් ඉන්නවා. එහෙම නේද ගරු මන්ත්‍රීතුමනි? දෙමව්පියන්ට සල්ලි තිබෙනවා නම් ළමයාට ඉගෙන ගන්න ඉඩ දෙන්නේ නැහැ. එහෙම නැත්නම් ඒ ළමයා වෙනුවෙන් අනවශ්‍ය වියදම් දරනවා. එහෙම නොකර, ළමයින්ටත් උගන්වලා, වෘත්තීන්හි නියැලිලා ඒ අයටත් ආදායමක් ගන්න කටයුතු සලස්වන්න ඕනෑ. කුටුම්බ ආදායම සකස් කිරීමේ සංකල්පයට අපි යන්න ඕනෑ. ඒක පැහැදිලි කරන්න තමයි මා මේ අවස්ථාව ගත්තේ.

ගරු කථානායකතුමනි, අපි ස්තුතිවන්ත වෙනවා, අපේ Central Bank එකේ අයට. ඒ වාගේම ඉන්දියාවේ දැන් ලොකු වෙනසක් වේගෙන යනවා. Dr. Raghuram G. Rajan කියන්නේ පෞද්ගලිකව මගේ යාළුවෙක්. එතුමාටත් තිබෙනවා අලුත් සංකල්ප. අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ, අපේ මහ බැංකුවට; අජිත් නිවාඩ් කබ්‍රාල් මැතිතුමාට. අපි ඉදිරියට යනවා. පසු ගිය අවුරුදු පහ ඇතුළත ආර්ථික හැලහැප්පුම් නැතිව මේ රට ඉදිරියට ගෙන යන්න අපට පුළුවන් වුණා. ඒ ගමනේදී අපි එක් එක් කොටස්වලට තවත් සහන දෙන්න ඕනෑ. අපි ඒවාත් දෙනවා. නමුත් අද ලෝකයම පිළිගන්නා මේ ආර්ථික ගමන ගැන තමුන්නාන්සේලාත් කරුණාකර අවබෝධ කරගන්න. මේ ගැන සොයා බලා පිළිගෙන අපට සහයෝගය දෙන ලෙස ඉල්ලමින් මා මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
ඛිණා එදුත්තියම්පප්පෙට්‍රත්තු.
Question proposed.

[අ.භා. 2.57]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු කථානායකතුමනි, අද මේ විවාදයට සම්බන්ධ වීමට ලැබීම පිළිබඳව මා බොහොම කැමැතියි. අපේ ආචාර්ය ගරු සරත් අමුණුගම මැතිතුමා ශාස්ත්‍රීය කථාවක් කළා. මම එය දිගටම අසාගෙන සිටියා. එතුමාගේ සමහර කරුණුවලට පිළිතුරු සපයන්නත් මම බලාපොරොත්තු වෙනවා. ඊට කලින් අපේ - එක්සත් ජාතික පක්ෂයේ- ස්ථාවරය කියන්න කැමැතියි. මේ ඒකාබද්ධ කිරීමට අපි විරුද්ධයි. ඒ විරුද්ධත්වයට හේතුවත් පැහැදිලි කරන්න මා බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, ඊට කලින් නියෝජ්‍ය අමාත්‍ය, ගරු සරත් අමුණුගම මැතිතුමා සඳහන් කළ කාරණා තුනක් පිළිබඳව මා මගේ අවධානය යොමු කරනවා. එතුමා කිව්වා, අපේ රට ශීඝ්‍රයෙන් දියුණු වන රටක්ය කියන එක මේ ඒජන්සි පිළිගන්නවාය කියලා. ඒ වාගේම ඇමෙරිකන් ඩොලර් 4000කට මේ රටේ ඒක පුද්ගල ආදායම ගෙන යන්නට බලාපොරොත්තු වෙනවාය කිව්වා. ඒත් එක්කම එතුමා කිව්වා, එතුමන්ලාගේ රජයේ මූලික පරමාර්ථය මේ කුටුම්බය දියුණු කිරීමය කියලා. ගරු කථානායකතුමනි, දැන් කුටුම්බය දියුණු කිරීම සම්බන්ධව තමයි, මූලික ප්‍රශ්නය මතු වන්නේ. කුටුම්බය කියන්නේ මොකක් ද? පවුල; ගෘහස්ථය. ගෘහස්ථයේ ආදායම වැඩි කර ගන්න එක තමයි ඕනෑම රජයක මූලික ඉලක්කය වන්නේ. ඒජන්සිවලට අනුව කොච්චර දළ දේශීය නිෂ්පාදනය ශීඝ්‍රයෙන් ඉහළ ගියත්, කුටුම්භයේ ආදායම වැඩි වෙන්නේ නැත්නම් එතැන සංවර්ධනයක් නැහැ, ගරු කථානායකතුමනි.

කුටුම්බයේ ආදායම මනින ක්‍රමය තමයි, කුටුම්බ සමීක්ෂණය. අවුරුදු තිහක් හතළිහක් තිස්සේ අවුරුදු තුනකට වරක් ශ්‍රී ලංකාවේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ගෘහස්ථ - කුටුම්බ - විසිපන්දාහක අහඹු සමීක්ෂණයක් කර ගෙන යනවා. එයින් 2006-2007 වර්ෂයේදී කළ සමීක්ෂණයෙන් දැනගත් කාරණාව මා කියන්න ඕනෑ. ගරු කථානායකතුමනි, රුපියල් විසිහයදහස් අටසිය ගණනක් තමයි, - මට හරියටම ගණන මතක නැහැ - කුටුම්බයක ආදායම. අවුරුදු හයකට පසුව නැවතත් සමීක්ෂණයක් මාර්ගයන් කුටුම්බයක ආදායම සොයා ගත්තා. ඒක අගෝස්තු මාසයේ පළ කළා. නාමික වශයෙන් මේ ආදායම වැඩි වෙලා තිබෙනවා: රුපියල් තිස්පන්දහසකට ද, හතළිස්පන්දහසකට ද කොහේ ද ඉහළ ගිහින් තිබෙනවා. නාමික වශයෙන් වැඩි වන එක කිසිම සංවර්ධනයක් නොවෙයි. මොකද අපට අවශ්‍ය වන්නේ අපේ ආදායමෙන් කරන්නට පුළුවන් වන්නේ මොකක් ද කියන එක දැන ගන්නයි; අපේ ආදායමේ ක්‍රය ශක්තිය මොකක් ද කියන එක දැන ගන්නයි. අද මට රුපියල් සියයක් තිබ්බලා හෙට දෙසීයක් ලැබිලා වැඩක් නැහැ ගරු කථානායකතුමනි, අද රුපියල් සියයකින් ගන්න පුළුවන් බඩුව හෙට රුපියල් දෙසීයකින් ගන්න බැරි නම්. එහෙම නම් ගරු කථානායකතුමනි, 2012-2013 කුටුම්බ සමීක්ෂණයෙන් අපි දැන ගත්ත දෙය තමයි, අර රුපියල් විසිහයදහස් අටසිය ගණනකට තිබුණු ගෘහස්ථ ආදායම රුපියල්

විසිහත්දහස් එකසියපහළොවක් වාගේ ගණනකට ගිහින් තිබෙනවාය කියන එක.

එතකොට ගරු කථානායකතුමනි, ගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ධුර කාලයේදී එතුමාගේ රජය බලාපොරොත්තු වුණු ඒ කුටුම්බ ආදායමේ දියුණුව මුළු අවුරුදු භයටම සියයට 3. 15යි. ඒ කියන්නේ ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා කියන ඒජන්සිවලට අනුව මේ රට ශීඝ්‍රයෙන් වර්ධනය වෙනවා කියන ගමන් -සියයට හතහමාරක මූර්ත වර්ධනයක් ඇති වෙන ගමන් - ගෘහස්ථ කුටුම්බය වර්ධනය වෙලා තිබෙන්නේ වසරකට සියයට 0. 5කිනුයි. එතැන තමයි, පරස්පරය තිබෙන්නේ. හැම රජයක්ම කල්පනා කරන්නේ ඔය පරස්පරය අඩු කර ගන්නයි. මේ සම්බන්ධයෙන් මා මෙතැනදී කථා කරනකට බලාපොරොත්තු වෙන්නේ නැහැ. නමුත් ඒක සඳහන් කරන්නම්. සියයට 7.5ත්, සියයට .5ත් අතර තිබෙන පරතරය පිළිබඳව ගැටලු රාශියක් මතු වෙනවා. එතැනදී දූෂණය ප්‍රධාන හේතුවක් හැටියට සඳහන් කරන්න පුළුවන්.

දෙවන කාරණය, අඩු පොලියක් තිබෙන්නට ඕනෑය කියා එතුමා කිව්වා. අලුත් ව්‍යාවසායකයෝ එනවාය කිව්වා. පාරේ ගිහින් බලන්න කිව්වා. ඩුප්ලිකේෂන් පාරේ යන්න කිව්වා. ගාලු පාරේ ගිහින් බලන්න කිව්වා.

ඩුප්ලිකේෂන් පාරේ, ගාලු පාරේ යනකොට මොනවා ද අපි දකින්නේ? ජේවිමන්ට හදනවා; රතු ගල් අල්ලනවා. ඒවායි අපි දකින්නේ. තාර දමනවා; කාපට් දමනවා. එවා මේ ව්‍යවසායකයෝ කරන ඒවා නොවෙයි. ඒවා රජයේ වියදම්. සමහර ඒවා චීනයෙන් ණයට අරගෙන කරනවා. එහෙමත් නැත්නම් ලෝක බැංකුවෙන් ණයට අරගෙන කරනවා.

ගරු කථානායකතුමනි, මා බොහොම ගරු කරන අපේ ගරු මුදල් නියෝජ්‍ය ඇමතිතුමාට කියන්නට කැමැතියි, පුද්ගලික අංශයේ ණය පොතේ වර්ධනය ලංකාවේ මෑත ඉතිහාසයේ අඩුම අගයට ඇවිත් තිබෙනවා බව. රජය බලාපොරොත්තු වුණේ පුද්ගලික ණය පොතේ වර්ධනය මේ අවුරුද්ද අවසාන වෙනකොට අවම වශයෙන් සියයට පහළොවක් දහසයක් වෙය කියායි. මේ වර්ධනය සියයට තිස් හතරට, තිස් පහට තිබුණා. මා හිතන හැටියට ඒ අවුරුදු තුනකට කලින්. ඊට පස්සේ මේක විසි ගණනකට අඩු වුණා. ඊළඟට මේක සියයට අටකට ද කොහේද අඩු වුණා. ගරු කථානායකතුමනි, අද තිබෙන අලුත්ම දත්තවලට අනුව - ඔබතුමා සමහරවිට මේක විශ්වාස නොකරන්නට පුළුවන් - පුද්ගලික අංශයේ ණය පොතේ වර්ධනය සියයට 0.8යි. එහෙම නම්, කෝ මේ ආශ්චර්ය? එතුමාත් කිව්වා, මමත් කිව්වා ආර්ථික මූලධර්ම ගැන. අපි පොලී අනුපාතය පහළට දානවා නම් ව්‍යවසායකයන් බැංකුවලට ඇවිල්ලා ඒ ණය අරගෙන ආයෝජනය කරනවා. පෙට්ටි කඩයක් තිබෙන මනුස්සයා පෙට්ටි කඩේ ලොකු කරනවා. එක තාච්චියක ආප්ප දාපු මනුස්සයා ආප්ප තාච්චි පහක ආප්ප දානවා. එහෙමත් නැත්නම් බට්ටා වාහනයක් තිබෙන කෙනා බට්ටා වාහන දෙකක් ගන්නවා. ඒකයි අපි බලාපොරොත්තු වෙන්නේ. නමුත් ගරු කථානායකතුමනි, ඒ බලාපොරොත්තුව නොවෙයි සිද්ධ වන්නේ මහ පොළොවේ. සියයට දශම අටයි. මේ ලංකාවේ මෑත ඉතිහාසයේ -

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ තර්කය ලේසියෙන් මට බිඳ හෙළන්න පුළුවන්. මොකද මේ ප්‍රතිපත්තිමය වෙනස්වීම්වල ප්‍රතිඵලය පහු වැනි දා පේන්නේ නැහැ. ඒකේ time frame එකක් තිබෙනවා. අද අපි ගන්න ප්‍රතිපත්තිවලට ඔබතුමාත් එකඟ වෙනවා නේ. ඒක පිළිගන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ඔබතුමාගේ කථාවට මම බාධා කළේ නැහැ නේ. මම කථා කරන්නම් කෝ. "In the long-term we will all be dead" කියලා අපි ආර්ථික විද්‍යාවේ කථා කරනවා. What is "long-term"? Long-term and short-term කියලා කියන්නේ මොකක්ද? ඒ කියන්නේ capital එක වෙනස් කරන්න පුළුවන් වෙලාව. ගරු කථානායකතුමනි, short-term එක කියන්නේ මේකයි. ආප්ප කඩයක් තිබෙන මිනිහෙක් තවත් පුද්ගලයෙක් වැඩට ගන්නවා. අන්න short-term එක. නමුත් ආප්ප තාච්චි සෙට් දෙකක් දානවා නම් එතැන තමයි long-term එක. කාලය ඕනෑ තරම් ගිහිල්ලා තිබෙනවා. කාලයෙන් මනින්න බැහැ. මාස හයද, මාස දහයද, මාස දොළහද, මාස දහඅටද කියලා. ඒ නිර්ණායකය හරියටම සෘජුවම නැහැ. කවුරුත් කියන්නේ නැහැ, මේක තමයි short-term, මේක තමයි medium-term, මේක තමයි long-term කියලා. If we are able to increase capital, එතැන long-term development එකක් තිබෙනවා. මම කියන්නේ ගරු කථානායකතුමනි, මේක එන්න එන්න අඩු වෙනවා කියන එකයි. ඒකට මොකක් හරි ප්‍රශ්නයක් තිබෙනවා.

අපි වෙන දෙයක් බලමු. අපි හම්බන්තොට වරාය, අරවා මේවා ගැන කථා කරනවා. දැන් මොකක්ද කරන්නේ? Infrastructure development කියනවා. යටිතල පහසුකම් හදනවා කියනවා. ඔව්, හැදුවයි කියමු. අපි ඒවාට සම්පූර්ණයෙන්ම විරුද්ධ නැහැ. අපේ ගැටලුව තිබෙන්නේ ඒක හදන්න යන වියදම ගැනයි. අවුරුදු ගණනකට කලින් කිව්වා වරාය ආශ්‍රිතව නොයෙකුත් පෞද්ගලික අංශයේ ආයෝජන එනවා කියලා. ගරු කථානායකතුමනි, Thatta Cement එනවා කියලා කිව්වා. ඊළඟට refinery එකක් එනවා කිව්වා. ඊළඟට කාර් assembling කරන්න හදනවා කියලා. ඊළඟට කිව්වා, තවත් මොනවාද කරනවා කියලා. ගරු කථානායකතුමනි, ඔබතුමාගේ දිස්ත්‍රික්කය නේ. ඒ නිසා ඔබතුමා හොඳටම දන්නවා නේ, ගරු කථානායකතුමනි. පාරවල් තිබෙනවා. උඩින් යන පාරවල් තිබෙනවා. යටින් යන පාරවල් තිබෙනවා. තාප්ප තිබෙනවා. වරාය තිබෙනවා. නමුත් පෞද්ගලික අංශයේ ආයෝජකයෝ නැහැ. පෞද්ගලික අංශයේ ආයෝජනය නැහැ. එතකොට ඒක තමයි ගැටලුව. මෙතුමා කියන්නේ ව්‍යවසායකයෝ එනවා කියලායි. නමුත් එන්නේ නැහැ. ඇවිල්ලා නැහැ. අපට පේන්නේ නැහැ. රජයේ ආයෝජන පමණයි තිබෙන්නේ.

මෙතුමා කිව්ව ඒවායෙන් තුන්වැනි කාරණය විධියට මම ගන්න බලාපොරොත්තු වුණේ මෙයයි. මෙතුමා "Abenomics" ගැන කථා කළා. The new Japanese Prime Minister, Shinzō Abe is named with "Abenomics" which is interesting. "Reaganomics" කියලා තිබෙනවා. ඔහොම, ඔහොම නොයෙකුත් "nomics" තිබෙනවා. "Raghunomics" තිබෙනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

"Harshanomics" කියලා තිබෙනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ඔව්. "Harshanomics" කියලා තිබෙනවා. ඔය ඔක්කෝම තිබෙනවා. [බාධා කිරීමක්] එක්සත් ජාතික පක්ෂ රජයක් යටතේ "Harshanomics" එක අනුව අපි පෙන්වන්නම්, ඇත්ත වශයෙන්ම එක්සත් ජාතික පක්ෂයේ radical ප්‍රතිපත්තිය අනුව කුටුම්භය සංවර්ධනය කරන ඒ වැඩ කටයුත්ත සමාජ වෙළෙඳ පොළ ආර්ථික ප්‍රතිපත්තියක් තුළ කරගෙන යන්නේ කොහොමද කියලා.

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

ඒක "Harshanomics". අපි ඒක කියලා දෙන්නම්. [බාධා කිරීමක්] අනේ, බාධා කරන්න එපා ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමා. [බාධා කිරීමක්] මට වෙලාව දෙන්න. [බාධා කිරීමක්]. Honourable Sir, let me speak. "Abenomics" කියලා තිබෙනවා. දැන් ඔබතුමාත් කිව්වා, "Abenomics" ජපානයෙන් ඇවිල්ලා අපට සල්ලි දෙනවා කියලා. I will just give you one example. ඊයේ පත්තරේ තිබුණා, ජපන් ජාතිකයෝ අපට ණය දීලා JICA එකෙන් අලුතෙන් කැලණි පාලමක් හදනවා; ඔවුන් අපට ණය දෙනවා කියලා. බොහොම හොඳයි. අපට ජපානයෙන් ගොඩක් ආධාර ලැබිලා තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ කැලණි පාලම හදන්න ගන්න ණයවල පොලිය සියයට දශම එකයි. ඊයේ පෙරේදා සී ජින්පින් ජනාධිපතිවරයා ආවා. චීන ජනාධිපති සී ජින්පින් ඇවිල්ලා අත්සන් කරපු බොහෝ agreements සමහර ඒවායේ ණය පොලිය සියයට තුනටත් වඩා එහාට යනවා.

නැවතත් මම මූලික කාරණයට පැමිණෙන්නම්. ඇයි, අපි මේකට විරුද්ධ වෙන්නේ? අපට අවශ්‍ය වෙලා තිබෙන්නේ සංවර්ධන බැංකුවක්. මම මේ ගැන කථා කරන්නේ මගේ පළමුවැනි රස්සාව හම්බ වුණේ ඩීඑෆ්සීසී බැංකුවේ නිසා. මගේ ආචාර්ය උපාධිය අරගෙන ඇවිල්ලා පළමුවෙන්ම ආර්ථික විද්‍යාඥයා හැටියට මේ බැංකුවට තමයි ගියේ. මම ඒ බැංකුවේ ප්‍රධාන ආර්ථික විශේෂඥයා හැටියටත්, ප්‍රථම භාණ්ඩාගාරික හැටියටත් වැඩ කළා. ගරු සරත් අමුණුගම ඇමතිතුමා කියන විධියට ජර්මනිය, ඇමෙරිකාව වැනි රටවලට ගිහිල්ලා දීර්ඝ කාලීන ණය ගැනීම, deposits පටන් ගැනීම වැනි දේවල්වලට අපි මූලික වුණා. ඇත්ත වශයෙන්ම මට මේ බැංකුව පිළිබඳව ගැඹුරු දැනීමක් තිබෙනවා.

ගරු කථානායකතුමනි, අපට අවශ්‍ය වෙලා තිබෙන්නේ සංවර්ධන බැංකුවක්. ගරු ඇමතිතුමා කියපු විධියට වාණිජ බැංකු මහා ගොඩක් මේ රටේ තිබෙනවා. දැන් NDB බැංකුව වාණිජ බැංකුවක්. It is a fully-fledged commercial bank. මේ NDB වාණිජ බැංකුවයි, ඩීඑෆ්සීසී කියන සංවර්ධන බැංකුවයි එකතු කළාම හැදෙන්නේ මොකක්ද? හැදෙන්නේ සංවර්ධන බැංකුවක් නොවෙයි, තවත් විශාල වාණිජ බැංකුවක්. ගරු ඇමතිතුමා කිව්වා වාගේ රජයේ අවශ්‍යතාව තමයි, ලොකු ශේෂ පත්‍රයක් තිබීම. You need a big balance sheet. ලොකු balance sheet එකක් ඕනෑ වන්නේ ඇයි? ඒ balance sheet එක පෙන්වා වෙන තැන්වලින් ණය ගන්නවා.

ගරු කථානායකතුමනි, හෙට අනිද්දා ඉදිරිපත් කරන්න යන අය වැය සම්බන්ධයෙන් අපට ගැටලු රාශියක් තිබෙනවා. අපි ඒවා ඒ වෙලාවේදී කථා කරන්නම්. මම ඒ සම්බන්ධයෙන් කෙටියෙන් පැහැදිලි කිරීමක් කරන්නම්. එකක් තමයි, Budget එකෙන් එළියේ - off-budget - ශේෂ පත්‍රයෙන් පිට මාර්ග සංවර්ධන අධිකාරිය, එහෙමත් නැත්නම් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය බැංකුවලින් ණය ගන්නවා. බැංකුවලින් ණය අරගෙන ඒ ණය ඒකාබද්ධ අරමුදලට - Consolidated Fund එකට- දමන්නේ නැතිව off-balance sheet account එකක් හැටියට තබා ගන්නවා. RDA එකට රුපියල් බිලියන 75ක් ණය ගන්න ඕනෑ වුණාම, එහෙම නැත්නම් ආරක්ෂක අමාත්‍යාංශයට රුපියල් බිලියන 15ක් ණය ගන්න ඕනෑ වුණාම ජාතික ඉතිරි කිරීමේ බැංකුව වාගේ ආයතන පාවිච්චි කරලා ණය ගන්න කියනවා. ඒ ණය වහා සෘජුවම රජයේ ආයතනවලට පවරනවා. ඊට පස්සේ මෙතැනට ඇවිල්ලා කියනවා, "ගරු කථානායකතුමනි, මේ බලන්න. අපේ අය වැය පරතරය අඩු වෙලා. අපේ වියදම අඩු වෙලා. අපේ දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව ණය අඩු වෙලා" කියලා. ඔව්, එහෙම වෙලා තිබෙනවා. මොකද, ඒක තමයි ශේෂ පත්‍රයේ තිබෙන්නේ. ශේෂ පත්‍රයට පිටින් ණය ගන්නා වැඩේට තමයි අපි විරුද්ධ වන්නේ. මේ බැංකු ලොකු කරන්නේ, ශේෂ පත්‍ර strengthen කරන්නේ - [බාධා කිරීමක්] Let me speak. ගරු කථානායකතුමනි, අපට ගරු සරත් අමුණුගම ඇමතිතුමාගේ argument එක පිළිබඳව හිතන්න පුළුවන්. එතුමා කොයි වෙලාවේත් කියන්නේ වැදගත් දෙයක්. එතුමා කියනවා, අපට ආදායම් ලැබෙන ආයතනවලට bonds දීලා ඒ ආදායමෙන් ඒ bonds ගෙවන්න පුළුවන් කියලා. නමුත් ගරු ඇමතිතුමනි, ඒකාබද්ධ අරමුදලෙන් හෝ annual account එකෙන් -ඒ කියන්නේ headsවලින්- පමණක් ආදායම බලාපොරොත්තු වන ආයතන ණය ගත්තොත් ගෙවන්නේ කොහොමද කියලා ඔබතුමා කල්පනා කරලා බලන්න. ඒ ආයතනවලට ඒ ණය ගෙවන්න ආදායමක් නැහැ. ගරු කථානායකතුමනි, ඒ ආයතනවලට ආදායම් නැහැ. මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන විසර්ජන පනතේ ඊට අදාළව එක ජේළියයි තිබෙන්නේ. ඒ අනුව "මෙන්න මේ උපරිමයට යටත්ව අපි ණය ගෙවනවා" කියලා පාර්ලිමේන්තු අනුමැතිය අරගෙන ඒ ණය ගෙවනවා. මෙතැනදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 සහ 150. (2) ව්‍යවස්ථා සම්පූර්ණයෙන් උල්ලංඝනය වනවා. ඔය කාරණාවට තමයි ශේෂ පත්‍රය strengthen කරන්නේ. "We should strengthen the balance sheet so that we can go to international bond markets and raise money" කියලා මහා ලොකුවට කියන්නේ ඔන්න ඔය කාරණාවටයි, ගරු කථානායකතුමනි.

මේ වැඩේට අර්ථසාධක අරමුදල පාවිච්චි කරන්න එපා කියලා අපි මුල ඉඳලාම කිව්වා. සේවක අර්ථසාධක අරමුදල් පනතේ තිබෙනවා, අර්ථසාධක අරමුදලේ මුදල් පාවිච්චි කරලා බැංකුවල කොටස් ගන්න බැහැ කියලා. නමුත් ඔබතුමන්ලා ඒක දිගින් දිගටම කළා. අපට කිව්වා, Chinese wall තිබෙනවා, conflict of interest එකක් නැහැ කියලා. මම ඒ සම්බන්ධයෙන් මෙතැන දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් ඒ සියලුම දේ අහක දමා, they ignored the good governance conditions. ඇත්ත වශයෙන්ම යහ පාලනය කියන එක කුණු බක්කියට දමලායි මේ වැඩේ කළේ.

ඒ විතරක් නොවෙයි. මේ කරුණ මම කියන්න කැමති නැති එකක්. නමුත් මම කෙටියෙන් ඒක කියනවා. මොකද, ඒක කිව යුතු දෙයක්. අර්ථසාධක අරමුදලේ මුදල්වලින් බැංකුවල කොටස් අරගෙන ඒ බැංකුවලට නෑදෑයෝ, යාළුවෝ පත් කරලා තිබෙනවා. ඒක එතරම් හොඳ දෙයක් නොවෙයි. මම එක පුද්ගලයෙකු ගැන පමණක් කියන්නම්. මම වෙන කිසිම කෙනෙකු ගැන කියන්නේ නැහැ. ඒ පුද්ගලයා ගැන කියන්නත් හේතුව, 2007 දී විජයදාස රාජපක්ෂ කෝප් වාර්තාවේ මේ ගැන සඳහන් කර තිබීමයි. ඒක පමණයි මම කියන්නේ. අර්ථසාධක අරමුදලේ මුදල්වලින් ඩීඑෆ්සීසී බැංකුවේ කොටස් ගත්තා. ඒ බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු හැටියට යම් කිසි පුද්ගලයෙකු පත් කරලා තිබෙනවා. එතුමාගේ නම ජෙයම් පෙරුමාල්. ජෙයම් පෙරුමාල් කියන පුද්ගලයා ගැන කෝප් වාර්තාවේ තිබෙනවා. Translanka Investments Limited කියන ආයතනයට මුදල් යෙදූ බොහෝ දෙනාගේ මුදල් සම්පූර්ණයෙන්ම නැති වෙලා තිබෙනවා. ඒ ආයතනය රුපියල් මිලියන 221.7ක් වියදම් කරලා බංකොලොත් වෙලා තිබෙනවා.

ඊට පසුව ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ කාලයේදී Presidential Commission එකක් පත් කර තිබෙනවා. ඒ Presidential Commission එකට මෙතුමා ඇවිත් නැහැ. ඊට පසුව පත්තරේ කියවූ පුද්ගලයෙකු මෙතුමාගේ address එක දීලා තිබෙනවා. එහෙමයි මේ මනුස්සයාව හොයා ගෙන තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, බැංකුවල අධ්‍යක්ෂවරුන් පත් කරන්න "fit and proper" කියලා condition එකක් තිබෙනවා. ජෙයම් පෙරුමාල් කියන පුද්ගලයා Translanka Investments Limited

කියන ආයතනයේ ප්‍රධාන විධායක අධ්‍යක්ෂ හැටියට හිටපු නිසා ඔහු "fit and proper" නැහැ. එතකොට මම ගරු කරන ඇමතිතුමා කිව්වේ මොකක් ද? He talked about Bernie Madoff. බර්නි මැඩෝෆ් කියන පුද්ගලයාගේ Ponzi scheme එක ගැන කථා කළා. බර්නි මැඩෝෆ්ට වුණු දෙයත් එතුමා කිව්වා. බර්නි මැඩෝෆ් ජීවිතාන්තය දක්වාම සිරගත කරලා කියලා අපේ ගරු (ආචාර්ය) සරත් අමුණුගම ඇමතිතුමා කිව්වා. හරි, ඒක තමයි විය යුත්තේ. Ponzi scheme කරන උදවියට විය යුත්තේ ඒකයි.

අපේ Ponzi scheme කරන උදවියට දීලා තිබෙන්නේ මොකක් ද? දීලා තිබෙනවා, promotion එකක්. අද මේ කථා කරන DFCC බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු හැටියට 2012 වර්ෂයේදී පත් කර තිබෙනවා. ඒවා සිදු විය යුතු කාරණා නොවෙයි. යහළුවෝ වෙන්න පුළුවන්; නෑදෑයෝ වෙන්න පුළුවන්. නමුත් අපේ යහපාලනයක් තිබෙන්න ඕනෑ.

බැංකු ගැන කථා කළා. බැංකුවක් වුණාම ඒ බැංකුව ගැන මිනිසුන් ළඟ සම්පූර්ණයෙන්ම විශ්වාසය තිබෙන්න ඕනෑ. Finance company එකක් බංකොලොත් කළ කෙනෙක් කොහොමද, බැංකුවක Chairman කෙනෙක්, අධ්‍යක්ෂවරයෙක් හැටියට පත් කරන්නේ?

අනිත් කාරණය තමයි, තව එකක් කියනවා, නම් නොකියා. CIFL කියන ආයතනය. CIFL ආයතනයේ වුණු දෙය - Ponzi scheme. ඔබතුමා කියපු නිසායි, මම මේ කියන්නේ. "It is a Ponzi scheme" කියා මහ බැංකුවේ අභ්‍යන්තර වාර්තාවේ සඳහන් වෙනවා. මම ඒක මීට කලින් මේ ගරු සභාවේදී හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කර, සභාගත කර තිබෙනවා. What does it say? It says that the Central Investments and Finance Limited, CIFL, is a Ponzi scheme. මහ බැංකුවෙන් කියන්නේ. නමුත් කළේ මොකක් ද? ඒක වසා දැම්මේ නැහැ; ඒක ක්‍රියාත්මක කළේ නැහැ; regulation හරියාකාරව ක්‍රියාත්මක කළේ නැහැ. අවසානයේදී -ඊයේ, පෙරේදා- උසාවියේදී මතු වුණු කාරණය මොකක්ද? දහස් ගණනකගේ ජීවිත සම්පූර්ණයෙන්ම අනතුරේ. කී දෙනෙක් ජීවිත හානි කර ගෙන තිබෙනවාද? කෝටි කීයක් නැති වෙලා තිබෙනවාද? අන්තිමට මොකද වුණේ? අධිකරණයේදී දැන ගත්ත දෙය තමයි, ඒ මනුස්සයාගේ නමත් හොර නමක් කියන එක. හොර නමකින් තමයි මේ මනුස්සයා මේක පටන් අරගෙන තිබෙන්නේ. නියාමනය කරනකොට මේවා ගැන බලන්නේ නැද්ද?

Where is good governance in regulation? Where is the responsibility in regulation? You talked about having a strong financial system but this is where the problem arises, Hon. Minister. You have to regulate properly. Regulation must not be based on favouritism. Regulation must not be based on whether that person is your friend or relative. Therefore, there is going to be a risk in the entire financial system. The risk that you wanted to avoid, the systemic risk, is going to arise. You know what I am talking about, Hon. Minister. I am talking about the systemic risk. To avoid systemic risk, the regulator must do its job right.

අවසාන වශයෙන් කථා කරන්න ඕනෑ, ඔය උදවියට - යහළුවන්ට, නෑදෑයන්ට- they are going to benefit tremendously with the share swaps. ගරු කථානායකතුමනි, අවුරුදු දෙක තුනකට කලින් සිදු කළ මේ ක්‍රියාවලිය ගැන මම මේ ගරු සභාවේදී අවුරුදු තුනකට කලින් කළ කථාව, හැන්සාඩ් වාර්තාවෙන් අරගෙන නැවත කියවා බැලුවොත්, අද කරන කථාවත් සමඟ සංසන්දනය කර බැලුවොත් එහි ඉතාමත්ම සෘජු සම්බන්ධතාවක් තිබෙන බව ඔබතුමාට හෝ එය කියවන ඕනෑම කෙනෙකුට වැටහේවි.

ගරු කථානායකතුමනි, දැන් consolidation ගැන කථා කරනකොට කිව්වා, ඒකාබද්ධ කළ යුතු ෆිනෑන්ස් කොම්පැනි 57ක් තිබෙනවා කියා. ගරු කථානායකතුමනි, මම ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි, - ඊළඟට පිළිතුරු දෙන මන්ත්‍රීවරයාට කියන්න කියලා - මේ ලයිසන් දුන්නේ කවදා ද; මේ ලයිසන් දුන්නේ කවුද; 2013 වර්ෂයේදී ලයිසන් කීයක් දුන්නාද කියා. මම දන්නවා, රිවඩ් පීරිස් ආර්පිකෝ ෆිනෑන්ස් සමාගම ලයිසන් දුන්නේ, ඒකාබද්ධ කළ යුතුයි කියා පටන් ගත්තායින් පසුවයි. 2011 වර්ෂයේ ලයිසන් කීයක් දුන්නාද? 2012 වර්ෂයේ ලයිසන් කීයක් දුන්නාද? ලබා දීලා තිබෙන ලයිසන් 57න් ගිය අවුරුදු තුන හතර තුළ ලයිසන් කීයක් දුන්නාද? පොඩි පොඩි මිනිසුන්ට ලයිසන් දීලා තිබෙනවා. අවසානයේදී කඩා ගෙන වැටෙනකොට ලොකු බැංකුවලට කියනවා, පොඩි finance companies ගන්න කියා. මම දැක්කා, මේ ළඟදී Indra Finance ද මොකක් ද එකක් කොමර්ෂල් බැංකුවෙන් අරගෙන. Look at the net asset value that is being used to calculate the cost of transaction. පොඩි finance company එකක් පටන් අරගෙන, ගරු කථානායකතුමනි. ඒකේ profit එක රුපියල් මිලියන 3යි, මිලියන 4යි. මේවායේ අයිතිකාරයෝ හිටපු ගමන් කෝටිපතියන් වෙනවා. මෙතැන තිබෙනවා, අපට සැඟවුණු කාරණයක්. සැඟවුණු කාරණය නිසාදෝ මේ කටයුත්ත කරන්නේ කියන එක සාධාරණ ප්‍රශ්නයක් හැටියට මා දකිනවා, ගරු කථානායකතුමනි.

Did somebody have a long-term plan in issuing licences so that there will be too many licences and there will be an issue? Then, the big companies and big banks will come and purchase the small companies which are already in trouble. So, if you really go back and look at it, there is a possibility. I am not saying that that was the reason but it is a question that can be asked in a reasonable way.

ගරු කථානායකතුමනි, මම මේ කියාගෙන ආවේ එතුමා ගෙනාපු තර්කයට අප එකඟ වන්නේ නැහැ කියායි. අප ඊට එකඟ නොවන්නේ මේ කාරණය නිසායි. අපේ රටට අවශ්‍ය වන්නේ සංවර්ධන බැංකුවක්. ඒ සංවර්ධන බැංකුවේ ප්‍රධාන ආර්ථික උපදේශක හැටියටත්, එහි පළමුවෙනි භාණ්ඩාගාරික හැටියටත් මට ඒ ගැන කථා කරන්න අයිතියක් තිබෙනවා.

ප්‍රධාන විධායක අධ්‍යක්ෂ නිහාල් ෆොන්සේකා මැතිතුමා ගැන කථා කළා. එතුමා එනකොට මම ගිහින්. මාව බඳවා ගත්තේ මැක්සි ප්‍රේලිස් මැතිතුමායි. මම NDB බැංකුව ගැන දන්නේ නැහැ. ඉරාන් වික්‍රමරත්න මැතිතුමා තමයි ඒකේ ප්‍රධාන විධායක අධ්‍යක්ෂතුමා. මා හිතන්නේ එතුමාත් පසුව කථා කරාවි. Sir, these are good banks; these are good people; these are qualified people. They know what they are doing.

අපට අවශ්‍ය සංවර්ධන බැංකුවක් නම්, 1955 දී පාර්ලිමේන්තු පනතකින් හදපු සංවර්ධන බැංකුව අත හරින්නේ ඇයි? ගිහින් බලන්න, ගරු කථානායකතුමනි, බැංකුවලින් මොනවාටද ණය දෙන්නේ කියා. වැඩිපුරම දෙන්නේ උකස් ණය. මිනිසුන් රත්රන් බඩු තියලා ණය ගන්නවා. රත්තරන් මිල පහළ වැටුණු නිසා උකස්වලට ගත්ත ණය වැටිලා ඒවා බොල් ණය වෙලා තිබෙනවා. ඒක තමයි, මහජන බැංකුවේ එහෙම profit එක සියයට 50කින් අඩු වෙන්න ප්‍රධාන හේතුව. අපට ඕනෑ උකස් ණය නොවෙයි.

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

අපට ඕනෑ සංවර්ධනය සඳහා දීර්ඝකාලීන ණයයි. ව්‍යවසායකයන්ට ඕනෑ දීර්ඝකාලීන ණයයි. මා ඉතාම ඕනෑකමින් හා වගකීමෙන් මේ කියන්නේ. දීර්ඝකාලීන ණය දෙන්න නම් අපට අවශ්‍ය වන්නේ සංවර්ධන බැංකුවක්. මේ සංවර්ධන බැංකුව නැති කිරීම පිළිබඳව එක්සත් ජාතික පක්ෂය හැටියට අපේ ස්ථාවරය මා ඔබතුමාට සෘජුවම කියනවා. අප මේකට විරුද්ධයි. මේක කරන්න එපා. රජයේ අවශ්‍යතාව සපුරා ගැනීම පිණිස ශේෂ පත්‍රය තව ටිකක් විශාල කර ගැනීම පමණයි මෙයින් සිදු වන්නේ කියන කාරණය සඳහන් කරමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ස්තුතියි. මීළඟට ගරු බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමා.

ඊට පෙර, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ වීය.

அதன்பிறகு, சபாநாயகர் அவர்கள் *அக்கிராசனத்தினின்று அகலவே,* பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] *தலைமை வகித்தார்கள்.*

Whereupon MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *took the Chair.*

[අ.භා. 3.21]

ගරු බන්දුල ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு பந்துல குணவர்தன - கல்வி அமைச்சர்)
(The Hon. Bandula Gunawardane - Minister of Education)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ දීර්ඝ කාලයක් පැවති ජාතික සංවර්ධන බැංකුවත්, DFCC බැංකුව හා DFCC වර්ධන බැංකුව ඒකාබද්ධ කොට, ශක්තිමත් බැංකු ඒකකයක් ගොඩනැඟීම සඳහා මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා පනත් කෙටුම්පතක් දෙවන වර කියැවීම සඳහා ඉදිරිපත් කර ඇති මේ අවස්ථාවේදී, රටේ බැංකු හා මූල්‍ය ක්‍රමය පිළිබඳ කරුණු කීපයක් සඳහන් කරන්න අවස්ථාවක් ලැබීම ගැන මා සතුටු වෙනවා.

අපේ රටේ හා ලෝකයේ වෙනත් ඕනෑම රටක ඉතාම වැදගත් වන මූල්‍ය ආයතන රාශියක් තිබෙනවා. වාණිජ බැංකු, වාණිජ බැංකු නොවන ඉතුරුම් ආයතන, විශේෂිත බැංකු, ණය පමණක් සපයන ආයතන යනාදී වශයෙන් විවිධ බැංකු පද්ධතියක් ඒ සෑම රටකම තිබෙනවා. ඒ සියලුම බැංකු, බැංකුකරුවන්ගේ බැංකුව වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඒ ක්ෂේත්‍රය පිළිබඳ විශේෂ අවබෝධයක්, අත් දැකීමක්, පළපුරුද්දක් සහ න්‍යායාත්මක හා භාවිතය පිළිබඳ පරිචයක් සහිත විශේෂඥ මානව ප්‍රාග්ධනයන් විසින් හසුරුවනු ලබනවා. විශේෂයෙන්ම ලෝකයේ බැංකු ක්‍රමය කඩා වැටුණොත්, වෙළෙඳ පොළ ආර්ථික තිබෙන හැම රටකම මනුෂ්‍ය ජීවිතවලට, දන්න, නොදන්න ලොකු, කුඩා සියලු දෙනාට එය බරපතළ ලෙස බලපානවා. අප කවුරුත් දන්නවා, පසු ගිය කාලය තුළ ලෝක ආර්ථික අර්බුදයේ එක් ප්‍රධාන සාධකයක් බවට පත් වුණේ බටහිර රටවල බැංකු ක්‍රමයේ කඩා වැටීම බව.

ලීමන් බ්‍රදර්ස් සමාගම බංකොලොත් වුණා. ලෝකයේ අනෙක් රටවල ඇති වූ ණය දීමේ ක්‍රියාවලිය තුළ විශාල වශයෙන් සුරැකුම් සහිතව හෝ රහිතව ණය සපයලා ඒ ණය ආපසු අය කර ගත නොහැකි වුණාම සමස්ත බැංකු පද්ධතිය කඩා වැටීමෙන් ලෝකයේ බටහිර රටවල් විශාල අර්බුදයකට ගමන් කළා. ලංකාවේ එක බැංකුවකට පමණක් එවැනි තත්ත්වයක් මතු වී ගෙන එන අවස්ථාවේදී එකම බැංකුවක්වත් කඩා වැටෙන්නේ නැති වන ආකාරයට බැංකු පද්ධතිය ආරක්ෂා කරන්නට අතිගරු ජනාධිපතිතුමා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා වශයෙන් වඩා ඵලදායී ලෙස ක්ෂණික තීන්දු තීරණ ගත් බව අපි මේ අවස්ථාවේදී මතක තබා ගත යුතු වෙනවා. මේ සමස්තය කඩා වැටිලා, ආර්ථිකය කඩා වැටිලා, ආර්ථිකයේ මුදල් සංසරණය වන්නේ නැහැ, බැංකු ක්‍රමය බොහොම අවදානම්, ණය ලැබෙන්නේ නැහැ වැනි මතවාද දේශපාලන වශයෙන් විපක්ෂය විසින් සාමාන්‍යයෙන් කියන කථා. ඒ නිසා මම කල්පනා කළා, අපේ මූල්‍ය පද්ධතියේ සැබෑ තත්ත්වය පිළිබඳව කථා කරන්න. මූල්‍ය පද්ධතියේ ප්‍රධාන ආයතන වර්ග 4ක් තිබෙනවා. එකක් බැංකු අංශය. තවත් එකක් තමයි, තැන්පත් භාර ගන්නා මූල්‍ය ආයතන.

ග්‍රාමීය අංශයේ තිබෙන -උදාහරණයක් වශයෙන් සමුපකාර ග්‍රාමීය බැංකුව වැනි- තැන්පත් භාර ගන්නා ආයතන, ජංගම ගිණුම් පවත්වා ගෙන නොයන ආයතන, අණ කරන චෙක්පත්වලට ගෙවීම් නොකරන, චෙක්පත් හා වෙනත් එවැනි සමකාර්ය උපකරණ ගිණුම්වලට රැස් කරන්නේ නැති, අයිරා පහසුකම් ලබා දෙන්න බැරි එවැනි තැන්පත් භාර ගන්නා ආයතන තිබෙනවා. ඊළඟට බලපත්‍රලාභී විශේෂිත මූල්‍ය ආයතන තිබෙනවා. ඊළඟට බැංකු නොවන ඉතුරුම් ආයතන තිබෙනවා. සමස්ත මූල්‍ය පද්ධතිය තුළ බැංකු අංශය, තැන්පත් භාර ගන්නා තැන්පතු ආයතන, විශේෂිත මූල්‍ය ආයතන සහ ඉතුරුම් ආයතන කියන හතරක් තිබෙනවා.

2005 දී අතිගරු ජනාධිපතිතුමා මේ රට භාර ගන්නා විට බැංකු අංශයේ තිබුණු සමස්ත වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 2208යි. තැන්පත් භාර ගන්නා මූල්‍ය ආයතනවල රුපියල් බිලියන 119ක් තිබුණා. විශේෂිත මූල්‍ය ආයතනවල රුපියල් බිලියන 129ක් තිබුණා. බැංකු නොවන ඉතුරුම් ආයතනවල රුපියල් බිලියන 694ක් තිබුණා. එතකොට 2005 දී මේ සමස්ත මූල්‍ය පද්ධතිය තුළ තිබූ වත්කම්වල මුළු වටිනාකම රුපියල් බිලියන 3151යි. ඊට පස්සේ 2013 වන තෙක් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා යටතේ ඒ අදාළ ආයතන විසින් වඩා ඵලදායක හා කාර්යක්ෂම ලෙස මූල්‍ය පද්ධතිය කළමනාකරණය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් බැංකු අංශයේ වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 7188 දක්වාත්, තැන්පතු භාර ගන්නා මූල්‍ය ආයතනවල වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන756 දක්වාත්, විශේෂිත මූල්‍ය ආයතනවල වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 376 දක්වාත්, බැංකු නොවන ඉතුරුම් ආයතනවල වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 1998 දක්වාත් වර්ධනය වීමෙන් බැංකු පද්ධතියේ මුළු වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 10318 දක්වා වර්ධනය වෙලා තිබෙනවා. ඕනෑම මූල්‍ය විශ්ලේෂකයකුට ඉලක්කම් විශ්ලේෂණය කළොත් පෙනෙනවා, 2001 දී සමස්ත මූල්‍ය පද්ධතිය සතු වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 3151 සිට 2013 වන විට රුපියල් බිලියන 10318 දක්වා වර්ධනය වුණාම, සමස්ත මූල්‍ය පද්ධතිය තුළ වත්කම් ප්‍රමාණයේ වැඩි වීම සියයට 200කටත් වඩා ඉහළ ගිහින් තිබෙන බව. අපි රටක් විධියට මූල්‍ය ක්‍රමය පිළිබඳ ස්ථාවරත්වය බැලුවොත් ඉතාම හොඳ දර්ශකයක් ලෙස මූල්‍ය ආයතන පද්ධතියේ වත්කම්වල ඉහළ යාම සිදු වෙලා තිබෙනවා.

ඊළඟට, බැංකු ව්‍යාපාරය පමණක් චෙනමම ගත්තොත් වාණිජ බැංකු හා වාණිජ නොවන බැංකුවල 2005 දී තිබුණ වත්කම් ප්‍රමාණය රුපියල් ට්‍රිලියන -බිලියන නොවෙයි- 1.8යි.

දැන් බැංකු ව්‍යාපාරයේ වත්කම් ප්‍රමාණය ට්‍රිලියන 3.9 දක්වා වර්ධනය වෙලා තිබෙනවා. ට්‍රිලියන 1.8ක් වුණු බැංකු ක්‍රමයේ වත්කම් ප්‍රමාණය ට්‍රිලියන 3.9 දක්වා ඉතා විශාල ප්‍රමාණාත්මක වර්ධනයක් සිද්ධ වෙලා තිබෙනවා. ණය ගන්නේ නැහැ, ණය මුදල් සංසරණය වෙන්නේ නැහැ කියන කොට අපි 2005 දී ණය දීලා තිබෙන්නේ ට්‍රිලියන එකයි. 2013 වෙනකොට බැංකු අංශය විසින් ට්‍රිලියන 3.4ක් ණය දීලා තිබෙනවා. ට්‍රිලියන එකක් පමණක් ණය දීපු බැංකු අංශය ට්‍රිලියන 3.4ක් දක්වා මේ රටේ විවිධ අංශවලට -කර්මාන්ත අංශයට, කෘෂි කර්මාන්ත අංශයට, සේවා අංශයේ ආර්ථික ක්‍රියාකාරිත්වය සඳහා- ණය පහසුකම් සපයලා තිබෙනවා. තැන්පත් අතින් බැලුවොත් 2005 දී තැන්පත් තිබුණේ ට්‍රිලියන 1.3 යි. දැන් තැන්පත් ට්‍රිලියන 4.2ක් තිබෙනවා. පුද්ගලයන්ගේ ආදායම වැඩි වෙලා නැත්නම්, ඉතුරුම් වැඩි වෙලා නැත්නම්, දුප්පත්කම වැඩි වෙලා නම් ට්‍රිලියන 1.3ක්වූ තැන්පත් ප්‍රමාණය ට්‍රිලියන 4.2 දක්වා වර්ධනය වන්නේ නැහැ කියන එක කුඩා දරුවෙකුට වුණත් තේරෙනවා. මේ කාලපරිච්ඡේදය තුළ දී තැන්පත් එලෙසින් වැඩි වුණු අතර, ආයෝජනය ගත්තොත් 2005 දී ආයෝජනය ට්‍රිලියන එකක්වත් නැහැ. ආයෝජනය ට්‍රිලියන 0.4යි. 2013 දී ආයෝජනය ට්‍රිලියන 1.7යි. මෙම සංඛ්‍යා දත්ත දිහා බැලුවාම ඉතා පැහැදිලිව බැංකු ව්‍යාපාර අංශයේ අර්බුදයක් හෝ කඩා වැටීමක් හෝ නායයාමක් ඇති නොවී බැංකු ව්‍යාපාරය වඩා ශක්තිමත් අංශයක් ලෙස සමස්ත ආර්ථික ක්‍රියාකාරිත්වය තුළ හොඳ වර්ධන තත්ත්වයක් පෙන්නුම් කර තිබෙන බව පෙනෙනවා. වත්කම් ප්‍රමාණය ට්‍රිලියන 1.8 සිට ට්‍රිලියන 5.9 දක්වාත්, ණය දීම ට්‍රිලියන 1 සිට 3.4 දක්වාත්, තැන්පත් ට්‍රිලියන 1.3 සිට ට්‍රිලියන 4.2 දක්වාත් වැඩි වෙලා තිබෙනවා. ට්‍රිලියන 0.4 ක්ව තිබුණු ආයෝජනය ට්‍රිලියන 1.7 දක්වා ඉහළ ගිහිල්ලා බැංකු ව්‍යාපාරය සමස්ත ආර්ථිකය තුළ නිමැවුම, ආදායම, සේවා නියුක්තිය, මිල මට්ටම, ගෙවුම් ශේෂය, ඉතුරුම්, ආයෝජනය වැනි සාර්ව ආර්ථික විචල්‍යයන් කෙරෙහි වඩා හිතකර බලපෑමක් ඇති කරලා තිබෙන බව පැහැදිලි වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්ථිකයේ විවිධ අංශවල ප්‍රගතිය මැන බැලීමට විවිධ දර්ශක පාවිච්චි කරනවා. ආර්ථික වර්ධන වේගය, ඒක පුද්ගල ආදායම, ක්‍රය ශක්තිය සහ ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදනය, ආර්ථිකයේ ව්‍යුහාත්මක වෙනස්කම් වැනි දර්ශක රාශියක් පාවිච්චි කරනවා. ආර්ථිකය ලැග සිටිනවාද, ඉදිරියට ගමන් කරනවාද, පිටු පසට ගමන් කරනවාද යනාදිය තේරුම් ගැනීම සඳහා මේ දර්ශක පාවිච්චි කරනවා. බැංකු අංශයේ ප්‍රගතිය මැන බලන ලෝකයේ බැංකුකරුවන් විසින් පිළිගත් දර්ශකයන් තිබෙනවා. එකක් තමයි ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතිකය. මෙය 2005 දී සියයට 13.4යි තිබුණේ. 2013 දී සියයට 16.3 දක්වා ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතිකය ඉහළ ගොස් තිබෙනවා. ඒ නිසා බැංකු ක්‍රමය කඩා වැටිලා ප්‍රාග්ධනය පිළිබඳ ගැටලු ඇති වුණු අවස්ථා අපි දකිනවා. ඩිංගිරි බණ්ඩා විජේතුංග මැතිතුමා මුදල් අමාත්‍යවරයාව සිටි කාලයේදී මම ළමා මන්ත්‍රීවරයෙක් ලෙස පාර්ලිමේන්තුවේ විපක්ෂයේ ඉඳලා තිබෙනවා. රාජ්‍ය බැංකු දෙකම -ලංකා බැංකුවත්, මහජන බැංකුවත්- බංකොලොත් කියලා එතුමා එදා මේ පාර්ලිමේන්තුවේදී කිව්වා. දැවැන්ත ආන්දෝලනයක් ඇති වුණා. මොකද අපේ රටේ තිබෙන ප්‍රධාන බැංකු දෙක බංකොලොත් වුණාට පස්සේ ණයවර ලිපියක් - Letter of Credit - open කළොත් ඒ ණයවර ලිපියට වෙන රටවල් ගරු කරන්නේ නැහැ. එහෙම ගරු නොකළොත් අපට ඛනිජ තෙල් ගේන්න බැහැ. ඛනිජ තෙල්වලට විශාල බිලක් ගෙවද්දී, මුදල් ඇමතිතුමා එවැනි ප්‍රකාශයක් කිරීම ගැන එදා විපක්ෂයේ හිටපු අපි සියලු දෙනා ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ නායකත්වයෙන් තදබල ලෙස විරුද්ධ වුණා.

පෞද්ගලීකරණය අසාර්ථක වූ නමුත් රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යතුමාත් රාජ්‍ය බැංකු සම්බන්ධයෙන් දැක්ක එකම ප්‍රතිපත්තිය වුණේ, රාජ්‍ය බැංකු අවශ්‍යයෙන්ම පෞද්ගලීකරණය කරලා ඉවර කරන්න ඕනෑ; රජයට බැංකු තියා ගෙන ඉන්න බැහැ කියන එකයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඒ කාලයේ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ කැබිනට් ඇමතිවරයා සහ මුදල් නියෝජ්‍ය ඇමතිවරයා ලෙසයි සිටියේ. ඒ අවස්ථාවේ එතුමා මගේ ළඟට විදේශීය විශේෂඥයෙක් එව්වා, මහජන බැංකුව පෞද්ගලීකරණය කරන්න කොහොම හරි අප කැමැති කර ගන්න කියලා. හොඳ වෙලාවට මගේ සහායට එවකට මහජන බැංකුවේ සිටියා ලාල් නානායක්කාර කියලා ආණ්ඩුව පත් කළ සභාපතිවරයෙක්. එතුමා වරලත් ගණකාධිකාරිවරයෙක්. එතුමා මේ රටට ආදරය කරන, වැදගත්, උගත්, විද්වතකු ලෙස මොන ලෙසකින්වත් මහජන බැංකුව පෞද්ගලීකරණය කරන්න ඉඩ දෙන්න එපා කියන මතයේ මාත් සමඟ සිටියා. ඒ නිසා ලාල් නානායක්කාර මැතිතුමාත් අපිත් බොහොම අමාරුවෙන් මහජන බැංකුව පෞද්ගලීකරණය කිරීම නතර කර ගත්තා. නමුත් ලංකා බැංකුවයි, මහජන බැංකුවයි දෙකටම භාණ්ඩාගාරයෙන් අරමුදල් සපයලා, ප්‍රාග්ධන සංචිතය ඉහළ නංවලා ප්‍රාග්ධන අනුපාතය පවත්වා ගෙන ගියා. අද එවැනි තත්ත්වයක් ඇති වෙලා නැහැ. ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය සියයට 13.4 සිට 16.3 දක්වා වර්ධනය වෙලා තිබෙනවා. ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය 2005 දී තිබුණේ සියයට 31.7යි. අද ඒක සියයට 37.4 දක්වා වර්ධනය වෙලා තිබෙනවා. ද්‍රවශීලතාව පිළිබඳ ගැටලුවකට සමස්ත බැංකු ක්‍රමය මුහුණ දෙන්නේ නැහැ. ඉල්ලූ විටෙක සියලු අවශ්‍යතා ඉෂ්ට කිරීම සඳහා ගෙවීම් ශක්තිය තිබෙන හොඳ ද්‍රවශීලතා මට්ටමක් බැංකු පද්ධතිය විසින් පවත්වා ගෙන යනවා. අක්‍රිය ණය අනුපාතය, -ගෙවන්නේ නැතුව තිබුණු ණය ප්‍රමාණය- සියයට 7.1යි. ඒ ගැන 1980 ගණන්වල මේ ගරු සභාවේ විශාල විවාදයක් ඇති වුණා. පොතකුත් මුද්‍රණය කරලා තිබෙනවා, "බැංකු දෙකම බංකොලොත්" කියලා. ඒ කාලයේ ආණ්ඩුව හිතවතුන්ට තොග වශයෙන් ණය දීලා, ඒ ණය නොගෙවූ අයගේ නාමලේඛනයක් මම විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් මේ ගරු සභාවේ සභාගත කරලා තිබෙනවා. ඒකට සම්බන්ධ ප්‍රබල දේශපාලනඥයන් සිටියා. හර්ෂ ද සිල්වා නවක ගරු මන්ත්‍රීතුමා දන්නේ නැහැ ඒ කාලයේ කොහොමද බැංකු ක්‍රමය දේශපාලනය සඳහා භාවිත කළේ කියලා. ඒවා හැන්සාඩ් වාර්තාවල තිබෙනවා. "බැංකු දෙකම බංකොලොත්" කියලා පොතක් තිබෙනවා. ඒ පොත අරගෙන බැලුවොත් මේ කරුණු දැන ගන්න පුළුවන්. මේ පාර්ලිමේන්තුවේ විවාදවලදී කියැවුණු නම් එහි සඳහන් වෙලා තිබෙනවා. රාජ්‍ය බැංකුවලින් හිතවතුන් ගත්ත ණය ආපසු අය කර නොගැනීම සම්බන්ධයෙන් නීත්‍යානුකූල ක්‍රියා මාර්ග ගත්තේ නැහැ. නමුත් 2005දී අක්‍රිය ණය අනුපාතය තිබුණේ සියයට 7.1ට. අද ඒ අක්‍රිය ණය අනුපාතය සියයට 5.6 දක්වා අඩු වෙලා තිබෙනවා.

ඊළඟට, හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය. එය 2005 දී තිබුණේ සියයට 16.4ට. 2013දීත් සියයට 16 මට්ටමේ තිබෙනවා. වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය 2005 දී තිබුණේ සියයට 1.2ට. අද ඒක සියයට 1.3 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ අනුව ගරු නියෝජ්‍ය කථානායකතුමනි, න්‍යායාත්මකව බැංකු අංශයේ ප්‍රගතිය මැන බලන දර්ශක වන ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය සියයට 13.4 සිට සියයට 16.3 දක්වාත්, ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය සියයට 31.7 සිට සියයට 37.7 දක්වාත් වැඩි වෙලා තිබෙනවා. අක්‍රිය ණය අනුපාතය 7.1 සිට 5.6 දක්වා අඩු වෙලා, හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය සියයට 16 මට්ටමේ පැවැතිලා, ව්‍යවස්ථාපිත වත්කම්වලට ලැබෙන ප්‍රතිලාභ අනුපාතය 1.2 සිට 1.3 දක්වා වර්ධනය වෙලා, බැංකු අංශයේ කාර්යක්ෂමතාව හා ප්‍රගතිය මැන බලන දර්ශක සියල්ලේම ඉතාම හොඳ ප්‍රගතියක් වාර්තා කරලා තිබෙනවා. මෙහි ප්‍රතිඵලයක් ලෙස, සමස්ත ආර්ථිකය තුළ බැංකු අංශයේ යහපත් ක්‍රියාකාරිත්වයක් ඇති කරන්න අවශ්‍ය කරන වෙනස්කම් පිළිබඳව බැංකු ක්ෂේත්‍රය හා සම්බන්ධිත විද්වතුන්

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

විසින් විටින් විට විවිධ කරුණු කාරණා පුළුල් ලෙස සාකච්ඡා කරලා යෝජනා කරලා තිබෙනවා. එවැනි යෝජනාවක් තමයි දැන් ඉදිරිපත් වෙලා තිබෙන්නේ. වඩා ශක්තිමත් බැංකු ඒකකයක් ඇති කිරීම සඳහා, වෙන් වෙන්ව ක්‍රියාත්මක වන ආයතන තුනක් ඒකාබද්ධ කිරීමේ යෝජනාව. වාණිජ බැංකු ස්වරූපයේ තනි බැංකු ඒකකයක් ස්ථාපිත කිරීම තුළින් ප්‍රාග්ධන වත්කම් අනුපාතිකය ඉහළ නංවා, වඩාත් ඉහළ ආයෝජන සඳහා අවශ්‍ය කරන මූල්‍ය සම්පත් සම්පාදනය කරන්නට අවශ්‍ය වන වඩා ඵලදායී විසඳුමකට යන්නත් අද ඇති කරන සංශෝධනයෙන් හැකි වෙන බව තමයි රජය වශයෙන් අපි අදහස් කරන්නේ.

අපි කවුරුත් පිළිගන්නවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලෝකයේ හැම රටකම ආර්ථිකය පවත්වා ගෙන යන්නේ ණය මත බව. කුටුම්බයක් ගත්තත්, ආයතනයක් ගත්තත්, සමාගමක් - ඒ සමාගම පෞද්ගලික සමාගමක් වුණත්, පොදු සමාගමක් වුණත් - ගත්තත්, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ගත්තත්, රජය ගත්තත්, ඒවා ණය මත තමයි පවත්වා ගෙන යන්නේ. ව්‍යාපාරයක් ගත්තොත් අධිතෝලන, අවතෝලන හා සමතෝලන ප්‍රාග්ධන ව්‍යුහයක් තිබෙනවා. අයිතිකරුවන්ගේ ප්‍රාග්ධනයට ණය ප්‍රාග්ධනය සමාන වෙනවා නම්, ඒක සමතෝලනය. අයිතිකරුවන්ගේ ප්‍රාග්ධනයට වඩා ණය ප්‍රාග්ධනය වැඩි නම්, ඒක අධිතෝලනය. අයිතිකරුවන්ගේ ප්‍රාග්ධනයට වඩා ණය ප්‍රාග්ධනය අඩු නම්, ඒක අවතෝලනය. ඒ විධියට තෝලන වර්ග තුනක් තිබෙනවා. බොහෝ ව්‍යාපාර ආයතනවල තිබෙන්නේ අධිතෝලනයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමන් ඉතුරු කළ ප්‍රමාණයෙන් පමණක් ව්‍යාපාරයක් ගොඩ නඟපු ව්‍යාපාරිකයෙක් ලංකාවේවත්, ලෝකයේ වෙන රටකවත් නැහැ. කෙනෙක් ගත්තත්, කුටුම්බයක් ගත්තත්, රටක් ගත්තත්, ඉතුරුම් හා ආයෝජන අතර පරතරයක් තිබෙනවා. පුද්ගලයෙක් ගත්තත්, ආයතනයක් ගත්තත්, රජය ගත්තත්, ඉතුරුම් පහළ මට්ටමේ තිබෙන කොට ආයෝජනය ඊට වඩා ඉහළ මට්ටමෙන් තිබෙනවා නම්, ඉතුරුම් හා ආයෝජන අතර පරතරය පියවීම සඳහා අපි කැමැති වුණත්, අකමැති වුණත් ණයක් ගන්න සිද්ධ වෙනවා. කුටුම්බයක් - පවුලක් - ගත්තොත්, අපේ රටේ කුටුම්බයක සාමාන්‍ය සාමාජික සංඛ්‍යාව 3.4ක් වෙනවා. හතර දෙනෙක් කියලා සාමාන්‍යයෙන් කියන්න පුළුවන්. කුටුම්බයක් කියන්නේ පවුල් ඒකකයක්; එකට ඉවුම් පිහුම් කෙරෙන ස්ථානයක්; එක හැලියේ බත් කන ස්ථානයක්. Household කියලා කියන්නත් පුළුවන්. අපේ කුටුම්බයක ඉතුරුම් තිබෙන්නේ මසකට රුපියල් 10,000ක් නම්, - මසකට රුපියල් 10,000ක් ඉතුරු කරන්න පුළුවන් ලංකාවේ පවුල් ඉතාම සීමිතයි. මොකද, එදිනෙදා ජීවත් වීම සඳහා වැඩි පිරිසක් ජීවිතය සමඟ අරගලයක යෙදෙනවා. ඒ නිසා ඔවුන්ට නිර්ඉතුරුම් තිබෙන්නේ; ඉතුරුම් නැහැ. පවුලේ මාසික ආදායම රුපියල් 10,000ක් නම්, ඒ පවුල මසකට රුපියල් 20,000ක් වියදම් කරනවා නම්, අනිවාර්යයෙන්ම රුපියල් 10,000ක ණයක් ලබා ගන්න වෙනවා. ඇති වෙන විශේෂිත තත්ත්වයන්හිදී ණය අවශ්‍යතාව මීට වඩා වැඩි වෙනවා. එතකොට, පරිභෝජන නොවන හදිසි අවශ්‍යතා වෙනුවෙන් ණය ගන්නවා. අද අපට අසනීපයක් ඇති වෙලා පෞද්ගලික රෝහලකට ගියොත්, එක රාත්‍රියක් ගත කරලා එනකොට නැවත අසනීපයක් ඇති වෙලා රෝහලට ඇතුළු වෙන්න සිදු වෙනවා, බිල දැක්කාම. නිදහස් සෞඛ්‍ය සේවයේ තිබෙන වැදගත්කම, සාමාන්‍යයෙන් ලෙඩ නොවන අයට තේරෙන්නේ නැහැ. ලෙඩ නොවී විවේචනය කරන අයට තේරෙන්නේත් නැහැ. සාමාන්‍යයෙන් රුපියල් ලක්ෂ භාගයකින් තමයි බිල පටන් ගන්නේ, පෞද්ගලික රෝහල්වල.

ලේඩි රිජ්වේ ළමා රෝහලේ නේවාසික දරුවන් සඳහා ගරු මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමා ඇතුළුව විශේෂඥ වෛද්‍යවරුන්ගේ ඉල්ලීම මත, කැබිනට් අනුමැතිය ඇතිව අපි රෝහල තුළ පාසලක් ආරම්භ කළා. ඒ පාසලේ ආබාධිත දරුවෙක් සිටියා. ඒ දරුවා රෝද පුටුවෙන් යන්නේ, අත පය පණ නැහැ. ඔහුට විභාගයට ලියන්න බැහැ. රෝද පුටුවකින් යන ආනන්ද විද්‍යාලයේ ඒ දරුවාට ඔහුගේ ගුරුතුමිය උගන්වලා ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 186ක් ලබාගෙන විශිෂ්ටයෙක් බවට පත් වුණා. රෝහල තුළ පාසලක් ආරම්භ කරන කොට බොහෝ අය අපට හිනා වුණා. නමුත් ඒ අසරණ දරුවාට තමන්ගේ ජීවිතය ගොඩ ගැනීමේ කාර්ය ඉෂ්ට කරගෙන විශිෂ්ටයෙක් බවට පත් වෙන්න පුළුවන්කම ලැබුණේ රෝහල තුළ අපි පාසල ආරම්භ කළ නිසයි. ඒ වාගේම ලියුකේමියා රෝගය වැළඳිලා පසුව සුව වන දරුවෝ පිළිකා රෝහල තුළ ඉන්නවා. ජාතික අධ්‍යාපන ආයතනය එතැනත් පාසලක් විවෘත කරලා තිබෙනවා. "මේ රටේ සිර ගෙවල්වල ඉන්නේද මනුෂ්‍යයෝය" කියන පදනම යටතේ වටරැක සිර ගෙවල් තුළ අපි පාසල් ආරම්භ කරලා තිබෙනවා.

මම කියමින් සිටියේ රෝහලකට ගිහිල්ලා ගෙවීම් කරන්න වුණොත්, විවාහයක් හෝ වෙනත් උත්සව කටයුත්තක් හදිසියෙන් යෙදුණොත්, මරණයක් වැනි දුක්ඛ දෝමනස්සයකට මුහුණ දෙන්න සිදු වුණොත් ඒ කුටුම්බයට ලැබෙන ආදායම හා ඉතුරුම් ප්‍රමාණවත් නැත්නම් ණය ගන්න සිද්ධ වෙනවා. එතකොට රටක ණය පොලිය අඩු වුණොත් තමයි ඔහුට තිබෙන ප්‍රධානම වාසිය, ඒ පවුලට, තමන්ගේ ජීවිතයට වන හොඳම වාසිය ලැබෙන්නේ. අපි දන්නවා, ණය ගන්න හුහක් ඇප ඉදිරිපත් කරන්න බැරි සාමාන්‍ය කුටුම්බවලට බැංකු ආයතන හා වෙනත් මූල්‍ය ආයතනවලින් ණය ගන්න බැරි බව. ඒ නිසා තමයි ඇප නැතුව පුද්ගලයන්ගේ දක්ෂතා, කුසලතා හා නිර්මාණාත්මක හැකියාවන් ඇපයට තබාගෙන සහනදායී පොලී අනුපාත යටතේ ණය දෙන්න ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා අලුතින් දිවි නැඟුම බැංකු ක්‍රමය ආරම්භ කරලා තිබෙන්නේ.

ග්‍රාමීය ණයගැතිකමේ ප්‍රශ්නයක් තිබෙනවා. සංවිධිත මූල්‍ය ආයතනවලින් ණය ගන්න බැරි වෙන කොට ඔවුන් ගිනි පොලීකාරයන්ගෙන් ණය ගන්නවා. ගිනි පොලීකාරයන් ගමේ කඩයකින් ණය දෙන කොට, පොලී මුදලාලි කෙනෙක් ණය දෙන කොට, සීට්ටුකාරයෙක් ණය දෙන කොට ඔවුන් ණය දෙන්නේ මාසයකට සියයට 10 පොලියට. මාසයකට සියයට 10 පොලිය කියන්නේ අවුරුද්දක පොලිය සියයට 120යි. ඒක තමයි ඒ පවුලේ ලොකුම බර බවට පත් වෙන්නේ. සියයට 120 පොලියට ණය ගත්තාම, ඒ ණය ගෙවන්න ඊට වඩා වැඩි පොලියකට ණය ගන්න සිද්ධ වෙනවා. සමහර විට එතැනදී ණය ගෙවා ගත නොහැකි වුණු මිනිස්සු සමාජයට මුහුණ දෙන්න බැරි නිසා එල්ලිලා මැරිලා තමන්ගේ ජීවිතය නැති කර ගන්නවා.

මම මේ ටික කියන්න ලැහැස්ති වුණේ මේකයි. අපි මහා කරුණාවෙන් පොලී අනුපාතය අඩු කරන කොට, එක්සත් ජාතික පක්ෂය ඉතාම නිර්ලජ්ජිත ලෙස ජනතාව මුළා කිරීම සඳහා අපි පොලිය වැඩි කරනවා කියන ප්‍රකාශයක් ඡන්දය සඳහා යොදා ගන්න බලාපොරොත්තු වෙනවා. ඕනෑම රටක දශමයක හෝ ආර්ථික විඥානයක් තිබෙන මනුෂ්‍යයෙක් පිළිගන්නා, ලෝකයේ පිළිගත් ආර්ථික න්‍යාය තමයි රටක පොලී අනුපාතය තනි ඉලක්කමේ සංඛ්‍යාවක් වෙන්න ඕනෑය කියන එක. අන්තර්ජාලයට ගිහිල්ලා බලන්න, ඕනෑම රටක එහෙමයි. මහජන චීනය, දකුණු කොරියාව, ජපානය, සිංගප්පූරුව, මැලේසියාව, ඒ කිසිම රටක double-digit interest rate එකක් -ඉලක්කම් දෙකේ පොලී අනුපාතයක්- නැහැ. පොලී අනුපාතය තනි ඉලක්කමේ තිබීම රටක ආර්ථික සංවර්ධනයට හා මිනිස්සු මත තිබෙන පීඩනය අඩු කරන්න තිබෙන අත්‍යවශ්‍ය කොන්දේසියක් වෙනවා. ඒක මුළු ලෝකයම භාවිත කරන ආර්ථික සංවර්ධනයක් හෝ ආර්ථිකයක් යහපත්ද කියා මැනීමේ එක නිර්ණායකයක්. රටක ආර්ථික වර්ධන

වේගය ඉහළ මට්ටමක පැවතීම, ඒක පුද්ගල ආදායම වර්ධනය වීම, උද්ධමනය තනි ඉලක්කමේ සංඛ්‍යාවක් බවට පත් වීම, පොලී අනුපාතය තනි ඉලක්කමේ සංඛ්‍යාවක් බවට පත් වීම, විරැකියාවේ අනුපාතය තනි ඉලක්කමේ සංඛ්‍යාවක් බවට පත් වීම කියන ඒවා තමයි ලෝකයේ ඕනෑම රටක ඉන්න ඕනෑම ආර්ථික විශේෂඥයෙක් ආර්ථිකය නිවැරදි ගමන් මඟක යෙදිලාද කියා බලන දර්ශකය. මූල්‍ය කළමනාකරණය යහපත් වෙලා, උද්ධමනය පාලනය කරලා ස්ථාවර තත්ත්වයක් තිබෙනවා නම් පමණයි රටේ පොලී අනුපාතය තනි ඉලක්කමේ සංඛ්‍යාවක් බවට පත් වෙන්නේ. ඒකයි ජපානයේ පොලී අනුපාතය තනි ඉලක්කමක් වෙලා තිබෙන්නේ, ඒකයි මහජන චීනයේ පොලී අනුපාතය තනි ඉලක්කමක් වෙලා තිබෙන්නේ, ඒකයි දකුණු කොරියාවේ පොලී අනුපාතය තනි ඉලක්කමක් වෙලා තිබෙන්නේ, ඒකයි මැලේසියාවේ පොලී අනුපාතය තනි ඉලක්කමක් වෙලා තිබෙන්නේ, ඒකයි සිංගප්පූරුවේ පොලී අනුපාතය තනි ඉලක්කමක් වෙලා තිබෙන්නේ. තනි ඉලක්කමේ පොලියක් තිබෙන කොට තමයි සමස්ත මිල මට්ටමේ පීඩනය හා ඒ ඒ පවුලේ තිබෙන ජීවන වියදමේ පීඩනය අඩු කරන්න පුළුවන් වෙන්නේ. පවුලක් - කුටුම්බයක්- ගත්තොත් ඒ අය එක්කෝ නිවාස ණයක් අරගෙන තිබෙනවා; එහෙම නැත්නම් ආපදා ණයක් අරගෙන තිබෙනවා; එහෙම නැත්නම් වෙනත් කල් පවතින පරිභෝජන භාණ්ඩ ගන්න ණයක් අරගෙන තිබෙනවා; එහෙම නැත්නම් කුලී සින්නක්කර ක්‍රමයට ණයක් අරගෙන තිබෙනවා. ණය නොවුණු පවුලක් කොහේද තිබෙන්නේ? මේ රටේ අනිමහත් පවුල් ප්‍රමාණයක් ණය අරගෙන තිබෙනවා. ගෙයක් හදනකොට ණයක් ගන්නවා; වාහනයක් ගන්නකොට ණයක් ගන්නවා; කල් පවතින පරිභෝජන භාණ්ඩයක් ගන්නකොට ණයක් ගන්නවා. ණය නැති පවුල කවුද? මේ රටේ ඉන්න ධනපති පවුල් විතරයි ණය නැත්තේ. ඉහළ මධ්‍යම පන්තියත් ණය අරගෙනයි තිබෙන්නේ. පහළ මධ්‍යම පන්තිය හා දිළිඳු හැම කෙනෙක්ම ණයයි. ඒ නිසා ඒ පවුලට සහනයක් වෙන්න නම් කරන්න තිබෙන්නේ පොලී අනුපාතය අඩු මට්ටමක් යටතේ පවත්වාගෙන යාමයි.

ඊළඟට, යම් කිසි පුද්ගලයෙක් රක්ෂාව කරලා ඉතුරු කළාය කියා අපි හිතමු. අපේ රටේ දාහතර ලක්ෂයක් දෙනා රජයේ සේවකයෝ. හැට ලක්ෂයක් පමණ පෞද්ගලික අංශයේ සේවකයෝ. අපි හිතමු, එක පුද්ගලයෙක් මාසයකට රුපියල් පනස් දාහක් ඉතුරු කළාය කියා. එහෙම වෙන්නේ නැහැ, නමුත් අපි හිතමු. මාසයකට රුපියල් පනස් දාහක් නම් අවුරුද්දකට ඉතුරු කරන්න පුළුවන් වෙන්නේ රුපියල් ලක්ෂ හයයි. අවුරුදු දහයක් ඉතුරු කළොත් රුපියල් ලක්ෂ හැටයි ඉතුරු කරන්න පුළුවන් වෙන්නේ. ඒ, පොලියක් නැතිවයි. අවුරුදු විස්සක් ඉතුරු කළොත් රුපියල් ලක්ෂ එකසිය විස්සක් ඉතුරු කරන්න පුළුවන් වෙනවා. අවුරුදු විස්සක් මාසයකට රුපියල් පනස් දාහ බැගින් අඛණ්ඩව ඉතුරු කළොත් රුපියල් ලක්ෂ එකසිය පනහක් ඉතුරු කර ගන්න පුළුවන්, පොලියත් එක්ක. අද කොළඹ නගරයේ පර්චස් එකක් රුපියල් ලක්ෂ හැත්තෑවයි. එතකොට මේ මුළු අවුරුදු විස්සම ඉතුරු කළොත් ඒ මුදල්වලින් කොළඹ නගරයෙන් පර්චස් දෙකයි ගන්න පුළුවන්. රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව තිබෙන බේරේ වැව කිට්ටුවෙන්, එහෙම නැත්නම් ගෝල්ෆේස් එක කිට්ටුවෙන් ගන්නවා නම් පර්චස් එකක් රුපියල් ලක්ෂ හැත්තෑවක්, ලක්ෂ අසූවක් විතර වෙනවා. ඉතින් පර්චස් දෙකක් ගන්න පුළුවන් වෙන්නේ මුළු කාලයේම -

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කරුණාකරලා මට විනාඩි දහයක් දෙන්න. මම මේ පොඩි theory එකක් විස්තර කරගෙන ආවේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
එහෙම නම් ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා දැනුවත් කරන්න වෙනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
හරි, විනාඩි පහකින් මගේ කථාව අවසන් කරන්නම්.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
විනාඩි දෙකකින් අවසන් කරන්න, ගරු ඇමතිතුමනි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
හරි, විනාඩි පහකින් අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ආයතනයක් ගත්තත් එහෙමයි. සුළු පරිමාණ කර්මාන්තකරුවෙක්, මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවෙක්, සිල්ලර වෙළෙන්දෙක්, තොග වෙළෙන්දෙක් වුණත් OD එකක් ගන්නවා, බැංකු ණයක් ගන්නවා. එහෙම නැති ව්‍යාපාරය මොකක්ද කියන්නය කියා මම කියනවා. ඒ නිසා ඔහුගේ ඒ සියලුම පොලිය, ඔහුගේ ලාභ අලාභ ගිණුමට හර වෙනවා. ලාභ අලාභ ගිණුමට හර වුණාම ශුද්ධ ලාභය අඩු වෙනවා. ශුද්ධ ලාභය අඩු වෙන එක නැති වෙන්න නම් ලාභ අලාභ ගිණුමට පොලිය අඩු වී හර වෙන ප්‍රමාණය අඩු වෙන්න ඕනෑ. එතකොට තමයි බඩු මිල අඩු කර ගන්න පුළුවන්කම තිබෙන්නේ. නිෂ්පාදන ආයතනයක් වුණත්, ඕනෑම ෆැක්ටරියක් වුණත් අමු ද්‍රව්‍ය සහ වෙනත් යෙදවුම් සඳහා ණය ගන්නවා. යන්ත්‍ර සූත්‍ර සඳහා ණය ගන්නවා. පොලිය අඩු වුණොත් ලාභ අලාභ ගිණුමට හර වෙන ප්‍රමාණය අඩු වෙනවා. ඒ නිසා ජීවන වියදමේ ප්‍රශ්නයට, බඩු මිලේ ප්‍රශ්නයට උත්තරයක් හොයනවා නම් ඒකට උත්තරය තිබෙන්නේ පොලී අනුපාතය තනි ඉලක්කමේ සංඛ්‍යාවක් ලෙස පවත්වාගෙන යාමයි. ලංකාවට නිදහස ලැබුණායින් පසුව ඉතා විශාල උත්සාහයක් දරා තිබෙනවා, පොලී අනුපාතය තනි ඉලක්කමේ සංඛ්‍යාවක් බවට පත් කරන්න.

ඊළඟට, රජය තමයි වැඩිම ණය ගන්න කෙනා. රජයේ පොලී අනුපාතය අඩු වුණාම රාජ්‍ය ණයවලින් ඉතා විශාල මුදලක් ඉතුරු වෙනවා. බැංකුවලට ගෙවන පොලී ප්‍රමාණය අඩු වෙනවා. ඒ නිසා කුටුම්බයකට ගත්තත්, කර්මාන්තයකට ගත්තත්, ව්‍යාපාරයකට ගත්තත්, රජයට ගත්තත් ඕනෑම ආයතනයකට පොලී අනුපාතය අඩු වීම තමයි සහනය. ඒක තමයි ඇත්ත සහනය. නමුත් නිලා කුරු සංවර්ධනයකින් එවැනි දෙයක් වෙන්නේ නැහැ. මොකද, නිදහසින් පසුව දීර්ඝ කාලයක් අපේ රටේ ඇති වෙලා තිබෙන්නේ, නිලා කුරු සංවර්ධනයක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නිලා කුරක් පත්තු කරනකොට ඉතාම දර්ශනීය එළියක් කෙටි වේලාවක් තුළදී දකින්න පුළුවන්. ටික වෙලාවකට පසුව බැලුවාම රත් වේවල පොඩි යකඩ කූරක් තමයි අතේ ඉතුරු

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

වෙලා තිබෙන්නේ. ඒක තමයි නිලා කුරු සංවර්ධනය කියන්නේ. අද මහින්ද රාජපක්ෂ රජය යටතේ තිබෙන්නේ, දොළොස් මහේ පහන වාගේ උපනුපන් පරම්පරාවලට එළිය දෙන සංවර්ධන මාවතකට මේ ආර්ථිකය අවතීර්ණ කර තිබෙනවා. නිලා කුරු සංවර්ධනය වෙනුවට දොළොස් මහේ පහනේ සංවර්ධනය නිසා පොලී අනුපාතය තනි ඉලක්කමකට ගෙනෙන්නත්, බැංකු ක්‍රමයේ වත්කම් වැඩි කරන්නත්, ණය වැඩි කරන්නත්, ආයෝජනය වැඩි කරන්නත් පුළුවන්කම ලැබී තිබෙනවා. ඒක යහපත් මූල්‍ය ප්‍රවණතාවක්. ඒ ප්‍රවණතාව තුළ මේ ආයතන ඒකාබද්ධ කිරීමෙන් එය තවත් ශක්තිමත් වෙන බව විශ්වාස කරන අතර, මට වැඩි වෙලාවක් ලබා දීම ගැන ඔබතුමාට ස්තුති කරමින් මගේ කථාව අවසන් කරනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(*பிரதிச் சபாநாயகர் அவர்கள்*)
(The Deputy Speaker)
ඊළඟට ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා.

[අ.භා. 3.54]

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(*மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி*)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම ගරු බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමාගේ ආර්ථික විද්‍යාව පාඩමෙන් පස්සේ මෙම විවාදයට සම්බන්ධ වෙන්න ලැබීම ගැන මා සන්තෝෂ වනවා. එතුමාගේ කථාව අවසානයේ ඉතා පැහැදිලිව කිව්ව එක දෙයක් තිබෙනවා. අවසානයේ එතුමා කියනවා, නිලා කුරු සංවර්ධනය නොවෙයි වටින්නේ, දොළොස් මහේ පහන වාගේ තිබෙන මහින්ද රාජපක්ෂ මහත්මයාගේ සංවර්ධනයයි වටින්නේ කියලා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(*மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்*)
(The Hon. Alhaj A.H.M. Azwer)
හරියට හරි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(*மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி*)
(The Hon. Sunil Handunnetti)
තිබෙන ප්‍රශ්නය මෙකයි. තමුන්නාන්සේලා ඒ දොළොස් මහේ පහන දල්වා ගෙන සිටියාට, රටේ ජනතාව හම්බ කරන දේවල්වලින් තමයි ඒ පහනට තෙල් දමන්න සිද්ධ වෙලා තිබෙන්නේ. පහන පත්තු වෙන්න තෙල් දමන්න සිද්ධ වෙලා තිබෙන්නේ අපේ රටේ ජනතාවටයි. ඒ ජනතාවට ඒක දරා ගන්න බැරි වෙලා තිබෙනවා. ඒ නිසා තමයි, අපේ පාර්ලිමේන්තුව වටේට ආරක්ෂක වැටවල් තර කර ගෙන අද පාර්ලිමේන්තුව රැස් වෙලා විවාදය කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. අපි දැක්කා, ඊයේ දවසේ කොළඹ නගරය පුරා දැවැන්ත විරෝධතා පවත්වපු ආකාරය. අදත් අපි දකිනවා, විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ, වෘත්තීය සමිති ව්‍යාපාර පාරේ විරෝධතා ව්‍යාපාර පවත්වනවා. ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේලාගේ සංවර්ධනය දොළොස් මහේ පහන වාගේ දැල්වෙනවා නම්, ඒ දැල්වෙන සංවර්ධනයේ ප්‍රතිලාභ ජනතාවට ගිහින් තිබෙනවා නම් ජනතාවට සිද්ධ වන්නේ නැහැ, මහ පාරවල විරෝධතා දක්වන්න. හැබැයි ඒ දොළොස් මහේ පහනට තෙල් දමන්න සිද්ධ වෙලා තිබෙන්නේ රටේ ජනතාවටයි. රටේ ජනතාවට එදා වේල හම්බ කර ගෙන ජීවත් වන්න බැරි ආර්ථිකයක් හදා තිබෙන නිසා තමුන්නාන්සේලාගේ පහනට තෙල් දමන එක ඒ අයට අමාරු වෙලා තිබෙනවා. රටේ ජනතාව තමුන්නාන්සේලාගේ පහනට තෙල් දමන්නේ සහනදායී ආර්ථිකයක් ඇතුළේ නොවෙයි. අන්න ඒක තේරුම් ගන්න ඕනෑ, මුලින්ම.

ඊළඟට, මේ මාතෘකාවට අදාළව කථා කළොත්, අද ඉදිරිපත් කරන මේ පනත් කෙටුම්පත තුළින් ඒකාබද්ධ කිරීමක් තමයි කරන්නේ. අපේ ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා ඉතා පැහැදිලිව කිව්වා, මේ ඒකාබද්ධ කිරීම, වාණිජ බැංකුවක් නිර්මාණය කිරීම සඳහා සිද්ධ කෙරෙන ඒකාබද්ධ කිරීමක්ය කියලා. ප්‍රශ්නය තිබෙන්නේ, සංවර්ධන බැංකුවක් නැති කරලා වාණිජ බැංකුවක් හදන එක ගැනයි. මහින්ද චින්තනයේ ප්‍රතිපත්තිය රාජ්‍ය බැංකු ආරක්ෂා කිරීමයි. මහින්ද රාජපක්ෂ මහත්මයා - ජනාධිපතිතුමා - බොහෝ විට කථා කරන කොට පපුවට ගහ ගෙන කියනවා, "අපි මේ ආර්ථිකය පෞද්ගලීකරණය කරන්නේ නැහැ, පෞද්ගලීකරණය කරපු එක ආයතනයක් තිබෙනවා නම් කියන්න"යි කියලා. ඒක ඇත්ත. පෞද්ගලීකරණය කියලා පරණ ක්‍රමයට විකුණා ගෙන කන එක නම් දැන් කෙරෙන්නේ නැති බව ඇත්තයි. හැබැයි මේ කරන්නේත් ඒකම තමයි. පෞද්ගලීකරණය කරන්නේ නැහැයි කියලාත්, පෞද්ගලීකරණය නොවෙයි කරන්නේ කියලාත් කරන්නේ පෞද්ගලීකරණයම තමයි. අන්න එතැනයි ගැටලුව තිබෙන්නේ. පෞද්ගලීකරණය කරපු එක ආයතනයක් පෙන්වන්නය කියා කියනවා.

ඉඩම් ටික විකුණන්නේ නැහැයි කියනවා. ඊයේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා, ඉඩම් විකිණීම සීමා කිරීමේ පනත් කෙටුම්පතක්. හැබැයි ඉඩම් විකිණීම සීමා කිරීමේ පනත් කෙටුම්පත ගෙනැවිත් කරන්නේ මොකක්ද? විදේශිකයින්ට, විදේශීය සමාගම්වලට, කොම්පැනිවලට ඉඩම් ගන්න පුළුවන් අවස්ථාවන් ටික හදා දෙන එකයි. පනත් කෙටුම්පත ගෙනෙන්නේ එක නමකින්, කරන්නේ වෙනත් දෙයක්. දැන් අද කරන්නේත් ඒක තමයි. රජයේ ප්‍රතිපත්තිය පෞද්ගලීකරණය කිරීම නොවෙයි. හැබැයි මේ රටේ දීර්ඝ කාලීන සංවර්ධනය සඳහා ණය දෙන්න 1955 දී ඇති කරපු බැංකුව අද තමුන්නාන්සේලා කොම්පැනියක් බවට, සමාගමක් බවට පත් කරනවා. සමාගමක් බවට පත් කරලා නතර වන්නේ නැහැ. ඒ සංවර්ධන බැංකුව සමාගමක් බවට පත් කිරීමේ වුවමනාව මොකක්ද? දැන් මේ ඩීඑෆ්සීසී බැංකුව සමාගමක් බවට පත් කිරීමේ අවශ්‍යතාව තිබෙන්නේ කාටද? වැඩ කරන ජනතාවට ඒ අවශ්‍යතාව තිබෙනවාද? පාරේ උද්ඝෝෂණය කරන ශිෂ්‍යයන්ට ඒ අවශ්‍යතාව තිබෙනවාද? අද තමුන්නාන්සේලා හයේ පාර්ලිමේන්තුව වටේ ආරක්ෂාව තර කර ගෙන ඉන්නවා. පෙළපාළි එන ශිෂ්‍යයින්ට හෝ වැඩ වර්ජනය කරන අයට හෝ උද්ඝෝෂණය කරන අයට හෝ වෘත්තීය සමිතිවලට හෝ රටේ බහුතර ජනතාවට හෝ මාධ්‍යවේදීන්ට හෝ මේ සංවර්ධන බැංකුව සමාගමක් බවට පත් කිරීමේ වුවමනාවක් තිබෙනවාද? නැහැ. කවුද, මේ ආණ්ඩුවට බල කළේ? අපි අහන්නේ ඒකයි. කවුද, මේ ආණ්ඩුවට බල කළේ මේ සංවර්ධන බැංකුව සමාගමක් කරන්නය කියලා? එහෙම කවුරුවත් කියලා නැහැ. එතකොට මෙය කාගේ වුවමනාවක්ද? ආණ්ඩුවත් කියනවා නම් ප්‍රතිපත්තියක් හැටියට ආණ්ඩුව පෞද්ගලීකරණය කරන්නේ නැහැයි කියලා, අපට අහන්න තිබෙන්නේ ඩීඑෆ්සීසී බැංකුව, ඩීඑෆ්සීසී වර්ධන බැංකුව සහ එන්ඩීබී බැංකුව ඒකාබද්ධ කරලා එක සමාගමක් හදලා, ඒ සමාගම්කරණය කිරීමේ අවශ්‍යතාව තිබෙන්නේ කාටද කියලායි. මහින්ද චින්තනයේ පෞද්ගලීකරණය නැහැ, හැබැයි සමාගම්කරණය තිබෙනවා. පෞද්ගලික සමාගම්කරණය තිබෙනවා. ඒකට අවශ්‍ය කරන පාර ඉතා පැහැදිලිව කපා තිබෙනවා. ඒ නිසා දැන් මෙතැන තිබෙන ලොකුම ගැටලුව මොකක්ද?

බන්දුල ගුණවර්ධන ඇමතිතුමා දැන් මේ ගරු සභාවේ සිටියා නම් හොඳයි. එතුමාගේ ආර්ථික විද්‍යා කථාව අස්සේ එතුමා කියපු වැදගත් කාරණා තිබෙනවා. එතුමා බොහොම පැහැදිලිව කිව්වා, එතුමා එක්සත් ජාතික පක්ෂ රජයේ ඇමති ධුරයක් දරද්දී එක්සත් ජාතික පක්ෂයේ රනිල් වික්‍රමසිංහ මහත්මයාලා මහජන බැංකුව පෞද්ගලීකරණය කිරීම සම්බන්ධයෙන් එතුමා වෙත අදහස් පළ කරන්න, යෝජනා දෙන්න, ඒ වෙනුවෙන් හිත හදන්න ආර්ථික උපදේශකයන්, විදේශ උපදේශකයන් එව්වා කියලා. හැබැයි අපි දුටුවා, ඒ දවස්වලත් එතුමා කථා කරපු ආකාරය. එදා එතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා ආණ්ඩු පක්ෂයේ ඉඳන් කථා කරන කොට අපි විපක්ෂයේ සිටියා. එදා එතුමා ආණ්ඩුව පැත්තට ඇවිල්ලා කථා කළේ මහජන බැංකුව පෞද්ගලීකරණය කිරීමේ අවශ්‍යතාව ගැනයි; රාජ්‍ය බැංකු දෙක පෞද්ගලීකරණය කිරීමේ වුවමනාව ගැනයි. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, රේගු දෙපාර්තමේන්තුව, සුරාබදු දෙපාර්තමේන්තුව ඒකාබද්ධ කරලා අධිකාරියක් හැදීමේ අවශ්‍යතාව වෙනුවෙනුයි එතුමා පෙනී සිටියේ. ඒ වන කොට පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ හිටපු එතුමා ඒ එක දවසකවත් කිව්වේ නැහැ, විදේශ නියෝජිතයන් ඇවිල්ලා මට මෙහෙම කියනවා, මගේ හිත හදන්න හදනවා, රනිල් වික්‍රමසිංහ මහත්මයා එසේ නියෝජිතයන් එවා තිබෙනවා කියලා. එතුමා එදා ආණ්ඩුවේ ප්‍රතිපත්තිය වෙනුවෙන් පෙනී සිටියා. එතුමා එදා ඒ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය වෙනුවෙන් පෙනී ඉඳලා ඊට පස්සේ මේ ආණ්ඩුවට එකතු වුණා. මේ ආණ්ඩුවට එකතු වෙලා මොකක්ද කරන්නේ? දැන් එතුමා කියනවා, බැංකු දෙකම බංකොලොත් කියලා එතුමා එදා පොතක් ලිව්වාය කියා. ඒ පොත කියවන්න ලු. අපට දැන් පොත කියවන්න වෙන්නේ බන්දුල ගුණවර්ධන ඇමතිතුමා අමතක කරලායි. පොත විතරයි කියවන්න වෙන්නේ. කර්තෘභාගය අමතක කරන්න අපට සිදු වෙනවා. ඇයි ඒ? අද කර්තෘ අඥාතයි. අඥාතයි නොවෙයි, ඇත්තටම අද කර්තෘ අනාථයි. එතුමාගේ දැනුමත් අනාථයි. සමහර පොත්වල තිබෙනවා නේ 'කර්තෘ අඥාතයි' කියලා. ඒ කියන්නේ 'කර්තෘ කෙනෙකු නැත' කියන එකයි. මේ සම්බන්ධයෙන් අපට දැන් කියන්න වෙන්නේ කර්තෘ අනාථයි කියලායි. එතුමා එදා රාජ්‍ය බැංකු දෙක බංකොලොත් කියලා පොත් ලියලා ඒ කියපු දේට සම්පූර්ණයෙන් පටහැනි, පරස්පර, ප්‍රතිවිරෝධී පැත්තේ වාඩි වෙලා අද මොකද කරන්නේ?

අද ඩීඑෆ්සීසී බැංකුව පෞද්ගලීකරණය කිරීම වෙනුවෙන් කථා කරනවා. 'ඒක හරි' කියලා කියනවා. 'ඒ ප්‍රතිපත්තිය නිවැරැදියි' කියලා කියනවා. අද මේ කරන්නේ මොකක්ද? අද මේ අනුගමනය කරන්නේ රාජ්‍ය බැංකු දෙක විතරක් නොව ඔක්කෝම බැංකු ටික බංකොලොත් කිරීමේ ක්‍රියා මාර්ගයයි. ඔක්කෝම බැංකු ටික බංකොලොත් කිරීමේ ගමන් මාර්ගයේයි මේ යන්නේ. ඉතින් අපට අහන්න වෙන්නේ, 'මොකක්ද හෘදය සාක්ෂිය?' කියලායි. මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරපු සරත් අමුණුගම ඇමතිතුමා ඒ කාලයේ කව්චේරියේ දිසාපතිවරයකු හැටියට සිටින විට, රාජ්‍ය සේවයේ ගෞරවනීය නිලධාරි මහත්මයකු හැටියට සිටින විට රාජ්‍ය සේවය වෙනුවෙන්, රටේ ජාතික ආර්ථිකය වෙනුවෙන්, දේශීයත්වය වෙනුවෙන් පෙනී සිටියා. එහෙම පෙනී සිටි මනුෂ්‍යයෝයි මේ. අද බලන්න හෘදය සාක්ෂිය විකුණපු මිනිස්සු කී දෙනෙක් නම් මේ ආණ්ඩුවේ ඉන්නවාද කියලා. ප්‍රශ්නය වන්නේ, 'ඒ අයගේ පෞද්ගලික කැමැත්තද මේ කියන්නේ?' කියන එකයි.

ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා අද ඇවිල්ලා "එදා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ අපට මෙහෙම කිව්වා, අපි ඒවා පිළිගත්තේ නැහැ, මහජන බැංකුවේ සභාපතිවරයෙක් සිටියා ලාල් නානායක්කාර කියලා, අපි එතුමාත් එක්ක එකතු වෙලා සටනක් කළා." කියා කියන කොට, අද අපට මොකක්ද තේරුම් ගන්න තිබෙන්නේ? මොකද, එතුමා මේ පාර්ලිමේන්තුවේදී නියෝජනය කළේ එහි අනෙක් පැත්තයි. අද අපට අහන්න වෙන්නේත්, මේ පනත් කෙටුම්පත් ගෙනෙන, මේවා වෙනුවෙන් කථා කරන තමුන්නාන්සේලාගේ හෘදය සාක්ෂිය තිබෙන්නේ කොහේද කියලායි. බොහොම පැහැදිලියි, මේ කරන්නේ මොකක්ද කියන එක. අද මේ ආණ්ඩුවට මහින්ද චින්තනයක් නැහැ. චින්තනයකුත් නැහැ; මහින්දත් නැහැ. අද මේ යන්නේ සම්පූර්ණයෙන් එක්සත් ජාතික පක්ෂය ගිය ගමනට වඩා ලොකු ගමනක්; ඊට වඩා එහා ගමනක්. රටේ ඉඩම් ටික විදේශීය කොම්පැනිවලට දෙන ප්‍රතිපත්තිය, රාජ්‍ය බැංකු ටික විකුණන, පෞද්ගලීකරණය කරන ප්‍රතිපත්තිය තමයි අද මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය. මේ ආර්ථිකය විකුණා ගෙන කන ප්‍රතිපත්තිය තමයි මේ ආණ්ඩුවට තිබෙන්නේ. ඒ නිසා තමයි අඩු තරමින් ජනතාවට තිබුණු බැංකු පද්ධතියත් අද විනාශ කරන්නේ. කල්පනා කරලා බලන්න. තමුන්නාන්සේලාගෙන් අපට අහන්න වෙන්නේ මොකක්ද? මේ ගිලටීනයටම හසු කරන තවත් බැංකු තිබෙනවා. මේකම තමයි තමුන්නාන්සේලා ඊළඟට ලංකා පුත්‍ර සංවර්ධන බැංකුවටත් කරන්නේ. ලංකා පුත්‍ර සංවර්ධන බැංකුවත් දැන් ණයයි; පාඩුයි. භාණ්ඩාගාරයෙන් නඩත්තු කරමිනුයි පවත්වා ගෙන යන්නේ. ලංකා පුත්‍ර සංවර්ධන බැංකුවටත් තමුන්නාන්සේලා කරන්නේ මේ ටිකම තමයි. ඒ විතරක් නොවෙයි. දැන් කිව්වා නේ, "මේ ආර්ථිකය විනාශ කරන උදව්ය ඉන්නවා, බැංකු පද්ධතිය විනාශ කරන අය ඉන්නවා." කියලා.

විජයදාස රාජපක්ෂ මන්ත්‍රීතුමාගේ සභාපතිත්වයෙන් පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව 2007 දී නිකුත් කරපු වාර්තාව උපුටා දක්වලා අපේ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා එක් පුද්ගලයකු ගැන කිව්වා. එතකොට මටත් මතක් වෙනවා, තවත් පුද්ගලයෙකුව. අපට මතකයි 2005 දී මේ ආණ්ඩුව බලය ගත්තාට පස්සේ විජයදාස රාජපක්ෂ මන්ත්‍රීතුමා සභාපති හැටියට පොදු ව්‍යාපාර කාරක සභාව මඟින් දැවැන්ත පරීක්ෂණයක් පැවැත්වූවා. එහිදී මර්කන්ටයිල් ක්‍රෙඩිට් බැංකුව ගැනත් කතා කළා. මහ බැංකුවේ සභාපතිතුමා ගෙනැල්ලා, මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා ගෙනැල්ලා වාර ගණනක් ප්‍රශ්න කරලා මර්කන්ටයිල් ක්‍රෙඩිට් බැංකුව ගැන කතා කළා. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාට මතක ඇති, ඒ බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය ගැනත් කතා කළා. අධ්‍යක්ෂක මණ්ඩලයේ හිටියේ කවුද කියලා කතා කළා. අධ්‍යක්ෂ මණ්ඩලයේ නාම ලේඛනය ගන්නකොට හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී මිලින්ද මොරගොඩ මහත්මයා -එතකොටත් මන්ත්‍රීතුමා- ඒ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙක් විධියට කටයුතු කරද්දී මර්කන්ටයිල් ක්‍රෙඩිට් බැංකුව මිලියන ගණනක් ණය ගත්ත ඒවාට මහ බැංකුවට පොලී ගෙවන්න තිබෙන බව ඒත්තු ගැන්වුණා. මගේ මතකය හරි නම් ඒ වනකොටත් පොලිය විතරක් මිලියන නවසියවිසි ගණනක් තිබුණා. ඒ ගැන පොදු ව්‍යාපාර කාරක සභාවෙන් පරීක්ෂණයක් පැවැත්වූවා. ඔබතුමාට අවශ්‍ය නම් දැනටත් අරගෙන බලන්න පුළුවන්, පොදු ව්‍යාපාර කාරක සභා වාර්තාවේ -විජයදාස රාජපක්ෂ වාර්තාවේ- අවසාන පිටුවේ තිබෙනවා, මර්කන්ටයිල් ක්‍රෙඩිට් බැංකුව ඇතුළු මූල්‍ය සමාගම් මහ බැංකුවට නොගෙවා පැහැර හැර තිබෙන ණය පොලී ප්‍රමාණය කොතරම්ද කියලා. අවසානයේ ආණ්ඩුව පොලී අය කර ගත්තා ද? පොලී අය කර ගත්තේ නැහැ. එතුමාව ආණ්ඩුවට අරගෙන ඇමතිකමක් දුන්නා. අදටත් මම හිතන්නේ එතුමා ආණ්ඩුවේ උපදේශකවරයෙක්. ඔන්න ඔහොමයි වෙන්නේ. කෝ මහින්ද චින්තනයක්? හරි පැහැදිලියි මේ යන ගමන. ඉතාම පැහැදිලිව මෙහි තිබෙන්නේ මොකක්ද? රාජ්‍ය බැංකු පද්ධතිය විනාශ කරලා තමුන්නාන්සේලා හදනවා මධ්‍යස්ථානයක්. ඒ මධ්‍යස්ථානය හොරා කන මධ්‍යස්ථානයක්. හොරුන්ට ආර්ථිකයක් මේ හදන්නේ. රටේ ජනතාවගේ ආර්ථිකයක් නොවෙයි. අද මේ වැටුප් ඉල්ලලා උද්ඝෝෂණය කරන, අර්ථ සාධක අරමුදල ආරක්ෂා කරගන්න උද්ඝෝෂණය කරන, සේවක අයිතිවාසිකම් ඉල්ලන, දීමනා මූලික වැටුපට එකතු කරන්න කියලා ඉල්ලන වැඩ කරන ජනතාවගේ සහ මහපොළ ශිෂ්‍යාධාර ඉල්ලන,

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

නේවාසිකාගාර පහසුකම් ඉල්ලන, ඉගෙන ගන්න පීඨයක් ඉල්ලන, අධ්‍යාපනයට සියයට 6ක් වෙන් කරන්න කියා ඉල්ලන ශිෂ්‍යයන්ගේ අයිතිවාසිකම් ගැන නොවෙයි මේ කතා කරන්නේ.

තමුන්නාන්සේලා කතා කරන්නේ මහා දැවැන්ත ව්‍යාපාරික පන්තියක් අපේ රටේ ආර්ථිකයේ අයිතිකාරයෝ බවට පත් කරන්නයි. ඊයෙත්, අදත් පාර්ලිමේන්තුව රැස් වුණේ ඒකටයි. මම ඒත් බැලුවා මේ හදිස්සියේම සඳුදා දවසේ පාර්ලිමේන්තුව රැස් වෙන්නේ ඇයි කියලා. මොකද, මේ අය වැයට කලින් දෙන්න තිබෙන සහන දෙන්නයි මේ හදන්නේ. කාටද? විදේශීය සමාගම්වලට. ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනත් කෙටුම්පත ගෙනාවේ ඒකටයි. ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති යටතේ ආණ්ඩුව 2013 අනුමත කරපු සියලු ව්‍යාපෘති වෙනුවෙන් අවශ්‍ය ඉඩම් ටික නිදහසේ බදු රහිතව බදු සහන සහිතව ලබා දෙන්නයි මේ කටයුතු කරන්නේ. අද මේ පනත් කෙටුම්පත ගේන්නේ මොකටද? මම දන්නේ නැහැ, ගරු නිස්ස විතාරණ ඇමතිතුමා මේකට කතා කරනවාද කියලා; මොනවා කතා කරයි ද කියලා. අද මේ පනත් කෙටුම්පත ගේන්නේ මොකටද? ඒක ගේන්නේ ඩීඑෆ්සීසී බැංකුව විනාශ කරන්න; ඩීඑෆ්සීසී බැංකුව අහෝසි කරන්න. කෝ ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමා? එතුමා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව බේරා ගැනීමේ මහා සටනේ සගයා. ඉතින් එතුමාලා කතා කරන්න එපායැ ඩීඑෆ්සීසී බැංකුව බේරා ගන්න. මොනවා කතා කරන්නද? තමුන්නාන්සේලා හෘදය සාක්ෂිය විකුණපු මිනිස්සු. අද කතා කරන්න දෙයක් ඉතිරි වෙලා නැහැ. මම විශ්වාස කරන හැටියට, මේ පාර්ලිමේන්තුවට එන ගරු ඇමතිවරුවත්, මේ පාර්ලිමේන්තුවට මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරපු ගරු සරත් අමුණුගම ඇමතිතුමාවත්, මේ වෙනුවෙන් කතා කරපු ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමාවත් නොවෙයි මේ කිසි දෙයක් හදන්නේ; මේ කිසි දෙයක් වෙනුවෙන් පෙනී ඉන්නේ. මේ අය නොවෙයි මේවා හදන්නේ. තමුන්නාන්සේලාට තියෙන්නේ පාර්ලිමේන්තුවට මේවා ඉදිරිපත් කරන එක. මේ මන්ත්‍රීවරුන්ට තියෙන්නේ මේවාට අත උස්සන එක. මොකද, මේවා සම්පූර්ණයෙන්ම හදන්නේ වෙන තැනකින්. වෙන තැන්වලින් හදලා, ඉංග්‍රීසියෙන් සිංහලයට පරිවර්තනය කරලා මෙහෙට එවන පනත් මේවා. මේවාට අත උස්සන එක විතරයි තමුන්නාන්සේලාගේ රාජකාරිය. අත උස්සන සමහර අය දන්නේ නැහැ, මොකටද අපි අත උස්සන්නේ කියලා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අවසන් කරනවා.

මම කියන්නේ මෙච්චරයි. ගරු සරත් අමුණුගම ඇමතිතුමා කිව්වනේ හිඳෙන්න යන මූල්‍ය ආයතන 58ක් තියෙනවා කියලා. ජෝර්ජ් සෝරෝස්ට එන්න කියන්න කෝ. ජෝර්ජ් සෝරෝස්ට එන්න කියලා ඔක්කෝම ටික භාර දෙන්න. ජෝර්ජ් සෝරෝස්ට එන්න කියලා, "මෙන්න මූල්‍ය ආයතන 58ක් තියෙනවා, මේ ටික ගනින්, මේවාට සල්ලි දාලා කරගෙන පලයන්" කියලා කියනවා. ජෝර්ජ් සෝරෝස් ආර්ථිකයේ ලකුණු ටික මහින්ද චින්තනයට.

ලකුණු දමා ගන්නවා, මහින්ද චින්තනයෙන් අප ආර්ථිකය බේරා ගත්තා කියලා. බන්දුල ගුණවර්ධන ඇමතිතුමා ඉලක්කම් ටිකක් ප්‍රතිශතත් එක්ක කිව්වා, මෙච්චර අච්චර නැහලා තිබෙනවාය කියලා. ඒ නැඟපු කිසි දෙයක් ජනතාවට දැනෙන්නේ නැහැ. ඒ නහින්නේ එතුමාගේ කොළවල විතරයි; ආර්ථිකය ඇතුළේ විතරයි. ආර්ථිකය කියන්නේ එතුමන්ලාගේ කොළ විතරයි. ඉතා පැහැදිලිව අපේ රටේ ආර්ථිකය දේශීය ආර්ථිකයක් නොවෙයි. විදේශීය ඒජන්ත පන්තියකට හොරා කන්න පුළුවන්, සූරා කන්න පුළුවන්, ඔවුන්ට පිනුම් ගහන්න පුළුවන් ආර්ථිකයක් මේ හදන්නේ.

ඊයේ ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනත් කෙටුම්පත පිළිබඳ විවාදයේ දී වෙන කවදාවත් නැතිව සජින් ද වාස් ගුණවර්ධන මන්ත්‍රීතුමා කථා කළා. වරහන් ඇතුළේ ඇමතිතුමා. එතුමා ඊයේ කථා කළේ මොකද කියලා අපට තේරෙනවා. ඒ විදේශ කටයුතු නිසා නොවෙයි, විදේශිකයින්ට ඉඩම් විකුණන නිසයි. අද තව කවුරු කථා කරයි ද දන්නේ නැහැ, මේ පනත් කෙටුම්පත වෙනුවෙන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතා පැහැදිලිව අප කියනවා, මේ සිද්ධ වන්නේ අපේ රටේ ආර්ථිකය විනාශ කිරීමේ ගමන් මගට යෑමක් බව. අය වැයට කලින් සහන දෙනවා වාගේම ඉදිරි අය වැයෙනුත් තව සහන දෙන බව අප දන්නවා. අය වැය හදාගෙන එන්නේ ජනතාවගෙන් ඡන්දය ගන්න. ජනාධිපතිවරණ අය වැයක් එන්නේ. හැබැයි, ඊට කලින් ආර්ථිකය විනාශ කිරීමේ අණපනත් ටික තමයි මේ සභයේ සම්මත කරන්නේ. ඒ නිසා මේ විනාශයට අත උස්සන හැම කෙනෙකුම, සහාය දෙන හැම කෙනෙකුම ඉතිහාසය ඉස්සරහ වගඋත්තරකාරයන් වන බව, හෘදය සාක්ෂියෙන් අද වගඋත්තරකාරයන් වෙලා ඉන්න බව අවධාරණය කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

[අ.භා. 4.10]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඩීඑෆ්සීසී බැංකුව (ඉවත් කිරීමේ හා ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත දෙවැනි වර කියැවීම සහ DFCC සහ NDB බැංකු ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන් වචන ස්වල්පයක් කථා කිරීමට ලැබීම තෘප්තියක් ලෙස මම සලකනවා. නමුත් මේ කථා කරන මොහොතේ අප රටේ ආර්ථිකය කඩා වැටිලා තිබෙනවා කියන කාරණය හැම දෙනාම පිළිගන්නා දෙයක්. අප රටේ ආර්ථිකය කඩා වැටීම නිසා රටට මුදල් ලබා ගන්න තිබෙන හැකියාව අඩු වෙලා තිබෙනවා. The ability to obtain funds from overseas has been curtailed owing to the financial breakdown in the country. රටට ණය ගන්න බැරි වුණාම බැංකු ක්ෂේත්‍රයෙන් හෝ පෞද්ගලික කොම්පැනි තුළින් ණය ගන්න පුළුවන් හැකියාව තමයි ඇති වෙලා තිබෙන්නේ. එයින් රටට වන බර අඩු වනවාය කියන මතයක් ඇති කරලා තිබෙනවා. මේ කථා කරන මොහොතේ අප DFCC බැංකුවේ - The repeal and consequential provisions in the Bill is what we are debating.

සාමාන්‍යයෙන් බැංකු ක්ෂේත්‍රය ගත්තොත් අද බැංකු 31ක් තිබෙනවා. මේ බැංකු 31 තුළින් රටට මෙවැනි කොම්පැනි එන්නේ කරුණු තුනක් නිසායි. එකක් තමයි, statutory provision. DFCC බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව - NSB - සහ නියෝජ්‍ය කථානායකතුමා එදා සභාපතිත්වය දැරූ State Mortgage Bank එක වාගේ ඒවා statutory provisions තුළින් එන ඒවායි.

අනික් එක තමයි Finance Act එක යටතේ සමාගම් පනත තුළින් එන ඒවා. ඒ අනුව තමයි NDB එක ඇති වෙලා තිබෙන්නේ. DFCC බැංකුවේ දැනට 1,800ක සේවක පිරිසක්

සිටිනවා. NDB බැංකුවේ 1,800ක් 2,000ක් අතර පිරිසක් ඉන්නවා. DFCC එකේ commercial පැත්ත කරන්නේ වර්ධන බැංකුව. NDB එක commercial activities කර ගෙන යනවා. ගිය වර ජනාධිපතිතුමා අය වැය ගැන කථා කරන අවස්ථාවේ දී යෝජනාවක් කළා, මේ බැංකු දෙක ඒකාබද්ධ කිරීම තුළින් රටටත්, මේ බැංකු දෙකටත් සෙතක් ඇති වනවාය කියලා. ඒ යෝජනාව කරලා දවස් 350ක් විතර මෙලොව දෙයක් වෙන්නේ නැතිව අක්‍රියව තිබුණා. නමුත් යටින් මොනවාද වෙන්නේ කියන එක තමයි හෙළිදරවු වෙමින් තිබෙන්නේ. දැන් අය වැය එන්න තිබෙන නිසා බොහොම කඩිනමින් මේක තල්ලු කරගෙන ගිහිල්ලා, මේ වැඩ කරන පිරිස විරුද්ධතාව ප්‍රකාශ කරන අවස්ථාවේ දී ඒකත් නොතකා මේ බැංකු දෙක ඒකාබද්ධ කරන්න හදනවා. DFCC බැංකුව සියයට 18ක විතර ලාභයක් උපයන ආයතනයක්. අපේ NDB බැංකුව සියයට 15ක් විතර ලාභයක් උපයන ආයතනයක්. ගිය අවුරුද්දේ DFCC එක බිලියන 3.8ක ලාභයක් උපයලා තිබෙනවා. NDB එක බිලියන 4.1ක ලාභයක් උපයලා තිබෙනවා. එහෙනම් මෙවැනි සවිශක්තිමත් බැංකු දෙකක් ඒකාබද්ධ කරන්න හදන්නේ ඇයි? අද මහ බැංකුව හැම බැංකුවටම ඇඟිලි ගහන්න පටන් අරගෙන තිබෙනවා. අද බැංකුවල තිබෙන විශේෂ දේ තමයි තිබෙන secrecy කොටස සම්පූර්ණයෙන් නැති වෙලා තිබීම. ශිරාන් ඛණ්ඩාරනායක අග්‍රාණ්ඩුකාරතුමියගේ ප්‍රශ්නය තුළින් බැංකුවල තිබෙන විශ්වාසය සම්පූර්ණයෙන්ම කඩා වැටිලා තිබෙනවා. ඒ කඩා වැටීම නිසා අද බැංකුවල තිබෙන විශ්වාසය අඩු වීගෙන යන ස්වරූපයක් තිබෙන්නේ.

මෙවැනි බැංකු දෙකක් ඒකාබද්ධ කර තිබෙන්නේ ආණ්ඩුවේ බංකොලොත්භාවය වසාගන්න. ආණ්ඩුවට මුදල් ගන්න බැරි නිසා, ඒ අය ගිහිල්ලා ජාතික ඉතිරි කිරීමේ බැංකුව මඟින් සියයට 17ක 18ක විතර වියදමක් දරාගෙන ණය අරගෙන තිබෙනවා. සියයට 8.9ක Foreign Exchange Risk එක භාර ගන්න තිබෙන්නේ ජාතික ඉතිරි කිරීමේ බැංකුවට. මහජන බැංකුවටත්, ලංකා බැංකුවටත් මේ වාගේ ණය ගන්න අවස්ථාව ඇති කර තිබෙනවා. ඒ කියන්නේ ආණ්ඩුවට මුදල් නැති වෙන කොට ඒ අය පාවිච්චි කරන උපක්‍රමය තමයි ආණ්ඩුව යටතේ තිබෙන බැංකුවලට හෝ ආයතනවලට හෝ ගිහිල්ලා මුදල් ගැනීමේ ස්වරූපය ඇති කිරීම. මේක ඉතාමත් භයානක ස්වරූපයක්.

මේ රට ආණ්ඩු ගණනාවක් පාලනය කළත්, 2004 වර්ෂය වන විට රටේ සම්පූර්ණ ණයබරතාව රුපියල් බිලියන 1784යි. නැතහොත් රුපියල් කෝටි එක්ලක්ෂ හැත්තෑඅටදහස් හාරසියයයි. අද මේ කථා කරන මොහොතේ අපේ සම්පූර්ණ ණය බරතාව රුපියල් කෝටි හත්ලක්ෂ හැත්තෑඅටදහස් පන්සියයයි. 2004 පැවැති තත්ත්වයට වඩා හතර ගුණයක් රටේ ණයබරතාව වැඩි වෙලා තිබෙනවා. අපේ රටේ වත්කම මෙහෙම වැඩි වෙලා තිබෙනවාද?

එදා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කූට ක්‍රියාවෙන් වට්ටනකොට, ඒක පුද්ගල ණයබරතාව තිබුණේ රුපියල් හැත්තෑඅටදහස් අටසියයක. හැත්තෑඅටදහස් අටසියයක් වූ ඒක පුද්ගල ණයබරතාව අද හාරලක්ෂ හතළිස් එක්දහසක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. හෙට උපදින දරුවෙක් බිහිවෙන්නේත් හාරලක්ෂ හතළිස්එක්දහසක් ණය වෙලයි. මේවා තමයි මහින්ද චින්තන ආණ්ඩුව තුළින් ඇති කර තිබෙන්නේ. මේවා ගැන පම්පෝරි ගහන ආණ්ඩුව, රටේ ආර්ථිකය කඩා වැටිලා තිබෙන නිසා මේ බැංකු ඒකාබද්ධ කිරීම තුළින් ආර්ථිකය තවත් ගැඹුරට තල්ලු කරන ගමනක් තමයි යමින් තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මේ කථා කරන මොහොතේත් මුදල් අමාත්‍යාංශයේ කවුරුත් මේ ගරු සභාවේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි කථා කරන්නේ කාටද? ඇමතිවරු හැටහුටහමාරක් ඉන්න ආණ්ඩුවේ අපි ගැන කථා කරන්න මේ ගරු සභාවේ ඇමතිවරු දෙදෙනෙක්වත් නැහැ. අපේ දක්ෂ සී.බී. රත්නායක ඇමතිතුමා නම් ඉන්නවා. එතුමාට දක්ෂතාව තිබුණාට, ලොකු දේවාලයක පොඩි පූසාරි කෙනෙක් වාගෙයි. වැඩක් නැහැ. එතුමාට මුදල් අමාත්‍යාංශයේ කිසිම දෙයක් කරන්න හැකියාවක් නැහැ නේ. කෝ අපේ ඇමතිවරු?

ගරු සී.බී. රත්නායක මහතා (පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යතුමා)
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க - தனியார் போக்குவரத்துச் சேவைகள் அமைச்சர்)
(The Hon. C.B. Rathnayake - Minister of Private Transport Services)

ගරු මන්ත්‍රීතුමා, පොඩි පූසාරි කෙනෙක් වුණාට ලොකු වැඩ කරන්න පුළුවන්.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ලොකු වැඩ කරන්න පුළුවන් පොඩි පූසාරි තමයි වටින්නේ. ඔබතුමාගේ දක්ෂතාවට ගැළපෙන මොනවාද දීලා තිබෙන්නේ? ප්‍රයිවට් බස් නේ. Clerk කෙනෙක්ටත් ඔය වැඩේ කරන්න පුළුවන් නේ. කොහොමත් රාජපක්ෂ ආණ්ඩුව කරන්නේ දක්ෂයෝ පැත්තකින් තියන එක නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අහන්නේ මෙතැන ඇමති මණ්ඩලයේ කවුරුවත් ඉන්නවාද කියලායි.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

යූඑන්පී එකේ කවුද ඉන්නේ තමුන්නාන්සේගේ කථාව අහන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

පනින රිළවුන්ට නොවෙයි මම කථා කළේ. ගරු සරත් අමුණුගම ඇමතිතුමා දැන් මේ ගරු සභාවට එනවා. අපි ඒක අභය කරනවා. එතුමා එක්ක කථා කර මේවා කරන්න පුළුවන්. බැංකුවක් තියා කිසිම දෙයක් ගැන දන්නේ නැති පුද්ගලයෙක් එක්ක නොවෙයි මම කථා කරන්නේ. සරත් අමුණුගම ඇමතිතුමනි, මම මේ කථා කර කර හිටියේ - [බාධා කිරීමක්] මන්ත්‍රීවරු මෙතැන ඉන්නේ වන්දි හට්ටියෝ වාගේ. කථා කරන දේ ගැන දන්නෙත් නැහැ. නිකම් පනිනවා. මේ පැත්තෙන් ඔය පැත්තට රිළවෙක් වාගේ පැනලා, දැන් සද්දේ දානවා. කඩා වැටිලා තිබෙන ආර්ථිකය ගොඩ ගන්න සරත් අමුණුගම ඇමතිතුමා වාගේ ඇමතිවරු උත්සාහ ගන්නවා. You have got a bad brief to defend.

මා කියමින් හිටියේ මේ රටේ ආර්ථිකය කඩා වැටිලා තිබෙන නිසා බැංකු ඒකාබද්ධ කරන්න කියායි. මාසයක් පඩියෙන් ජීවත් වෙන්න පුළුවන්ද? මේ රටේ සියයට 70ක 80ක විතර අහිංසක ජන ප්‍රමාණය ජීවත් වෙන්නේ රුපියල් විසිපන්දහසත්, තිස්දහසත් අතර මුදල් ප්‍රමාණයකින්. මේ තුළින් ජීවත් වෙන්න පුළුවන්ද? අද මාසයක පඩිය සුමානයකටත් මදි. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලයේ ස්ථීර ආදායම් ලබන අයට මුදල් ඉතිරි කිරීම් කර සියයට 15ක 16ක පොලියක් ලබා ගන්න පුළුවන් කාලයක් තිබුණා. අද ඒ යුගය නැති වෙලා. අද ඒක සියයට 5ට 6ට අඩු වෙලා. කොහොමද ජනතාව ජීවත් වෙන්නේ?

[ගරු රවි කරුණානායක මහතා]

මේ ආණ්ඩුව කියන විධියට ඒක පුද්ගල ආදායම ඩොලර් 3800 දක්වා වැඩි වෙලා. ඒ වැඩි වුණාට, එක්කෙනෙක්ට දෙදෙනෙක්ට බිලියන ගණන් ආදායම තිබෙනවා. එක පවුලකට ඒ වාගේ තිබෙනවා. අනෙක් අය දවසට 500, 1000 හොයලා මාසයකට විසිදහසක් හොයා ගන්නේ අමාරුවෙන්. ඒ දෙක ඒකාබද්ධ කළාම ඔන්න අපේ ඒක පුද්ගල ආදායම ඩොලර් 3800යි කියනවා. ඩොලර් 3800ක් කියන්නේ එක් පුද්ගලයෙකුට මාසයකට තිස්අටදහසයි, තිස්නවදහසයි, හතළිස්දහසයි. මේ රටේ මේ තරම් ප්‍රමාණයක ආදායමක් උපයන්නේ කවුද? අඩුම තරමින් අපේ රටේ සාමය රකින පොලිස් කොස්තාපල්වරයකුටත් ලැබෙන්නේ රුපියල් 16,800 ක වැටුපක්. මේ රටේ ආර්ථිකය කඩා වැටිලා තිබෙන මොහොතක ආර්ථිකය හදන්න කටයුතු කරන්නේ නැත්තේ ඇයි කියා අහන්න මම මේ අවස්ථාව උපයෝගී කර ගන්නවා.

මේ විජ්ජාව කරලා හරි යන්නේ නැහැ. ඩීඑෆ්සීසී බැංකුවත්, එන්ඩීබී බැංකුවත් ඒකාබද්ධ කිරීමෙන් රටේ ආර්ථිකය හදන්න නොවෙයි බලන්නේ. මේ ආණ්ඩුව තවත් ණය ගන්න පුළුවන් හැකියාවයි ඇති කරන්නේ. ඒක තමයි වෙන්නේ. දැන් මේකේ සඳහන් වන්නේ මොකක්ද? The express provisions are to make an enlarged balance sheet. ඒ කියන්නේ, ශේෂ පත්‍රය ලොකු කිරීමයි. නමුත් ශේෂ පත්‍රය ලොකු කිරීම තුළින් අභිංසක සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයාට වෙනසක් වනවාද? ඒ ගොල්ලන්ට කොහොමත් ලැබෙන්න පුළුවන්. අඩු ගණනේ කලින් තිබුණු තරගකාරී තත්ත්වයත් දැන් නැති වීගෙන යනවා. මේක තමයි තිබෙන ප්‍රශ්නය. අපේ ත්‍යාගරාජා මැතිතුමා එන්ඩීබී ආයතනයේ බොහොම හොඳ දක්ෂ නිලධාරියෙක්. එතුමා දැනුවත්කම තුළින් ගිහිල්ලා එතැනට නායකත්වය දෙනවා. මේ පැත්තෙන් අර්ජුන ප්‍රනාන්දු, ලක්ෂ්මන් සිල්වා වැනි ඉතාමත් දක්ෂ අය ඩීඑෆ්සීසී වර්ධන බැංකුව තුළ කටයුතු කරනවා. ඉතින් මේ දෙක ඒකාබද්ධ කිරීමෙන් එක පාරටම සවිටනයක් ඇති වනවා. එතැන වැඩ කරන පිරිස අඩු කරන්න වේවි. මේ බැංකු දෙක ඒකාබද්ධ වීම තුළ 3,600ක පිරිසක් එක තැනකට එකතු වුණාම අඩු තරමින් 1,000කට විතර රක්ෂා නැති වෙනවා. ඉතින් මේකද වෙන්නේ?

ඒ විතරක් නොවෙයි. ආණ්ඩුව මහින්ද චින්තනය තුළින් උදේ ඉඳන් රෑ වන තුරු පම්පෝරි ගහන්නේ අපි රජයේ ආයතන පෞද්ගලීකරණය කරන්නේ නැහැ කියායි. නමුත් පෞද්ගලීකරණය නොවේ නම් මොකක්ද මේ කරන්නේ? දැන් ඩීඑෆ්සීසී බැංකුවේ සියයට 31ක හිමිකම ආණ්ඩුව තුළ තිබෙනවා. එන්ඩීබී එකේ සියයට 33ක හිමිකම තිබෙනවා. ඒ නිසා තමයි මෙතැන බලහත්කාරයෙන් ඒකාබද්ධ කිරීමක් කරන්නේ. නමුත් මේ බැංකු දෙක ඒකාබද්ධ කළාම එක වතාවට ලාභයක් එන්නේ නැහැනේ. එතැන ඉන්න සේවක පිරිස අඩු කිරීමෙන් තමයි එහෙම කරන්න හැකියාව තිබෙන්නේ.

මේ බැංකු දෙක ඒකාබද්ධ කිරීමෙන් ණය දෙන්න පුළුවන් හැකියාව සියයට පහකින්, භයකින් අඩු කරන්න පුළුවන් නම් ඔන්න හොඳයි. නමුත් ඒක නොවෙයි වෙන්නේ. මෙතැන මේ තරගකාරී තත්ත්වය අඩු වීමෙන් තවත් ප්‍රශ්නයක් ඇති වෙනවා. I do confess that there is overbanking. But, overbanking does not necessarily mean that you have to amalgamate two of the best bankers. ඩීඑෆ්සීසී බැංකුව development bank එකක්. Venture capital පාවිච්චි කර මේක දියුණු කරන්න පුළුවන් හැකියාව තිබෙනවා. එන්ඩීබී එකේත් පරමාර්ථය වූයේ ඒකයි. නමුත් ඊට පසුව ඒක සංශෝධනයට ලක් වුණා. නමුත් මේ බැංකු දෙකේ අභිලාෂය වූයේ පුළුවන් තරම් සුළු සහ මධ්‍යම පන්තියේ ව්‍යාපාරිකයන්ට අත්උදව්ව දෙමින් කටයුතු කිරීමයි. ඉතින් මේක වෙනවාද? මොකක්ද මේකේ අධිෂ්ඨානය කියන එක තවම හෙළිදිරවූ වෙලා නැහැ.

බැංකු දෙකේම සේවක පිරිස අකමැත්ත ප්‍රකාශ කර තිබෙනවා වාගේම මේකේ ගුණාංගත් තිබෙනවා. විපක්ෂයේ අපි ආණ්ඩුව කරන හැම දේම ප්‍රතික්ෂේප කරනවා නොවෙයි. මේකේ හොඳ ගුණාංග තිබෙනවා. අනිවාර්යෙන්ම ශීඝ්‍රයෙන් සංවර්ධනය වන ආර්ථිකයකට මේ වාගේ ලොකු බැංකුත් අවශ්‍යයි. නමුත්, ඇයි එන්ඩීබී එක සහ ඩීඑෆ්සීසී බැංකුව ඒකාබද්ධ කරන්නේ. රජයේ තිබෙන බැංකු දෙකක් වන Bank of Ceylon එකයි, People's Bank එකයි ඒකාබද්ධ කළා නම් එහෙනම් balance sheetsවලින් මා හිතන විධියට බිලියන 1900ක් විතර එකතු වනවා. එතකොට ඉන්දියාවේ තිබෙන බැංකු තරම් වෙනවා. ඇයි එහෙම කළේ නැත්තේ? මෙන්න මේක තමයි මේ මහ බැංකුවේ පණ්ඩිතයෝ එතැනට ගිහිල්ලා කරපු දේ. එතැන වෙලා තිබෙන්නේ මොකක්ද? එතැනට ගිහිල්ලා ඒ අයට උගන්වන්න හදනවා කොහොමද කරන්නේ කියා. ඔබතුමන්ලා යටතේ අඩු ගණනේ clerk post එකක් ගන්න බැරි කෙනකු, ඔය වාගේ තැනකට දැම්මාම ඔබතුමා වාගේ මුදල් ඇමතිවරයකුටත් ගණන් උගන්වන්න හදන පුද්ගලයින්නේ ඉන්නේ. මෙන්න මේක තමයි වෙලා තිබෙන්නේ. ඉතින් ගරු ඇමතිතුමනි, කරුණාකර මේවා සම්බන්ධයෙන් අප දැනුවත් කරන්න. මේක එක් කෙනෙකුගේ දෙදෙනෙකුගේ ආර්ථිකයක් නොවෙයි. රටේ සමස්ත ජනතාවගේ ආර්ථිකය කඩා වටිටන්න පුළුවන් ස්වරූපයෙන් මේ කටයුතු කරන එක තමයි අපට තිබෙන ප්‍රශ්නය.

මා මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාගෙන් එක කාරණයක් අහනවා. ඔබතුමාට නැවත අදහස් යොමු කරන්න පුළුවන් වේවි කියා මා විශ්වාස කරනවා. අපට අවශ්‍ය වන්නේ මේකයි. දැන් HNB එකේ රුපියල් බිලියන 430ක් තිබෙනවා කියා අපට හෙළිදරවු වෙලා තිබෙනවා. කොමර්ෂල් බැංකුවේ රුපියල් බිලියන 700ක් විතර තිබෙනවා. ඒ කියන්නේ asset base එක. සම්පත් බැංකුවේ රුපියල් බිලියන 450ක විතර asset base එකක් තිබෙනවා. මේ වාගේ බැංකු 31ක් තිබෙනවා නම්, මේක අඩු කරන්න අවශ්‍ය නම්, ඒකට පොඩි බැංකු තිබෙනවා දහයක්, දොළහක්. මේ දෙක එකතු කළාට වඩා ඒ බැංකු තුන හතරක් ඒකාබද්ධ කළා නම් මීට වඩා හොඳයි නේද? ඇයි, ඇමතිතුමා මේ සම්බන්ධයෙන් කටයුතු කර නැත්තේ. මහ බැංකුවේ අධිපති ඒ බැංකුවල තිබෙන පෞද්ගලික අයිතිවාසිකම් පාවිච්චි කරගෙන, EPF, ETF වාගේ captive sources පාවිච්චි කරගෙන ගිහිල්ලා shareholding අරගෙන අද සම්පූර්ණයෙන් ව්‍යසනයක් ඇති කර තිබෙනවා කියන එක මා කියන්නේ මෙන්න මේ නිසයි. ඒක පිළිගන්න වෙනවා මේ වාගේ කටයුතු තුළින්.

පසු ගිය අවුරුද්දේ අය වැය හිඟයක් තිබුණා. හිඟය පියවන්න අන්තිමට මොකක්ද පාවිච්චි කරපු උපක්‍රමය. ජාතික ඉතිරි කිරීමේ බැංකුවට ගිහිල්ලා foreign borrowingsවලට අනුමතිය දුන්නා. මෙකෙන් අන්තිමට ගත්තේ සියයට 8.9යි. සියයට 8.9කට විදේශ විනිමය අනුපාතය සියයට 7ක්, 8ක් එකතු කළාම මේකට ලාභයක් එකතු කරන්න සියයට 17ක විතර වියදමක් දරන්න වෙනවා. ඒ අවස්ථාවේදීම එන්ඩීබී බැංකුව ගියා, මේ වාගේ foreign borrowing එකකට. මේකට සියයට 5.5ක් ලැබුණා. ජාතික ඉතිරි කිරීමේ බැංකුවත්, එන්ඩීබී බැංකුවත් පෞද්ගලික අංශයේ බැංකු වාගේ හැසිරුණු නිසා සියයට 3ක වෙනසක් තිබුණා. මෙන්න මේවා සම්පූර්ණයෙන්ම ආණ්ඩුවේ ග්‍රහණයට ලක් වුණොත් ඒ තත්ත්වය නැති වී ගෙන යනවා නේ. මේ ගැන තමයි අපි කියන්නේ.

2000 වර්ෂය වෙන කොට ශ්‍රී ලංකා නිදහස් පක්ෂ රජය ආර්ථිකය සම්පූර්ණයෙන්ම කඩා වට්ටලා එක්සත් ජාතික පක්ෂයට ඍණ ආර්ථිකයක් භාර දුන්නා. එදා අපි සම්පූර්ණයෙන් ඒක වෙනස් කළා. එදා වෙළෙඳ ඇමති වශයෙන් කටයුතු කරපු මටත්, අනෙක් ඇමතිවරුන්ටත් ලොකු ප්‍රශ්නයක් වුණා, ඒ කඩා වැටුණු ආර්ථිකය යථා තත්ත්වයට පත් කර ගැනීම. අපි එදා රටේ ආර්ථිකය හැදුවා. නමුත් ජනතාව කිව්වේ, "උඹලා රටේ ආර්ථිකය හැදුවාට අපට කළ දේ මොකක්ද?" කියලායි. එදා ඒ ශක්තිමත් කළ ආර්ථිකයේ ප්‍රතිලාභ තමයි ජනතාවට ලැබුණේ. නමුත් අපේ කරුමෙට, රටේ කරුමෙට ඒක අනික් පැත්තට කැරකිලා ගියා. දැන් බලන්න මොනවාද වෙන්නේ කියලා.

Hon. Minister, we must basically look at the overall impact that has on the economy because the holistic view of this amalgamation is to ensure that we have a lesser lending rate, a higher competition and also an enlarged balance sheet, which would permit small banks in Sri Lanka to get into the region and act as fairly big banks. මෙහෙම කරන්න පටන් ගත්තොත් වැඩි කල් යන්න ඉස්සෙල්ලා පෞද්ගලීකරණය කියන වචනය ඉතා ජනප්‍රිය වචනයක් වේවි. පෞද්ගලීකරණය කියන නම මේ ආණ්ඩුවට කලින් සයනයිඩ් වාගේ තිබුණාට දැන් මහින්ද රාජපක්ෂගේ චින්තනයෙන් මේ වාගේ ඒවා පෞද්ගලීකරණය කළාට කමක් නැහැ කියලා පොඩි පොඩි කැලි එළියට දානවා. සුද්දාට ඉඩම් විකුණුවාට කමක් නැහැ, අපේ ලංකාවේ අයට නැතුවාට; මුහුදු ගොඩ කරලා වීනුන්ට අක්කර 500ක් දුන්නාට කිසි ප්‍රශ්නයක් නැහැ ආදී වශයෙන් දැන් පොඩි පොඩි කැලි එළියට දානවා. නමුත් ඉන්දියන් කොම්පැනියක් ආවොත් ප්‍රශ්නයක් තිබෙනවා.

හම්බන්තොට වරාය සම්පූර්ණයෙන්ම චීන අයිතියට යනවා. කොළඹ වරාය දැන්මම ගිහිල්ලා ඉවරයි. ලෝකයේ 138වන ස්ථානයට තිබුණු කොළඹ වරාය එදා ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා 18වන ස්ථානයට ගෙනාවා. ඒ වරායේ JCT එකේ stevedoring ඒවා ඔක්කෝම කරන්න පුළුවන් වුණාට dry docking සහ container storage කරන්න බැරි වුණා. අද චීන කොම්පැනියට Colombo South Terminal එකේ ඒවාත් කරන්න ඉඩ දීලා තිබෙනවා. මොකක්ද මේ මහින්ද චින්තනය කරගෙන යන්නේ? මේවා අපේ මේ පුංචි රටේ ආර්ථිකය ශක්තිමත් කරන්න පුළුවන් මාර්ග. පොළොව ඉඹලා පපුවට ගහගත්ත අය අද මොනවාද මේවා සම්බන්ධයෙන් කරන්නේ? ඇයි, ඔබතුමන්ලා ඇමතිවරු වශයෙන් නිශ්ශබ්දව සිටින්නේ? ගරු සරත් අමුණුගම ඇමතිතුමනි, අද මුදල් නියෝජ්‍ය ඇමති වශයෙන් ඔබතුමා මේ ගරු සභාවේ කටයුතු කරනවා. තිස්ස විතාරණ ඇමතිතුමා මේ ගරු සභාවේ ඉන්නවා. මම ඔබ දෙපළගෙන් අහන්නේ, රාජපක්ෂගේ ආණ්ඩුව මේ රටේ ආර්ථිකයට කරන්නේ මොකක්ද කියලායි. ඔබතුමාට මෙතැන control එකක් තිබෙනවාද? නැත්නම් තිරය පිටු පස ඉඳගෙන නටවන රූකඩ වාගේ ඔබතුමන්ලා නැටවෙනවාද? මේක තමයි අද අහන්න තිබෙන්නේ.

2005 දී විධායක ජනාධිපති ධුරය අහෝසි කරනවා කියලා ඒ ජනාධිපතිවරණය දිනුවා. ඊට පස්සේ නැවත 2009 දී ඇවිල්ලා ජනාධිපති ධුරය අහෝසි කරනවා කියලා මොනවාද කරලා තිබෙන්නේ? එදා දෙවැනි වතාවටත් ජයග්‍රහණය කළා මදිවට තුන්වැනි වතාවටත් එන්න දැන් තවත් ඉන්දයකට යන්න හදනවා. කිසි ප්‍රශ්නයක් නැහැ. මොකද මේක තමයි රට බේරා ගන්න පුළුවන් අවස්ථාව. අද අපට වැඩිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අය, කොමියුනිස්ට් පක්ෂයේ අය බලාගෙන ඉන්නේ මේ යන මාර්ගය නිවැරැදි කරන්න අවශ්‍යයි කියලායි. මේ පිපිරීම පටන් ගනීවි. ඒ තුළින් තමයි රට ආරක්ෂා කරන්න පුළුවන් වන්නේ කියන එක මම ඉතාමත් වග කීමෙන් මේ අවස්ථාවේදී රටේ ජනතාවට කියනවා. වපර ඇඟින් බැලූ කාලය අවසන් කරන්න.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ මේ ආණ්ඩුව ඉදිරිපත් කළ අය වැය දහය අරගෙන බැලුවත්, හෙට අනිද්දා එන අනෙක් අය වැය බැලුවත් කරන්න යන්නේ එකම දෙයයි. මවනවා නිකම් හොලිවුඩ් වාගේ picture එකක්. අන්තිමට රුපියල් 10ක් එක සාක්කුවට දාලා අනෙක් සාක්කුවෙන් රුපියල් 100ක් pickpocket කිරීමක් තමයි මහින්ද රාජපක්ෂගේ මහින්ද චින්තනය තුළින් කරන්නේ. ජනාධිපතිට ඉතා දක්ෂ ලෙස ඒක කරන්න නම් හැකියාව තිබෙනවා. නමුත් දැන් ජනතාවට තිත්ත වෙලායි තිබෙන්නේ. මේ අනිද්දා ඉදිරිපත් කරන්න යන අය වැය තුළිනුත් ඒක මීට වැඩිය උපක්‍රමශීලීව කරන්න පටන් ගනීවි.

මම කිව්වා වාගේ එක්සත් ජාතික පක්ෂය බලයේ සිටි අවස්ථාවලදී හැම දෙනාම දන්නවා අඩුම ගණනේ රටේ හැම තැනම සල්ලි සංසරණය වුණු බව. සාක්කුවල සල්ලි තිබුණා. ඒ සල්ලි තුළින් තමයි රට සංවර්ධනය වෙන්නේ කියන එක ගැන කථා කරනවා. අපේ සංකල්පය රුපියල් 100ක් සාක්කුවට දාලා ඒකෙන් 10ක් බදු වශයෙන් ගන්න එකයි. එවැනි ආණ්ඩුවකට තමයි අපි නායකත්වය දෙන්නේ. මම ඉතාමත් ඕනෑකමින් අහන්නේ ඩීඑෆ්සීසී බැංකුවත්, එන්ඩීබී බැංකුවත් ඒකාබද්ධ කිරීමෙන් මේ රටට වෙලා තිබෙන මේ ව්‍යසනය යථා තත්ත්වයට ගේන්න පුළුවන්ද කියන ප්‍රශ්නයයි.

I guess there are positive signs of this merger: the risk appetite can be better looked at; the overall size of the capital of the banks will be increased and the country can say that we have got banks of this nature. But, does that address all the economic downturns that are there? මම මේ අවස්ථාව පාවිච්චි කරන්නේ, මේ සම්බන්ධයෙන් අපට ඍජු පිළිතුරක් අවශ්‍ය බව කියන්නයි. මේ බැංකු ඒකාබද්ධ කිරීමෙන් රටේ ආර්ථික ප්‍රශ්න විසඳෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතා අසතුටෙන් වුණත් මට ප්‍රකාශ කරන්නට අවශ්‍ය වන කාරණයක් තිබෙනවා. වරාය අධිකාරියේ වැඩ කරන 17,800කින් 150ක් 200ක් විතර දෙනා අදට දවස් දෙකකට ඉස්සර වෙලා අපෙන් කාරුණික ඉල්ලීමක් කළා. -මේ අවස්ථාවේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම්තුමා මේ ගරු සභා ගැබට පිවිසියා.- ඔවුන් ඉල්ලීමක් කළා, "මේ රටේ වැදගත් ආයතනයක් වන වරාය අධිකාරිය අද තුට්ටු දෙකේ තත්ත්වයට තල්ලු කරලායි තිබෙන්නේ. පඩි ගෙවන්නට බැහැ, බෝනස් ගෙවන්න නැහැ. මේ ආයතනයේ වැඩ කරන පිරිස සම්පූර්ණයෙන් දේශපාලන වැඩවලට පාවිච්චි කරනවා. ඒ නිසා කරුණාකරලා ඇවිත් බලන්න" කියලා. කොම්පඤ්ඤ වීදියේ තිබෙනවා, වරාය අධිකාරියට අයත් අක්කර තුනක විතර ඉඩමක් සහ ගොඩනැඟිල්ලක්. මෝර්ගන් වීදියේ තිබෙන ස්ථානයකට වරාය අධිකාරියේ 150ක් පමණ දෙනා ගෙන්වාගෙන, යකඩ බට ගහලා, stages ගහනවා; billboards ගහනවා; "මහින්ද රාජපක්ෂ අනාගත ජනාධිපති වේවා!" කියලා පෝස්ටර් ගහනවා. Number plates ගලවලා එහි රථවාහන

[ගරු රවි කරුණානායක මහතා]

පාවිච්චි කරනවා. අද උදේ මමත්, අජිත් පී. පෙරේරා මැතිතුමාත්, නලින් බණ්ඩාර මැතිතුමාත්, යෝගරාජන් මැතිතුමාත් මාධ්‍යයත් එක්ක එතැනට ගියා. එතැනට ගියාම අපේ ඇස්වලින් දැක්කා, ඒ කියපු දේවල්. අපි ඒ දේවල් සම්පූර්ණයෙන්ම වීඩියෝගත කළා. වීඩියෝගත කරද්දි කට්ටියක් එක පාරටම කඩා වැදුණා. ඒ අය ඇහුවා, "මොකක් කරන්නද, මේ ඇවිල්ලා තිබෙන්නේ?" කියලා. අපි කිව්වා, "වරාය සුරකින්න තමයි අපි මෙතැනට ආවේ. වැඩ කරන සේවක පිරිස අපට කිව්වා, මෙන්න මේ වාගේ වංචනික, දේශපාලනික වැඩ කටයුතු කර ගෙන යනවා" යි කියලා. අපි එතැන ඇතුළේ ඉන්න කොට යම් කිසි පිරිසක් ඇවිල්ලා, අපි ඇතුළේ දාලා වහන්න හැදුවා. නමුත් එතැන සිටිය සේවක පිරිස කිව්වා, "එහෙම කරන්න එපා. අපේ රක්ෂා ආරක්ෂා කරන්න ඇවිල්ලා ඉන්න මේ මන්ත්‍රීවරුන්ට අවස්ථාවක් දෙන්න, මොනවාද කරන්නේ කියලා බලන්න" කියා. මම මේ අවස්ථාවේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගරු මහ ලේකම්තුමාට, මහන්සි වෙලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආරක්ෂා කරන්න හදන, ඇත්ත වශයෙන් අගමැති විය යුතු පුද්ගලයෙක් වශයෙන් කටයුතු කරන ඇමතිතුමාට මම විස්තර එවන්නම්, මේ වරායේ වෙලා තිබෙන දේ ගැන බලන්න. හිටපු මුදල් ඇමතිතුමාටත් බලන්න පුළුවන්, මේ මුදල් නාස්ති කරන්නේ කොහොමද කියලා. අද දුගී දුප්පත් පවුල්වලට - සමෘද්ධියට- වෙන් කරන්නේ රුපියල් කෝටි 7,800යි. නමුත් මේ වාගේ තැනක 150ක විතර සේවක පිරිසක් යොදවා, රුපියල් කෝටි 25ක්, 30ක් විතර වියදම් කරලා තිබෙනවා, stages ගහන්න. අපි අහනවා, කාටද මේ stages ගහන්නේ කියලා.

මැතකදී සරත් එන් සිල්වා හිටපු අග්‍ර විනිශ්චයකාරතුමා කිව්ව දේ තමුන්නාන්සේලාට මතකද? එතුමා කිව්වා, "මේ වාගේ දෙයක් අපි කරන්න ගිහිල්ලා රටට සිදු වෙලා තිබෙන ව්‍යසනය මොකක්ද කියලා බලන්න" කියලා. එතුමා තවම කම්පා වෙනවා, කළ අපරාධය සම්බන්ධයෙන්. දැන් කම්පා වෙලා වැඩක් නැහැ. කරලා තිබෙන දේ සිදු වෙලා ඉවරයි. නමුත් අඩු ගණනේ වැරැද්ද නිවැරදි කරන්න අවශ්‍යයි. ඒ කළ වැරැද්ද නිවැරදි කරන්න ශක්තිය ඔබතුමන්ලාටත් තිබෙන්න ඕනෑ කියලා අපි මේ ගරු සභාවේ ඇමති මණ්ඩලයටත් කියනවා. මොකද, මේ රට කඩා ගෙන යන විධියෙන් පුංචි ලංකාව ලෝකයෙන් ඇත් වී ගෙන යනවා. මේ අය හිතනවා, මෙතැන වණ්ඩි පාට දා ගෙන කෑ ගැහුවාම මුළු ලෝකයම අපි ළඟට ඇවිත් දණ ගහයි කියලා. අද මේ ආණ්ඩුවේ තිබෙන වැරැද්ද තමයි, මුළු ලෝකයම තිබෙන්නේ ලංකාව ඇතුළෙයි කියලා හිතන එක. අපි මෙතැන ශබ්ද කළාම, ඉන්දියාව ඇවිල්ලා දණ ගහනවා ලු; ඇමෙරිකාව මෙතැනට ඇවිල්ලා මුකුළු කරන්න හදනවා ලු; ජපානය ඇවිල්ලා සල්ලි දෙන්න හදනවා ලු කියලා කියමින් යනවා. ඇත්ත වශයෙන්ම මොනවාද වෙලා තිබෙන්නේ?

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම් තුමනි, මේ වරාය අධිකාරිය දෙස බලන්න කියා අපි ඉතාමත් කනගාටුවෙන් කියනවා. අපේ කථානායක චමල් රාජපක්ෂ මැතිතුමා, වරාය භාර ඇමතිවරයා වශයෙන් කටයුතු කළ කාලයේ නම් කවදාවත් මේ වාගේ දෙයක් වෙන්න ඉඩ දුන්නේ නැහැ. එතුමාගේ මල්ලි ජනාධිපති වුවත් මේ වාගේ දේවල් ඒ ආයතනයේ වෙන්න ඉඩ දුන්නේ නැති ඇමතිවරයෙක් වශයෙන් තමයි මම කථානායකතුමාව මේ අවස්ථාවේදී සිහිපත් කරන්නේ.

යෝගරාජන් මන්ත්‍රීතුමාගේ වාහනයට ගල් ගැහුවා. අපට තර්ජනය කරන්න හැදුවා. මේ තමයි අද ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක් යන්න හදන ගමන. විළි ලජ්ජාවක් නැති මේ අය තමාගේ රක්ෂාවවත් ආරක්ෂා කරගන්නේ නැතුව ආණ්ඩුවේ වන්දි භට්ටයෝ වෙන්න ගිහිල්ලා අද රටේ වරාය අධිකාරිය සම්පූර්ණයෙන්ම නැත්තටම නැති වෙලා තිබෙනවා. වරාය අධිකාරිය තිබෙන්නේ තරගකාරී තත්ත්වයක් ඇති කරන්නයි. ඒ තරගකාරී තත්ත්වය තුළින් සිංගප්පූරුවේ වරායවල්, ෆුජෙයිරා වරාය, මස්කට් වරාය වාගේ වරායවල් එක්ක තරග කරන්න පුළුවන් හැකියාවක් තමයි ඇති කරන්නේ. මේ වාගේ අනවශ්‍ය වියදම් තුළින් ඒ තරගකාරී තත්ත්වය නැති වී ගෙන යනවා. එතකොට මොකද වෙන්නේ? අපි වියදම් කර තිබෙන මුදල් උපයා ගන්න බැරි වෙනවා. බැරිවෙන කොට බංකොලොත්භාවය ඇති වෙනවා. බංකොලොත්භාවය ඇතිවන විට මොකද කරන්නේ? ඔන්න, ගිය සුමානේ හම්බන්තොට වරාය චීන්නුන්ට පවරා දීලා තිබෙන බව වාර්තා වෙලා තිබෙනවා. මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය ඇමතිතුමනි, කරුණා කරලා අපට කියන්න ඒක සැබෑ තත්ත්වයක්ද කියලා. Colombo South Harbour Development Project එකේ එක pier එකක් සම්පූර්ණයෙන්ම චීන අයිතියට පවරා දීලා තිබන්නේ. එදා පෞද්ගලික අංශයට සියයට 35ක් තිබුණු Aitken Spence PLC එක චීන කොම්පැනියකට වික්කා. දැන් සියයට 66ක් තිබෙනවා.

අප රටේ ප්‍රතිඅපනයන කිරීම - re-export - ඇති වෙලා තිබෙන්නේ ඉන්දියාවේ නිෂ්පාදන මෙහාට ගෙනැල්ලා අපේ වරාය හරහා අපනයනය කිරීමෙන්. මේක ඉතා භයානක ස්වරූපයක් නොවෙයිද? ඉන්දියාවේ නිෂ්පාදනය කරන භාණ්ඩ ලංකාවට ඇවිල්ලා, චීන වරායක් තුළින් අපනයනය කිරීමට පුළුවන් වෙයි කියලා හිතනවාද? අපි වරාය සුරැකීමේ ව්‍යාපාරයක් වශයෙන් එතැන ගවේෂණය කරන්න ගියේ, ඒ සේවක පිරිසේ අවශ්‍යතාවටයි. එතකොට ගහලා පන්නන එකද සිරිත? අපේ සංජීව සුදත් මැතිතුමාටත්, ධර්මසේන වැලිවිට කියන "දිවයින" මාධ්‍යවේදියාටත් ගහලා තිබෙනවා. මේ වාගේ නින්දිත වැඩ කරලා ජනතාවගේ විශ්වාසය රැක ගන්න පුළුවන් වෙයි කියලා තමුන්නාන්සේලා හිතනවාද?

මේ දවස්වල නොයෙක් නොයෙක් දේවල් සිද්ධ වෙලා තිබෙනවා. මේ ස්ථානයෙන් ගිය වාහන තමයි ඊයේ අම්පාරේදී අල්ලාගෙන තිබෙන්නේ. ඒ ගම්වැසියන් ඒ වාහන අල්ලාගෙන තිබෙනවා, පෝස්ටරයක් අලවන්න යෑමේදී. මොකක්ද ගහන පෝස්ටර් එක? පෝස්ටර් ගහන්න ගියේ වරාය අධිකාරියේ ඉන්න පුද්ගලයෙක්. මම නම කියන්නම්. සංජීව කුමාර, වැලිගම. සාමාන්‍යයෙන් කියන්නේ සභාපතිගේ "තගා" කියලා. ඒ කියන වචනවලින් තමයි මම කියන්නේ. සංජීව කුමාර ඊයේ හැන්දෑවේ ආරක්ෂක නිලධාරියෙකුට ගහලා, ඒ ආරක්ෂක නිලධාරියා ඉස්පිරිතාලේ ඉන්නවා. මේ අය අම්පාරේදී එක්සත් ජාතික පක්ෂයේ නායකතුමාටත්, අපටත් විරුද්ධව පෝස්ටර් ගහන විට අල්ලාගෙන තිබෙනවා.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම්තුමනි, මොකක්ද මේ රටේ තත්ත්වය? අපි අද උදේ වරාය අධිකාරියට ගිහින් ගවේෂණ කරන අවස්ථාවේදී දැක්ක, එතැන තිබුණු දේවල් තමයි අල්ලාගෙන තිබෙන්නේ. දැන් අපට කියන්න පුළුවන්ද, වරාය අධිකාරියේ සභාපති, ඇමති මණ්ඩලය මේ සම්බන්ධයෙන් මොනවාද කරන්නේ කියලා?

කෙහෙළිය රඹුක්වැල්ල ඇමතිතුමා කුණ්ඩසාලේදී කියනවා, "මැතිවරණයක් පවත්වනවා" කියලා. මැතිවරණයක් පවත්වන බව ප්‍රකාශ කරන්නත් කලින් නක්ෂත්‍රය අනුව අරලියගහ මන්දිරයෙන් කියනවා, ජනවාරි මාසයේ 08 වෙනි දා මැතිවරණයක් තියනවා කියලා. එහෙම කියන්නේ, විධායක බලතල යොදාගෙන උසාවිය පවරාගෙන තිබෙනවා වාගේම, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පවරාගෙන තිබෙනවා වාගේම, අනෙකුත් ස්වාධීන ආයතන අත්

පත් කරගෙන තිබෙනවා වාගේම, දැන් ඡන්ද කොමසාරිස්වත් අත් පත් කරගෙන තිබෙන නිසාද? කොහොමද ඒ දිනය ජනවාරි මාසයේ 08වෙනි දා කියලා දැනුම් දෙන්නේ කියන එක අපට දැන ගන්නට අවශ්‍යයි. අපි ඡන්ද කොමසාරිස්ගෙන් මේ ගැන අහනවා. මැතිවරණයක් ගැන Gazette Notification එකක් ඉදිරිපත් කිරීමට හෝ nominations දෙන්න ඉස්සෙල්ලා, ජනවාරි මාසයේ 8වෙනි දා මැතිවරණයක් තියනවා කියලා කියන්නේ කොහොමද? ඡන්ද කොමසාරිස්තුමාගේ ස්වාධීනත්වය අපි බලනවා. අපි මේ ගැන ලෝකයට කියනවා. ස්වාධීන මැතිවරණයක් තියන්න ඕනෑ අවස්ථාවක විධායකයට ඕනෑ විධියට ඡන්ද කොමසාරිස් නටවනවාද? ස්වාධීනත්වයක් තිබෙනවා නම් කරුණාකර කියන්න, මැතිවරණයක් ප්‍රකාශ කරලා නැති අවස්ථාවක ජනවාරි මාසයේ 08වෙනි දා මැතිවරණය පවත්වනවාය කියලා කියන්නේ කොහොමද කියලා?

මේ ආණ්ඩුවේ තිබෙන එකම දේ තමයි දූෂණය. ඒ වාගේම පවුල්වාදය ව්‍යාප්ත කරලා, තරුණ තරුණියන්ගේ අනාගතය නැත්තටම නැති කරලා තිබෙනවා. දැන් ඉතිරි වෙලා තිබෙන්නේ අන්තවාදය විකුණන්නයි. ඒ නිසා තමයි එක්සත් ජාතික පක්ෂයට විරුද්ධව දෝෂාරෝපණ කරලා මඩ ව්‍යාපාරයක් ගෙන යන්න හදන්නේ, අපි කොටින් එක්ක ජීවත් වෙනවා කියලා. මම නැවත මතක් කරන්නට අවශ්‍යයි කොටින් එක්ක කවුද ඉන්නේ කියලා. ඔබතුමාට පිටුපස්සෙන් වාඩිවෙලා ඉන්න කරුණා අම්මාන්, දළදා මාළිගාවට බෝම්බ ගහපු කරුණා අම්මාන් අද කොහේද ඉන්නේ අපේ මුදල් නියෝජ්‍ය ඇමතිතුමනි? එතුමා ඉන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උපසභාපති වශයෙන් නොවෙයිද? එදා ඒ බෝම්බේ අරගෙන ගිය පිල්ලෙයාන් මහ ඇමතිතුමා අද කොහේද සිටින්නේ? එයා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ අමැතිවරයකු වශයෙන් කටයුතු කරනවා නොවේද? ඒ වාගේම, කේපී කියන පුද්ගලයා අද ඉන්දියාවෙන් ඉල්ලනවා. අපේ පොලීසියේ සහ ත්‍රිවිධ හමුදාවේ හැත්තෑදහසක් පමණ මරන්න සල්ලි එකතු කළ කේපී අද කොහේද ඉන්නේ? රජ ගෙදර නොවෙයිද? සම්පූර්ණ ආරක්ෂක රැකවරණය සහිතව නොවෙයිද ඉන්නේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම, මේ අවස්ථාවේදී විමල් වීරවංශ ඇමතිතුමා කියනවා, "ඔව්, ජිනීවාවල තිබෙන අපේ Embassy එක ප්‍රතිසංස්කරණය කරන්න කොටින්ට අවස්ථාව දීලා තිබෙනවා" කියලා.

හැබැයි කියනවා, ඒ අවස්ථාව දුන්නේ ක්ෂෙනුකා සෙනෙවිරත්න ලේකම්තුමිය නොවෙයි, ඊට පෙර හිටපු කෙනෙක් කියලා. ඒකෙන් අර්ථකථනය වෙන්නේ ආණ්ඩුව කොටින් එක්ක ඉන්නවාය කියන එක නොවෙයිද? එහෙම කරන විලිලජ්ජාවක් නැති මේ ආණ්ඩුව තමන්ගේ ප්‍රශ්න විසඳා ගන්න බැරිව එක්සත් ජාතික පක්ෂයට බැනලා හරියනවාද? මේක නිකම්, ජිනීවාවල පොල් ගෙඩියක් වැටුණත් ඒක එක්සත් ජාතික පක්ෂයේ account එකට යනවා වාගේ වැඩක්. European Union ඉවත් කළ ඒ proscription එක re-introduce කරන්න අඩු ගණනේ එහි සිටින නානාපතිවරු affidavit එකක් දුන්නාද? අන්න ඒ නිසා තමයි දැන් උපුල් ජයසූරිය, Bar Association එකේ සභාපති ඇතුළු අය ඉදිරිපත් වෙලා තිබෙන්නේ යුරෝපයට උත්තර දෙන්න. ආණ්ඩුවේ නීතිපති දෙපාර්තමේන්තුවේ කිසිම දක්ෂතාවක් නැහැ ඒකට. එදා හෙජින් සූදුවෙන් නැතිවුණා; පැරදුණා. ඒ වාගේම තමයි Channel 4 සම්බන්ධවත්. අඩු ගණනේ ඒ සම්බන්ධව නඩුවක් දාන්න බැරිවුණා.

ඊළඟට කියනවා, රනිල් වික්‍රමසිංහ යුරෝපයට ගියාට පස්සේ මේ දේ වුණා කියලා. අනේ නියෝජ්‍ය මුදල් ඇමතිතුමනි, රනිල්ට එහෙම කරන්න පුළුවන් නම්, ඇයි කොටියා ඒ වාගේ පුද්ගලයෙකුට ආණ්ඩුව නොදෙන්නේ? 1994 දී රනිල් පැරැද්දුවේත් කොටියෝ. 2005 දී පැරැද්දුවේ ටිරාන් අලස්ලා වාගේ කට්ටිය ගිහින් සල්ලි දීලා. මුලතිව්වලදී සල්ලි දීලා නේද? කොටියා රනිල් පරාජය කළා නම්, මොකටද ඒ කොටිත් එක්ක තිබෙන සම්බන්ධකම? කොටිත් එක්ක ඒ සම්බන්ධකම් තියා ගන්නේ පැරදෙන්නද? දැන් තමයි පෙනෙන්නේ කොහේද මේ කොටි සම්බන්ධකම තියෙන්නේ කියලා. කොහේද ඒ කොටි සම්බන්ධකම තියෙන්නේ? අර දයාන් ජයතිලකලා කොටින්ට විරුද්ධව සටන් කරන කොට ගෙදර යවනවා; රජීව් විජේසිංහ මන්ත්‍රීතුමා නිර්භීතව සටන් කරන කොට ගෙදර යවනවා; ක්‍රිස් නෝනිස්ලා කොටින්ට විරුද්ධව Channel 4 එකේ දක්ෂ ලෙස කථා කරන කොට, මෙහේ ඉන්න මන්ත්‍රීවරු ගිහිල්ලා කම්මුලට ගහලා මෙහාට ගෙන්න ගන්නවා. අමුණුගම ලේකම්තුමා - මම දන්නෙ නෑ නියෝජ්‍ය මුදල් ඇමතිතුමාට ඥාතිකමක් තිබෙනවද කියලා - ඒ විධියට සටන් කරන කොට මෙහේට ගෙන්න ගන්නවා. තමාරා කුගනායගම්ටත් ඒ වගේම ඉරණමක් නොවෙයිද අත් වුණේ? එහෙම නම්, කොටින්ට විරුද්ධව සටන් කරන, අන්තවාදය පරාජය කරන්න කටයුතු කරන හැම දෙනාම මේ ආණ්ඩුව විහින් තමයි වට්ටන්නේ. මොකද, අන්තවාදය තිබෙන කොට විතරයි මේ ගොල්ලන්ට ඉන්න පුළුවන් වෙන්නේ. එහේ අන්තවාදය තිබෙන කොට, මේ ගොල්ලන් මෙහේ අන්තවාදය ලස්සනට වපුරා ගෙන කටයුතු කරනවා. ඉතින් මේ DFCC බැංකුව, NDB බැංකුව ඒකාබද්ධ කිරීමෙන් රටේ තිබෙන ප්‍රශ්න විසඳෙනවාද? නැහැ. මේකෙන් මේ එක්කෙනෙකුගේ දෙන්නෙකුගේ පවුලේ ප්‍රශ්න විසඳනවා මිසක් රටේ සමස්ථ ආර්ථික ප්‍රශ්න විසඳෙන්නේ නැහැ.

යුරෝපයේ කොටි තහනම ඉවත් කිරීම සම්බන්ධයෙන් විදේශ ඇමති, නියෝජ්‍ය විදේශ ඇමති, ඒ වැඩ සම්පූර්ණයෙන්ම අධීක්ෂණය කරන මන්ත්‍රීතුමා, විදේශ අමාත්‍යාංශයේ ලේකම්තුමා ඉල්ලා අස් වෙන්න ඕනෑ නේද කියලා අපි අහන්න කැමැතියි. තවම ඒ සිද්ධිය ගැන ඇමතිතුමා ප්‍රකාශයක් කරලා නැහැ. මට ආරංචියි අද හැන්දෑවේ ප්‍රකාශයක් සිදු කරන බව. ඒ ප්‍රකාශය මොන ස්වරූපයෙන්ද කරන්න පුළුවන් වෙන්නේ? පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් තානාපති වරයෙකුට ගැහුවාම අඩු ගණනේ ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් - investigation - ක්ෂණිකව ඇති කරන්න බැරි නම්, මොකක්ද ඒ ඇමතිකමේ තිබෙන වටිනාකම? මම කියනවා, යම් විධියක investigation එකක් කළත් හෙළිදරවු වේවි තානාපති නෝනිස් එයාටම ගහගෙන කියලා. ඒක තමයි ඒ පරීක්ෂණයෙන් අන්තිමට අනාවරණය වෙන්නේ.

ඉතින් නියෝජ්‍ය කථානායකතුමනි, මේ වාගේ විලිලජ්ජා නැති ආණ්ඩුවක කොන්දක් නැතිව ඉන්නවාට වැඩිය හොඳයි නේද, මේ රටේ යමක් කරන්න පුළුවන් විපක්ෂයත් සමඟ කොන්දක් සහිතව ඒකාබද්ධ වෙලා රට ආරක්ෂා කරන එක? අපි වරායට ගියාම වරායේ ඉන්න කට්ටිය අපට ගහන්න හදනවා. ගහන්න හැදුවාට අපි බය වෙන්නෙ නැහැ. අපට අවශ්‍ය වෙන්නේ මේ රට සංවර්ධනය කරන්නයි. අපට අවශ්‍ය වෙන්නේ මේ රටේ ජනතාව ජීවත් කරවන්නයි. අපට අවශ්‍ය වෙන්නේ මේ රටේ බදු ගෙවන්නාගේ සල්ලි මේ ආයතන හරහා සූරා කෑම නවත්වන්නයි. අපට අවශ්‍ය වන්නේ මේ රටේ නන්නත්තාර වෙලා සිටින ජනතාවට හෙටක් තිබෙනවා කියලා පෙන්වලා දෙන්නයි. ඒක කරන්න පුළුවන් එකම පක්ෂය එක්සත් ජාතික පක්ෂයයි. ඒ නිසා මේ NDB ආයතනය, DFCC ආයතනය සමඟ ඒකාබද්ධ කිරීමට අපි විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. මොකද, මෙය කරන්නේ බංකොලොත් වෙලා තිබෙන ආණ්ඩුවකට තව සල්ලි ගන්න පුළුවන් හැකියාව ඇති කිරීමටයි. මම දන්නේ නැහැ මේවා කොහෙන් එන සල්ලිද කියලා. මේවා drug baronsලාගේ සල්ලි වෙන්න පුළුවන්; මේවා මේ අවි ආයුධ හරහා එන සල්ලි වෙන්න පුළුවන්. ඒවා පාවිච්චි කරලා මේ රටේ ණය ගැනීමේ හැකියාව

[ගරු රවි කරුණානායක මහතා]

ඇති කිරීම විතරයි මේ කරන්නේ. ඒ නිසා අපට ඔබතුමන්ලාගෙන් මේ සම්බන්ධයෙන් සෘජු පිළිතුරක් අවශ්‍යයි, කොහොමද මේ කටයුතු නිරාකරණය කරන්නේ, කොහොමද මේ කටයුතු හරි මාර්ගයට ගන්නේ කියලා. එක මතක් කරමින්, මේ බැංකු ඒකාබද්ධ කිරීමට අපි විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. මේ බැංකු දෙකේ තිබෙන දක්ෂතා සමඟ බැලුවාම, මේවා ඒකාබද්ධ කිරීමෙන් වෙන්නේ ජනතාවට සේවයක් වෙන එක නොවෙයි, මේ බංකොලොත් ආණ්ඩුවට තව ණය ගන්න පුළුවන් හැකියාව ඇති කිරීම පමණයි. ඒ නිසා තමයි අපි මේ පනත් කෙටුම්පතට විරුද්ධත්වය ප්‍රකාශ කරන්නේ කියන කාරණය මතක් කරනවා. කරුණාකර රටේ ආර්ථිකය තව කඩා වැටෙන්න ඉස්සර වෙලා, මේ පාලනය කරන්න බැරි නම්, පාලනය අපට භාර දෙන්න. එක්සත් ජාතික පක්ෂයට නැවත මේ රටේ ආර්ථිකය සවි ශක්තිමත් කරන්න භාර දෙන්න කියමින් මම නිහඬ වෙනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(*பிரதிச் சபாநாயகர் அவர்கள்*)
(The Deputy Speaker)
ඊළඟට, ගරු තිලංග සුමතිපාල මහතා. Order, please! Will an Hon. Member propose the Hon. Janaka Bandara to take the Chair?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
I propose that the Hon. Janaka Bandara do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ජානක බණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு ஜானக பண்டார அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. JANAKA BANDARA *took the Chair.*

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 4.43]

ගරු තිලංග සුමතිපාල මහතා
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
නමෝ බුද්ධාය!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින දෙවන වර කියැවීම සඳහා අප ඉදිරියේ තිබෙන ඩිඑෆ්සීසී බැංකුව (ඉවත් කිරීමේ හා ආනුෂාංගික විධිවිධාන) පනත් කෙටුම්පත සම්බන්ධ විවාදයේදී වචන ස්වල්පයක් ඉදිරිපත් කිරීමට ලැබීම ගැන මම සතුටු වෙනවා.

එම පනත් කෙටුම්පතේ අරමුණ අපේ මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍ය ගරු සරත් අමුණුගම මැතිතුමා මේ උත්තරීතර සභාවට ඉදිරිපත් කළා. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාගේ, ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාගේ, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාගේ සහ ඊට කලින් කථා කළ ගරු මන්ත්‍රීතුමන්ලාගේත් කථාවලට මා සවන් දුන්නා. ඒ ගරු මන්ත්‍රීතුමන්ලා කරුණු කියන්නට උත්සාහ කළේ, මෙම තීන්දුව පදනම් කර ගෙනයි; ඊට විරුද්ධව නොවෙයි. එතුමන්ලා හැමෝම අද කථා කළේ මේ පනත් කෙටුම්පත ගැන කථා කරනවාට වඩා ඊට එහා ගිය දේශපාලන කරුණු ගැනයි. ඒ දේශපාලන කරුණුවලට උත්තර දෙන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ, ඒවා අද මේ පනත් කෙටුම්පතට සම්බන්ධ නොවන නිසා. කෙසේ වෙතත් යම් කරුණුවලට උත්තර දිය යුතුය කියා මා කල්පනා කරනවා.

ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කරුණු ඉදිරිපත් කරමින් පෞද්ගලික අංශයේ ණය වර්ධන වේගය සියයට දශම 8ක්ය කිව්වා. ඇත්තටම එදා තත්ත්වය එහෙම වුණාට ගරු සරත් අමුණුගම මැතිතුමා කිව්වා වාගේ මේ වර්ධනය සඳහා කාලයක් අවශ්‍යයි. අගෝස්තු මාසය වෙනකොට, පෞද්ගලික අංශයේ ණය වර්ධනය සියයට 2.6 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒක ඉතා හොඳ තත්ත්වයක්. ඒ වැඩි වීම වාගේම ලෝකයේ රත්රන්වල මිල අඩු වීමක් වුණා. රත්රන්වල මිල අඩු වෙනකොට, මිනිස්සු අතමාරුවට ණය ගන්න පොලී අනුපාතය අඩු වෙනකොට එවැනි තත්ත්වයක් උදා වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ඩිඑෆ්සීසී බැංකුවට අද මොකක්ද කරන්නේ කියා බැලුවොත් මේක හදිසියේ වෙන දෙයක් නොවෙයි. හේතු රාශියක් උඩ කරන දෙයක්. වර්ධන බැංකුව කියන්නේ ඩිඑෆ්සීසී බැංකුවේම ශාඛාවක්. - ඒ වාගේම එන්ඩීබී බැංකුව ගැන බලනවිට, මේ බැංකු පද්ධති දෙක එකතු වෙන්නේ ශක්තිමත් වෙලා ඉදිරියට යන්නයි. මේකට "mergers and acquisitions" කියා කියන්නේ. මේ බැංකු ඒකාබද්ධ වීම ලෙහෙසි නැහැ. පළමුවෙන්ම ඒ බැංකු එකිනෙක කථා කර ගන්නවා. ඊට පස්සේ මහ බැංකුවට - Central Bank එකට ඒක ඉදිරිපත් කර අවසරයක් ගන්නවා. අවසරයක් අරගෙන, "මෙහෙම අදහසක් අපේ තිබෙනවා, මෙවැනි ක්‍රමවේදයකට අප යනවා" කියා ඒ අය කොටස් වෙළඳපොළ දැනුවත් කරනවා. ඊට පස්සේ, මේ දෙක සම්බන්ධ වීමෙන් තමන්ගේ ශක්තිය වැඩි කර ගන්නේ කොහොම ද, ඒ ශක්තියෙන් තමන්ගේ පාරිභෝගිකයන්ට ප්‍රතිලාභ ලබා දෙන්නේ කොහොමද කියා මේ ආයතන දෙක කතිකාවක් ඇති කර ගන්නවා. මෙම ක්‍රමවේදයට පෞද්ගලික අංශයේ මෙවැනි බැංකු පද්ධතියක් එකතු වෙනකොට මොකක් ද හේතු වෙන්නේ කියා කල්පනා කරන්නට ඕනෑ.

දැනට අවුරුදු භයකට හතකට ඉස්සෙල්ලා බැංකු පවත්වාගෙන යන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. අද බැංකු එකතු වෙලා ඉදිරියට යන්නට හිතන්නේ ඇයි? ප්‍රධාන දෙය තමයි, ඒ අයට ස්ථාවරභාවයක් මූල්‍ය ශක්තියක් ඇති වන බව පෙනීම. විශාල මූල්‍ය අවශ්‍යතාවක් සඳහා බැංකු පද්ධතියට අනාගතයක් තිබෙනවා. අප මේ බැංකු දෙකේ ප්‍රාග්ධන මුදල් බැලුවොත් ඩිඑෆ්සීසී බැංකුවට බිලියන 56ක ප්‍රාග්ධනයක් තිබෙනවා. ඒ වාගේම එන්ඩීබී බැංකුවටත් බිලියන 35ක විතර ප්‍රාග්ධන ප්‍රමාණයක් තිබෙනවා. මේ බැංකු දෙක එකතු කළාම බිලියන 100ක් පමණ වූ බැංකු පද්ධතියක් එක ශක්තිමත් බැංකුවක් බවට පත් වෙන බව අපට පැහැදිලිව පෙනෙනවා. පෞද්ගලික අංශයේ සියලු අය සහභාගි කර ගෙන මෙහෙම හිතනකොට - මේකේ ශක්‍යතාව - feasibility - බලනකොට, ඒකේ පැවැත්මේ ඉඳලා අඩුම ගණනේ අවුරුදු පහක - දහයක දීර්ඝ කාලීන පැවැත්ම සඳහා බැංකුව තුළම වාර්තා එකතු කරනවා. ඒ තුළින් තමයි ඒ අය ක්‍රියාත්මක වෙන්නේ. මේ බැංකු පද්ධති දෙක එකතු වීම තුළින් මොකක් ද සිද්ධ වෙන්නේ? විශාල ප්‍රාග්ධන මුදලක් බැංකුවට ගේන්න පුළුවන් වෙනවා. එහෙම ප්‍රාග්ධන මුදලක් ගෙනැල්ලා සංවර්ධනය සඳහා, ජනතාවගේ අවශ්‍යතාවය සඳහා නිදහස් කරන්න පුළුවන් වෙනවා.

අපේ රටේ එවැනි බැංකු විශාල සංඛ්‍යාවක් නැහැ. විපක්ෂයෙන් අද ලංකා බැංකුව ගැන කිව්වා, මහජන බැංකුව ගැන කිව්වා. අපි ඒ බැංකු පද්ධති දෙකට අත තිබ්බා නම් කියයි, "බැංකු එකතු කරලා රාජ්‍ය බැංකු දෙක විනාශ කරන්න යනවා. එතකොට තරගකාරිත්වය වැටෙනවා." කියලා. ඒ නිසා ගරු ඇමතිතුමා ක්‍රියාත්මක කළේ හොඳම උපක්‍රමයක්. ඔබතුමා ලංකා බැංකුවට, මහජන බැංකුවට අත තිබ්බා නම් කියයි, "මෙන්න ඉවරයි, ආණ්ඩුවේ තිබෙන හොඳම බැංකු දෙක, දුප්පත් මිනිස්සුන්ගේ සල්ලි දමන තැන, මේ බැංකුවල තමයි EPF එකේ ETF එකේ ඔක්කොම සල්ලි තිබෙන්නේ. ආණ්ඩුව මේක විනාශ කරන්න යන්නේ." කියලා. මේ බැංකු දෙක ඊළඟ තලයට යන්න පුළුවන් බැංකු දෙකක්. මේ බැංකු දෙක එක බැංකුවක් බවට පත් වීමෙන් වන්නේ මොකක්ද? බැංකුවක් තුළ සාමාන්‍යයෙන් පරිපාලන ව්‍යූහයේ ක්‍රමවේදයක් තිබෙන්න ඕනෑ. ඒ කියන්නේ හොඳ පරිපාලනයක්, නැත්නම් යහ පාලනයක් බැංකුව තුළ තිබෙන්න ඕනෑ.

ඊළඟට, බැංකුවකට මුදල් රඳවා ගැනීමේ ධාරිතාවක්, නැත්නම් තැන්පතු පිළිබඳ විශාල ධාරිතාවක් තිබෙන්න ඕනෑ. ඒ වාගේම බැංකුව තුළ හොඳ පිරිස් කළමනාකරණයක් තිබෙන්න ඕනෑ. ඒ වාගේම බුද්ධිමත්, දැනුම තිබෙන, මූල්‍ය කළමනාකාරිත්වය තිබෙන, හොඳ පිරිස් පාලනයක් තිබෙන්න ඕනෑ. ලෝකයේ තිබෙන බැංකුවක ස්ථාවරභාවය මූලික වශයෙන් බලන්නේ පිරිස් පාලනයත්, යහ පාලනයත්, මූල්‍යමය ශක්තියත් පදනම් කර ගෙනයි. දැනට අවුරුදු හතරකට ඉස්සර වෙලා අපි මේ මහා උත්තරීතර සභාවට ගෙනාවේ ට්‍රිලියන් එකකට අඩු අය වැයක්. නමුත්, අපි අවුරුදු හතරකට ඉස්සෙල්ලා ට්‍රිලියනය ඉක්මවා ගියා. අපි මේ වසරේ ට්‍රිලියන 1.7ක අය වැයක් පාර්ලිමේන්තුවට ගේනවා. මේ කියන්නේ මොකක්ද? ට්‍රිලියනයක අය වැයක් ඉදිරිපත් කරන රටක බැංකු පද්ධතියේ බැංකු කීයද තිබෙන්නේ? බැංකුවක් මඟින් කරන්නේ විශාල මුදලක් පාලනයක් යටතේ ජනතාව අතර බෙදා හැරීමයි.

අපි බලාපොරොත්තු වන වේගයට දළ දේශීය නිෂ්පාදනය වැඩි වන්න, 2016 වර්ෂය වන කොට අපි බලාපොරොත්තු වන විධියට ඒකපුද්ගල ආදායම ඩොලර් 4,000කට, 2020 වර්ෂය වන කොට ඒකපුද්ගල ආදායම ඩොලර් 7,000කට ඉහළ යන්න රටට විශාල මුදල් සංක්‍රමණයක් අවශ්‍යයි. ඒ මුදල් රට තුළම නිෂ්පාදනය වන්නේ නැහැ. ජාත්‍යන්තර වශයෙන් අපට FDI - Foreign Direct Investments - එන්න ඕනෑ. ඒ වාගේම ඒ එන සංවර්ධනයට සාපේක්ෂිතව මුදල් සංසරණය කිරීම සඳහා ජනතාව අතරටත්, සංවර්ධනයටත් මුදල් බෙදා හරින්න බැංකුවලට ශක්තිය තිබෙන්න ඕනෑ. අපට එවැනි බැංකු පහක්, හයක් අවශ්‍යයි. ඒ නිසා මේක ඉතා ප්‍රගතිශීලී වැඩක් කියලායි මම හිතන්නේ. මේ තුළින් වාසි රාශියක් ඇති වන්න පුළුවන්.

මම 2001, 2002 සහ 2003 වර්ෂවලදී ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ සභාපති විධියට සේවය කළා. ඒ කාලයේදී අපි මොබිටෙල් ආයතනය සල්ලි දීලා ගත්තා. ඒ කාලයේ මොබිටෙල් ආයතනය ගන්න ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට සල්ලි තිබුණේ නැහැ. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ සියලුම ශක්තිය දමා අපේ ගමන් මාර්ගයට යන විධිය කියලා පිට රටින් ණයක් ගන්න ලංකාවේ බැංකුවක් නම් කරන්න ඒ වෙලාවේ අපට සිද්ධ වුණා. 2002 දී මුදලක් පිට රටින් අරගෙන ණයක් දෙන්න ලංකාවේ කිසි බැංකුවක් තිබුණේ නැහැ. ඒ නිසා අපට ස්ටැන්ඩඩ් චාර්ටඩ් බැංකුවට යන්න සිද්ධ වුණා. ඒ අයට අපි ජාත්‍යන්තරයෙන් ඇපකරයක් දීලා ලංකාවේ ස්ටැන්ඩඩ් චාර්ටඩ් බැංකුවෙන් නියෝගයක් නිකුත් කළා, ලංකාවේ බැංකුවකට සල්ලි දෙන්න කියලා. මොකද, ජාත්‍යන්තර තත්ත්වයේ බැංකුවක් එදා අපේ රටේ තිබුණේ නැහැ.

ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමා කරන්නේ අපේ capacity-building එක, එහෙම නැත්නම් අපේ bottomline එක උඩට ගන්න එක. මේක කළ යුතුයි කියන එක ගැන කිසිම විවාදයක් නැහැ. නමුත්, මේ අවස්ථාව නිර්මාණය වන්නේ රට තුළ අත්‍යවශ්‍ය කරුණුවල වර්ධනයක් තිබෙන නිසාත්, දළ දේශීය නිෂ්පාදනය වැඩි වන නිසාත්, ඒකපුද්ගල ආදායම වැඩි වීම නිසා සහ අපේ ප්‍රාග්ධන වියදම් එක්ක බලන කොට අපේ ණයට වඩා අපි හොඳ ආදායමක් දරන රටක් නිසාත්ය. මම හිතන්නේ මේ තුළින් යවන ජාත්‍යන්තර පණිවුඩය - signal එක - තමයි අපි ඉතා උපක්‍රමශීලීව ඉදිරියට යන ප්‍රගතිශීලී රජයක්ය කියන කරුණ. මේ රජය බොහොම ක්‍රමවත්ව, විධිමත්ව මේ ගමන යනවා. මේ රජය ආයෝජකයන්ගේ අවශ්‍යතාව සඳහා ප්‍රාග්ධන මුදල් වැඩිදියුණු කර ගැනීම සඳහා අවස්ථාව හදනවා. මේ වාගේ දේවල්වලින් තමයි රටක මිනිසුන්ගේ විශ්වාසය ඇති වන්නේ.

අපි අධිවේගී මාර්ග -highways- හදනවා, ගුවන් තොටුපොළවල් හදනවා, වරායවල් හදනවා. හැබැයි, ඔබතුමා මේ විධියට අපේ මූල්‍ය පරිපාලනය වැඩි කළේ නැත්නම්, ඒ කිසිම දෙයකින් වැඩක් නැහැ. ඒ නිසා මීට සමාන්තරව අපේ ශක්තිය, එහෙම නැත්නම් capacity- building එක වැඩිදියුණු කරන්න ඔබතුමා කරන එක උපක්‍රමයක් තමයි මේ බැංකු දෙක එකක් කිරීම. ඒ නිසා මේ ගැන අපි හදවතින්ම සන්තෝෂ වනවා පමණක් නෙවෙයි, මේක යුගයේ අවශ්‍යතාවක් කියලායි අපි හිතන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම, මේ බැංකුවල ඉන්නේ ඉතාම දක්ෂ අධ්‍යක්ෂ මණ්ඩලයක්. මේවායේ ඉන්නේ මූල්‍ය කළමනාකාරිත්වය ගැන විශාල අවබෝධයක් තිබෙන අය. ඒ අය ආවාට, ගියාට මේ ලියකියවිලි හදන්නේ නැහැ. මේවාට උපදෙස් ලබා දෙන නීති ආයතන වෙන වෙනම තිබෙනවා; මූල්‍ය උපදෙස් දෙන ආයතන තිබෙනවා; ලෝක බැංකුව වෙනම ඉන්නවා; ආසියානු සංවර්ධන බැංකුව මේ පැත්තෙන් ඉන්නවා. මේ සියලු දෙනාගේම දත්තයන් තිබෙනවා. ඒවා ගැන තොරතුරු ලබා දෙන මූල්‍ය පරිපාලන උපදේශක මණ්ඩල ඉන්නවා. උපදේශක ආයතන තිබෙනවා. ඒ සියලු දෙනා කියනවා, මේ දෙය විය යුතු දෙයක්ය කියලා.

මම මේ වෙලාවේ එක දෙයක් උපුටා ගත්තා, ඔබතුමාගේ දැන ගැනීම පිණිස. ඒ තමයි පසු ගිය අවුරුදු කිහිපය ගත්තොත්, 2013 වර්ෂයේ දී ඇමෙරිකාවේ NBT Bank එකත්, Alliance Bank එකත් merge වුණා. ඒ වාගේම 2013 වර්ෂයේ දී FirstMerit Bank එකත්, Citizens Republic Bancorp එකත් එකතු වෙලා FirstMerit Bank එක බවට පත් කළා. 2012 වර්ෂයේ දී PNC Financial Services එකත්, RBC Bank එකත් PNC Financial Services කියලා එකතු කළා. 2011 වර්ෂයේ දී Capital One එක සහ ING Direct USA එක එකතු වුණා. ඒ වාගේම 2011 වර්ෂයේ දී M&T Bank එක සහ Wilmington Trust එක එකතු වුණා. 2009 වර්ෂයේ දී M&T Bank එක Bradford Bank එක සමඟ එකතු වුණා. 2009 වර්ෂයේදීම M&T Bank එක Provident Bank of Maryland එකත් එක්ක එකතු වුණා. එසේ එකතු වෙලා කළේ මොකක් ද? ඇමෙරිකාවට එහෙම එකතු වෙන්න ඕනෑ නැහැ නේ. හැබැයි, ඒ ඇත්තන්ටත් පෙනුණා, සමහර බැංකුවල ඒ අයගේ ප්‍රාග්ධන ශක්තිය වැඩි කිරීම තුළින් ඒ අයට මෙය සිදු කළ යුතුයි කියලා.

එක මතයක් හැදුවා, මේ බැංකු තුන එකතු වීම තුළින් ඒවායේ සංවර්ධනයක් නොව, එදිනෙදා බැංකු පද්ධතියට අනුවයි කටයුතු වෙන්නේ කියලා. දැන් අපි යනවා, අලුත් අඩවියකට. එසේ අලුත් අඩවියකට ගියාම මේ බැංකු තුන, Companies Act එක යටතේ ලියාපදිංචි වෙනවා. එතකොට ඒ අය පරිපාලනය වෙන්නේ, ඒ රටේ නීති රාමුව තුළයි. ඒ නීති රාමුව තුළ ඉන්න කොට, මේවා

[ගරු තිලංග සුමතිපාල මහතා]

commercial banking කරන වාණිජ බැංකුවක් හැටියට පත් විය යුතුමයි. වාණිජ බැංකුවක ශක්තිය නැත්නම්, මේ බැංකුවල ප්‍රාග්ධනය වැඩි වුණාට වැඩක් නැහැ. ඒ අයට පිට රටින් මුදල් ගෙනෙන්න පුළුවන්. එය පෞද්ගලික අංශයට වෙන්න පුළුවන්; රජයට වෙන්න පුළුවන්. නමුත් ව්‍යාපෘතිවලට ආයෝජනය කරන්න බැහැ, වාණිජ බැංකුවක - commercial bank එකක - licence එකක්, ක්‍රමවේදයක් නැත්නම්. එම නිසා ඒක විය යුතු දෙයක්.

DFCC බැංකුව කියන්නේ හොඳ, සංවර්ධන බැංකුවක්. එම නිසා සංවර්ධන බැංකුවට, සංවර්ධනය පමණක් කර ගෙන ඉන්න තිබුණා, මේ merger එකෙන් සංවර්ධනයට හානියක් වෙනවා කියලා. එහෙම නැහැ. ඒ ඇත්තන් කර ගෙන ආපු දේවල් දිගටම කර ගෙන යන්න පුළුවන්. ඊට අමතරව ඒ අයගේ portfolio එක, එහෙම නැත්නම් ඒ අයගේ spread එක, ඒ ගොල්ලන්ගේ අවස්ථාව තව පුළුල් වෙනවා. එසේ පුළුල් වීම තුළින් ඒ කර්තව්‍යය වඩාත් හොඳින් කර ගෙන යන්න පුළුවන් වෙනවා.

මෙතැනදී එක සැකයක් මතු වෙනවා, මේ අය මේ විධියට කර ගෙන ගියාම, මේ අය නැවතත් මුදල් ගත්තාම, එම මුදල් ආයෝජනය කරන්නේ රජයේ ව්‍යාපෘතිවලට සල්ලි අවශ්‍ය නිසා කියලා. ඒක එහෙම වෙන්නේ නැහැ. හේතුව මේකයි. මෙය කොටස් වෙළඳ පොළේ ආයතනයක්. මිනිසුන් කොටස් ගත්තායින් පසුව ඒ අයට පීඩනයක් තිබෙනවා. මහ සභා රැස්වීමක් තිබෙනවා. ඒ මහ සභා රැස්වීමේදී තමන්ගේ සියලුම වාර්ෂික වාර්තා ඉදිරිපත් කරනවා. අධ්‍යක්ෂ මණ්ඩලයක් සිටිනවා. ඒ අයගේ බැඳීමක් තිබෙනවා, මෙය හොඳින් කර ගෙන යෑමට.

මා හිතන හැටියට අපට ජාත්‍යන්තර වශයෙන් මුදල් ගෙනෙන්න පුළුවන් විධියේ බැංකු බොහොම ටිකයි තිබෙන්නේ. ඒ බැංකු ටික ශක්තිමත් වෙනවා කියන්නේ, පැහැදිලිවම විශේෂයෙන්ම පෞද්ගලික අංශයට මේකේ වාසිය ලැබෙනවා කියන එකයි. පෞද්ගලික අංශයට විශාල වාසියක් අත් වෙනවා. මොකද, අද ලංකාව තුළ ඉන්න දේශීය ව්‍යාපාරිකයාට ජාත්‍යන්තර තලයේ ව්‍යාපාරයක් කර ගෙන යන්න, ජාත්‍යන්තර තලයේ හැකියාව තිබෙන දේශීය ව්‍යාපාරිකයාට ජාත්‍යන්තර මුදල් ගන්න තිබෙන අවස්ථාව අඩුයි. ඒ අය ලංකාවේ මුදල් අර ගෙන, ලංකාවේ ණය අර ගෙන ව්‍යාපාර දියුණු කරනවා. හැබැයි, රටක් විධියට දියුණු වෙමින් පවතින මේ වෙලාවේදී අපි මධ්‍යම දියුණුවේ රටක් විධියට හිතලා වැඩ කළොත්, අපට මේකෙන් එළියට එන්න බැරි වෙනවා. මේ රට මැදි ආදායම් රටක් හැටියට නැතුව දියුණු වුණු රටක් බවට පත් වෙන්න නම් මේ අවස්ථාව නිර්මාණය විය යුතුමයි. ගරු සරත් අමුණුගම නියෝජ්‍ය ඇමතිතුමා එතුමාගේ කථාවේදී බොහොම පැහැදිලිව කිව්වා, "අපිට middle-income trap එකට යන්න බැහැ" කියලා. ඒ middle-income trap එකට අපි යනවා නම්, අපට ඔහේ ඉන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා එය හරියාකාරව විග්‍රහ කළා. අපි ඊළඟ අඩවියට යන්න නම්, දියුණු වුණු රටක් වෙන්න නම් මේ තුළින් විතරයි රට තුළ ඉන්න දේශීය ව්‍යාපාරිකයා ශක්තිමත් වෙන්නේ.

භය නැතිව ගිහින් ඒ අයට ලංකාවේදී විදේශ ණයක් ගන්න පුළුවන්. දේශීය ව්‍යාපාරිකයාට ඩොලර්වලින් බැංකු ණයක් ගන්න පුළුවන් නම් එය කොයි තරම් වටිනවාද? ආනයනය කරන බඩු ටිකට, ආනයනය කරන යන්ත්‍රෝපකරණවලට, ආනයනය කරන සියලුම තාක්ෂණයට දේශීය ව්‍යාපාරිකයාට ඩොලර්වලින් ණයක් ගන්න පුළුවන් අවස්ථාවක් මේ හරහා උදා වෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මෙවැනි ප්‍රගතිශීලී තීන්දුවක් ගැනීම පිළිබඳව නැවතත් අපි ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ කර්තව්‍ය සාර්ථක වෙලා, හැකි ඉක්මනින් මේ බැංකු දෙක අලුත් වෙලා, ඒ අලුත් වූ බැංකුවලින් මේ රටට වැඩි සේවාවක් කරන්න ලැබෙවායි කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 32ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.59]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි අද කථා කරන්නේ ඩීඑෆ්සීසී බැංකුව (ඉවත් කිරීමේ හා ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත ගැනයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ගැන කථා කරන්න සූදානම් වන මේ මොහොතේදී මම පළමුවෙන්ම මෙන්න මේ කාරණය සඳහන් කරන්න ඕනෑ. අපේ රවි කරුණානායක මන්ත්‍රීතුමා මීට මොහොතකට පෙර මේ ගැන කිව්වා. අද අපේ රවි කරුණානායක මන්ත්‍රීතුමා, යෝගරාජන් මන්ත්‍රීතුමා, නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා, අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා කොම්පඤ්ඤ වීදියේ තිබෙන වරාය අධිකාරියේ ඉඩමකට ගිහින්, එහි සේවකයන්ගේ ඉල්ලීම මත කරුණු සොයා බලන කොට, ඒ අයට එල්ල වුණු ප්‍රහාරය ගැනයි මම මේ කියන්නේ. මා හිතන හැටියට ගරු කථානායකතුමා ඒක ගැන සොයා බලයි. රජයේ ඉඩමක, රජයේ සේවකයෝ එතැන මැතිවරණ කටයුතු කර ගෙන යනවා. ඒක බලන්න ගියාම තමයි, මේ ගල් ප්‍රහාරයෙන් ඒ වාහනවලට ලොකු අලාභ හානි අද සිදු වෙලා තිබෙන්නේ. මේක අධි ආරක්ෂිත කලාපයක් තුළ වූ සිදුවීමක්. මම දන්නවා, ගරු කථානායකතුමා ඒ ගැන සොයා බලයි කියලා. රාජ්‍ය සේවයක් නොවෙයි, අද රාජ පාක්ෂික සේවයක් තිබෙන්නේ. නමුත් අපේ ගරු කථානායකතුමා ඒ ගැන සොයා බලනවා. මොකද, අපි දන්නවා අතේ ඇඟිලි පහම එක වාගේ නොවෙයි කියන එක. අපට ඒක සම්පූර්ණයෙන්ම පැහැදිලියි. ගරු කථානායකතුමා ඒ ගැන සොයා බලලා සාධාරණත්වයක් ඉෂ්ට කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

අද අපි සාකච්ඡා කරන්නේ DFCC බැංකුව මේ පනතින් ඉවත් වෙලා, එය සමාගම් පනත යටතට යෑම ගැනයි. නමුත් ඒ කාරණය ගැන සාකච්ඡා කරනවාට වඩා අද මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන්ගේත්, ගරු ඇමතිතුමාගේත් අවධානය විශේෂයෙන්ම යොමු වුණේ බද්ධ කිරීමත්, මේ බැංකු ක්ෂේත්‍රය -මූල්‍ය ක්ෂේත්‍රය- තුළ වෙන ප්‍රතිසංස්කරණයත් ගැනයි.

මෑතකදී ඇමෙරිකාවේත්, යුරෝපයේත් මූල්‍ය ක්ෂේත්‍රයේ කඩා වැටීමක් සිදු වෙලා තිබෙනවා. ඒක හැම කෙනෙක්ම දන්නා දෙයක්. කාලයකට පෙර අදහසක් ඉදිරිපත් වුණා, බැංකු ඒකාබද්ධ කරන්න දුන්නොත්, විශාල බැංකුවක් නම් ඒ බැංකුව කඩා වැටෙන්නේ නැහැ, ස්ථාවරභාවය වැඩියි කියලා, that they are too large to fail. ඒ කියන්නේ, බැංකු විශාල වැඩියි, ඒ නිසා ඒවා කඩා වැටෙන්නේ නැහැ කියන අදහසයි. වාණිජ බැංකුයි, ආයෝජන බැංකුයි වෙනම තිබෙන්න ඕනෑ, ඒවා වෙනම පාලනය කරන්න

ඕනෑය කියලා එක්දහස් නවසියතිස් ගණන්වලදී ඇමෙරිකාව Glass -Steagall Act කියන ඒ පනත ගෙනාවා. මේ බැංකු වෙන වෙනම අධීක්ෂණය කරන්න ඕනෑ; වෙන වෙනම ක්‍රියාත්මක වෙන්න ඕනෑ. මොකද, වාණිජ බැංකුවකට වඩා ආයෝජන බැංකුවක අවදානම වැඩියි. හැම පුද්ගලයාම තමන් ඉතිරි කර ගත්ත විශාල මුදලත්, කුඩා සොච්චම් මුදලත් වාණිජ බැංකුවකට තමයි දමන්නේ. පසු කලෙක -විශේෂයෙන්ම විශ්‍රාම ගියාට පසු- ඒ අයගේ ජීවිතය බලා ගන්න වන්නේ ඒ මුදලින් නිසා එය විශේෂයෙන් ආරක්ෂා කරන්න ඕනෑ. ඒ නිසා මේ බැංකු වෙන් වෙන්ව අධීක්ෂණය වුණා. පසුව ඒ Glass-Steagall Act එක අයින් කරලා මේ බැංකු ඒකාබද්ධ කළා. අවුරුදු ගණනාවක් එහෙම ගියාට පසුව ඔවුන්ට පෙනුණා විශාල අර්බුදයකට ගියාය කියලා. මා හිතන හැටියට ඒක එකම කාරණය නොවෙයි.

මේ වාගේ මූල්‍ය අර්බුද ඇති වන්නේ ඇයි කියන එකට හුහක් කරුණු තිබෙනවා. බැංකුවක ප්‍රාග්ධනය ගැනත් ද්‍රවශීලීභාවය - liquidity - ගැනත් බලන්න හැම තිස්සේම මේ බැංකු stress test කරනවා. එහෙම කරලා බලනවා, මේක හරියනවාද නැද්ද කියලා. අපි දන්නවා, ලංකාවේත් එහෙම ඒකාබද්ධ කිරීමේ වැඩ පිළිවෙළක් දැන් මහ බැංකුව ප්‍රකාශ කර තිබෙන බව. විශේෂයෙන්ම ඒ වැඩ පිළිවෙළ ගැන දීර්ඝ කථාවක් මේ අවුරුද්දේ පෙබරවාරි මාසයේ 05 වැනි දා මම මේ ගරු සභාවේ දී කළා. මේ ඒකාබද්ධ කිරීමේ - consolidation - ප්‍රතිපත්තියට අපි විරුද්ධ නැහැ. මොකද, කුඩා කුඩා මූල්‍ය ආයතන රැසක්ම තිබීමේ වාසි තිබෙනවා වාගේම අවාසිත් තිබෙනවා. ඒ අවාසිය සීමා කරන්න යම්කිසි ඒකාබද්ධ කිරීමක් සිදු විය යුතුයි. ඉතින් ඒ මූලධර්මයට අපි විරුද්ධ නැහැයි කියලා මම ප්‍රකාශ කරන්නට ඕනෑ. මම එදාත් කිව්වේ ඒකයි. අදත් කියන්නේ ඒකයි.

අපි 1997 දී ආසියානිකය දිහා බැලුවොත්, යුරෝපය ඇමෙරිකාව එක්ක සංසන්දනය කරනවාට වඩා ආසියානිකයේ සිදු වුණු දේ සංසන්දනය කරන එකේ තේරුමක් තිබෙනවා. අපේ ආර්ථික ක්‍රමවේදය ඊට වඩා පහසුවෙන් සංසන්දනය කරන්න පුළුවන්. 1997 ආසියානික මූල්‍ය අර්බුදයෙන් පස්සේ මැලේසියාවේ finance companies තිස්නවය, අටකට අඩු වුණා. ඒ වාගේම මැලේසියාවේ බැංකු පණස්හතරක් විතර තිබුණා, එම ප්‍රමාණය දහයකට විතර අඩු වුණා. ලංකාවේ ආර්ථිකයට වඩා මැලේසියාවේ ආර්ථිකය විශාලයි. ජනගහනයත් ඊට වඩා ටිකක් විශාලයි. අපි දන්නවා, මේ ශත වර්ෂයේ මුල සිංගප්පූරුවේ බැංකු හයක් තිබුණු බව. දැන් නොවෙයි, සෑහෙන කලකට කලින්. ඊට පස්සේ ඒක විශාල සමූහ ව්‍යාපාර තුනකට අඩු වුණා. ඒ වාගේම තායිලන්තයේත් ඒක සිදු වී ගෙන එනවා. බැංකු දහහතර, පහකට අඩු වෙලා තිබෙනවා. ඉතින් මම හිතන විධියට මේ මූලධර්මය තුළ යම්කිසි යහපත් දේවල් තිබෙනවා. නමුත් විශාල වීමෙන් පමණක්, විශාල බැංකු ඇති කිරීමෙන් පමණක් බැංකුවල ස්ථාවරභාවය වැඩියි කියන මූලධර්මය ගැන අපි ප්‍රවේශම් වන්නට ඕනෑ. මොකද, ඒක ඉබේටම සිදු වන්නේ නැහැ. මම දැන් ඒක විස්තර කරන්නම්.

1988 දී සහ 1990 දී ලංකාවේ finance companies දහතුනක් විතර අමාරුවේ වැටුණු බව අපි දන්නවා. අන්තිමට ඒ දහතුනෙන් එකොළහක්ම නැති වෙලා ගියා. 2002 දීත් බැංකුවලට විශාල ප්‍රශ්නයක් ඇති වුණු බව අපි දන්නවා. ඒ වාගේම 2009 දී විශාල සමූහ මූල්‍ය ව්‍යාපාරයකට ගැටලුවක් ඇති වුණා. ඒ සමූහ මූල්‍ය ව්‍යාපාරය තුළ මේ වාගේ බැංකු නොවන මූල්‍ය ආයතන අටක් තිබුණා. ඒ අවස්ථාවේ දී ඒ සියල්ලටම ගැටලුවක් ඇති වුණා. මේ බැංකු ඒකාබද්ධ කිරීම - consolidation - එක ගැන අද අපි කථා කරනවා. නමුත් 2013 නොවැම්බර් මාසයේ අපේ මහ බැංකුව finance companiesවලට බලපත්‍ර නිකුත් කළා. මට මේක විස්තර කරන්න අමාරුයි. බද්ධ කිරීමක් කරන්න ලැහැස්ති වෙනවා නම්, මේ මූලධර්මය පිළිගන්නවා නම් මෙච්චර මෑතකදී මේ වාගේ බලපත්‍ර දුන්නේ කොහොමද? මම හිතන විධියට අනුදැනුමක් නැතිව දුන්නු එකක් වෙන්න පුළුවන්. එහෙම හිතුවොත් හොඳයි. මොකද, එහෙම හිතුවේ නැත්නම් දූෂිත හේතුවක් නිසා එහෙම දෙනවා කියන නිගමනයට එන්න වෙනවා. ඉතින් මම හිතන හැටියට මේක අනුදැනුමක් නැතිව කළ වැඩක් වාගෙයි.

ලෝකය වටේ බැලුවොත් මහ බැංකුවක අධිපති කෙනෙක් වෙන්න හුහක්ම සුදුසුයි, central banker කෙනෙක් නම්. එහෙම නැත්නම් අවම වශයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳව දැනුම තිබෙන කෙනෙක් නම් හුහක් හොඳයි. එහෙම නැතිව ඕනෑම කෙනකුට ඕනෑම දෙයක් කරන්න පුළුවන්ය කියන මතය තුළ ඉන්නවා නම් අපට ඒවා ඉගෙන ගන්න හුහක් කල් යනවා. ඒවා ඉගෙන ගන්න කල් ගියාම ඒ කාලයට කවුරු හරි ගෙවීම කරන්න ඕනෑ. මේ වාගේ අවස්ථාවල ඒවා ගෙවන්න වෙන්නේ රටටයි. රටේ පුරවැසියන්ට තමයි ගෙවන්න වෙන්නේ. සුදුසු තැනට සුදුසු පුද්ගලයන් පත් කරන්න ඕනෑ. මේ වාගේ බොහොම වැදගත් පත්වීම්වලට ජනාධිපතිතුමාත්, මුදල් ඇමතිතුමාත් වගකියන්න ඕනෑ.

දැන් අපි බලමු මහ බැංකුව කරලා තිබෙන්නේ මොනවාද කියලා. අද අපි අනුගමනය කරන න්‍යාය තමයි ළැදියාවට තැන දීම. මේ රටේ හැකියාවටයි, හැදියාවටයි තැන දෙන්නේ නැහැ. ළැදියාවටයි තැන දෙන්නේ. ඒ නිසා තමයි මේ රට ගොඩ ගන්න බැරි. හැදියාවට වාගේම හැකියාවට තැන දෙන්න ඕනෑ. එක එක ක්ෂේත්‍රවල විශේෂඥයන් අවශ්‍යයි. ඒ පුද්ගලයන්ට තැන දෙන්නට ඕනෑ. ඒ මූලධර්මය රජය ක්‍රියාත්මක කරන්නේ නැහැ. ඒ මූලධර්මය රජය ක්‍රියාත්මක කරන්න ඕනෑ. ප්‍රාග්ධනය තිබුණු පමණින්ම බැංකුවක් ස්ථාවරයි කියලා අපට හිතන්න බැහැ. ප්‍රාග්ධනය කියන එක ඉක්මනට නැති වෙන්න පුළුවන්. මොකද බැංකුවක් ණය දෙනකොට ප්‍රාග්ධනය 10 නම්, ණය 10 ගුණයක් වෙනවා; ණය 100ක් වෙනවා. එතකොට ප්‍රාග්ධනයෙන් බැංකුව ණය දුන්නොත්, ඒවා බොල් ණය වුණොත් ඒ බැංකුව බේරා ගන්නට බැහැ. සුදුසු පුද්ගලයාට සුදුසු තැන දීම ඉහළ මට්ටමේදී හරිම වැදගත් වෙනවා. නමුත් අපි දන්නවා, ළඟදී NSB වාගේ ඒවාට පහළ මට්ටමිනුත් නුසුදුසු පුද්ගලයන් 300ක් විතර ගත්තා කියලා. ඇත්තටම රටට ඒක ප්‍රසිද්ධ නොකර, ඒ ක්‍රමවේද අනුගමනය නොකර එවැනි අයව බඳවා ගත්තා. මේ නිසා තමයි මම කියන්නේ ප්‍රාග්ධනය විශාල වුණු පමණින්ම බැංකුවල ස්ථාවරභාවය ගැන නිශ්චිතව කියන්නට බැහැ කියලා.

මේ ළඟදී CIFL කියලා මූල්‍ය ආයතනයක්; බැංකුවක් නොවන finance company එකක් කඩා වැටුණා. ඊට ඉස්සෙල්ලා අපි දන්නවා, Golden Key Credit Card Company එක කඩා වැටුණා කියලා. එහි තැන්පත්කරුවන් තවම බලාගෙන ඉන්නවා. CIFL ආයතනය කඩා වැටෙන්න මාස කිහිපයකට ප්‍රථමයෙන් මහ බැංකුවෙන් අවසර දුන්නා ඒ අයට ගිහිල්ලා අනෙක් අයගෙන් ප්‍රාග්ධනය - share capital - එකතු කර ගන්න, කොටස්කරුවන්ට ඒ ආයතනයට මුදල් දමන්න. මහ බැංකු අභ්‍යන්තර වාර්තාවල ඒ ගැන සඳහන් වෙනවා. ඒ වාර්තා ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා සභාගත කරලා තිබෙනවා. ඒ වාර්තාවල සඳහන් කරනවා ඒ CIFL ආයතනය කඩා වැටුණු ආයතනයක්ය කියලා. ඒ අයට කොටස්කරුවන්ගෙන් ප්‍රාග්ධනය ලබා ගන්න මහ බැංකුව අනුමැතියක් දුන්නේ කොහොමද කියලා මම දන්නේ නැහැ. අනිවාර්යයෙන්ම මෙතැන තිබෙනවා, අධීක්ෂණය ගැන ප්‍රශ්නයක්.

බැංකු පාලනය සහ අධීක්ෂණයේ වෙනස අපි දැන ගන්නට ඕනෑ. බැංකු පාලනය කියන්නේ එකක්, බැංකු අධීක්ෂණය තව එකක්. මහ බැංකුවට තිබෙන වගකීම බැංකු පාලනය නොවෙයි. මහ බැංකුවට තිබෙන වගකීම තමයි අධීක්ෂණය. මම

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

උදාහරණයක් දෙන්නම්. බැංකුවක අධ්‍යක්ෂ මණ්ඩලයට කවුරුන් හෝ පත් කරනවා නම් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය ඒ නාම යෝජනාව මහ බැංකුවට එවන්නට ඕනෑ. ඒ තීරණය ගන්න ඕනෑ බැංකුවයි. මහ බැංකුවට තිබෙන වගකීම ඒ පුද්ගලයාව ඒ පුටුවේ ඉඳ ගන්න සුදුසුද නැද්ද කියන එක තීරණය කිරීමයි. මහ බැංකුව ඒක තීරණය කරනවා වෙනුවට ඇත්තටම සිද්ධ වන්නේ මොකක්ද? සරත් අමුණුගම ඇමතිතුමා මේ කාරණය දන්නවා කියලා මම කියන්නේ නැහැ. නමුත් මම දන්නා නිසායි කියන්නේ. ඇත්තටම සිදු වන්නේ එහෙම නොවෙයි. මහ බැංකුවෙන් අද සභාපතිට නැත්නම් ප්‍රධාන විධායක නිලධාරිට කතා කරලා යෝජනා කරනවා, අධ්‍යක්ෂ හැටියට හෝ සභාපති හැටියට පත්වෙන්න ඕනෑ කවුද කියන එක ගැන.

ඕනෑම රටක යහපාලනය තිබෙන්න නම් විධායකය, ව්‍යවස්ථාදායකය හා අධිකරණය ස්වාධීනව ක්‍රියාත්මක විය යුතු බව අපි දන්නවා. ඒවා ස්වාධීනව ක්‍රියාත්මක නොවන විට තමයි යහපාලනය කඩා ගෙන වැටෙන්නේ. මූල්‍ය ක්ෂේත්‍රයේත්, ව්‍යාපාරික ක්ෂේත්‍රයේත් සමාගම් යහපාලනය - corporate governance - කියා න්‍යායක් තිබෙනවා. ඒ න්‍යාය අපි අනුගමනය කරන්නට ඕනෑ. මහ බැංකුවට තිබෙන්නේ පාලනය නොවෙයි, අධීක්ෂණය. ඒක තීරණය වෙන්න ඕනෑ කොටස්කරුවන් හරහායි. ඒ වාගේම ඒ තීරණ එන්න ඕනෑ අධ්‍යක්ෂ මණ්ඩල හරහායි. ඒ නිසා බැංකු පාලනය හා අධීක්ෂණයේ වෙනස අපි තේරුම් ගන්න ඕනෑ. රටක් සාර්ථක වෙන්න නම් ඒ ක්‍රමවේදය අනුගමනය කරන්නට ඕනෑ.

බැංකුව ව්‍යුහය ගත්තාම එහි ප්‍රධාන විධායක නිලධාරි ඇතුළුව කළමනාකාර මණ්ඩලයක් සිටිනවා. ඒ වාගේම Board of Directors කියා තවත් මණ්ඩලයක් තිබෙනවා. ඒවාට වගකීම් වෙන වෙනම තිබෙන්නේ. වගකීම් පටලවා ගත්තාම තමයි ප්‍රශ්නය ඇති වෙන්නේ. යහපාලනයට ඒක බොහොම වැදගත්. Governance is more important than consolidation. ඒකයි මම කියන්න හදන්නේ. ඕනෑම ක්‍රමයක් තිබෙන්න පුළුවන්. නමුත් යහපාලනය නැත්නම් ඒ ක්ෂේත්‍රය කඩා වැටෙන්න පුළුවන්. යහපාලනය තිබෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දවස් 10කට උඩදී හොංකොං රටට ගියා. හොංකොං රටේ ප්‍රධාන විධායක නිලධාරී තනතුරට මැතිවරණ නැහැ. නමුත් යහපාලනය තිබෙනවා. ඒකයි වෙනස. ඒ රටේ කොහොමද යහපාලනය ක්‍රියාත්මක වන්නේ? ස්වාධීන අධිකරණයක් තිබෙනවා. ඒකට කාටවත් ඇඟිලි ගහන්න බැහැ. දේශපාලනඥයෙකුටවත් ඇඟිලි ගහන්න බැහැ. ඒක ස්වාධීනව ක්‍රියාත්මක වනවා. ඒ වාගේම ව්‍යවස්ථාදායකය ස්වාධීනව ක්‍රියාත්මක වනවා. කවුරු හෝ ව්‍යවස්ථාදායකයට පත් වුණාම ඒ අයගේ මතය අනුව තමයි ඡන්දය දමන්නේ. වෙන කාගේවත් මතය අනුව නොවෙයි. ඒ අයට ස්වාධීනත්වයක් තිබෙනවා. නමුත් මැතිවරණයක් නැහැ. ලංකාවේ තිබෙන්නේ ඒකේ අනෙක් පැත්ත. මැතිවරණ නම් ඕනෑ තරම් තිබෙනවා. නමුත් විධායකයෙන් ව්‍යවස්ථාදායකයටයි, අධිකරණයටයි ස්වාධීනත්වයක් නැහැ. ඒකයි යහපාලනය පිළිබඳ ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ. අපට බැංකු ක්ෂේත්‍රයේත් යහපාලනය වැදගත්. ඒකාබද්ධ කිරීමට වැඩිය යහපාලනය වැදගත් කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යම් අධීක්ෂණ අධිකාරියක - මේක බැංකුවලට විතරක් අදාළ නැහැ.- සේවය කරන අයට, නියාමනය කරන අයට, තමන්ට මොකක් හෝ වරප්‍රසාදයක් දෙන්න යනවා කියා බලාපොරොත්තුවක් දෙනවා නම්, එතකොට ඒ අයට ස්වාධීනව ඒ නියාමන කටයුතු කරන්නට බැහැ. මම ඒක තව පැහැදිලි කරන්නම්. මහ බැංකුවේ ඉහළ තනතුරුවල සේවය කරන අය වාණිජ බැංකුවල සභාපතිවරු හැටියට හෝ අධ්‍යක්ෂකවරු හැටියට පත් වෙන්න බලා ගෙන ඉන්නවා නම් ඒ අයගේ ස්වාධීනත්වය ගැන ඉබේම ප්‍රශ්නයක් ඇති වනවා. මේ රටේ මෑතක සිට ප්‍රවණතාවක් තිබෙනවා, මහ බැංකුවේ ඉහළ නිලතලවල ඉඳලා විශ්‍රාම ලැබුවාට පස්සේ වාණිජ බැංකුවකට ගිහින් එතැන වැඩ කරලා ඒකේ වරප්‍රසාද ලබා ගැනීමේ. අපි එහෙම තමයි යහපාලනය නැති කරන්නේ. එහෙම තමයි අපේ ආයතන අපි නැති කරන්නේ. මම පුද්ගලයන් නම් කරන්න යන්නේ නැහැ. මොකද, මම හිතන හැටියට මේ වාද විවාදය පුද්ගලයකු ගැන නොවෙයි. මේ වාද විවාදය තිබෙන්නේ ප්‍රතිපත්ති ගැනයි. අපි ඒ පැත්තේ හිටියත්, මේ පැත්තේ හිටියත් නිවැරදි ප්‍රතිපත්ති අනුගමනය කරන්න ඕනෑ. ප්‍රතිපත්තියක් නොමැති නිසා තමයි ආයතන කඩා වැටෙන්නේ. මම දන්නවා, නම් තව මාස කීපයකින් මහ බැංකුවේ හෝ වාණිජ බැංකුවක සභාපති හෝ අධ්‍යක්ෂවරයෙකු වෙන්න යනවා කියා, ඉතින් මම කොහොමද ස්වාධීනව කටයුතු කරන්නේ. ඒක කරන්න බැහැ. ගරු ඇමතිතුමනි, ඊට වැඩිය හොඳයි විශ්‍රාම යන වයස් සීමාව වැඩි කර ඒ අයගේ ස්වාධීනත්වය ආරක්ෂා කරලා දෙන එක. ඒ අයට අවුරුදු 65 නොවෙයි, 75 වුණත් කමක් නැහැ වැඩ කරලා එතැනින් අයින් වෙලා යන එක ඊට වැඩිය සුදුසුයි කියලා මම සඳහන් කරනවා. නියාමනය කරන ඕනෑම ස්ථානයකට ඒක අවශ්‍යයි. අපි විනිසුරු කෙනෙක් ගත්තොත් අග්‍ර විනිශ්චයකරු වෙන්න පුළුවන්, අනෙක් විනිසුරුවරුන් වෙන්න පුළුවන්, ඒ අයට විශ්‍රාම යාමෙන් පසු bonus එකක් ලබා ගන්න අදහසක් තිබුණොත්, ඒ කියන්නේ වරප්‍රසාදයක් ලබා ගන්න අදහසක් තිබුණොත්, අපට ඒ අයගෙන් ස්වාධීනත්වය බලාපොරොත්තු වෙන්න බැහැ. ඒ විනිසුරුවරුන් විශ්‍රාම යාමෙන් පස්සේ පවතින රජය ඒ අය වෙන රටවල තානාපතිවරුන් හැටියට, නැත්නම් ජනාධිපති උපදේශකවරුන් හැටියට, නැත්නම් වෙන වෙන තනතුරුවලට පත් කරයි කියා වරප්‍රසාද බලාපොරොත්තු වෙලා ඒ විනිසුරු පුටුවේ ඉන්නවා නම් ඒක ස්වාධීනත්වයට ප්‍රශ්නයක්,

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ මූලධර්මය අපි පිළිගන්නට ඕනෑ. ඊට වඩා හොඳයි ඒ විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස ඉවත් කරන එක. නැත්නම් විශ්‍රාම යන වයස 65, 70, 75 කරන එක. එතකොට ඒ අයගේ ජීවිත කාලය සම්පූර්ණයෙන්ම වාගේ එතැනට යොදවලා, හරියට වැඩක් කරලා ගෞරවයෙන් විශ්‍රාම ලබන්න පුළුවන්. ඒකයි අපි කරන්න ඕනෑ. අසනීප වුණොත්, පෞද්ගලික රෝහලකට යන්න වුණොත් නැත්නම් වෙන මොකක් හෝ ලෙඩක් හැදුණොත් සිංගප්පූරුවට හෝ ඇමෙරිකාවට හෝ ගෙන යන්න වුණොත්, ජනාධිපතිතුමා කොහොම හරි ඒ මුදල් ලබා දෙයි කියා බලා ගෙන සිටිනවා. ඒ රටට ගිහිල්ලා සෞඛ්‍ය සේවාව ලබා ගන්න. ඔන්න ඔය වාගේ දේවල්වලින් තමයි යහපාලනය කඩා වැටිලා තිබෙන්නේ. මම නැවත නැවතත් යෝජනා කර තිබෙනවා. පාර්ලිමේන්තුව වගකීම ගන්න ඕනෑ, නියාමන කොමිෂන් සභාවලත්, අධිකරණයේ වරප්‍රසාද පාර්ලිමේන්තුවෙන් දෙන්න. පාර්ලිමේන්තුවෙන් දෙන්න ඕනෑ. අපි ඒ වගකීම ගන්න ඕනෑ. ඒක Public Service Commission එක හරහා කරන වැඩක් නොවෙයි. මේක පාර්ලිමේන්තුවේ වගකීම පැහැර හැරීමක්. මොකද, මේ ව්‍යවස්ථාව තුළ තිබෙනවා, පාර්ලිමේන්තුවේ වගකීම් මොනවාද කියා. අපට වගකීමක් තිබෙනවා. විශේෂයෙන්ම අධිකරණයට වගකීමක් තිබෙනවා. අපි ඒක සිදු කරන්නේ නැහැ. මහ බැංකුවට විතරක් නොවෙයි, මම ඒ මූලධර්මය ඊට වඩා පුළුල් ලෙසයි අද මෙතැන සාකච්ඡා කරන්නේ. අපි ඒක කළේ නැත්නම් අපට ප්‍රශ්නයක් ඇති වෙනවා. එන අවුරුද්දේ මැතිවරණයක් තියලා රජයක් පිහිටෙව්වොත් ඒ රජයේ මූලික සිද්ධාන්තයක් වෙන්නට ඕනෑ විධායකය, අධිකරණය හා ව්‍යවස්ථාදායකය අතර ස්වාධීනත්වය

ඇති කිරීම. පත් වන ඕනෑම කෙනෙක් ඒකට ඉදිරිපත් වුණොත් කිසිම සැකයක් නැහැ, මේ රටේ පොදු ජනතාව එය තේරුම් අර ගෙන එතුමාට හෝ එතුමියට ඡන්දය දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම කථාව අවසන් කරන්නට ප්‍රථමයෙන් නැවතත් කියන්න ඕනෑ, අපේ ගරු සරත් අමුණුගම ඇමතිතුමා මෙහි යහපත ගැන අද හුඟක් කථා කළ බව. මම කිව්වා, මූලධර්මය ගැන මට කිසිම ගැටලුවක් නැහැ කියා. බැංකුව මුහුණ දෙන ප්‍රශ්න ප්‍රමාණයවත්, ප්‍රාග්ධනයේ විශාලත්වය ගැන ප්‍රශ්නයක් නොවෙයි තිබෙන්නේ. ඒක මම නැවත කියන්න ඕනෑ.

මගේ කථාව අවසන් කරන්න ප්‍රථමයෙන් DFCC බැංකුව ගැනයි, NDB එක ගැනයි වචනයක් කියන්න ඕනෑ. විශේෂයෙන්ම අපි "ඩීඑෆ්සීසී බැංකුව (ඉවත් කිරීමේ හා ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත" ගැන කථා කරන මොහොත. මමත් බැංකු නිලධාරියෙක් හැටියට අවුරුදු දෙකක් විතර වැඩ කළා. එතකොට මේ වාගේ පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ගෙන එන්න කටයුතු කළා. මම දන්නවා, අවුරුදු ගණනාවක් වැඩ කළ නිලධාරින් සිටින බව. අපේ ගරු ඇමතිතුමාත්, ගරු හර්ෂ ද සිල්වා ආචාර්යතුමාත් සඳහන් කළා, අත් දැකීම් තිබෙන හුරුපුරුදු ඒ වාගේම දක්ෂ නිලධාරින් මේ බැංකුවල සිටිනවා කියා. අපට මතක් වෙනවා, DFCC බැංකුවේ මැක්සි ෆිලික්ස් මැතිතුමා ඒ බැංකුව ගොඩ නහන්න මුල ඉඳලාම විශාල වෑයමක් දැරූ බව. ඒ වාගේම නිහාල් ෆොන්සේකා මැතිතුමා මතක් කරනවා. ඒ වාගේම NDB එකේ රංජිත් ප්‍රනාන්දු මැතිතුමා මතක් කරනවා. ඔහු විශාල ලෙස ක්‍රියා කළා, NDB එක අද තිබෙන තත්ත්වයට ගෙනෙන්න. ඒක නවීකරණය කරන්න නිහාල් වැලිකල මැතිතුමාත් හුඟක් වැඩ කළා.

ඒ අයගේ කැපවීම නිසා තමයි මේ බැංකු දෙක හොඳින් ක්‍රියාත්මක වන, professionally ක්‍රියාත්මක වන බැංකු දෙකක් බවට අද මේ ගරු සභාවේ දෙපාර්ශ්වයේම විශ්වාසයක් තිබෙන්නේ. මේ බැංකු දෙකට අවදානමක් නැහැ. නමුත් රජය විසින් මේ බැංකු දෙක ඒකාබද්ධ කිරීමේ යෝජනාව ගෙනෙන්නේ අවදානම නිසා නොවෙයි, වෙනත් හේතුවක් නිසායි කියන එක අද අපට පැහැදිලි කළා. ඒ නිසා මේ අවස්ථාවේදී මම ඒ නිලධාරින් විශේෂයෙන් මතක් කරනවා.

DFCC බැංකුවයි NDB බැංකුවයි ඒකාබද්ධ කිරීම ගැන මට තිබෙන ගැටලුව මොකක්ද කියා එදා මේ කටයුත්ත පටන් ගත් මුලදීම -පෙබරවාරි මාසයේ 5වැනි දා- මම මේ ගරු සභාවේදී කිව්වා. මම ඒක නැවත කියන්නට ඕනෑ. මම මේ ඒකාබද්ධ කිරීමට විරුද්ධ මෙන්න මේ හේතුව නිසායි. මේ බැංකු දෙක ඒකාබද්ධ වෙනවා නම්, මේ බැංකු දෙක ඒකාබද්ධ කළ යුතුද කියන එක මේ බැංකු දෙකේ කොටස්කරුවන් විසින් නිදහසේ තෝරා ගන්න ඕනෑ. ඒක විය යුතුද නැද්ද කියන මූලධර්මය අපට පැහැදිලියි.

මේක හරියටම විවාහයක් වාගෙයි. විවාහයක් නම්, දෙමව්පියන්ට ඒ විවාහය ලැහැස්ති කරන්න පුළුවන්. නැත්නම් ප්‍රේම සම්බන්ධතාවකින් විවාහය සිදු වෙන්නත් පුළුවන්. මම නම් හිතන්නේ ප්‍රේම සම්බන්ධතාවකින් වුණොත් හොඳයි කියායි.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු මන්ත්‍රීතුමා, මෙතැන තුන්දෙනෙක් ඉන්නවා.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ඔව්, මෙතැන තුන්දෙනෙක් ඉන්නවා. ඒක මම දන්නවා. හැබැයි ඉස්සෙල්ලා දෙන්නෙකුට එකතු වෙන්න පුළුවන්. කැමැති නම් ඊට පස්සේ අනෙක් එක්කෙනා එක්කත් එකතු වෙන්න පුළුවන්. ගරු සරත් අමුණුගම ඇමතිතුමා මේවා ගැන හොඳට දන්නවා. සමහර වෙලාවට දෙමව්පියන් යෝජනාවක් ගෙනැල්ලා විවාහ වුණාම ඒ විවාහය හරියන්නේ නැති අවස්ථාත් තිබෙනවා; දික්කසාද වෙන්න සිද්ධ වෙන අවස්ථා තිබෙනවා.

[බාධා කිරීමක්] මම, නම් කියන්නේ නැහැ නේ. සමහර වෙලාවට දික්කසාද වෙලා දෙවැනි විවාහය කරගන්න කොට ඒක හොඳට කරගන්න පුළුවන්. දෙවැනි විවාහයේදී නීති-රීති, ව්‍යුහය වෙනස්. පළමුවැනි විවාහය වාගේ දෙවැනි විවාහය සම්ප්‍රදායානුකූල වෙන්න ඕනෑත් නැහැනේ. එක එක ක්‍රම -විධි- තිබෙනවා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ඇත්තද?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ඔව්, ඔව්. මම කියන්නේ එහෙම තමයි. මම හිතන විධියට ඔබතුමාට ඒ පිළිබඳව අත් දැකීමක් නැහැ කියලායි. මටත් නැහැ. අත් දැකීම් තිබෙන අය මේ ගරු සභාවේ ඇති.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
අනේ! මට විනාඩි 5යි තිබෙන්නේ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
රීති ප්‍රශ්නයක්. ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
නීති ප්‍රකාරව විවාහය පිළිබඳව මට හොඳ අත් දැකීමක් තිබෙනවා. මෙතුමාට ඒ අත් දැකීම නැති එක ගැන මම කනගාටු වෙනවා.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
සමාවෙන්න. [බාධා කිරීමක්]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි, ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

මම ඒක ඉල්ලා අස් කරගන්නවා. නීති ප්‍රකාරව විවාහ වීම ගැන ඔබතුමාට හොඳට අත් දැකීම් තිබෙනවා. [බාධා කිරීමක්] මම මෙතැනදී කියන මූලධර්මය මේකයි. ඕනෑම ඒකාබද්ධ කිරීමක් ස්වායත්තව, කිසිම බලපෑමක් නොමැතිව සිදු විය යුතුයි. එය කොටස්කරුවන්ගේ තීරණය වෙන්න ඕනෑ කියන එක මම කියනවා. මේක දිහා දෙවිධියකට බලන්නට පුළුවන්. මොකද, අපි මෙතැනදී බලන්නේ බැංකුව දිහා විතරක් නොවෙයි. අපි ගනුදෙනුකරුවන් දිහාත් බලන්නට ඕනෑ. ඇත්තටම මේ බැංකු දෙක අනෙක් වාණිජ බැංකුවලට වඩා වෙනස්. මේ බැංකුවල විශේෂත්වයක් තිබෙනවා. මේ බැංකුවල විශේෂත්වය මම කියන්නම්. මේ බැංකු දීර්ඝ කාලීනව ණය දෙනවා. ඒ වාගේම මේ බැංකුවලින් ප්‍රාග්ධනයත් ලබා දීලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. අනෙක් වාණිජ බැංකු වාගේ නොවෙයි, අලුත් අදහසක්, අලුත් කර්මාන්තයක්, අලුත් ව්‍යාපෘතියක් ගෙනෙනවා නම් ඒ සඳහා අත දෙන්න මේ බැංකුවලට හැකියාව තිබෙනවා. ඔවුන්ට දීර්ඝ ඉතිහාසයක් තිබෙනවා. මේ බැංකු දෙකට දීර්ඝ කාලීන මූල්‍ය තිබෙනවා. අනෙක් වාණිජ බැංකුවලට එම තත්ත්වය ඊට වඩා අඩුවෙන් තිබෙනවාය කියා කිව්වොත් ඒක සාධාරණයි.

බැංකු දෙකක් තිබෙනවා. මොනවාද ව්‍යාපාරිකයා කරන්නේ? ව්‍යාපාරිකයාට රුපියල් මිලියන 5ක ණයක් ගන්න ඕනෑ නම් DFCC බැංකුවට කථා කරලා අහනවා, "මට රුපියල් මිලියන 5ක් ඕනෑ, මට අවුරුදු 7කින් ආපසු ගෙවන්න පුළුවන්, ඔබතුමන්ලාගේ පොලිය කීයද" කියලා. ඒ විස්තරය දැන ගත්තාට පස්සේ DFCC බැංකුවෙන් කිව්වොත් සියයට 14ට එම ණය මුදල දෙනවා කියලා, ඊට පස්සේ ඔහු ගිහිල්ලා NDB බැංකුවට කථා කරනවා. කථා කරලා අහනවා, "මට රුපියල් මිලියන 5ක ණය මුදලක් ඕනෑ, මට අවුරුදු 7කින් ආපසු ගෙවන්න පුළුවන්, ඔබලාගේ පොලිය කීයද" කියලා. ඒ බැංකුව කියනවා, "අවුරුදු 7කින් ගෙවන්න දෙන්න බැහැ, අපි දෙන්නේ අවුරුදු 5කින් ගෙවන්න" කියලා. "මට දැනටමත් අවුරුදු 7කින් ආපසු ගෙවන්න ණය ගන්න පුළුවන්කමක් තිබෙනවා, අවුරුදු 7කින් ගෙවන්න දෙන්න පුළුවන් නම් දෙන්න. පොලිය කීයද" කියලා එතකොට ඔහුට අහන්න පුළුවන්. මොකක්ද මම මේ කියන්න හදන්නේ? බැංකු දෙකක් තිබෙන කොට දේශීය වෙළෙඳ පොළ තුළ තරගකාරිත්වයක් ඇති වෙනවාය කියන කාරණයයි. ඔය බැංකු දෙක ඒකාබද්ධ කළොත් ඒ තරගකාරිත්වය නැති වෙනවා. එයින් කුඩා පරිමාණයේත්, මධ්‍යම පරිමාණයේත් ව්‍යාපාරිකයන්ට විශේෂයෙන් අවාසියක් විය හැකියි. නමුත් මේ රටේ විශාලම සමාගම්වල අයට පිටරටවලට ගිහිල්ලාත් ණය ගන්න පුළුවන් නිසා ඒ අයට මේකෙන් අවාසියක් නොවෙන්න පුළුවන්.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

හොඳයි. තව විනාඩි දෙකකින් මගේ කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එකට එකක් එකතු කළාම ප්‍රතිඵලය දෙකයි. නමුත් අපි දන්නවා, බැංකු දෙකක් ඒකාබද්ධ කරනකොට, සමාගම් ඒකාබද්ධ කරනකොට ඒවා ඒකාබද්ධ කරන්නේ එකට එකක් එකතු කළාම ප්‍රතිඵලය දෙක වෙන්න නොවෙයි කියලා. එකට එකක් එකතු කළාම ප්‍රතිඵලය 3 වෙන්නයි ඒවා ඒකාබද්ධ කරන්නේ. ඒක අපි දන්නවා. දෙදෙනෙක් එකතු වුණාම දරුවෙක් ලැබෙනවා නේ. එතැනදී එකයි, එකයි එකතු වුණාම ප්‍රතිඵලය තුන වෙනවා. ඒක ඉබේටම වෙනවා. එය තීරණය කරන්නේ කවුද? ඒ බැංකුවේ කොටස්කරුවන් තමයි එය තීරණය කරන්න ඕනෑ. DFCC බැංකුවෙත්, ජාතික සංවර්ධන බැංකුවෙත් සේවකයන්ටයි මම මේ දෙය කියන්නේ. මම ඒ අයට මේ දෙය කියන්නේ මමත් ඒ බැංකුවල ප්‍රධාන විධායක නිලධාරි වෙලා සිටි නිසායි. ඕනෑම ඒකාබද්ධ කිරීමකදී බැංකුවට වාසියක් තිබෙනවා. එක වාසියක් තමයි බැංකුවේ වියදම අඩු කරන්න පුළුවන් වීම. වියදම අඩු කරනකොට තාක්ෂණයෙන් අඩු වෙනවා. ඒ වාගේම මිනිස් බලයේ වියදමත් අඩු වෙනවා. ඒක මේ ලෝකය වටේම සිදු වන දෙයක්. රැකී රක්ෂාවන් නැති වෙන්නේ නැහැ කියා කවුරු කිව්වත්, බැංකු ඒකාබද්ධ කිරීමකදී අපට ඒක බලාපොරොත්තු වෙන්න වෙනවා. DFCC බැංකුවෙත්, NDB බැංකුවේත් මේ ඒකාබද්ධ කිරීමට අපි විරුද්ධයි කියා නැවතත් කියනවා. ඒ සේවකයන්ට සාධාරණයක් ඉටු කරන්නය කියා ඉල්ලමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 5.31]

ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු අදහස් කළා අද දින විවාදයට ගැනෙන ඩීඑෆ්සීසී බැංකුව (ඉවත් කිරීමේ හා ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත අලුතින්, අහම්බෙන් ඉදිරිපත් වුණු දෙයක්ය කියා. මේක එහෙම දෙයක් නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය අය වැය කථාවේදී අපේ අතිගරු ජනාධිපතිතුමා මුදල් අමාත්‍යවරයා හැටියට බැංකු හා මූල්‍ය සමාගම් ශක්තිමත් කිරීම යටතේ කියා තිබෙන කරුණු කෙරෙහි මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. එහි මේ විධියට කියා තිබෙනවා:

> "ගරු කතානායකතුමනි, ශ්‍රී ලංකා මහ බැංකුව, විදේශ වත්කම් කළමනාකරණයේදීත්, විවිධ අරමුදල් පාලනය කිරීමේදීත්, බැංකු හා මූල්‍ය ආයතන අධීක්ෂණය කිරීමේදීත්, මුදල් සැපයුම කළමනාකරණය කිරීමේදීත්, මෑත කාලයේ ප්‍රශංසනීය කාර්යභාරයක් ඉටුකර තිබෙනවා. එබැවින් මහ බැංකුවේ වගකීම් හා මෑත කාලීන ආර්ථික ප්‍රවණතා අනුව එහි ප්‍රාග්ධන වත්කම් රුපියල් බිලියන 50 දක්වා වැඩිකිරීමට යෝජනා කරනවා. වර්තමානයේ අප රටේ ඇති මූල්‍ය සමාගම් 58න් රුපියල් බිලියන 20 ට වඩා වත්කම් ඇත්තේ සමාගම් 20කට පමණි. මෙම මුදල් සමාගම් ශක්තිමත් කිරීම සඳහා ප්‍රධාන සමාගම විසින් පවත්වාගෙන යනු ලබන අනුබද්ධිත මුදල් සමාගම් ප්‍රධාන සමාගම සමඟ ඒකාබද්ධ කිරීමට යෝජනා කරනවා. එමෙන්ම වාණිජමය බැංකු ශක්තිමත් කිරීම සඳහා බැංකු විසින් පවත්වාගෙන යනු ලබන මූල්‍ය සමාගම් එම බැංකු හා ඒකාබද්ධ කිරීමටද යෝජනා කරනවා. මෙම බැංකු හා මූල්‍ය සමාගම් ශක්තිමත් කිරීමට දිරිගැන්වීමක් වශයෙන් අත්පත් කරගැනීමේදී කරනු ලබන ආයෝජන වියදම් බදු වලින් අඩු කර ගැනීමේ වියදම් ලෙස සැලකීමටද යෝජනා කරනවා. මූල්‍ය ක්ෂේත්‍රය ශක්තිමත් කිරීම සඳහා සංවර්ධන බැංකු ඒකාබද්ධ කිරීමටත්, බැංකුවලට මෙන්ම ගණුදෙනුකරුවන්ට පහසුකම් සැලසෙන පරිදි ණය තොරතුරු කාර්යාංශය වැඩිදියුණු කිරීමටත් යෝජනා කරනවා. "

එහෙම නම් මෙය එදා 2014 අය වැය කථාවේදී අතිගරු ජනාධිපතිතුමා මුදල් අමාත්‍යවරයා හැටියට මේ පාර්ලිමේන්තුවට දැනුම් දීලා මේ රටේ මූල්‍ය අංශය ශක්තිමත් කිරීමට ගෙනෙන ලද කාලෝචිත යෝජනාවක්ය කියන එක අපි කියන්න ඕනෑ. අද එය පනත් කෙටුම්පතක් බවට පරිවර්තනය කරලා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා ඒ බැංකු දෙක ඒකාබද්ධ කරන්නට කටයුතු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ රටේ බැංකු 34ක් තිබෙනවා. එයින් 22ක් රාජ්‍ය අංශයේ බැංකු වන අතර අනික් 12 පෞද්ගලික අංශයේ බැංකු වනවා. ඒ වාගේම මූල්‍ය ආයතන 58ක් තිබෙනවා. විපක්ෂයෙන් කියනවා, පොලී අනුපාතය අඩු වනවාය කියලා. දියුණුවත් එක්ක එහෙම වෙනවා. රාජ්‍ය සේවකයකු ගන්න ණය මුදලක් ගැන අපි බලමු. සියයට 12 පොලියට නිවාස ණයක් ගත්තොත්, ඒ පොලී අනුපාතය සියයට 7 දක්වා අඩු වනවාය කියන්නේ විශාල අඩු වීමක්. එතකොට ඔහුගේ මූර්ත ආදායමේ වැඩි වීමක් සිද්ධ වනවා. ඔහුගේ වැටුපෙන් ඔහු කරන වියදම අඩු වනවා. රජයක් හැටියට අපට පුළුවන්කම ලැබී තිබෙනවා, පොලී අනුපාතය අඩු කරන්න. මේකේ තවත් පැත්තක් තිබෙනවා. වාණිජ බැංකුවක් හැටියට පොලී අනුපාතය අඩු කරන කොට තැන්පතුවලට ගෙවන පොලියත් අඩු වන්න පුළුවන්. අපට පුද්ගලයකු ගැන හිතලා කටයුතු කරන්න බැහැ. පුද්ගලයන් කොටසක් ගැන හිතලා කටයුතු කරන්න බැහැ. ආර්ථිකයක් ගැන කටයුතු කරන කොට ආර්ථිකයේ ප්‍රතිපත්ති ගැන හිතලා කටයුතු කරන්න ඕනෑ. අද බැංකු ක්ෂේත්‍රයේ පොලී අනුපාතය අඩු වීම නිසා මේ රටේ ආර්ථිකයේ වර්ධනයක් සිදු වනවාය කියන එක තහවුරු කරලා තිබෙනවා. ඒක අපි පිළිගන්න ඕනෑ.

ඊළඟට ඉදිරිපත් කළ තවත් තර්කයක් තමයි, මේ රටේ එක් පුරවැසියෙක් රුපියල් 3,20,000ක් පමණ ණයයි කියන එක. එය හැම වෙලාවේම කියන කථාවක්. ඒක ගැලරි කථාවක් කිව්වත් කමක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක් පුරවැසියෙක් රුපියල් 3,20,000ක් ණයයි කියන කොට අපි කියන්න ඕනෑ, ඒක පුද්ගල ආදායම අනුව අද එක පුරවැසියෙක් රුපියල් 3,80,000ක ආදායමක් උපයනවාය කියලා. ඒ, ආදායම් උත්පාදනය.

රජයක් හැටියට අපි කිසිම අවස්ථාවක ණය වාරිකයක් ගෙවීම පැහැර හැරලා නැහැ. පුද්ගලයෙක් බැංකුවෙන් ගත්ත ණයක් ගෙව්වේ නැත්නම් අපට බැංකුවෙන් ලියුම් එවනවා. ඒ වාගේම තමයි මූල්‍ය ආයතනයකින් ණයක් ගත්තාමත්. මූල්‍ය ආයතනයකින් ගත්ත ණයක් ගෙව්වේ නැත්නම් මේ රට ණය ගෙවන්නේ නැති රටක් වශයෙන් ජාත්‍යන්තරව වර්ගීකරණයක් කරනවා. එහෙම වෙලා නැහැ, මේ ලංකාද්වීපයට. අපේ රට ඒ ණය ඉතාම හොඳින් ගෙවන රටක්.

ණය ගැනීම තුළ මොකක්ද සිද්ධ වන්නේ? මම මගේ ගෙදර හදලා තිබෙන්නේ HDFC බැංකුවෙන් ණයක් අරගෙන. ඒ ණය මුදල අදත් මායි මගේ නෝනා මහත්මයායි ගෙවනවා. මා ඒ ණය මුදල ගත්තේ නැත්නම් මට ගෙයක සිහිනය දකින්න ලැබෙන්නේ නැහැ. ඒ ගෙය තුළ දරුවන් සමඟ අප සියලුදෙනාම ජීවත් වනවා. රුපියල් ලක්ෂ විසි ගණනක්, රුපියල් ලක්ෂ තිස් ගණනක් එකතු කරලා ගෙයක් හදන්න ගියා නම්, මට ඒ ප්‍රතිලාභය භුක්ති විඳින්න ලැබෙන්නේ නැහැ.

ඒ විධියට රජය ගත්ත ණය මුදල්වල ප්‍රතිලාභ තිබෙනවා, වත්කම් තිබෙනවා. අද වරාය තිබෙනවා, ගුවන් තොටු පොළවල් තිබෙනවා, අධිවේගී මාර්ග තිබෙනවා, විශාල වාරි මාර්ග ව්‍යාපෘති තිබෙනවා. අතීතයේදීත් මෙහෙම සිද්ධ වෙලා තිබෙනවා. ඒ තුළින් රටට, ඒ ප්‍රදේශයට වත්කම් එකතු වීමක් තිබෙනවා. පවුලක් ණය වනවාය කිව්වාට, ගෙය හැදීමේදී ඒ පවුලේ තාත්තාට රුපියල් ලක්ෂ විස්සක් වියදම් වුණත්, ඒ පවුලේ පස්දෙනෙක් ඉන්නවා නම් එක් කෙනෙක් රුපියල් ලක්ෂ 4ක් පමණයි ණය වෙලා තිබෙන්නේ. නමුත් ඒ ණයවීම තුළින් ඒ දරුවාට නිවහනක් ඉදි වෙලා තිබෙනවා; ප්‍රාග්ධනයක් ඇති වෙලා තිබෙනවා; මේ රටට ප්‍රාග්ධනයක් ඇති වෙලා තිබෙනවා. එම නිසා ඒවා ගැන කථා කරන්න. එහෙම නැතුව විපක්ෂය කියන වැරැදි පැත්ත ගැන විතරක් හිතන්න හොඳ නැහැ.

ඊළඟ දේ තමයි, මේ බැංකු ඒකාබද්ධ කිරීම. මා හිතන හැටියට පසු ගිය කාලයේ කොමර්ෂල් බැංකුව ඉන්ද්‍රා ෆිනෑන්ස් ලිමිටඩ් සමාගම අරගෙන තිබෙනවා. ඒ දෙක ඒකාබද්ධ වීමක් වෙලා තිබෙනවා. මේ ඒකාබද්ධ වීම නොවුණා නම් මොකක්ද වන්නේ? සමහර විට අර බැංකුව පවත්වා ගෙන යන්න බැරි වෙලා කඩා වැටෙන්න පුළුවන්. පසු ගිය කාලයේ එවැනි අත්දැකීම් තිබුණා. අපේ ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා කිව්ව ආකාරයට තරඟකාරිත්වය සඳහා අඩු පොලියට ණය දෙන්න ගියොත්, තරඟකාරිත්වයේ සිටියත් සමහරුන්ට තමන්ගේ ව්‍යාපාරික ප්‍රතිපත්ති අමතක වෙලා යනවා. තරඟකාරිත්වයට ගිහින් අඩු පොලියට ණය දුන්නාම ඒ ආයතන කඩා වැටෙන්න පුළුවන්. එහෙම කඩා වැටුණොත් මොකද වන්නේ? ගනුදෙනු කරන විශාල පිරිසකට ලොකු ප්‍රශ්න ඇති වනවා. පසු ගිය කාලයේ මූල්‍ය සමාගම්වලට එවැනි තත්ත්ව ඇති වෙලා ඒවායේ අහිතකර ප්‍රතිඵල පුරවැසියන්ට භුක්ති විඳින්න සිද්ධ වුණා.

අතිගරු ජනාධිපතිතුමා අය වැය කථාවෙන් ඒ කරුණු පෙන්නුම් කරලා, මේ රට ආර්ථික වර්ධනයෙන් ඉදිරියට යන කොට බැංකු ක්ෂේත්‍රය ශක්තිමත් කරන්න කටයුතු කළා. අපි ඒ ගැන සතුටු වනවා. ලංකා බැංකු, මහජන බැංකු වැනි ආයතන අද මූල්‍ය ක්ෂේත්‍රයේ ශක්තිමත් ආයතන බවට පත් වෙලා තිබෙනවා. ජාත්‍යන්තර වශයෙනුත් ඒ ශක්තිය තිබෙනවා. එහෙම නම් ඒ ආයතන එක්ක තව කුඩා බැංකු එකතු වීම තුළින් ඒ බැංකුවල තැන්පත්කරුවන්ටත්, ගනුදෙනුකරුවන්ටත් ලොකු ශක්තියක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා මෙය ඉතා කාලෝචිත යෝජනාවක් බව කියන්න ඕනෑ.

අපේ ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා කිව්වා, විනිශ්චයකාරවරුන් ගැන. අපි කියනවා, රාජකාරියේ යෙදී සිටින විනිශ්චයකාරවරුන් විතරක් නොවෙයි, විශ්‍රාම ගොස් සිටින විනිශ්චයකාරවරුත් හොඳින් ඉන්න ඕනෑ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් හිටපු විනිශ්චයකාරතුමෙක්. ඒ විනිශ්චයකාරතුමන්ලා විශ්‍රාම ගිය පසුවත් හොඳින් ඉන්න ඕනෑ. හිටපු අග්‍ර විනිශ්චයකාරතුමා අද කියනවා, එක් පුද්ගලයකුට ජනාධිපතිවරණයට තුන්වරක් ඉල්ලන්න බැහැයි කියලා. මා ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෙක්. එතකොට මට හිතෙනවා, එතුමා UNP පාක්ෂිකයෙක්, එතුමා විනිශ්චයාසනයේ ඉන්න කොට කොහොම හින්දු දෙන්න ඇතිද කියලා. එවැනි මත ප්‍රකාශ කිරීම තුළින් අපට හිතෙනවා, හිටපු අග්‍ර විනිශ්චයකාර සරත් එන්. ද සිල්වා මහතා එදා උසාවියේ රාජකාරි කිරීමේදී ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන් ඔක්කොටම විරුද්ධ වුණාය කියලා.

පෘථග්ජනයන් හැටියට අපට එහෙම හිතෙනවා. මා නම් හිතන්නේ, විශ්‍රාම ගියාමත් ඒ දේවල් කථා නොකර ඉන්න ඕනෑ කියලායි. ඒක ඉතාම වැදගත්. රාජ්‍ය සේවයේ ඉන්නකොට පමණක් නොවෙයි, විනිශ්චයකාරවරුන් විශ්‍රාම ගියාමත් නිහඬව ඉන්න ඕනෑ. මොකද, ඔවුන් යම් මතයක් ප්‍රකාශ කරන කොට ඒ මතයට විරුද්ධ අයට -අපට- "එහෙම නම් මෙතුමා විනිශ්චය ආසනයේ සිටින විටත් ස්වාධීනව කටයුතු කළාද?" කියන සැකය ඇති වෙනවා. ඒක තමයි පෘථග්ජනභාවය. අද එවැනි මතයක් සරත් එන්. සිල්වා මැතිතුමා ඇති කර තිබෙනවා. එහෙම නම්, එතුමා විනිශ්චය ආසනයේ සිටින විට කොහොම කටයුතු කළාද, පක්ෂග්‍රාහී වුණාද කියන ප්‍රශ්නය පෘථග්ජනයන් හැටියට අපට ඇති වෙනවා. ඒ නිසා මේවා ගැන අපි හිතන්න ඕනෑ. සමාජයට එවැනි සැක ඇති කරන්න හොඳ නැහැ.

එදා බලයට ආවාට පස්සේ ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා මොකක්ද කළේ? මේ රටේ ඉතිහාසයේ පළමුවැනි වතාවට, විනිශ්චයකාරවරුන් ගෙදර යැව්වා. ඊට පස්සේ එතුමා නැවත පත් කළ විනිශ්චයකාරවරු කවුද? මේ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්තුමාත් හිටපු දිසා විනිසුරුතුමෙක්. එදා මොකක්ද කළේ?

[ගරු ලලිත් දිසානායක මහතා]

විනිශ්චයකාරවරුන් ගෙදර යවලා අග්‍ර විනිශ්චයකාරවරයා හැටියට නෙවිල් සමරකෝන් මහත්මයා පත් කළා. පොළොන්නරුව පැත්තේ උසාවියක වැඩ කරපු කෙනෙක්. පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්තුමා ඒ ගැන දන්නවා ඇති. ඉතිහාසයේ එහෙම වෙලා තිබෙනවා. එහෙම ඉතිහාසයක් තිබෙන පක්ෂයක්, ඒ පක්ෂයේ මන්ත්‍රීවරුන්, "අපි එහෙම කරන්නේ නැහැ." කියලා කියන කොට මිනිස්සු ටිකක් සැකෙන් බලා ඉන්නවා, "අනේ මේ අය ඒ විධියට කටයුතු කරපු මිනිස්සු. අපි කොහොමද මේවා තවත් විශ්වාස කරන්නේ?" කියලා. එවැනි සැකයක් තිබෙනවා. ඒක තමයි පෘථග්ජන මනුස්සයාට ඇති වන සිතිවිල්ල. ඒ නිසා, තමුන්නාන්සේලා කොච්චර කිව්වත් මේ රටේ ජනතාවට සැකයක් ඇති වෙනවා, "අනේ මෙහෙම කිව්වාට, මේ අයම නේ උසාවියේ හිටපු මහත්තයෙක් අග්‍ර විනිශ්චයකාරයා කළේ. අනේ, අප්පෝ! මේ අය ආයෙත් බලයට ආවොත් එහෙම නොකරයිද?" කියලා. ඒ විතරක් නොවෙයි. හිටපු අග්‍ර විනිශ්චයකාරවරිය ගෙදර යැව්වා කියලා ඒ අය අපට ඇඟිල්ල දිගු කරන කොට,-

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
රීති ප්‍රශ්නයක් නඟනවා, ගරු පී. හැරිසන් මන්ත්‍රීතුමා.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා සරත් නන්ද සිල්වා මැතිතුමා ගැන කියන කොට අපට පොඩි සැකයක් ඇති වෙනවා. මෙතුමා එතුමාගේ නඩු තීන්දු ගැන මේ විධියට විග්‍රහ කරන කොට-

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඒක රීති ප්‍රශ්නයක් නොවෙයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමා කථා කරන්න.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමන්ලා කියනවා, "හිටපු අග්‍ර විනිශ්චයකාරතුමිය ගෙදර යැව්වා." කියලා. ශිරානි බණ්ඩාරනායක මැතිනුමිය ගැන කථා කරලා, "හිටපු අග්‍ර විනිශ්චයකාරතුමිය ගෙදර යැව්වා." කියලා මෙතුමන්ලා කියන කොට ජනතාවට සැකයක් ඇති වෙනවා, "මේක අද ඊයේ වූ දෙයක් නොවෙයි. මේ අය පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ සිටිද්දී, රනිල් වික්‍රමසිංහ මහත්මයා අගමැති වෙලා සිටිද්දී-

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
සුනාමි නඩුවට දීපු තීන්දුව හරියි කියලා ඔබතුමාට කියන්න පුළුවන්ද?

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ගරු නියෝජ්‍ය ඇමතිතුමාට බාධා කරන්න එපා.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
එදා ජේ.ආර්. ජයවර්ධන මහත්මයා එක්සත් ජාතික පක්ෂයේ නායකයා හැටියට සිටිද්දී අග්‍ර විනිශ්චයකාරවරයා හැටියට පත් කරපු නෙවිල් සමරකෝන් මහත්මයා ගෙදර යැව්වා, ජේ.ආර්. ජයවර්ධන මහත්මයා විසින්ම. ඒ නිසා ජනතාව කියනවා, "මේ අය අද උපාසකයන් හැටියට සිටියාට එදා කළේ මෙහෙමයි. කොටි හම තවම තිබෙනවා. ඒකට උඩින් තමයි මේ හම දාගෙන ඉන්නේ." කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රවි කරුණානායක මහත්මයා කියපු දෙයක් ගැනත් කියන්න ඕනෑ. මම ඊයේත් එතුමාට අභියෝග කළා. මොකක්ද ඊයේ කිව්වේ? එතුමා පෞද්ගලික ආයතන ගැන කථා කළා. එතුමා මේ වෙලාවේ මේ ගරු සභාවේ නැහැ. මේවාට උත්තර දෙන්න එතුමා දැන් සිටියා නම් හොඳයි. එදා කෝට්ටේ චන්ද්‍රා ද සිල්වා ක්‍රීඩාංගනයට මොකද වුණේ? එතුමා කෝට්ටේ සංවිධායක. එය දුන්නා පෞද්ගලික අංශයට. ළමයි ක්‍රීඩා කරන කෝට්ටේ චන්ද්‍රා ද සිල්වා ක්‍රීඩාංගනය පෞද්ගලික අංශයට දීලා අද මේ විධියට කථා කරනවා. සතොස එළි වන කල් -පැය 24 ම- විවෘත කර තියලා එහෙම පිටින් විකුණා දැම්මා. එතුමා වෙළෙඳ ඇමති හැටියට, එදා Main Street එකේ තිබුණු සතොස ආයතනය -රජයේ ආයතනය- පෞද්ගලික අංශයේ කෙනකුට දුන්නා. එහෙම කරපු එතුමා, "මේ රට චීනයට දෙන්න යනවා. චීනයට විකුණන්න යනවා." කියලා අද කියන කොට ජනතාව කියනවා, "දෙයියෝ සාක්කි! අපට අඩුම ගණනේ හාල් මැස්සන් ටිකක්වත් ගන්න තිබුණු සතොස පැය 24න් විකුණපු මිනිහා අද රාජ්‍ය දේපළ ආරක්ෂා කරන්න කථා කරනවා." කියලා. ජනතාවට මෙතුමන්ලා විහිළුවක් වෙනවා. ජනතාව මෙතුමන්ලා කෙරේ විශ්වාසයක් තියන්නේ නැහැ.

ඒ විතරක් නොවෙයි. මෙතුමන්ලා අද කොටි ත්‍රස්තවාදය ගැන කථා කරනවා. එදා ශ්‍රී මහා බෝධින් වහන්සේ අසල හිටපු උපාසක මහත්වරුන් මරපු, අපේ ගරු අස්වර් මන්ත්‍රීතුමාගේ සහෝදරවරුන් ආගම කියද්දී කාත්තන්කුඩි පල්ලියේදී ඝාතනය කරපු, ඒ වාගේම දළ දා මාළිගාවට බෝම්බ ගහපු කොටි පරද්දන්න අපේ හමුදාව කිලිනොච්චියට යන කොට රවි කරුණානායක මන්ත්‍රීතුමා ඔය පැත්තේ ඉඳගෙන මොකක්ද කිව්වේ? "කිලිනොච්චි නොවෙයි, හමුදාව යන්නේ මැදවච්චි." කිව්වා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
දළ දා මාළිගාවට බෝම්බ ගහපු කොටි, ශ්‍රී මහා බෝධින් වහන්සේට පහර දීපු කොටි පරද්දන්න අපේ හමුදාව යන කොට මේ පාර්ලිමේන්තුවේ ඔය පැත්තේම ඉඳගෙන කථා කරපු රවි කරුණානායක මහත්මයා කිව්වා, "මේ හමුදාව යන්නේ

කිලිනොච්චි නොවෙයි, මැදවච්චිය." කියලා. එදා එහෙම කියලා අද එතුමා හමුදාව ගැන කථා කරන කොට, බොහොම දේශානුරාගයෙන් කථා කරන කොට ජනතාව කියනවා, "අනේ දෙවියනේ, මේ මනුස්සයා කියපු ඒවා අපට අමතක නැහැ." කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තිබෙන්නේ 2014 ඔක්තෝබර් මස 20වැනි දා "දිනමිණ" පත්තරේ. එහි මොකක්ද තිබෙන්නේ? එහි තිබෙනවා, "රනිල්ගේ ලන්ඩන් චාරිකාවෙන් පසු කොටින්ට ලැබුණු ජයග්‍රහණ..." යනුවෙන් පළ වූ ලිපියක්. එහි පැහැදිලිව කියලා තිබෙනවා. පළමුවෙන්ම හම්බ වුණු කොටියා කවුද? කොටි සංවිධානයේ ජාත්‍යන්තර කටයුතු රැසක් සිදු කළ සුරේන් සුරන්දිරන්. එම්මානුවෙල් පියතුමාගේ පෞද්ගලික ලේකම් සුරේන්. ඊළඟ එක්කෙනා කවුද? ඒ විධියට කොටි හිතවාදීන් හැටියට 24 දෙනෙකුගේ නම් ඇතුළත් වනවා. සුරේන් සුරන්දිරන්, සුගන්ධන් කුමාර්, කුමරේන් දිරන් මේ වාගේ අය. මේ අය ගිහින් සාකච්ඡා කරලා මේ ගැන වචනයක්වත්- [බාධා කිරීම්]

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, රීති ප්‍රශ්නයක් තිබෙනවා.
ගරු පී. හැරිසන් මන්ත්‍රීතුමා, මොකක්ද රීති ප්‍රශ්නය?

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ලලිත් දිසානායක නියෝජ්‍ය ඇමතිතුමා කොටි ගැන කතා කරනවා. නමුත්, කොටි ඉන්නේ ඒ පැත්තේ. කරුණා අම්මාන් ඉන්නෙත් ඔය පැත්තේ නේ.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
DFCC බැංකුව ගැන කතා කරන්න. අද මාතෘකාව ඒක නේ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි. රීති ප්‍රශ්නයක් නැහැ. ගරු නියෝජ්‍ය ඇමතිතුමා කතා කරන්න.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, විදේශ නියෝජිතයෝ ද හමුවෙලා තිබෙන්නේ? විපක්ෂ නායකතුමා රට ගිහිල්ලා හමුවෙලා තිබෙන්නේ එක මන්ත්‍රීවරයෙක් පමණයි. ඒ විපක්ෂයේ සිටින ලියම් ෆොක්ස් මන්ත්‍රීතුමා. මේ ආකාරයෙන් රට ගිහිල්ලා එනකොට මෙහි අභිංසක මාළු වෙළෙන්දන්ගේ මාළු ටික ගන්න එක යුරෝපා සංගමයෙන් තහනම් කරන්න යනවා. ඒ වාගේම කොටින්ට නිදහස ලබා දෙනවාද? කොටින්ට තහනමක් නිකුත් කරලා තිබුණා, කොටින්ට සල්ලි එකතු කරන්න බැහැ කියලා. එය තහනම් කර තිබුණා. මොකද, ඒ සල්ලිවලින් තමයි ඔවුන් ආයුධ අරගෙන අපේ අය මැරුවේ. [බාධා කිරීම්] එහෙමනම්, රනිල් වික්‍රමසිංහ මහත්තයා රට ගිහිල්ලා එනකොට යුරෝපා සංගමයෙන් කොටින්ට නිදහස ලබා දෙනවා. ඒ වාගේම, අපේ ධීවරයන්ගේ මාළු ටික ගන්න එකත් නවත්වනවා. ඉතින් මෙන්න මේ දේවල් සම්බන්ධයෙන් මොනවා හරි බැඳීමක් තිබෙනවා. ඒ නිසා මේවා ගැන අපි හිතන්න ඕනෑ. මේ රටට මේ අභියෝගය එල්ල වෙලා තිබෙනවා. ප්‍රභාකරන්ගේ ඝාතනයෙන් විතරක් කොටි ත්‍රස්තවාදය නවතින්නේ නැහැ. ඒ නිසා තමයි අපි කිව්වේ ආරක්ෂක හමුදා දැනුවත් කරන්න ඕනෑ; එම හමුදාව ශක්තිමත් කර තියා ගන්න ඕනෑ; නාවික හමුදාව ශක්තිමත් කරන්න ඕනෑ කියලා. ඒවාට යම් කිසි වියදමක් දරන්න වෙනවා. එතකොට අය වැයක් එනකොට ආරක්ෂක වියදම වැඩියි කියලා කෑ ගහනවා. එදා විතරක් නොවෙයි, අදත් අපි මුහුදු-වෙරළ- රකින්න ඕනෑ. මුහුදේ ඒ ඔත්තු ටික බලන්න ඕනෑ. ඒ වාගේම මේ බුද්ධි අංශය මෙහෙයවන්න ඕනෑ. මේ සියල්ල කරන්න ඕනෑ සංයමයකින් යුතුව. නමුත් මේ අය බොහොම හෑල්ලුවට කියන්නේ ආරක්ෂක වියදම බිංදුවට තියලායි. මේ අයට හැඟීමක් නැහැ. මම ඉතාමත් පැහැදිලිව කියන්නේ, මේ කාරණයයි. ඉතාමත් කාලෝචිත යෝජනාවක් ගෙනැල්ලා මේ රටේ මූල්‍ය අංශය ශක්තිමත් කරන්න කටයුතු කිරීම පිළිබඳ ගරු මුදල් ඇමතිතුමාට මා ස්තුතිවන්ත වෙමින් මගේ කතාව අවසන් කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා ඔබතුමාට බොහොමත්ම ස්තුතියි. මීළඟට, ගරු ෆිලික්ස් පෙරේරා ඇමතිතුමා.

[අ.භා. 5.46]

ගරු ෆිලික්ස් පෙරේරා මහතා (සමාජ සේවා අමාත්‍යතුමා)
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா - சமூக சேவைகள் அமைச்சர்)
(The Hon. Felix Perera - Minister of Social Services)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ විවාදය පවත්වද්දි අපේ ගරු සරත් අමුණුගම ඇමතිතුමා ඒ පිළිබඳව මූලික කරුණු රාශියක් ඉදිරිපත් කළා. ඇත්ත වශයෙන්ම DFCC බැංකුව කියන එක පාර්ලිමේන්තු පනතකින් සම්මත කළ එකක්. NDB බැංකුව Companies Act එක යටතේ තිබුණු එකක්. ඉතින් මේ දෙක එක කළමනාකරණයක් යටතට ගැනීම හොඳයි කියන එක තමයි මගේ පෞද්ගලික අදහස. අපේ ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමාත් කතා කළේ වරදක් නෙමෙයි කියන මතයේ සිටයි. අපි ස්තුතිවන්ත වෙනවා, එතුමාටත්.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
කිසිම ප්‍රශ්නයක් නැහැ, කැමැත්තෙන් කරනවා නම්. විරුද්ධයි කියලායි කිව්වේ.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
විරුද්ධයි කියලා. හා එහෙමද කිව්වේ?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මූලධර්මයට විරුද්ධයි. මූලධර්මය හරි නම් ඒ අනුව යන්න.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මූලධර්මය හරි නම්, ඒ කියන්නේ හරියටම ස්ත්‍රියක්, පුරුෂයෙක් හා එක් වුණා වාගේ නේද? එක්කෙනෙක් එංගලන්තයේ වෙන්න පුළුවන්, අනිත් කෙනා ලංකාවේ වෙන්න පුළුවන් ඒක ප්‍රශ්නයක් නැහැ. ඒකත් හිතාගන්න කෝ.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ඔව්. කැමැත්තෙන් වෙනවානම්.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
හොඳයි කැමැත්තෙන්.

මෙම මූල්‍ය පද්ධතිය ඒකාබද්ධ කිරීමෙන් රට ශක්තිමත් වෙනවා. මූල්‍ය පද්ධතිය සුරක්ෂිත වෙනවා. නමුත්, මෙයින් සේවකයන්ට කිසිම හානියක් සිදු වන්නේ නැහැ. ඇත්ත වශයෙන්ම, ඉදිරියේදී මේවා අඩු වෙන්න ඕනෑ. මේකේ ලොකු ප්‍රශ්න ටිකක් තිබෙනවා, අපි ඒ ගැන පසුව කතා කරමු. නමුත්නාන්සේලා කියන්නේ මේ ගෝලීයකරණය තුළ ක්‍රය ශක්තිය අඩු වෙනවා කියලා නේ. කෙසේ වෙතත්, අපි කියන්න ඕනෑ ගෝලීයකරණය තුළ ක්‍රයශක්තිය අඩු වෙනවා නොවෙයි, ගෝලීයකරණය තුළ නොයෙකුත් විපර්යාස වෙමින් පවතිනවා කියලායි. ඉතින් ඒක සමාජ ප්‍රශ්නයකුත් එක්ක තමයි බද්ධ වෙලා පවතින්නේ. සරල ජීවිතයෙන් මිදිලා වාණිජකරණය වුණාම හැම විටම හැමෝම බලන්නේ ආර්ථික විද්‍යාවෙන් පමණක් පුළුවන්ය කියලා. නැහැ, මෙයට සමාජ විද්‍යාවත් බද්ධ කර ගන්න ඕනෑ. දැන් ක්‍රෙඩිට් කාඩ් තිබෙනවා, යනවා සුපර් මාකට් එකට. තමා ගෙදරින් යනකොට ගන්න හිතාගෙන ගිය දේත් නොවෙයි එතැනට ගියාම ගන්නේ. හැමදේම අර ගන්නවා. ක්‍රෙඩිට් කාඩ් එකෙන් ගෙවනවා. අන්තිමේදී මොනවාද වෙන්නේ "පොකට්" එක හිස් වෙලා ණය කාරයෙක් බවට පත් වෙනවා. ඇත්ත තත්ත්වය ඒකයි. සුපර් මාකට් එකට ගියාම රාක්කයක බැලුවත් කොම්පැනිවලට වාසි විදියට තමයි බඩු දාලා තිබෙන්නේ. කොම්පැනියට වාසි බඩු ඇස් මට්ටමේ දාලා තිබෙනවා. ලාභ බඩු තිබෙන්නේ උඩ. උඩ බලලා ගත්තොත් ලාභයි. මේක තමයි මේ ආර්ථිකයේ -මේ වෙළෙඳ රටාවේ- ඇත්ත තත්ත්වය. "පළමුව බාටා දෙවනුව පාසල" කියලා කියනවා නේ. මේ වාගේ වාණිජකරණය කිරීමට පාවිච්චි කරන දැන්වීම් ගැනත් අපි හිතන්න ඕනෑ කියලා මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ.

බැංකු තිබෙන්නේ කා සඳහා ද? බැංකු තිබෙන්නේ සමස්ත ජනතාවම සඳහා. බැංකුවකට සම්බන්ධ වෙන්න වයසක් බලපාන්නේ නැහැ.

උපදින දරුවාගේ සිට ජ්‍යෙෂ්ඨ පුරවැසියා දක්වා හැම කෙනකුම බැංකුවත් එක්ක ගනුදෙනු කරනවා. සමහර ළමයි ඉපදෙන කොටම ඒ අයගේ පියවරුන් ඒ ළමයින්ට ගිණුම් විවෘත කරනවා. නැත්නම් ඥාතියෙක් ගිණුමක් විවෘත කරනවා. සුප්පුව දෙන්න ඉස්සෙල්ලා බැංකු පොත ඇවිල්ලා. ඇත්තම කථා කරනවා නම් ඒක තමයි අද මේ සමාජයේ යථාර්ථය. විශේෂයෙන්ම, බැංකු පද්ධතිය ආරක්ෂා කිරීම රජයේ යුතුකමක් විධියට අපි දකිනවා.

ලංකාවේ බැංකු ගැන කථා කරද්දී අපට අමතක වන බැංකුවකුත් දැන් තිබෙනවා. ඒ තමයි කොටි බැංකුව. අද කොටි බැංකු නැහැ. ඒ ගොල්ලො රත්තරන් ටික අරගෙන බැංකුවේ දමා ගත්තා.පහු ගිය දවසක ජනාධිපතිතුමා එක්ක මමත් කිලිනොච්චියට ගියා. ජනාධිපතිතුමා කිලිනොච්චි ගිහින් රත්තරන් බෙදුවා. ඒ ගත්තුවා බෙදලා දුන්නා. ඔන්න තත්ත්වය.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
කොටි පැහැර ගත්තා.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ඔව්. කොටි පැහැර ගත්ත ඒවා බෙදලා දුන්නා. මේවා තිබුණේ කොයි බැංකුවේද? මේවා තිබුණේ කොටි බැංකුවේ. මේ සමාජ ක්‍රමය තුළ අපේ ජනාධිපතිතුමා කොටි බැංකු ටිකත් නැති කළා. ඒක අපි ආඩම්බරයෙන් කියන්න ඕනෑ. කිලිනොච්චියේ teller machines තියෙනවා. මම කිලිනොච්චි ගිහින් සොයා බැලුවා මොන බැංකුවද නැත්තේ කියලා. එහේ නැති බැංකුවක් නැහැ. හැම බැංකුවක්ම විවෘත කරලා. මේ යුද්ධය අවසන් වෙච්ච ගමන් අපේ කැබිනට් රැස්වීම මුලින්ම තිබුණේ කිලිනොච්චියේ. එදා පළමුවෙන්ම ජනාධිපතිතුමා විවෘත කළේ petrol shed එකක්. අද බලද්දී දවල්ට වඩා රෑට කිලිනොච්චිය එළියයි. පැය 24 ම ලයිට් පත්තු වෙනවා. මිනිස්සු ගමන් බිමන් යනවා. ජනගහනය වැඩිවෙලා. පාරේ යන වාහන වැඩි වෙලා. ඒ විතරක් නොවෙයි, හුහාක් දේවල් අද එහේ සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා මේ බැංකු පද්ධතිය ගැන කථා කරද්දී, උපතේ සිට විපත දක්වාම බැංකුව අපට සේවය කරන බව කියන්න ඕනෑ. අපට පෙනෙනවා, සමාජය බැංකු පද්ධතිය වැළඳගෙන ඉවරයි කියා.

1505 දී තමයි පෘතුගීසීන් ලංකාවට ඇවිල්ලා තිබෙන්නේ. ඒ එක්කම චෙට්ටියාර්වරු ඇවිල්ලා තිබෙනවා. මේ චෙට්ටියාර්වරු ගම් දෙකක පදිංචි වුණා. එකක් කොළඹ කොච්චිකඩේ. අනෙක මීගමුව කොච්චිකඩේ. මම මේ ළඟදි විශ්‍රාමික වැඩිහිටි බැංකු නිලධාරීන් එක්ක රැස්වීමකට ගිහිල්ලා ඉන්නකොට මේ කරුණු කාරණා ගැන අපි කථා කළා. චෙට්ටියාර්වරු කොළඹ කොච්චිකඩේත් ඉන්නවා. ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව කොච්චිකඩේත් ඉන්නවා. මේ අය තමයි ඉස්සෙල්ලාම මූල්‍ය කළමනාකරණය කරලා තිබෙන්නේ. පොලියට දීම, පොලියට බඩු ගැනීම වාගේ කටයුතු කර තිබෙනවා. බැංකුව කරන්නේත් මහජනයාගේ මුදල් අරගෙන තැන්පත් කරලා, ඒක ටිකක් වැඩිපුර මුදලකට දෙන එකයි. හැබැයි ද්‍රැවශීලිභාවය තිබෙන්නට ඕනෑ. බැංකුවට බැරිකමක් තිබුණොත් ඉල්ලන වේලාවට සල්ලි දෙන්න අවිශ්වාසය ඇති වෙනවා. ඒ "අවිශ්වාසය ඇති වුණාම කඩාවැටීම් සිද්ධ වෙනවාය" කියන එක අපි මූලධර්මයක් විධියට දකිනවා. අවිශ්වාසය මුල් කරගෙන යම් කටයුත්තක් කළොත්, ඒක කඩා වැටීමේ අවදානමක් තිබෙනවා කියලා බුදුහාමුදුරුවොත් දේශනා කරලා තිබෙනවා නේ. අවදානම කියන එක නැති කරන්න ජනාධිපතිතුමා අපේ රටේ හුහාක් වැඩ කරලා තිබෙනවා.

මේ රටේ සක්විතිලා හිටියා. නොයෙකුත් අය හිටියා. ජාඇල මූල්‍ය සමාගම් දෙකක් තිබුණා. ජාඇල මූල්‍ය සමාගම් දෙක බලය නොගත්තු පොලිය එකතු කරන ආයතන. අද ඒවා නැති කරලා තිබෙනවා. ඉතින් එදා සෙලාන් බැංකුව කඩා වැටුණු වේලාවේ අජිත් නිවාඩ් කබ්‍රාල් මැතිතුමා ප්‍රකාශයක් කරලා කිව්වා "භය වෙන්න එපා. අපි මේක සමථයකට පත් කරලා තිබෙන්නේ" කියලා. 2009 ජනවාරි 04 වෙනිදා ශ්‍රී ලංකාවේ මහ බැංකුවේ අධිපති කියනවා "නොයෙකුත් හේතු නිසා මූල්‍ය පද්ධතිය අස්ථායී තත්ත්වයක් ඇති වෙන්න පුළුවන්. මුදල් පනත අනුව එම තත්ත්වය සමනය කරන්න ශ්‍රී ලංකා මහ බැංකුව මැදිහත් වෙන්න පුළුවන්. මේ ආකාරයෙන් සෙලාන් බැංකුවේ යම් අස්ථාවරත්වයක්

ඇති වුණා. එම නිසා මහ බැංකුව වහාම මැදිහත් වෙලා අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කරලා දන්වා සිටිනවා වෙනත් බැංකුවලට කිසිදු පැකිලීමකින් තොරව සෙලාන් බැංකුව සමඟ ගනුදෙනු කරන්නැයි අපි ඉල්ලා සිටිනවා" කියලා. කවුද කියන්නේ, 2009 ජනවාරි 04 වෙනිදා "දිවයින" ඉරිදා පුවත් පත තමයි මේ ප්‍රකාශ කරලා තිබෙන්නේ. මම ඒකත් අරගෙන ආවේ. මේක තමයි ඇත්ත තත්ත්වය. ජනාධිපතිතුමාත් ඉන්න වේලාවේ ඇමෙරිකාවේදී බැංකුකරුවන්ටත්, මූල්‍ය කළමනාකරුවන්ටත් සම්මන්ත්‍රණයක් තියලා "රටේ ලොක්කා කවිද?" කියලා ප්‍රශ්නයක් ඇහුවා. ඇත්ත වශයෙන්ම, රටේ ලොක්කා ජනාධිපතිතුමා. ඒක තමයි ඇත්ත. නමුත් මහ බැංකුවේ හිටපු කෙනා නැඟිටලා කිව්වා "මමයි ලොක්කා" කියලා. ඒකට හේතුවක් තිබුණා.

"මමයි ලොක්කා" කියන එකේ තේරුම මේකයි. එතුමා මූල්‍ය තත්ත්වය අස්ථාවරයි කියලා කිව්වොත් රටම අක්‍රිය වනවා. මොකද, ජනාධිපතිතුමා දේශපාලන පත්වීමක්. නමුත් මහ බැංකුවේ ලොක්කා එහෙම නොවෙයි. විශ්වාසයෙන් යුතුව, පොඩ්ඩක් සංකේතයක් කරලා, එහෙම නැත්නම් ඉඟියක් කළොත් රටම කඩා වැටෙන්න පුළුවන්. මේකෙන් අපි තේරුම් ගන්න ඕනෑ දේ තමයි, මූල්‍ය කළමනාකරණය හරියාකාරව කරන්න ඕනෑය කියන කාරණය. මූල්‍ය කළමනාකරණය ආණ්ඩුව කරනවා. අපේ දත්තයන් දිහා බලද්දී අපි ටිකක් හොඳ, උසස් තත්ත්වයක ඉන්නවා කියන එක කාට වුණත් කියන්න පුළුවන්. ඒකට කරුණු තිබෙනවා. වෙලාව තිබුණොත් මට ඒ කරුණු ඉදිරිපත් කරන්න පුළුවන්. පොදු මහ ජනතාවගේ අවශ්‍යතාව ඉෂ්ට කිරීමට කටයුතු කරන්න ඕනෑ. බලන්න, ඒ කාලයේ හැම තැනම සීට්ටු දැම්මා. මම මේ කියන්නේ ප්‍රායෝගික ප්‍රශ්න පිළිබඳවයි. ඒ කාලයේ සීට්ටු දැම්මා. සීට්ටුවේ පළමුවැනි කොටස අරගෙන අන්තිම කොටස ගෙවන්නේ නැහැ. අන්තිමට සීට්ටුව ගත්ත කට්ටිය අමාරුවේ වැටෙනවා.

නමුත් අද අපේ බැසිල් රාජපක්ෂ මහත්මයා "දිවි නැහුම" හරහා දෙන ණය ආධාර නිසා සීට්ටු ක්‍රමය එන්න එන්න නැති වී ගොස් තිබෙනවා. මිනිසුන් මේ ණය ආධාර භාවිත කරමින් තමුන්ගේ මූල්‍ය කළමනාකරණය කිරීමට කටයුතු කරනවා. මම පසු ගිය සතියේදීත් පාර්ලිමේන්තුවේ දී මේ කාරණය පිළිබඳව කිව්වා. ඒ ගොල්ලන්ට රුපියල් 50,000ක් දෙනවා. මම උදාහරණයක් වශයෙන් එක පුද්ගලයෙකු යොදා ගත්තා. ඔහු සියයට දහයේ පොලියට රුපියල් 30,000ක් අරගෙන තිබෙනවා. හැම මාසයකම ඔහුට පොලිය වශයෙන් රුපියල් 3,000ක් ගෙවන්න වනවා. මම ඔහුට උපදෙසක් දුන්නා, රුපියල් 50,000න් රුපියල් 30,000ක් ගෙවලා දාලා රුපියල් 20,000ක් ඉතුරු කර ගන්න, ඒ රුපියල් 20,000න් business එකක් පටන් ගන්න, එතකොට රුපියල් 3,000ක් ඉතුරු වනවා නේ කියලා. මේක තමයි, බැංකුව කරන්න ඕනෑ. අපේ රට ඉස්සරහට යද්දී අපි හොඳ කටයුතු කරන්න ඕනෑ. රජයේ බැංකුවල විශේෂයෙන්ම අනුන්ගේ සල්ලි තිබෙන්නේ. ව්‍යාපාරිකයින්, කර්මාන්තකරුවන්, විශ්‍රාමිකයින්, රජයේ සේවකයින්, කුඩා දරුවන් කියන ඒ සියලු දෙනාගේම සල්ලි දැන් තිබෙන්නේ බැංකුවල. රටක මූල්‍ය ක්‍රමයේ ප්‍රතිබිම්බය බැංකු පද්ධතිය කියන එක අපි කවුරුත් දන්නා කතන්දරයක්. මූල්‍ය ක්‍රමය කියන්නේ මේ වාගේ අර වාගේ කියා පෙන්වන්න පුළුවන් දෙයක් නොවෙයි. කණ්ණාඩියක් ඉස්සරහට ගෙනාවොත් එම කණ්ණාඩියෙන් පෙනෙන්න ගන්න ප්‍රතිබිම්බය බැංකුවයි කියලා තමයි කථාවට කියන්නේ. බැංකුවක් කියන්නේ උපකාරක සේවා කරන වැඩ පිළිවෙළක්. සන්නිවේදනය - communication, ගබඩාකරණය - warehousing, රක්ෂණය - insurance, ප්‍රවාහනය -transportation - කියන ඒවා තමයි උපකාරක සේවා. නමුත් මේ හැම උපකාරක සේවයකටම වඩා නූතනයේ ප්‍රමුඛතම උපකාරක සේවය බවට පත්ව ඇත්තේ බැංකු සේවා - banking service - කියන එකයි. Banking service කියන එක හොඳට තිබෙන්න ඕනෑ. ඒකෙන් පොදු සේවා රැසක් කරනවා නේ. විදුලි බිල්පත් ගෙවීම, රන් ණය සේවා, lockers, telebanking, විනිමය හුවමාරුව, මූල්‍ය උපදේශන සේවා, අළෙවි උපදේශන සේවා, ව්‍යාපෘති සැකසීමට උපදෙස්, සම්මන්ත්‍රණ සංවිධානය කිරීම, තාක්ෂණික උපදේශන සේවා, තැරැව්කාර සේවය, කොටස් වෙළෙඳ පොළ ගැන උපදෙස්, ජාත්‍යන්තර වෙළෙඳ උපදේශනය බැංකුවට කරන්න පුළුවන්. සෙලාන් බැංකුවේ අර්බුදයේ දී අප රජයෙන් ඊට මැදිහත් වන්න සිදු වුණු නිසා ලංකාවේ බැංකු පද්ධතිය ගැන විශ්වාසයක් තිබෙනවා. බැංකු පද්ධතිය කඩා වැටිලා නැහැ. Bail out කරපු නිසා ඒ විශ්වාසය තහවුරු වෙලා තිබෙනවා. දැන් කවුරුත් දන්නවා, මේ බැංකු පද්ධතිය කඩා වැටෙන්නේ නැහැ කියන එක. "අල්ලක් වපුරා මල්ලක් ගෙට ගන්නවා" කියලා ආප්තෝපදේශයක් තිබෙනවා නේ. මීයක් කඩන්නේ අත ලෙවකන්ඩ නොවෙයි කියලා ඒ කාලයේ කියලා තිබෙනවා. ඒ වාගේම සමහර අය තණ්හාවට වැඩි පොලියක් ගන්න පෞද්ගලික ආයතනවල මුදල් තැන්පත් කරනවා. කඩා වැටිච්ච එවැනි ආයතන කීපයක් තිබෙනවා. මේවා පිළිබඳව ජනතාව දැනුවත් කරන්න ඕනෑ. මේ බැංකුවලට අපි කියන්න ඕනෑ, ජනතාව දැනුවත් කිරීමට ක්‍රමවේදයක් හදන්නව කියලා. ඒකට ක්‍රමවේදයක් තිබෙනවා. එය ප්‍රසිද්ධ කරන්න ඕනෑ.

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවක් තිබෙනවා; එහි දුරකථන අංකයක් තිබෙනවා. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවක් තිබෙනවා; එහි දුරකථන අංකයක් තිබෙනවා. නීති කටයුතු දෙපාර්තමේන්තුවක් තිබෙනවා. රාජ්‍ය ණය දෙන දෙපාර්තමේන්තුවක් තිබෙනවා. කොළඹ කොටස් වෙළෙඳ පොළ තිබෙනවා. මේවායේ දුරකථන අංක දීලා තිබෙනවා. 119 වාගේ මේ දුරකථන අංකත් ප්‍රසිද්ධ කරන්න, අපේ ගරු සරත් අමුණුගම ඇමතිතුමනි. මේ දුරකථන අංක ප්‍රසිද්ධ කළාම වෙළෙඳ ව්‍යාපාරිකයන්ට, සාමාන්‍ය ජනතාවට තමුන්ගේ බැංකු පිළිබඳව තිබෙන තත්ත්වයන් ගැන කථා කරන්න, උපදේශනය ගැන හොයන්න පුළුවන්. නැත්නම් පොලීකාරයින්ට, අරයාට මෙයාට අහු වෙලා මිනිසුන් නැති නාස්ති වෙලා යනවා. පොලියට යමක් දෙනවා නම් ඔප්පුවක් තියා ගන්නවා. නැත්නම් රත්රන් බඩු ටික තියා ගන්නවා. අන්තිමට පොලී ගෙවන්න බැරිව ගියාම ඔප්පුව ලියා ගන්නවා. පසුව දේශපාලනඥයෝ වශයෙන් අප ළඟට ඔවුන් එනවා. අපි මේ ගැන බොහොම පසුතැවිල්ලට පත් වෙලායි ඉන්නේ. නමුත් මේ වැඩ පිළිවෙළ නිසා අද ගොඩාක් වැඩ කටයුතු සාර්ථක වෙලා තිබෙනවා. ඒ කාලයේ අපි ජාතික ඉතිරි කිරීමේ බැංකුව, සංවර්ධන බැංකුව, මහජන බැංකුව හැදුවේ ගමට ගෙන යන්නයි. නමුත් ගමට ගියාද? ගමට ගියා, බැංකු දැම්මා. ඊට වඩා සමෘද්ධි බැංකුවෙන් යම් කිසි සේවයක් වුණා. ඉතින් මේ කාරණා ගැන අපි හොඳට කල්පනා කළ යුතුයි කියන එක මා මේ අවස්ථාවේදී යෝජනාවක් වශයෙන් ඉදිරිපත් කරනවා. ඊළඟට-

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

කාලය ඉවර වුණාද? මොනවා වුණත් අපි මූල්‍ය කළමනාකරණය හොඳින් කර ගෙන යනවා. ඇත්ත වශයෙන්ම බලපත්‍රලාභී වාණිජ බැංකු 22ක් තිබෙනවා. අයිසිඅයිසිඅයි බෑන්ක් ලිමිටඩ්, ඉන්දියන් ඕවර්සීස් බැංකුව, ඉන්දියන් බැංකුව, එම්සීබී බෑන්ක් ලිමිටඩ්, කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී, ඩීඑෆ්සීසී වර්ධන බෑන්ක් ලිමිටඩ්, ඩොයිෂ් බැංකුව ඒජී, ද

[ගරු ෆිලික්ස් පෙරේරා මහතා]

හොංකොං ඇන්ඩ් ෂැංහයි බෑන්කින් කෝපරේෂන් ලිමිටඩ්. බලන්න, රටවල්වල නම්නුත් තිබෙනවා. ඊළඟට නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පීඑල්සී, නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පීඑල්සී, පබ්ලික් බෑන්ක් බර්හාඩ්, පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් පීඑල්සී, මහජන බංකුව, යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු ලිමිටඩ්, ලංකා බැංකුව, සම්පත් බෑන්ක් පීඑල්සී, ස්ටෑන්ඩර්ඩ් චාර්ටර්ඩ් බැංකුව, ස්ටේට් බෑන්ක් ඔෆ් ඉන්දියා, සිටිබෑන්ක් එන්ඒ, සෙලාන් බෑන්ක් පීඑල්සී, හබීබ් බෑන්ක් ලිමිටඩ්, හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී. සමහර බැංකු පොලී ගන්නේ නැහැ. ලාභ ප්‍රතිශතය ගන්න බැංකුත් තිබෙනවා.

ඊළඟට, බලපත්‍රලාභී බැංකුත් තිබෙනවා. ඌව සංවර්ධන බැංකුව, කඳුරට සංවර්ධන බැංකුව, වයඹ සංවර්ධන බැංකුව, රුහුණු සංවර්ධන බැංකුව ඔය විධියට ගම්වල, ප්‍රදේශවල නම් දාලා ඇති කළ මූල්‍ය ආයතනත් තිබෙනවා. ඒවා පිළිගත්ත ඒවා. බලපත්‍රලාභී විශේෂිත බැංකු. ඒ වාගේම ලියා පදිංචි කළ මූල්‍ය සමාගම් 34ක් තිබෙනවා. මේවා නම් වැඩියි. මේවාත් ඒකාබද්ධ කරන්න ඕනෑ. 34ක් තිබෙනවා. පොඩි ගණනක් නොවෙයි. මේ 34 ඒකාබද්ධ කරන්න, ගරු ඇමතිතුමනි. අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පය අනුව ආර්ථිකය ශක්තිමත් කරන්න, මූල්‍ය ක්‍රමය ශක්තිමත් කරන්න මේවා කරන්න වෙනවා. එහෙම නැතිව පුංචි පුංචි කෑලි කඩලා හරි යන්නේ නැහැ.

ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා කිව්වා, විවාහයක් වුණාම දරුවකු පිළිසිඳ ගන්නවා කියලා. ඒක ඇත්ත. මේවා බන්දලා දෙන්න ඕනෑ. මේවා බන්දලා දෙන්න. අපේ ගරු අමුණුගම ඇමතිතුමා විවාහ රෙජිස්ට්‍රාර් කෙනකු වාගේ කටයුතු කරලා මේවා එකතු කරන්න. එතකොට තමයි මේ වැඩේ හරි යන්නේ. දැන් බලන්න, මේ තිබෙන ඒවායේ නම් කියා ගන්නත් බැහැ. ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් ලිමිටඩ්, සිංහපුත්‍ර ෆිනෑන්ස් ලිමිටඩ්, සෙලින්කෝ ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් රියල්ටි ලිමිටඩ්, සෙලාන් මර්චන්ට් ලීසිං පීඑල්සී, සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී, සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් ලිමිටඩ්, සෙංකඩගල ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්, සිංගර් ෆිනෑන්ස් (ලංකා) ලිමිටඩ්, සිල්වරින් ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්, සෙලින්කෝ ඩිවලොප්මන්ට් බෑන්ක් ලිමිටඩ්, වැලිබල් ෆිනෑන්ස් ලිමිටඩ්, ලංකා ඔරික්ස් ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්, මර්චන්ට් ක්‍රෙඩිට් ඔෆ් ශ්‍රී ලංකා ලිමිටඩ්, මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්, බිම්පුත් ලංකා ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ්, බාර්ට්ලීට් ෆිනෑන්ස් ලිමිටඩ් වාගේ බර ගණනක් තිබෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි, ගරු අමතිතුමනි, දැන් අවසන් කරන්න.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තත්පරයක් දෙන්න මා අවසන් කරන්නම්. ඒ නිසා මේවා අපි කරන්න ඕනෑ. සමුපකාර සමිතිවලටත් දැන් මුදල් එකතු කරන්න පුළුවන්. සණසත් බැංකුවක් බවට පත්වෙලා තිබෙනවා. ඉතින් මේ පුංචි පුංචි දේවල් එකතු කර ගන්න පුළුවන් නම් ඒවාට ශක්තියකුත් එනවා. අනෙක, අපේ බැංකු ටික හොඳට ශක්තිමත් කියලා ලෝකයේ පිළිගන්න තත්ත්වයක් ඇති වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෙලාව තව පොඩ්ඩක් දෙන්න අමාරුයි නේද? කමක් නැහැ, ඔබතුමාට ගරු කරලා මා කථාව නතර කරන්නම්.

අවසාන වශයෙන් මා තව කාරණයක් කියන්න ඕනෑ, අනේ! අර කොටි බැංකුවෙන් ගත්ත රත්තරන් ටික දැන් ආපසු දෙනවා. දැන් කොටිත් නැහැ. කොටි බැංකුත් නැහැ. කොටි බැංකු තිබෙන කාලයේ කොටි බලෙනුයි සල්ලි ටික ගත්තේ. ඒවාත් දැන් මිනිස්සුන්ට දෙනවා. පසු ගිය මාසයේ අතිගරු ජනාධිපතිතුමා ගිහිල්ලා යාල් දේවි දුම්රිය ධාවනයත් ආරම්භ කරලා ඒ කටයුතු කළා. මමත් ඒ රැස්වීමට ගියා. දහස් ගණනක් සෙනඟ පැමිණ සිටියා. විසිහතරදහසක් පමණ සිටියා. ඔබතුමන්ලාත් ගියා නේ. ඉතින් රත්තරං බඩු ටික බෙදලා දුන්නාම ඒ අයට මැණිකක් හම්බ වුණා වාගෙයි. මොකද, හේතුව? ඒ අය මේක කවදාකවත් බලාපොරොත්තු වුණේ නැහැ. මේ රත්තරං බඩු උගස් තියා ගත්තේ මොකටද? විකුණලා කොටින්ට ආයුධ ගන්නයි. එදා ඒවා ගැන කාගෙන්ද අහන්නේ? කෝ, නීතියක් තිබුණාද? පොලිස්පති කෙනකුත් හිටියා නේ. නීතියක් තිබුණේ නැහැ. අධිකරණයත් ඒ ගොල්ලන්ගේ. රටේ තුනෙන් එකක් එහෙමයි තිබුණේ.

ඉතින් එහෙම නම් අද ඩීඑෆ්සීසී බැංකුව ඉවත් කරලා මූල්‍ය කළමනාකරණය ශක්තිමත් කරන්න වැඩ කටයුතු කිරීම ගැන අපිත් නිවාඩ් කබ්‍රාල් මැතිතුමා ඇතුළු සියලු දෙනාට ස්තුතිවන්ත වෙනවා. මේ දත්ත බලපුවාම එක්සත් ජාතික පක්ෂයේ තර්ක බොඳ වෙලා යනවා; වියැකිලා යනවා. අපට තව කරුණු කියන්න පුළුවන්. වෙලාව නැති නිසා කියන්න විධියක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[6.02 p.m.]

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Bismillahir Rahmanir Raheem.

Sir, this is yet another feather in the cap of our dear Minister, the Hon. (Dr.) Sarath Amunugama. ඩීඑෆ්සීසී බැංකුව (ඉවත් කිරීමේ හා ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත තමයි අපි දැන් සාකච්ඡා කරන්නේ. අද ශක්ති සම්පන්න ආර්ථිකයක් ගොඩ නැඟීමේ වාතාවරණයක් මේ රටේ බැංකු ක්ෂේත්‍රය මඟින් ඇති කර දී තිබෙන බව අපි ඉතාමත්ම සතුටින් හා ආඩම්බරයෙන් ප්‍රකාශ කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ දන්නවා, ඉස්සර කාලයේ බැංකු කඩපු හැටි; විනාශ කරපු හැටි; පුච්චපු හැටි. ඒ බැංකු ක්ෂේත්‍රය මුළුමනින්ම විනාශ කළ ජේවීපී එක තමයි අද බැංකු ගැන කථා කරන්නේ; බැංකුවලට සිදු වන අලාභහානි ගැන කථා කරන්නේ. ඒ අලාභහානි සියල්ලක්ම එතුමන්ලා කරලා අවසානයි. ඔක්කෝම කාලා ඉවර කරලා තමයි දැන් බැංකු ගැන කථා කරන්නේ.

එදා ජේවීපී එක ආරම්භයේදී මැතිවරණයෙන් ලැබූ ප්‍රතිශතය කීයද? මුළු ලංකාවෙන්ම 3.5යි. ඌව මැතිවරණය ගැන සලකන කොට ලැබුවේත් 3.5යි. අනේ! අපි ප්‍රාර්ථනා කරනවා, අනික් ගමනේදී ප්‍රතිශතය සියයට 4ක් ලැබේවා කියා. මේ රට විනාශ කළ, නාස්ති කළ අය තමයි අද එහෙම කථා කරන්නේ. එදා බැංකු පමණක් නොවෙයි, පාඨශාලා, රෝහල් මේ ආදී දේවල් සියල්ලම විනාශ කළා. එහෙම කරපු අය අද විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න කියලා පන්දම් අල්ලනවා. ඒ ගොල්ලන්ගේ ඉතිහාසය අමතක වෙලායි තිබෙන්නේ. වතුකරයේ factories ඔක්කෝම ගිනි තිබ්බා. අනුර දිසානායක ජේවීපී එකේ නව නායකතුමා පුරුද්දක් කරගෙන ඉන්නවා, හැම දාම මේ ගරු සභාව

ආරම්භයේදී ස්ථාවර නියෝග 23(2) යටතේ මොකක් හරි ප්‍රකාශයක් කරන්න. Television එකට, පත්තරයට දා ගන්න ඒ ප්‍රකාශය කරලා මෙතැනින් අතුරුදහන් වෙනවා. ජේවීපී එකේ එක මන්ත්‍රීවරයෙක්වත් දැන් මේ ගරු සභාවේ නැහැ. ඒක නිසා මේ නාඩගම මේ රටේ ජනතාව කවදාවත් පිළිගන්නේ නැති බව මම අවධාරණය කරනවා.

Sir, the CEO of the DFCC Bank, Arjun Fernando, has gone on record saying that the decision to go public with this issue is to provide retail and institutional investors with an alternative investment opportunity to earn a fixed rate of interest at their chosen frequency of payment. The Minister, Hon. (Dr.) Sarath Amunugama very clearly stated the objectives of the Bill, which he presented. The online edition of "The Sunday Observer" newspaper dated 27th July, 2014 states, I quote:

> "'The funds raised from this Issue will be used for medium to long term lending activities of the Bank, whilst mitigating DFCC's interest rate risk by reducing maturity mismatches. It will supplement the diversification of the borrowing base and further strengthen the SME loan portfolio to offer fixed rates of interest.'"

මේක තමයි ආර්ථිකයේ නැග්ම. මේක තමයි අපි දැන් ගහන මැව් එක. මම එදාත් මේ ගරු සභාවේදී ඒක කිව්වා. අපි දැන් ගහන්නේ විස්සයි20 මැව් එකක්. 2020 දී අපි මේ රට සමෘද්ධිමත් රටක් කිරීමේ ඒ ව්‍යායාමය සම්පූර්ණ කරනවා. මහින්ද චින්තනය අනුව අපේ ප්‍රගතිය නවත්වන්න කාටවත් බැහැ. පිට රට ගිහිල්ලා European Union එක අල්ලා ගෙන කේලාම් කියලා මේ රටට ද්‍රෝහිකම් කරන අයව දැන් ජනතාව හොඳට අවබෝධ කරගෙන සිටිනවා.

මම ඊයේ ඉතිහාසය ගැන කිව්වා. තමුන්නාන්සේ දන්නවා, දොන් ජුවන් ධර්මපාලලා මේ රටේ හිටපු බව. කළු අකුරුවලින් තමයි ඒ ගොල්ලන්ගේ නම් ඉතිහාසයේ ලියවිලා තිබෙන්නේ. අත්සන් තබලා කෝට්ටේ රාජධානිය පාවා දුන්නා. තමුන්නාන්සේ මූලාසනය අරගෙන සිටින, පුද බිමයි කියලා කියන්නට පුළුවන් භූමිය ඍතුගීසින්ට පාවා දුන්නු එවැනි දොන් ජුවන් රාලලා අපට වුවමනා කරන්නේ නැහැ. මේ රටේ ජනතාව ඔවුන්ව පිළිගන්නේ නැහැ.

මේක විහිළුවක් නොවෙයි. ඉතාමත් අමාරුවෙන් තමයි මේ රට ගොඩ නැඟුවේ; මේ රට බේරා ගත්තේ. මම ඊයේ කිව්වා වාගේ අද ජාත්‍යන්තරව ගෙන යන කුමන්ත්‍රණය ගැන බලන කොට මේ රට බේරා ගන්න, මේ රටේ ජනතාව බේරා ගන්න, ස්වෛරීත්වය ආරක්ෂා කරන්න, ප්‍රභාකරන්ට විරුද්ධව සටන් කළාට වඩා දක්ෂ හට හමුදාවක් වුවමනා කරනවා. අන්න ඒ දක්ෂ හට හමුදාව මේ රටේ ඉන්නා බව මම සාක්ෂාත් කරනවා. ඒ දක්ෂ හමුදාව මේ රටේ පොදු මහ ජනතාවයි කියන එක මම කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අදත් මොවුන් මොකක්ද කරන්නේ? රතු කොටියයි, කොළ කොටියයි ඔක්කෝම එකතු වෙලා පොදු අපේක්ෂකයෙක් හොයනවා. තවම හොයා ගන්න බැහැ. හැම දාම මේ පොදු අපේක්ෂකයා පැටවු ගහනවා. මේ පැටවු ටික ඔක්කෝම එකතු කරලා එක තැනකට ගෙනාවොත් මැතිවරණ කොට්ඨාසයක් ඇති වනවා. අන්න ඒකේ ඡන්දය ඕනෑ නම් ලබා ගන්න කියලා මම ඔවුන්ට කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි යන ගමන ඉතාමත් සාර්ථකයි. බැංකු ක්ෂේත්‍රයෙන් අපේ නැග්ම බලන්න. "ඉසුරුමත් නිවහනක් අසිරිමත් මව් බිමක්" යන තේමාව යටතේ මව් බිමේ මහ සරසමින් දිවි නැඟුම හයවන පියවර ඊයේ ඇරඹුණා.

ගරු ආර්ථික සංවර්ධන අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහත්මයා ඊයේ මේ ගැන ප්‍රකාශයක් කර තිබෙනවා. මේවා කියන්න ඕනෑ; රටට පෙන්වන්න ඕනෑ. මේ ගරු සභාව තුළින් මේ කාරණා ප්‍රචාරය කරන්නට ඕනෑ. This must be told to the diaspora; this must be told to the European Union; this must be told to the ඇමෙරිකන් අධිරාජ්‍යවාදීන්.

2014 ඔක්තෝබර් මස 21 වැනි අහඹරුවාදා 'දිනමිණ' පත්තරයේ කොටසක් මම මේ අවස්ථාවේදී උපුටා දක්වන්නම්. එහි මෙසේ පළ වෙනවා:

> "ලක්ෂ 20කට ආසන්න පිරිසක් එක් වූ 'දිවි නැඟුම' ජාතික වැඩසටහන රට පුරා"

බැංකු ක්ෂේත්‍රය ශක්තිමත් නිසා නේද, මහින්ද චින්තනය අනුව මේ ආර්ථික ප්‍රගතිය, සංවර්ධනය මේ රටට කරන්නට පුළුවන් වුණේ. උතුරත් දැන් මේ වැඩසටහනට සම්බන්ධ වෙලා තිබෙනවා. දකුණට දෙන දිවි නැඟුමේ ප්‍රතිඵලකාර සියල්ලක්ම උතුරටත් දෙනවා. ඒ ජනතාව ඉතා සන්තෝෂයෙන් ඉන්නේ. ඒක මම ඊයේ පැහැදිලි කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ සුමන්තිරන් මහතාගේ කථාවෙන් පසුව මට බොහෝ calls ආවා. They said that they were very unhappy and waiting till he goes there because he pulled out some piece of legislation from somewhere and argued in this House against the aspirations and benefits derived by the people of North, such as granting of land permits to the 20,000 people of the North as elaborated by our Minister, the Hon. Felix Perera. It is wrong කියලා එතුමා කිව්වා. අනේ! මෙව්වර කල් ප්‍රජාතන්ත්‍රවාදය අනුව, நாங்கள் ஒரு மாகாண சபையைக் கொடுத்தோம். அதன் முதலமைச்சராக முன்னாள் உயர் நீதிமன்ற நீதியரசர் விக்கினேஸ்வரன் அவர்கள் இருக்கின்றார். யாழ்ப்பாணத்து மக்கள் என்னுடன் தொலைபேசியில் தொடர்புகொண்டு நியாயபூர்வமாகக் கேட்கின்றார்கள். அதாவது, ஒரு வருடத்துக்கு மேலாக அந்த மாகாண சபையை நடத்துகின் றார்கள். ஆனால், இன்றுவரையிலே ஒரு துண்டுக் காணி யாவது - අපට ගල් කැටයක් දුන්නේ නැහැ. රටේ නායකතුමා අපට සලකලා මේවා දෙනවා. හොරා ගත්ත රත්තරන් පවා දුන්නා. යාපනයේ ජනතාව "தங்கத்தின் தங்கமே வருக!" කියලා දෙමළෙන් කියමින් දැන් ඔසවලායි එතුමාව පිළිගත්තේ.

මේ රජය පරද්දන්න G20 කියලා එකක් සිරිකොතෙන් හදලා තිබෙනවා. වෙන දෙයක් කරන්නට බැහැ. ගමේ මිනිස්සු කියන්නේ ගෙම්බෝ 20ක් කියලා. නමුත් ඒ ගෙම්බෝ විස්සෙන් මේ ගොල්ලෝ නැහැ නේ. කවුද, නැත්තේ? ලස්සනට ඒ ඔළු ගෙඩි ටික තියන photograph එකක් ඊයේ "Daily Mirror" පත්තරයේ දාලා තිබුණා. අපේ කෑ ගහන Hon. (Dr.) Harsha De Silva ඒකේ නැහැ. එතුමාට වෙන දේ එතුමාම දන්නේ නැහැ. අනේ! Hon. Chandrani Bandara Jayasinghe. එතුමිය අපි ඉතා ගෞරව කරන කෙනෙක්. චන්ද්‍ර බණ්ඩාර මැතිතුමාගේ ආදරණීය දෝනියන්දෑ. මම අනුරාධපුරයේ යනකොට ඇය පොඩි කාලයේ මම වඩාගෙන තිබෙනවා. මේ ගෙම්බෝ 20 කණ්ඩායමට එතුමියත් නැහැ. එතුමියටත් මේකේ තැනක් නැහැ. අපෝ! යන්න එපා, ගෙම්බෝ 20ට ඔබතුමිය යන්න එපා. විජයකලා මහේෂ්වරන් මන්ත්‍රීතුමිය, උතුරෙන් ආපු එකම එක කාන්තාවට මේ G20 එකේ ඉඩක් නැහැ. Hon. Anoma Gamage, අනේ! පුරුෂයා කොයි තරම් සල්ලි වියදම් කරනවාද, සිරිකොත වෙනුවෙන්. එතුමියටත් ඉඩක් නැහැ. සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා කෑ ගැහුවා, කෑ ගැහුවා. දැන් එන්නෙත් නැහැ. කොහේ අතුරුදහන් වෙලාද මම දන්නේ

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

නැහැ. අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමා ගිය පාරේ ගියාද දන්නෙත් නැහැ. අපි ඉතා සන්තෝෂ වෙනවා, ගරු අකිල විරාජ් මන්ත්‍රීතුමා රීයේ හොඳ කාන්තාවක් සමඟ විවාහ වුණා. නමුත් සිරිකොත මාර්ගයෙන් කියනවා, රීට පස්සේ නායකතුමා කලකිරිලාද දන්නේ නැහැ, රටත් දාලා ගිහින්; කවදාද එන්නේ දන්නේ නැහැ කියලා. මේක කරන්න එපා. මේ රටේ මිනිස්සු මේ රට ආරක්ෂා කරනවා. මේ අප ඉපදුණු භූමිය. අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා, accident එකක් වෙලා මහ රෝහලේ හිටියා. මහ රෝහලේ ඉන්දැද්දී මමත් ගිහින් බැලුවා. පවු! එතුමා පාර්ලිමේන්තුවට අලුතෙන් ආපු කෙනෙක්. එතුමාත් මේ G20 එකේ නැහැ. මගේ අම්මේ! තව නමක් නැහැ නේ. මම එතුමාවත් photographsවල දැක්කේ නැහැ නේ. ඒ තමයි තිස්ස අත්තනායක මන්ත්‍රීතුමාව. එතුමාවත් කපලාද? කැපිලාද? ඒ වාගේමයි, අබ්දුල් හලීම් මැතිතුමා. එතුමාත් නැහැ. ඉම්තියාස් බාකීර් මාකාර් මහත්තයාත් දැන් මේ කටයුතුවලට අරන් තිබෙනවා. එතුමා ගිහින් තිබෙන්නේ හොඳ චේතනාවක් අනුව. සජිත් ප්‍රේමදාස මහත්තයා යූඑන්පී එකේ Deputy Leader වුණාම එතුමාත් අරන් තිබෙනවා. එතුමා දක්ෂ කෙනෙක්. මුළු ලංකාවේම ඇවිදලා හොඳ කථිකත්වයක් ප්‍රදර්ශනය කරලා තිබෙනවා. ඒ ගොල්ලන් වුවමනා කරන අය. ඒ අයට ඡන්ද ලබා ගන්න පුළුවන්. නමුත් අපි ඒකට හොඳ මන්තරයක්, බෙහෙතක් යොදවනවා. ඒ ගැන භය වෙන්න වුවමනාවක් නැහැ. එතුමාත් මේ කණ්ඩායමට නැහැ.

එතකොට මේ විස්සේ ඉන්නේ කවුද කියලා ජනතාව අහනවා. මේ විස්සේ ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමායි, රවි කරුණානායක මන්ත්‍රීතුමායි ඉන්නවා. රවි කරුණානායක මන්ත්‍රීතුමා සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාට කපනවා. සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා රවි කරුණානායක මන්ත්‍රීතුමාට කපනවා. දැන් සිරිකොතේ -ඒ ප්‍රාන්තයේ- කවුරු කාට කපනවාද කියලා දන්නේ නැහැ. ඒ නිසා අපි කියනවා, නායකතුමනි, බලන්න අපේ උතුරේ -

"මුල්ලෛත්තීවු මාවට්ටත්තිල් සේතමුට්ට කට්ටිඩංකල්, කුළංකල් පල කෝටි රූපාවිල් පුනරමෛප්පු"

එන්න තලෛප්පිල් මිග අරුමෙයාන ඔරු කට්ටුරෙ 'තිනකරන්' පත්තිරිකෙයිලේ වෙළිවන්දිරුක්කින්රදු. වාසිත්තුප් පාරුංකළ්! මුන්නාළ් පාරාළුමන්ර උරුප්පිනර් මාණ්පුමිකු එස්. කනකරත්තිනම් අවර්කළ් චොල්කින්රාර්, "මුල්ලෛත්තීවු මාවට්ටත්තිල් මුන්නෙඩුක්කප්පඩුම් අපිවිරුත්ති නඩවඩික්කෙ කළුක්කු මුල්ලෛත්තීවු මාවට්ට අරස අතිපර් මට්රුම් කරෙතුරෙප්පට්රු, ඔට්ටුසුට්ටාන්, මාන්තෛ කිළක්කු, තුණුක්කාය්, වෙලිඉයා, පුතුක්කුඩියිරුප්පු ආකිය ඉන්දු පිරදේසංකළුක්කාන පිරදේස චෙයලාළර්කළුම් ඉරාණුවම් උළ්ළිට්ට පොලිසාරුම් එමක්කු මනප්පූර්වමාන ඔත්තුළෛප්පෛත් තරුකින්රාර්කළ්" එන්රු. අදේනේරත්තිලේ, "එංකළුක්කු එන්තවිතමාන උදවියුම් මාකාණ සපෛමූලම් කිටෛප්පදිල්ලෛ; අවර්කළ් තමිළ් මක්කළෛ ඒමාට්රි ක්කොණ්ඩිරුක්කින්රාර්කළ්; අන්රු නාන් පුලිකළෝටු චේර්න්තිරුන්තේන්... I was under the influence of the Tigers" says the former Member of Parliament, Mr. S. Kanagaratnam, in this article. මේලුම්, "පුලිකළින් කට්ටායත්තින්පේරිල් අරසුක්කෙතිරාක ඌටකංකළිල් කුරල්කොටුක්ක නේර්න්තදු" එන්රුම් කුරිප්පිටුකිරාර්. අදෛත්තාන් ඉන්රුම් අවර්කළ් diaspora උටන් චේර්න්තු චෙය්කින්රාර්කළ්.

තමිළ්ත් තේසියක් කූට්ටමෛප්පුක්කු diaspora ඉටමිරුන්තු කෝටික්කණක්කාන පණම් කිටෛක්කින්රදු එන්පදු එංකළුක්කුත් තෙරියුම්. අතනෛ වෛත්තු වටපකුති මක්කළුටෛය කුරල්වළෛයෛ නසුක්කි අවර්කළ් අරසියල් වියාපාරම් චෙය්කින්රාර්කළ්. වෙට්කක්කේටාන විටයම්! මුප්පදු ආණ්ටුකාලමාක නීංකළ් චෙය්ත අනියායත්තින් කාරණමාක වටක්කිලේ වාලිපර්කළ් තම්මුටෛය ඉන්නුයිරෛ නීත්තාර්කළ්. ඉරත්ත වෙළ්ළක්කාටාකත් තිකළ්න්තදු යාළ්ප්පාණක් කුටා. තොටර්න්තුම් අතෛයේ චෙය්යප්පෝකින්රීර්කළා? එන්රු නාන් ඉවර්කළෛප් පාර්ත්තුක් කේට්ක විරුම්පුකින්රේන්. කනකරත්තිනම් පෝන්රවර්කළ් අතර්කු ඉටමළික්ක මාට්ටාර්කළ්. ඉනිමේලුම් තන්නෛ ඒමාට්ර මුටියාතෙන්රු මුන්නාළ් පාරාළුමන්ර උරුප්පිනර් අවර්කළ් චොල්කින්රාර්.

දැන් අපත් එක්ක සම්බන්ධ වෙලා එක්සත් ජාතික පක්ෂය- [බාධා කිරීමක්] මම අවසන් කරන්නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි ඉතිරිව තිබෙන්නේ.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

I will wind up within two minutes. I will heed to your request. දැන් බලන්න, එක්සත් ජාතික පක්ෂය. එදා මේ කෝට්ටේ ජයවර්ධන පුවරවය ගැන තොටගමුවේ ශ්‍රී රාහුල හිමි සැළලිහිණි සන්දේශය නිබන්ධනය කළා. අද අලුත් රාහුල හිමිවරු සියයක් වුවමනා කරනවා, මේ රටේ ඇති වී තිබෙන්නා වූ මනරම් දර්ශනය වර්ණනා කරමින් නව කාව්‍යය සන්දේශ නිබන්ධනය කරන්නට. මොන තරම් ආකර්ෂණීය ද? පිට රට ජනතාව අපේ රටට දැන් ඇදී ගෙන එනවා. මොන තරම් මනරම් විධියට කොළඹ, Viharamahadevi Park එක සහ දියවන්නා කලාපය නිර්මාණය කර තිබෙනවාද? රීයේ ලන්ඩන්වල ඉඳන් අප්සරා කදනආරච්චි කියන මම දන්න ළමයෙක් ආවා. ඒ ළමයා කොළඹ නගරය බැලුවාට පසුව මෙහෙම කිව්වා;

"My mom and dad were in London for the last 40 years. I like to come here uncle. The beauty of Sri Lanka captured my heart".

එහෙමයි ඇය කිව්වේ.

By the way, Sir, Lakshman Kandanaarachchi is one of the best known trade union leaders at the State Engineering Corporation who worked with my cousin from Maharagama, Dr. M. Haris Deen. They were top officials of the Ceylon Mercantile Union of Mr. Bala Thampoe, who passed away recently.

මෙන්න අපට කොළඹ නගරයෙන් ලැබෙන ආධාරය බලන්න. 2014 ඔක්තෝබර් 20 දින "දිනමිණ" පුවත් පතේ "වරකාගේ පැදුරු සාජ්ජය" කියන කාටුන් එකේ මෙසේ විචිත්‍ර ලෙස සඳහන් වෙනවා:

"එක බැම්මෙන් එකට බැඳෙනවා...
එක පොකුරට
එකට ඉන්නවා..."

ඒකෙන් මොකක්ද කියන්නේ, කවුද මේ සින්දුව කියන්නේ? අපේ ඒ.ජේ.එම්. මුසම්මිල් නගරාධිපතිතුමා. ඒකට අපේ ගරු

නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා මෙසේ පිළිතුරු දෙනවා. තවදුරටත් එම පුවත් පතේ මෙහෙම සඳහන් වෙනවා:

"...ඔහු විතරයි අපට සිටින්නේ...

අපි මිය යනතුරු ළඟම සිටින්නේ..."

ඔන්න කොළඹින් එක්සත් ජාතික පක්ෂයට ලැබුණු විශාලම ගුණ්ඩුව කියලා ප්‍රකාශ කරමින්, රට සශ්‍රීකවත් වේවා කියන ප්‍රාර්ථනය එක් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.

වීනා විධුක්කප්පට්ටු, ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.

අතන්පඩි, සට්ටමූලම් මූරණ්ටාම් මුරෙයාග මතිප්පිටප්පට්ටදු.

Question put, and agreed to.

Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:

''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය.'' -[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

තීර්මානිక్కప్పట్టదు.

"සට්ටමූලම් මුළුప్ පారాళుమన్రక్ కుళువుక్కుచ్ చාట్టప్పడుమాగ" [මාණ්පුමිකු නිමල් සිරිපාල ද සිල්වා]

Resolved:

That the Bill be referred to a Committee of the whole Parliament."- [The Hon. Nimal Siripala de Silva]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.

[මූලාසනාරූඪ මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]

කුළුවිల් ఆరాయప్పట్టదు.

[තలෙමෛ තాంగుම් ఉరుప్పినర్ අවර්කළ් තలෙමෛ වකිත්තාර්කළ්.]

Considered in Committee.

[MR. PRESIDING MEMBER in the Chair.]

1 වන වගන්තිය.- (ලුහුඬු නාමය)

வாசகம் 1.- (சுருக்கப் பெயர்.)

CLAUSE 1.- (*Short title*)

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා;

"1 වන පිටුවේ, 3 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'1. මේ පනත 2014 අංක දරන ඩීඑෆ්සීසී බැංකුව (ඉවත් ";

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

1 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 1, as amended, ordered to stand part of the Bill.

2 සිට 4 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

2ஆம் வாசகம் தொடக்கம் 4ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 2 to 4 ordered to stand part of the Bill.

5 වන වගන්තිය.- (අන්තර්කාලීන විධිවිධාන.)

வாசகம் 5.- (நிலைபெயர் கால ஏற்பாடுகள்.)

CLAUSE 5.- (*Transitional provisions.*)

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා;

(1) "2 වන පිටුවේ, 11 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(අ) නිශ්චිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඩීඑෆ්සීසී බැංකුවේ කොටස් ප්‍රාග්ධනය සහ කොටස් අධි' ";

(2) "2 වන පිටුවේ, 15 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(ආ) නිශ්චිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඩීඑෆ්සීසී බැංකුවේ ' ";

(3) "4 වන පිටුවේ, 14 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ගිණුමට අදාළව දෙන ලදුව නිශ්චිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවතියා' ";

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendments put, and agreed to.

5 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

5ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 5, as amended, ordered to stand part of the Bill.

6 වන වගන්තිය.- ((165 වන අධිකාරය වූ) ඩීඑෆ්සීසී බැංකුව පනතේ 10 වන වගන්තිය සහ 14 වන වගන්තිය සීමිතව අදාළ වන බව)

வாசகம் 6.- (165ஆம் அத்தியாயமான) இ.அ.நி.கூ. வங்கிச் சட்டத்தின் 10ஆம் மற்றும் 14ஆம் பிரிவுகளின் வரையறுக்கப்பட்ட ஏற்புடைமை.)

CLAUSE 6. - (*Limited applicability of section 10 and 14 of the DFCC Bank Act (Chapter 165)*)

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා;

"8වන පිටුවේ, 10 වන පේළිය සහ 11 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'යුතුය. ඉහත දැක්වුණු පරිදි නිශ්චිත දිනයට පෙරාතුව ඇප වන ලදුව නිශ්චිත දිනයට පෙරාතුව ම වූ දිනයේදී පැවතියා වූ සෑම ණය මුදලක්" ";

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

6 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

6ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

Clause 6, as amended, ordered to stand part of the Bill.

7 සහ 8 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

7ආම්, 8ආම් වාසකංකළ් චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

Clauses 7 and 8 ordered to stand part of the Bill.

9 වන වගන්තිය.- (බද්ධ කිරීම හා ඒකාබද්ධ කිරීම.)

වාසකම් 9.- (ஒன்றிணைவும், ஒன்று சேர்க்கையும்.)

CLAUSE 9. - (*Merger and amalgamation.*)

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්පුමිකු නිමල් සිරිපාල ත සිල්වා)
(The Hon. Nimal Siripala de Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා;

"9වන පිටුවේ, 18 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'මුදල් මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන බලපත්‍රය යටතේ බලපත්‍රලත් වාණිජ බැංකුවක් ලෙස' ";

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තම් විටුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටතු.

Amendment put, and agreed to.

9 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

9ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

Clause 9, as amended, ordered to stand part of the Bill.

10 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

10ආම් වාසකම් චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

Clause 10, ordered to stand part of the Bill.

11 වන වගන්තිය.- (අර්ථ නිරූපණය.)

වාසකම් 11.- (பொருள்கோடல்)

CLAUSE 11. - (*Interpretation.*)

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්පුමිකු නිමල් සිරිපාල ත සිල්වා)
(The Hon. Nimal Siripala de Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා;

"10 වන පිටුවේ, 24 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

"1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන්";

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තම් විටුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටතු.

Amendment put, and agreed to.

11 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

11ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

Clause 11, as amended, ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

පනත් කෙටුම්පත, සංශෝධන සහිතව, වාර්තා කරන ලදී.

චට්ටමාකු වාසකමුම් තලෛප්පුම් චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

චට්ටමූලම් තිරුත්තංකළුටන් අරික්කෛ චෙය්යප්පට්ටතු.

Enacting Clause and Title ordered to stand part of the Bill.

Bill reported with Amendments.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්පුමිකු නිමල් සිරිපාල ත සිල්වා)
(The Hon. Nimal Siripala de Silva)

මූලසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන්වැනි වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන් තුන් වන වර කියවා සම්මත කරන ලදී.

විනා විටුක්කප්පට්ටු, ඒත්‍රුක්කොළ්ළප්පට්ටතු.

අතන්පඩි, චට්ටමූලම් තිරුත්තප්පට්ටවාරු මූන්‍රාම්මුරෛයාක මතිප්පිටප්පට්ටු නිරෛවේර්‍රප්පට්ටතු.

Question put, and agreed to.

Bill, as amended, accordingly read the Third time, and passed.

2015 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවෙන් තෝරාගත් අමාත්‍යාංශවල වැය ශීර්ෂ පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා වන විශේෂ කාරක සභාව

2015ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்ட மதிப்பீடுகளிலிருந்து தெரிவுசெய்யப்பட்ட அமைச்சுக்களின் செலவுத் தலைப்புக்கள் பற்றிக் கலந்துரையாடுவதற்கான தெரிகுழு

SELECT COMMITTEE TO DISCUSS THE HEADS OF EXPENDITURE OF THE MINISTRIES SELECTED FROM THE BUDGET ESTIMATES OF THE YEAR 2015

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්පුමිකු නිමල් සිරිපාල ත සිල්වා)
(The Hon. Nimal Siripala de Silva)

මූලසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2015 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු පිළිබඳ කාරක සභා අවස්ථාවේ වැඩසටහන සඳහා වෙන්කොට ඇති කාලසීමාව දින 17 ක් වන හෙයින් ද,

අයවැය කාරක සභා අවස්ථාවේ වැඩ සටහන සඳහා දිනකට පැය 8ක් පමණ වෙන්කර ඇති අතර, එක් දිනකදී අමාත්‍යාංශ කිහිපයක වැය ශීර්ෂයන් පිළිබඳව සාකච්ඡා කිරීමට සිදුවී ඇති හෙයින්, ඒ අනුව එක් වැය ශීර්ෂයක් සඳහා වෙන් කරනු ලැබ ඇත්තේ ආසන්න වශයෙන් පැය 02ක පමණ කාල සීමාවක් වන හෙයින් ද, ඒ අනුව එක් එක් අමාත්‍යාංශය තුළ වැය ශීර්ෂයන් සාකච්ඡා කිරීම සඳහා වෙන්කර ඇති කාලය සීමාසහිත වන හෙයින්ද,

පාර්ලිමේන්තුවේ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයාගේ සහ විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයාගේ එකඟත්වය පරිදි පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ දී තීරණය කරන ලද මතු සඳහන් ඇමුණුමේ පරිදි අමාත්‍යාංශ 22 සහ විශේෂ කාර්යයන් පිළිබඳ ලේකම් කාර්යාලයේ වැය ශීර්ෂයන් පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපතිවරයා කථානායකවරයා විසින් නම් කරනු ලැබිය යුතුය.

(ආ) ස්ථාවර නියෝග අංක 95 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, මෙම කාරක සභාව ආණ්ඩු පාර්ශ්වයෙන් හා විරුද්ධ පාර්ශ්වයෙන් තෝරාගනු ලබන සාමාජිකයන් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතුය.

3. එකී කාරක සභාවට,-

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට; සහ

(ආ) පුද්ගලයන්, ලිපි ලේඛන හා වාර්තා ගෙන්වා ගැනීමට ද, පාර්ලිමේන්තුව හෝ සිය කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තෙකුට නියම කිරීමට ද; බලය තිබිය යුතුය.

4. එකී තෝරාගත් අමාත්‍යාංශවල වැය ශීර්ෂයන්හි කාරක සභා අවස්ථාව ආරම්භ කරන දින හෝ එදිනට පෙර කාරක සභාව සිය වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය.

ඇමුණුම:

1. විශේෂ කාර්යයන් පිළිබඳ ලේකම් කාර්යාලය
   (i) යහපාලනය හා යටිතල පහසුකම් අමාත්‍යතුමා
   (ii) මානව සම්පත් අමාත්‍යතුමා
   (iii) ග්‍රාමීය කටයුතු අමාත්‍යතුමා
   (iv) ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා
   (v) නාගරික කටයුතු අමාත්‍යතුමා
   (vi) සමාජ සුබසාධන අමාත්‍යතුමා
   (vii) පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමා
   (viii) ජාතික සම්පත් අමාත්‍යතුමා
   (ix) විද්‍යාත්මක කටයුතු අමාත්‍යතුමා
   (x) ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍යතුමා
2. බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය
3. තැපැල් සේවා අමාත්‍යාංශය
4. ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය
5. නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය
6. සමාජ සේවා අමාත්‍යාංශය
7. ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
8. රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය
9. පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශය
10. මහජන සම්බන්ධතා හා මහජන කටයුතු අමාත්‍යාංශය
11. රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
12. ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය
13. ජාතික උරුමයන් අමාත්‍යාංශය
14. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
15. තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය
16. සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය
17. පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය
18. විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය
19. සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය
20. වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය
21. සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය
22. උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය
23. විශේෂ ව්‍යාපෘති අමාත්‍යාංශය"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ලංකා පොස්ෆේට් ලිමිටඩ් ආයතනය තුළ සිදුවන අයථා ක්‍රියා
லங்கா பொஸ்பேற் லிமிரெட் நிறுவன முறைகேடுகள்
IRREGULAR ACTIVITIES IN LANKA PHOSPHATE LIMITED

[අ.භා. 6.21]

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

මූලසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"මහින්ද චින්තන සංකල්පය තුළ සඳහන් කර ඇති ආකාරයට රට ආහාර වලින් ස්වයංපෝෂිත කිරීම සඳහා අතිවිශාල මෙහෙයක් සිදු කිරීමට හැකියාව ඇති ලොව විටිනාම පොස්ෆේට් නිධි අතරින් එකක් වන හෙක්ටයාර් 324 ක් පුරා විහිදී ඇති එප්පාවල පොස්ෆේට් නිධිය සතු ලංකා පොස්ෆේට් ලිමිටඩ් ආයතනය තුළ මේ වන විට එම පාලන අධිකාරිය විසින් සිදු කරන විවිධ වංචා, දූෂණ, අයථා සේවක බඳවා ගැනීම් නිෂ්පාදන ක්‍රියාවලියට සිදු කරන නොයෙකුත් බාධා හේතුවෙන් රජයට හා ආයතනයට විශාල වශයෙන් පාඩු සිදුවී ඇත.

තේ, රබර් හා පොල් වැනි ස්ථිර බෝග වගාවේදී භාවිතා වන පොස්ෆේට් පොහොර දේශීය වශයෙන් උසස් ප්‍රමිතියෙන් නිෂ්පාදනය කිරීමට හැකියාව පවතින ලංකා පොස්ෆේට් ලිමිටඩ් ආයතනයෙහි සිදුවන ඉහත සඳහන් අයථා ක්‍රියා පරීක්ෂා කර බලා මෙම තත්ත්වය වළක්වා ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගන්නා මෙන් මෙම ගරු සභාවට යෝජනා කරමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන්ම මෙම පොස්ෆේට් නිධිය සම්බන්ධයෙන් කරුණු කීපයක් මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමා වෙත ඉදිරිපත් කරන්න කැමතියි. විශේෂයෙන්ම එප්පාවල පොස්ෆේට් නිධිය අවුරුදු ගණනාවක් තිස්සේ ලාභ ලබපු ආයතනයක්. ඒ වගේම මෙම ආයතනයේ විශාල ස්ථාවර තැන්පතුවක් තිබුණා. මේ ප්‍රදේශයේ රැකියා නොමැති තරුණ තරුණියන් ගණනාවකට රැකියා අවස්ථා ලබා දෙමින් ඒ ආයතනය කාලයක් තිස්සේ හොඳ විනයක්, භික්ෂීමක් ඇතිව පරිපාලන කටයුතු සාර්ථකව කර ගෙන ගියා. පරිපාලන කටයුතු සාර්ථකව කර ගන්න ඒ අදාළ වගකිව යුතු නිලධාරීන් ඒ ආයතනයේ රැඳී සිටියා. විශේෂයෙන්ම මේ ආයතනය භාරව කටයුතු කරන සාමාන්‍යාධිකාරීවරයා මේ ආයතනයේ රැඳී සිටියා. ඔහු වෙනුවෙන් මේ ආයතනයේ වෙනම නිල නිවාසයක් තිබුණා.

ඒ නිල නිවාසයට අවශ්‍ය නිලධාරීන් සියලුම දෙනා මේ ස්ථානයේ රැඳී සිටියා. එම නිසාම මේ ආයතනයේ පරිපාලන කටයුතු සාර්ථක කර ගන්නට එය හේතුවක් වුණා. නමුත් 2014 වර්ෂයෙන් පස්සේ මේ ආයතනයේ වග කිව යුතු නිලධාරීන් ආයතනයෙන් පිටයි ඉන්නේ. විශේෂයෙන් මේ ආයතනය භාරව ඉන්න සාමාන්‍යාධිකාරීවරයා මුළු මාසයක කාලසීමාවෙන් එක දවසක් එනැනට ගිහින් බලා එනවා. එහෙම නැත්නම් කොළඹ රැඳී ඉන්නවා. ඒ වාගේම මේ ආයතනයේ දෙවැනියා හැටියට කටයුතු

[ගරු පී. හැරිසන් මහතා]

කරන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයා මේ ආයතනයේ රැඳී ඉන්නේ නැහැ. ඒ විතරක් නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම ආයතනයේ මුදල් කළමනාකරු, සැපයුම් කළමනාකරු වාගේ වග කිව යුතු නිලධාරීන් සියලු දෙනාම ඉන්නේ කොළඹයි කියන එක මා තමුන්නාන්සේට මතක් කරන්නට කැමතියි. මෙම ආයතනයට යම් කිසි දෙයක් මිලදී ගැනීමට හදිසි අවශ්‍යතාවක් ඇති වුණොත් ඒ සියලු තොරතුරු කොළඹට ෆැක්ස් කරන්නට ඕනෑ. කොළඹ ඉන්න නිලධාරියා තමයි ඒ තීන්දුව එහාට යවන්නට ඕනෑ. මේ විධියට මේ කාර්යය කරන්නට ගියොත් කොතරම් මුදලක්, කාලයක්, ශ්‍රමයක් ඒ සඳහා වැය වෙනවා ද කියා මා තමුන්නාන්සේගෙන් අහන්නට කැමැතියි.

ගරු ඇමතිතුමනි, ඒ විතරක් නොවෙයි, අඩුම ගණනේ මේ ආයතනයෙන් වාහනයක් පිටතට ගන්න අනුමතිය ගන්න නම් කොළඹට ෆැක්ස් කරන්නට ඕනෑ; කොළඹ නිලධාරියාගෙන් අවසර ගන්නට ඕනෑ. එතකොට මේ ආයතනයෙන් හරිහමන් විධියට රාජකාරි කටයුත්තක් කරන්නට බැරිව යනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සියලු කාර්යයන් සඳහා කොළඹින් අවසර ගන්නා ක්‍රමයක් යටතේ ගියොත් මේ ආයතනයේ වැඩ කටයුතු ඉස්සරහට ගෙන යන්නේ කොහොමද කියන එක මා තමුන්නාන්සේගෙන් අහන්න කැමැතියි.

ඊළඟට, මේ ආයතනයේ ඉන්න සාමාන්‍යාධිකාරිවරයාගේ පත් කිරීම සම්බන්ධයෙන් මා තමුන්නාන්සේගෙන් අහන්නට කැමතියි. සාමාන්‍යාධිකාරිවරයාගේ පත් කිරීම සම්බන්ධයෙන් ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. මේ සාමාන්‍යාධිකාරිවරයාට අවශ්‍ය සුදුසුකම් නැහැ. මේක අප කියන කථාවක් නොවෙයි. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන අනුව බැලුවාම සුදුසුකම් නැති පුද්ගලයෙකු තමයි සමාන්‍යාධිකාරි තනතුරට පත් කර ගෙන තිබෙන්නේ. මා තමුන්නාන්සේට එය පෙන්වන්නම්.

ගරු ඇමතිතුමනි, මේ චක්‍රලේඛන අනුව සාමාන්‍යාධිකාරිවරයා පත් කිරීමේදී ඇති වෙලා තිබෙන තත්ත්වයත්, ඒ වාගේම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයා බඳවා ගැනීමේදී ඇති වෙලා තිබෙන දෝෂ සහගත තත්ත්වයත් මම තමුන්නාන්සේට පෙන්වන්නම්. සාමාන්‍යාධිකාරි තනතුරට අවශ්‍ය මූලික සුදුසුකම වන පශ්චාත් උපාධියවත් නැති කෙනෙකු තමයි සාමාන්‍යාධිකාරිවරයා වශයෙන් පත් කර ගෙන තිබෙන්නේ. සාමාන්‍යාධිකාරිවරයාට අනිවාර්යයෙන්ම පශ්චාත් උපාධියක් තිබෙන්න ඕනෑය කියලා අදාළ චක්‍රලේඛනයේම තිබෙනවා. බඳවා ගැනීමේ පටිපාටිය අනුව සාමාන්‍යාධිකාරිවරයා කොයි විධියේ කෙනෙකු විය යුතුද කියලා තමුන්නාන්සේලාගේ චක්‍රලේඛනයකම තිබෙනවා.

මේ ආයතනයට පත් කරලා තිබෙන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයාගේ තත්ත්වයත් ඒ විධියමයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආයතනයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයා වශයෙන් පත් කර ගෙන තිබෙන්නේ අවුරුදු 60 ඉක්ම වූ පුද්ගලයෙකු බව මම තමුන්නාන්සේට කියන්න කැමැතියි. අවුරුදු 60 ඉක්ම වූ පුද්ගලයෙකු පත් කර ගන්නවා නම්, මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව, එය කැබිනට් එකට දමා ඒ සඳහා කැබිනට් අනුමැතියක් ගන්න ඕනෑ. නමුත් මේ ආයතනයට පත් කර ගෙන තිබෙන්නේ එහෙම අනුමැතිය ලබා ගත් කෙනෙකු නොවෙයි. මම ඇමතිතුමාට මතක් කරන්න කැමැතියි, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයා හැටියට තමුන්නාන්සේලා පත් කර ගෙන ඉන්න පුද්ගලයා "හබරාදුව පීල්ලගේ දයා ගුණසිරි" බව. මේ පුද්ගලයාගේ හැඳුනුම්පතේ පිටපතක් මා සතුව තිබෙනවා. මා එය **සභාගත*** කරනවා.

මේ පුද්ගලයාගේ උපන් දිනය 1953.09.23වන දිනයි. 2013 වර්ෂය වන කොට මේ පුද්ගලයාගේ වයස අවුරුදු 60 ඉක්මවා ගිහිල්ලා. අවුරුදු 60 ඉක්ම වූ පුද්ගලයෙකු මේ ආයතනයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයා විධියට පත් කර ගන්නේ කොහොමද? විශ්‍රාම ගිය අයෙකු නැවත සේවයට බඳවා ගන්නවා නම්, රජයේ සේවකයන් බඳවා ගැනීමට අදාළ වන ආයතන සංග්‍රහයේ දෙවන පරිච්ඡේදයේ 9(1) වගන්තියට අනුව කැබිනට් මණ්ඩලයේ අනුමැතිය තිබෙන්න ඕනෑ. මේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයා පත් කර ගැනීමේදී එහෙම දෙයක් වෙලා නැහැ. ගරු ඇමතිතුමනි, මේ ආයතනයේ සිටින ප්‍රධාන නිලධාරීන් දෙදෙනා පත් කර ගැනීම සම්පූර්ණයෙන්ම අක්‍රමිකතා මත සිදු වූවක් කියලා මම තමුන්නාන්සේට මතක් කරන්න කැමැතියි. ඇමතිතුමාගේ පිළිතුරු කථාවේදී මේවාට හරිහමන් උත්තර ලැබෙයි කියලා මම බලාපොරොත්තු වනවා.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම ලංකා හොස්පේට් ලිමිටඩ් (රාජ්‍ය සමාගම) කියන ආයතනයේ කාර්යාල භූමිය අක්කර 5ක්, 6ක් වාගේ විශාල ප්‍රදේශයක් පුරා විහිදී පවතින බවත් තමුන්නාන්සේට මම කියන්න කැමැතියි. ඒ වාගේම හොස්පේට් නිධිය හෙක්ටෙයාර 50ක පමණ විශාල භූමි ප්‍රදේශයක් පුරා විහිදී පවතිනවා. හැබැයි, ඒ භූමි ප්‍රදේශය තිබෙද්දි පොල් පොහොර නිෂ්පාදනය කරන්න කියලා තමුන්නාන්සේලා වාරියපොළ ප්‍රදේශයේ කනත්තේවැව ශ්‍රී මීගුණාරාමයේ පන්සලට මේ ආයතනය ගෙන ගියා. ගරු ඇමතිතුමනි, හොස්පේට් මිශ්‍ර කරලා පොහොර හදලා ආයතන තුන, හතරක විකුණන්න මේ ආයතනයට පුළුවන් නම්, තමුන්නාන්සේලා මෙහෙම කළේ ඇයි? තමුන්නාන්සේලා මීගුණාරාමය පන්සලට අයත් ඒ ඉඩම බදු ගත්තේ කොපමණ මුදලකටද? ඒ ඉඩම මාසයකට රුපියල් 25,000 ගණනේ බද්දට අරගෙන තව රුපියල් මිලියන 2ක්, 3ක් වියදම් කරලා ලොකු ගොඩනැගිල්ලක් හදලා සේවකයෝ ගණනාවක් ඒ ස්ථානයට බඳවා ගෙන පොහොර මිශ්‍රණය කරනවා. හැබැයි, අඩුම ගණනේ පොහොර බෑග් 100ක්වත් වික්කාද කියලා තමුන්නාන්සේගෙන් මම අහන්න කැමැතියි. දැන් එතැන machines කැඩිලා. දැන් එතැන සිටි සේවකයන්ගෙන් භාගයක් ආපහු එවා තිබෙනවා. අනෙක් සේවකයන්ට පැය 150, 200 O/T දෙනවා. මේවා කරන්නේ කාගේ වුවමනාවටද? එපමණක් නොවෙයි. එතැන තිබෙන පන්සලේ හාමුදුරුවන්ට හදිසියකට වාහනයක් දුන්නාට අපේ විරුද්ධත්වයක් නැහැ. ගරු ඇමතිතුමනි, මම තමුන්නාන්සේට අංක ඇතුවම කියන්නම්. ඒ පන්සලේ ස්වාමීන් වහන්සේගෙන් මේ ඉඩම බදු අරගෙන තමුන්නාන්සේලා ඉඩමේ බද්ද වෙනම ගෙවනවා. ඒ වාගේම මේ ආයතනයේ JR 8680 දරන කැබ් රථය රියැදුරු කෙනෙක් එක්කම ඒ පන්සලේ ස්වාමීන් වහන්සේට දීලා තිබෙනවා. මේ දේවල්වලට වැය වන්නේ මේ ආයතනයේ සල්ලි. ගරු ඇමතිතුමනි, මෙලෙස අම්මාගේ අප්පාගේ බූදලය වාගේ මේ සල්ලි වියදම් කරන්නේ කාගේ වුවමනාවටද කියන එක මම තමුන්නාන්සේගෙන් අහන්න කැමැතියි. මොකද, විශාල පිරිසක් ලොකු කැප වීමක් කරලා, දායකත්වයක් දරා තමයි මේ හොස්පේට් නිධිය ආරක්ෂා කර ගෙන එහි නිෂ්පාදනයෙන් ලොකු මුදලක් ඉතිරි කර ගන්න මහන්සි වන්නේ. හැබැයි, ඒ මුදල කොයි විධියට ද අපතේ යවන්නේ?

ඒ වාගේම තමයි, ගරු ඇමතිතුමනි, ලංකා පොස්පේට් ලිමිටඩ් ආයතනයේ කොළඹ තිබෙන තමුන්නාන්සේගේ කාර්යාලයට එක මාසයකට රුපියල් ලක්ෂ 2ක් කුලිය ගෙවනවා. අලුත් සභාපතිතුමා පැමිණියාට පසුව මෙම කාර්යාලය අලුත්වැඩියා කරන්න තව රුපියල් ලක්ෂ 40ක් වියදම් කළා. ගරු ඇමතිතුමනි, මේ වාගේ කාර්යාලයක් අලුත්වැඩියා කරන්න රුපියල් ලක්ෂ 40ක්, 50ක් මේ ආයතනයේ සල්ලි වියදම් කරන්නේ මොකටද? එය අලුත්වැඩියා කර දිය යුත්තේ කාර්යාලය කුලියට දුන් ආයතනයෙන්. නැත්නම් ඒ කුලී අය කරන අය තමයි, මෙය අලුත්වැඩියා කර දෙන්න ඕනෑ. තමුන්නාන්සේගේ කාර්යාලය අලුත්වැඩියා කරන්න රුපියල් ලක්ෂ 40කට වැඩි මුදලක් වියදම් කර තිබෙනවා.

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

ගරු ඇමතිතුමනි, ඒ වාගේම මේ ආයතනයේ ස්ථාවර තැන්පතුව රුපියල් මිලියන 300කට වඩා තිබුණා. රුපියල් මිලියන 300කට වැඩිය තිබුණු ස්ථාවර තැන්පතුවෙන් අර ගෙන, මීටර් 850ක් දිග පාරක් හදන්න රුපියල් ලක්ෂ 650ක් වියදම් කළා. ගරු ඇමතිතුමනි, එතැන කාපට් පාරක් දමන්න ඕනෑ තැනක් නොවෙයි. කාර්යාලයේ ගේට්ටුව ළඟ ඉඳලා කාර්යාලයට යන්න, ඒ වාගේම ගබඩාවට යන්න, මැෂින් සවි කර තිබෙන තැන්වලට යන්න තිබෙන මීටර් 850 පාර හදන්න රුපියල් ලක්ෂ 650ක් වියදම් කර තිබෙනවා. පාරේ එක මීටරයක් හදන්න, රුපියල් ලක්ෂ 1½ කට කිට්ටු වෙන මුදලක් වියදම් කර තිබෙනවා. මේවා විගණනය කළේ කවුද? මේවාට ඇස්තමේන්තුව හැදුවේ කවුද? එක එක හිතවතුන්ට, ඒ අයගේ අවශ්‍යතාවන් ඉෂ්ට කරන්න මේ ආයතනයේ සල්ලි වියදම් කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මම තමුන්නාන්සේගෙන් ඉල්ලන්න කැමැතියි, මේ ආයතනය කර තිබෙන මේ විය හියදම් ගැන පරීක්ෂණයක් කරලා -හරි හමන් විගණනයක් කරලා- තමුන්නාන්සේ මේ ගරු සභාවට නිවැරදි උත්තරයක් දෙන්න කියලා.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම මීට කලිනුත් මම මේ ගරු සභාවේ දී මේ කාරණය ඉදිරිපත් කළා. පසු ගිය කාලයේ පොස්ෆේට් ඇඹරීමේ මැෂින් තිබුණා. ඒ මැෂින්වල ධාරිතාව, අවුරුද්දකට මෙට්‍රික් ටොන් 60,000යි. තමුන්නාන්සේලාගේ මේ නිෂ්පාදනය වාගේම කොටසක් තමයි, බොහෝ දුරට - මෙට්‍රික් ටොන් 60,000ක පමණ ප්‍රමාණයක් තමයි - අවුරුද්දකට ඒකේ විකුණන්නේ. ඒ නිෂ්පාදන ධාරිතාව සම්පූර්ණ කර ගන්න ඒ මැෂින් හොඳටම ප්‍රමාණවත් වුණා. එහෙම ප්‍රමාණවත්ව තිබියදී තමුන්නාන්සේලාගේ ආයතනය චීනයෙන් වෙනම වී මෝල්ක් ගෙනාවා. චීනයෙන් grinding mill එකක් ගෙනාවා. එසේ ගෙනැවිත් කොළඹ තිබුණු සමාගමකට භාර දීලා, ඒකට කැලි ටික මූට්ටු කළා. අන්තිමේදී එහිදී සිදු වුණු අක්‍රමිකතා නිසා හිටපු සභාපතිවරයාට ගෙදර යන්න වුණා. මම හිතන හැටියට එම අක්‍රමිකතාව විතරක් නොවෙයි, තවත් අක්‍රමිකතා ගණනාවක් නිසා එතුමාට ගෙදර යන්න වුණා. හැබැයි, සිදු වුණු පාඩුව අය කර ගන්න, සිදු වුණු පාඩුවට වග කියන්න කෙනෙක් නැහැ. සභාපති මෙතැනින් අයින් වෙලා වෙන තැනකට යයි. නමුත් මේවායේ ගසාකෑම් කළ ඒවා ගැන, මේ ආයතනයේ සල්ලිවලට වුණු දේ ගැන එතැනින් එහාට වග කියන්න කවුරුවත් නැහැ. මේ ආයතනවල සභාපතිවරුන් පත් කරන්නේ අපි නොවෙයි; වෙනම interview කරලා නොවෙයි. දේශපාලන අධිකාරියේ හිතවත්කම්වලට පත් කරන අය තමයි මේ වාගේ ගසාකෑම්වලට වැඩිපුරම ලක් වෙන්නේ. එහෙම නම් මම තමුන්නාන්සේගෙන් අහනවා, මේ පාරවල්වල වැඩ වෙනුවෙන් ගත්ත මුදල හරියාකාරව වියදම් කර තිබෙනවාද කියලා. තමුන්නාන්සේ මේ ගැන වහාම පරීක්ෂණයක් කරලා ඒ ගැන රටට හෙළි කරන්න කියන එකත් මම මේ අවස්ථාවේ දී මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම ආයතනයේ සාමාන්‍යයෙන් සේවකයන් 350ක් විතර ඉන්නවා. හැබැයි, shift ක්‍රමයට වැඩ කරන්නේ. එක shift එකකට වැඩ කරන සංඛ්‍යාවත් එක්ක බැලුවාම, තව දහ පහළොස් දෙනෙකුට වැඩි පිරිසක් මේ ආයතනයේ නිකම් කාලය නාස්ති කරනවා. ඒ ගොල්ලන්ට හරි හමන් වැඩක් නැහැ. ඇයි, වැඩක් නැත්තේ? තමුන්නාන්සේලා දේශපාලන හිතවත්කම් අනුව වැඩ කරපු ගෝල බාලයන්ට රස්සා දෙනවා වෙනුවට ඔවුන්ගෙන් මේ ආයතනය පුරවා තිබෙන්නේ. පිරෙව්වා විතරක් නොවෙයි, දැන් අලුත්ම සිදුවීම තමයි ලංකා පොස්ෆේට් ලිමිටඩ් ආයතනයේ හිටපු ආරක්ෂක අංශය පෞද්ගලික අංශයකට භාර දීලා, ඒ අයත් අර ගෙන ගිහින් මෙම ආයතනය ඇතුළට දමලා තිබෙනවා.

ගරු දයාශ්‍රිත තිසේරා ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් මෙය අහනවා. මේ අයට පඩි ගෙවන්නේ කොහොමද? මේ ආයතනයේ එක පිරිසක් වෙහෙස මහන්සි වෙලා ගන්න නිෂ්පාදනයට ලැබෙන මුදලින්, නිකම් ඉන්න විශාල පිරිසකට පඩි ගෙවන්න වෙලා තිබෙනවා. මෙක වහාම නවත්වන්න ඕනෑ. ආරක්ෂක අංශයේ එක පුද්ගලයෙක්, දෙන්නෙක් කරපු වැරැදිවලට මුළු ආරක්ෂක අංශයේ අයම මේ ස්ථානයට දමලා, මේ ආයතනයේ මුදල් කාබාසිනියා කරන්න ඉඩ දෙන්න එපාය කියන කාරණය මම තමුන්නාන්සේට මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ තවත් කාරණයක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ ආයතනයේ අඩු පාඩුකම් ගැන තමුන්නාන්සේට අවස්ථා ගණනාවකදී පැහැදිලි කළා. මේ ආයතනයේ වැඩ කරන සේවකයන් සියලු දෙනා කිසිම භේදයකින් තොරව -ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වෘත්තීය සමිතිය, එක්සත් ජාතික පක්ෂයේ වෘත්තීය සමිතිය, ඒ වාගේම මේ කාර්යාලයේ වැඩ කරන වෘත්තීය සමිතිවලට නොබැඳුණු නිලධාරීන්- එකතු වෙලා මේ ආයතනයේ දූෂණ, වංචා, හොර මැරකම් සියල්ල ගැන තමුන්නාන්සේට පැමිණිලි කරලා තිබෙනවා. තමුන්නාන්සේගෙන් ඒකට හරියාකාරව විසඳුමක් ලැබුණේ නැති නිසා, මේ සියලු නිලධාරීන් එකතු වෙලා මේ කරුණු සඳහන් කරලා ජනාධිපතිතුමාට ලිපියක් යැව්වා. ඒ ලිපියට අත්සන් කළ අයගේ ලැයිස්තුව මා ළඟ තිබෙනවා. සියලු වෘත්තීය සමිතිවලට අයත් නිලධාරීන් 170 දෙනෙක් මේ ලියුමට අත්සන් කරලා තිබෙනවා. නිලධාරීන් 170 දෙනෙක් එකතු වෙලා පෙත්සමක් අත්සන් කරලා යැව්වාය කියලා දඩුවම හම්බ වෙලා තිබෙන්නේ කාටද? ගරු ඇමතිතුමනි, ඒ ආයතනයේ හිටපු එක නිලධාරියෙකුට තමුන්නාන්සේලා දඩුවම් දීලා තිබෙනවා. ඒ වාගේම, එක්සත් ජාතික පක්ෂයේ වෘත්තීය සමිතියේ සිටි නිලධාරීන් දෙදෙනෙකුගේ සේවය දීර්ඝ කිරීම නවත්වා තිබෙනවා. මේ ආයතනයේ සාමාන්‍යාධිකාරිවරයා මඟින් එවා තිබෙන, "ඩී.ඒ. මුණසිංහ මෙනෙවිය, පරිපාලන හා මානව සම්පත් කළමනාකරු, ලංකා පොස්ෆේට් ලිමිටඩ්, එප්පාවල" කියන ලිපිය මඟින් එම නිලධාරිනියගේ සේවය අත් හිටුවා තිබෙනවා. මොකක්ද හේතුව? ඒ නිලධාරීන්ට තිබෙන එකම චෝදනාව, මේ ආයතනයේ තිබෙන අක්‍රමිකතා, වැරැදි, අඩු පාඩු ටික ජනාධිපතිතුමාට දන්වා යවපු ලිපියට අත්සන් කරපු එකයි.

මේ ආයතනයේ හිටපු ඒ නිලධාරීන් ඇතුළු ඒ කණ්ඩායම මේ කරුණු විරුද්ධ පක්ෂයේ අපට දැනුම් දුන්නේ නැහැ; ජනතා විමුක්ති පෙරමුණේ කාර්යාලයට යැව්වේ නැහැ. මේවා ගැන පරීක්ෂණයක් කරන්න කියලා මේ අය මේ ලිපිය සකස් කරලා යැව්වේ මේ රටේ ජනාධිපතිවරයාට. ඒකේ ප්‍රතිඵලයක් හැටියට, එක්සත් ජාතික පක්ෂයේ වෘත්තීය සමිතියේ සිටි මුණසිංහ මහත්මයාගේ සහ සෝමරත්න දිසානායක මහත්මයාගේ සේවාව දීර්ඝ කිරීම නවත්වලා, පරිපාලන නිලධාරිනියක හැටියට කටයුතු කරපු මුණසිංහ මෙනෙවියගේ රැකියාව අහිමි කරලා තිබෙනවා. එහෙම කළේ වෙන මොකක්වත් නිසා නොවෙයි, මේ ආයතනයේ දූර්වලකම් රටට හෙළි කළා කියලායි. ඇත්තටම රටට හෙළි කළේත් නැහැ; පත්තරවලට දුන්නේත් නැහැ. එහෙම වෙන කාටවත් ඔවුන් මේ තොරතුරු දුන්නේ නැහැ නේ. ජනාධිපතිතුමාට දැන්වුවා කියලායි එහෙම කළේ. එහෙම නම් වෙන කාටද දන්වන්නේ ගරු ඇමතිතුමනි? ඔබතුමාට ඒ තොරතුරු දුන්නාට, ඔබතුමාගෙන් ඒ සඳහා හරි පිළිතුරක් ලැබුණේ නැත්නම්, සභාපතිවරයාගෙන් හරි පිළිතුරක් ලැබෙන්නේ නැත්නම්, එතැන තිබෙන දූෂණ, අක්‍රමිකතා, වංචා සම්බන්ධයෙන් වෙන කාට කියන්නද? ඒ නිසා මම තමුන්නාන්සේගෙන් ඉල්ලන්නේ, මේ සම්බන්ධයෙන් හරිහමන් පරීක්ෂණයක් කරලා, ඒ වැඩ තහනමට ලක් වුණු නිලධාරීන් ගැන පෞද්ගලිකව සොයා බලන්න කියලායි.

ගරු ඇමතිතුමනි, මේ ආයතනය රැක ගැනීම ඔබතුමාගේ යුතුකමක්. ඇමතිවරයා හැටියට ඔබතුමාගෙන් අපි ඉල්ලන්නේ මේකයි. මේ ආයතනයේ ඇති වෙලා තිබෙන වංචා, දූෂණ සම්බන්ධයෙන් තමුන්නාන්සේ මීට වැඩිය හොයන්න.

[ගරු පී. හැරිසන් මහතා]

මේ නිලධාරීන්ගේ රැස්වීමක් කොළඹ තියන කොට ගරු ඇමතිතුමනි, ඒ හැම නිලධාරියෙකුටම දවසකට රුපියල් 2,500ක 3,000ක පමණ විශාල මුදලක් ගෙවනවා. ඒ මුදල ගෙවලා මේ අය කොළඹට කැඳවනවා. කොළඹදී මේ අය ඔක්කොම මුණ ගැහෙන්නේ, අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම තියෙන්නේ කටුනායක පැත්තේ තිබෙන හෝටලයක. මේ එක සාකච්ඡාවක් වෙනුවෙන් ලොකු මුදලක් වැය කරනවා. ඉස්සර මේවා මෙහෙම වුණේ නැහැ. ඉස්සර මේ සාකච්ඡා ඔක්කෝම තිබ්බේ එප්පාවල පොස්පේට් කර්මාන්තශාලාව ඇතුළේ. තමුන්නාන්සේත් එක්ක කළ සාකච්ඡාවේදී, කවුරු හරි වගකිව යුතු නිලධාරියෙක් ඒකට යොමු කරන්නම් කියලා තමුන්නාන්සේත් කිව්වා. හැබැයි, අද වනතෙක් ඒ වැඩේ කෙරිලා නැහැ. ඒක නිසා මම තමුන්නාන්සේට කියන්නේ විශේෂයෙන්ම මේ කාර්යය ගැන සොයලා බලන්න කියලායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තමයි මෙහි ප්‍රධාන නිලධාරීන් දෙදෙනා. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයා සහ සාමාන්‍යාධිකාරිවරයා. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයාගේ පත්වීම ඉතාම දුෂිත පත්වීමක්. කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ගන්නේ නැතිව ඒ නිලධාරියාට රුපියල් 75,000ක විතර ලොකු පඩියක් ගෙවනවා. තව රුපියල් 75,000කට කිට්ටු ඉන්ධන දීමනාවක් ගෙවනවා. ඒ පත්වීම සම්බන්ධයෙන් ඔබතුමා නිසි පියවරක් ගනීවි කියලා මම හිතනවා. එක්කෝ ඒ වැරදි පත්වීම අවලංගු කරන්න, එහෙම නැත්නම් සුදුස්සෙක් එතැනට පත් කර ගන්න. එතුමා විශ්‍රාම ගිය නිලධාරියෙක්. තවත් දක්ෂ නිලධාරීන් ඉඳිද්දී තමයි ඒ පත්වීම කරලා තිබෙන්නේ. ඒ වාගේම තමයි පත් කළ සාමාන්‍යාධිකාරිවරයා. එතුමා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයකු විධියට කටයුතු කළත්, සාමාන්‍යාධිකාරිවරයා හැටියට කටයුතු කරන්න සුදුසුකම් නැහැ. ඒ නිසා ඒ සම්බන්ධයෙන් තමුන්නාන්සේ කටයුතු කරයි කියලා මා බලාපොරොත්තු වෙනවා.

මම මීට වඩා කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. චන්ද්‍රානි බණ්ඩාර ගරු මන්ත්‍රීතුමියට මේ යෝජනාව ස්ථිර කරන්න අවස්ථාව දෙමින්, මට මේ අවස්ථාව ලබා දීම ගැන තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙමින් නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරුමන්ත්‍රීතුමනි.

[අ.භා. 6.44]

ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය
(மாண்புமிகு (திருமதி)சந்திராணி பண்டார ஜயசிங்க)
(The Hon. (Mrs.) Chandrani Bandara Jayasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ යෝජනාව ස්ථිර කරමින්, ඒ පිළිබඳව අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්න කැමැතියි. දකුණු ආසියාවේ තිබෙන විශාලතම, වටිනාම ස්වාභාවික සම්පතක් තමයි මේ පොස්පේට් නිධිය. අද මේ පොස්පේට් නිධිය හරහා අපේ රටට විශාල විදේශ විනිමයක් එනවා. නමුත් අද මේ වටිනා සම්පතට අදාළ ආයතනය බොහොම කනගාටුදායක තත්ත්වයක තමයි තිබෙන්නේ.

අවුරුදු විස්සකට ආසන්න කාලයක් රට පාලනය කරන එක්සත් ජනතා නිදහස් සන්ධාන රජය දේශීය කර්මාන්ත නහාසිටුවනවා කියලා හැම තිස්සේම කිව්වාට, මේ වනවිට නහාසිටුවා තිබෙන දේශීය කර්මාන්ත මොනවාද කියලා තමයි අපි අහන්නේ. විශේෂයෙන්ම මේ පොස්පේට් ආයතනය විශාල ලෙස ලාභ උපයන ආයතනයක්. නමුත් අද වන විට ඒ උපයන ලාභයට මොකද වෙන්නේ කියන එක තමයි ඒ ආයතනයේ සේවය කරන සේවකයන්ටත් ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ. ඒ නිසා තමයි මේ පිළිබඳව සොයා බලන්න කියලා විෂය භාර අමාත්‍යවරයාට වාගේම අතිගරු ජනාධිපතිතුමාට ඒ අය ලිඛිතව පවා දිගින් දිගටම දැනුම් දීලා තිබෙන්නේ. නමුත් අද වන තෙක් ඒ ගැන කිසිම දෙයක් කෙරිලා නැහැ. ඒ සම්බන්ධයෙන් මේ ආයතනයේ සිටින ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය සහ එක්සත් ජාතික පක්ෂයේ ජාතික සේවක සංගමය - මේ දෙගොල්ලම - එකතු වෙලා මෙහි සිදු වන වංචා, දූෂණ පිළිබඳව සොයලා බලලා, පරීක්ෂණයක් කරලා ඒකට සාධාරණයක් කරන්න කියලා විෂය භාර ඇමතිතුමාටත්, අතිගරු ජනාධිපතිතුමාටත් ලිඛිතව පැමිණිලි කර තිබෙනවා. නමුත් අද වන තෙක් ඒ පිළිබඳව කිසිම දෙයක් සිදු වෙලා නැහැ.

මේ ආයතනයේ මහා පරිමාණයෙන් වංචා දූෂණ සිද්ධ වෙනවා. ඒ වංචා දූෂණ පිළිබඳව අපේ ගරු පී. හැරිසන් මන්ත්‍රීතුමාත් කිව්වා. පොල් පොහොර නිෂ්පාදනාගාරයක් පිහිටුවා තිබෙනවා, වාරියපොළ. ඇත්තටම ඒ සඳහා ඉඩමක් අනුරාධපුරයේ තිබුණේම නැද්ද කියලා අපි අහනවා. වාරියපොළ වාගේ එතරම් දුර ප්‍රදේශයකට ඒ ආයතනය ගෙනැල්ලා තිබෙනවා. ඒකත් ආරම්භ කරලා තිබෙන්නේ පන්සල් වත්තක. ඒ පන්සලේ ඉන්න ස්වාමීන් වහන්සේට ඒ ආයතනයෙන් කැබ රථයක් ලබා දීලා තිබෙනවා. ඉතින් ආයතනයක පරිපාලනයට ස්වාමීන් වහන්සේ කෙනෙක් පත් කර තිබෙන්නේ මොකටද කියන ප්‍රශ්නයත් ඒකෙන් මතු වෙනවා. ඒ නිසා අනවශ්‍ය විධියේ දූෂණ වංචා මහා පරිමාණයෙන් මේ ආයතනය තුළ සිදු වෙමින් පවතිනවා. ඒ වාගේම මට ආරංචි විධියට, කොළඹ ගොඩනැඟිල්ලට රුපියල් ලක්ෂ 40ක් නොවෙයි, ලක්ෂ 80කට වැඩි මුදලක් වියදම් කරලා තිබෙනවා. එතැන ඉන්නේ සේවකයෝ විසිදෙනායි. ඒ වෙනුවෙන් මාසයකට රුපියල් ලක්ෂ 50ක විතර වියදමක් යනවා. ඉතින් බලන්න, කොයි තරම් දූෂණයක්, ගසාකෑමක් මේ ආයතනය තුළ සිදු වෙනවාද කියලා? මේ සිදුවීම් එක්ක දූෂණ, වංචා විශාල ලෙස මේ ආයතනය තුළ සිදු වෙනවා. මේ ආයතනයේ අහිංසක සේවකයෝ පොස්පේට් ගල් කඩලා, ඒවා අඹරනවා. එහෙම වැඩ කර ඒ එන ලාභයේ වාසිය ඒ සේවකයන්ට ලැබෙන්නේත් නැහැ; ඒ ආයතනයට ලැබෙන්නේත් නැහැ. ඒ නිසා විශේෂයෙන්ම මේ පිළිබඳව දිගින් දිගටම පැමිණිලි කළාම ලොකු සැකයක් මතු වෙනවා. මේ දිස්ත්‍රික්කයේ ඉන්න විපක්ෂයේ මන්ත්‍රීවරු හැටියට අපටත් ලොකු සැකයක් පහළ වෙනවා. මේ සමාගමේ ඉන්න සභාපතිතුමා ඇතුළු මේ පාලකයෝ මේ එන මුදල් ගිල ගන්නවාද කියන සැකය අද මතු වෙලා තිබෙනවා. මොකද, සේවකයෝ දිගින් දිගටම පැමිණිලි කළාට මේ සම්බන්ධයෙන් කිසිම ප්‍රතිඵලයක් ලැබිලා නැහැ. මේකෙන් පේන්නේ "නඩුත් හාමුදුරුවන්ගේ - බඩුත් හාමුදුරුවන්ගේ" වාගේ දෙයක්. ඒ නිසා විශේෂයෙන්ම මේ පිළිබඳව වහාම පරීක්ෂණයක් පවත්වලා, මේ ඉන්න සේවකයන්ට සාධාරණයක් ඉෂ්ට කරන්න ඕනෑ.

අනුරාධපුර දිස්ත්‍රික්කය ගත්තාම, අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැබිනට් ඇමතිවරු ඉන්නවා; ප්‍රධාන අමාත්‍යවරයා ඉන්නවා. මේ අය ඇස් වහගෙන, කන් වහගෙන ඉඳලා හරි යන්නේ නැහැ, මේවාගේ සම්පතක් මේ විධියට නාස්තිවෙලා යනකොට. මේ විධියට වංචා, දූෂණ සිදු වෙන කොට වහාම ක්‍රියා මාර්ගයක් ගන්න ඕනෑ. ඒ නිසා මේ ඉදිරියේදී එන ජනාධිපතිවරණය හෝ වේවා, පාර්ලිමේන්තු මහා මැතිවරණය හෝ වේවා, ඊට කලින් වහාම මේ පිළිබඳව ක්‍රියා මාර්ගයක් අරගෙන මේ ආයතනයේ ඉන්න සේවකයන්ටත්, මේ ආයතනයටත් සාධාරණයක් ඉෂ්ට කරන්නය කියා ඉල්ලා සිටින අතර එම යෝජනාව ස්ථිර කරමින් මා නිහඬ වෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි මන්ත්‍රීතුමිය.
පිළිතුරු කථාව කිරීමට ගරු දයාශ්‍රිත තිසේරා අමාත්‍යතුමා.

[අ.භා. 6.49]

ගරු දයාශ්‍රිත තිසේරා මහතා (රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு தயாசிறித திசேரா - அரச வளங்கள், தொழில்முயற்சி அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Dayasritha Thissera - Minister of State Resources and Enterprise Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ යෝජනාව ඉදිරිපත් කරන ලද අපේ ගරු පී. හැරිසන් මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම ලංකා පොස්පේට් ආයතනය මා නියෝජනය කරන මෙම අමාත්‍යාංශයට ලැබිලා වසර 4 ක් විතර වෙනවා. මේ ආයතනය අප අමාත්‍යාංශයට ලැබෙද්දී මේ කර්මාන්තශාලාව බොහොම ගරා වැටුණු තත්ත්වයකයි තිබුණේ. අපි මේ වෙද්දී එය වෙනස් කර, අද මෙම ආයතනය ප්‍රියමනාප තත්ත්වයට ගෙනැවිත් තිබෙනවා. එපමණක් නොවෙයි ලාභ ලබන තත්ත්වයටත් ගෙනවිත් තිබෙනවා. අපේ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන ලද විස්තර දිහා බලද්දී පසු ගිය කාලය තුළ යම් ප්‍රශ්නයක් තිබුණා. ඒක මම පිළිගන්නවා. සියලුම ව්‍යක්තීය සමිති සමඟ ඒකාබද්ධව මම සාකච්ඡා කළා. සාකච්ඡා කර විසඳුම් දුන්නා. නැවත ඒ සියලුම ව්‍යක්තීය සමිති කොළඹට කැඳවා -මගේ අමාත්‍යාංශයට කැඳවා- ප්‍රශ්න තිබෙනවාද කියලා ඇහුවා; "නැහැ" කිව්වා. ඊට පස්සේ - තව මාස 2කට වාගේ පස්සේ- නැවතත් කැඳෙව්වා. මම හිතන හැටියට තුන්වරක් විතර මම මේ වෙද්දී කැඳවලා තිබෙනවා, ප්‍රශ්නය ඉදිරිපත් කෙරුවාට පස්සේ. "ප්‍රශ්න තිබෙනවා නම් ඉදිරිපත් කරන්න" කිව්වා. තමුන්නාන්සේලාගේ ව්‍යක්තීය සමිතිය කැඳෙව්වා; අපේ ව්‍යක්තීය සමිතිය කැඳෙව්වා. මේ සියල්ල ඒකාබද්ධව කැඳවලා සාකච්ඡා කළාම "දැන් නම් ප්‍රශ්න නැහැ" කියන එක තමයි ඔවුන් මට නම් ප්‍රකාශ කෙරුවේ, ගරු මන්ත්‍රීතුමා. අද තමුන්නාන්සේලා මේ ආයතනයේ දූෂණ ගැන, වංචා ගැන කථා කරනවා. තමුන්නාන්සේලා තැනින් තැනට යනවා, ආයතන පරීක්ෂා කරන්න, නරඹන්න. මම තමුන්නාන්සේලාට ආරාධනා කරනවා, තමුන්නාන්සේලා අපේ ආයතනයටත් ඇවිල්ලා නරඹන්න. මට සැකයක් ඇති වෙනවා, තමුන්නාන්සේලා අනුරාධපුර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරු දෙදෙනෙක් හැටියට මේ පරණ වුණු විස්තර වගයක් අද කථා කෙරුවේ ඇයි කියලා.

ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය
(மாண்புமிகு (திருமதி)சந்திராணி பண்டார ஜயசிங்க)
(The Hon. (Mrs.) Chandrani Bandara Jayasinghe)
නැහැ. නැහැ. පරණ විස්තර නොවෙයි.

ගරු දයාශ්‍රිත තිසේරා මහතා
(மாண்புமிகு தயாசிறித திசேரா)
(The Hon. Dayasritha Thissera)
තමුන්නාන්සේලා හෙට ගිහිල්ලා බලන්න-[බාධා කිරීමක්]

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

බාධා කිරීමක් නොවෙයි, ඇමතිතුමාට තව සහයෝගය දෙන්න. මොකද මේ ප්‍රශ්න නැහැ කියන්න බැහැ ඇමතිතුමා. ප්‍රශ්න තිබෙනවා. තමුන්නාන්සේත් ඇවිල්ලා කීපවරක් කථා කර ගිහිල්ලා තිබෙනවා. එතකොට ඔබතුමා කිව්වාට පස්සෙත් මේ ප්‍රශ්න විසඳිලා නැහැ. නැතුව මේ පරණ විස්තර ඇතුව අපි කියනවා නොවෙයි. මේ පොස්පේට් එක ඔබතුමා බාර ගන්න කලිනුත් ලාභ ලබපු ආයතනයක්. ඒ වෙන කොටත් ලංකා බැංකුවේ එප්පාවල ශාඛාවේ රුපියල් මිලියන 30ක ස්ථාවර තැන්පතුවක් තිබුණා.

ගරු දයාශ්‍රිත තිසේරා මහතා
(மாண்புமிகு தயாசிறித திசேரா)
(The Hon. Dayasritha Thissera)

ඒක තාම එහෙම තිබෙනවා. ඒක දැන් වැඩිවෙලා තිබෙනවා. මම හිතන හැටියට ස්ථාවර තැන්පතුව මිලියන 325 දක්වා අපි වැඩි කරලා තිබෙනවා. හැබැයි, අවශ්‍ය වෙලාවට අපි බැංකුවේ තිබෙන ස්ථාවර තැන්පතුව අරගෙන ආයතනයේ ප්‍රශ්නවලට, ආයතනය ගොඩ නඟන්න යොදවලා ලාභාංශ ලැබුණාම ඒ මුදල් නැවත අපි බැංකුවේ තැන්පත් කර තිබෙනවා. එහෙම නැතුව අපි කාබාසිනියා කරලා නම් නැහැ. මම මේ අමාත්‍යාංශය බාර ගත්තාට පස්සේ ඒ ආයතන දියුණු කරන්න බැලුවා මිසක් මේ ආයතන විනාශ කරන්න ඉඩ දුන්නේ නැහැ. මම ඉන්න තාක් කල් ඉඩ දෙන්නේත් නැහැ කියන ඒ පොරොන්දුව මම තමුන්නාන්සේට දෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, අපි මේ වසර තුන තුළ මහා භාණ්ඩාගාරයට රුපියල් මිලියන 120ක් ලබා දී තිබෙනවා. එප්පාවල අභ්‍යන්තර මාර්ගය ගැන තමුන්නාන්සේ ප්‍රකාශ කළා. ආයතනයට ලැබෙන ලාභාංශයෙන් අද අපි ඒක අලුත්වැඩියා කර තිබෙනවා. අපි පොල් පොහොර කම්හල වාරියපොළ ප්‍රදේශයේ නිර්මාණය කළා. පොල් පොහොර කම්හල වාරියපොළට ගෙන යන්න හේතුව වුණේ, පොල් ත්‍රිකෝණයට අපි සම්බන්ධ වෙන්න ඕනෑ කියන අදහස අනුවයි. අනෙක් එක මම පොල් ත්‍රිකෝණය ආශ්‍රිතව ජීවත්වන ඇමතිවරයෙක්. ඒ නිසා මම අදහස් කළා, පොල් පොහොර නිෂ්පාදනය කරන කර්මාන්තශාලාව පොල් ත්‍රිකෝණය තුළ ඉදි කරන්න.

අද මේ වෙද්දි -පොහොර හඳුන්වා දීමේ කාලය තුළ- අපි පොහොර මෙට්‍රික්ටොන් 190ක් විකුණලා තිබෙනවා. අපි පොහොර මිටියක් දෙන්නේ රුපියල් 1,170යි. මම හිතන හැටියට අනෙකුත් ආයතන පොහොර මිටියක් දෙන්නේ රුපියල් 1,250යි. අපි "පොල් ඩබල්" කියලායි ඒ පොහොර වර්ගය හඳුන්වලා තිබෙන්නේ. අද ඒ සඳහා ලොකු ඉල්ලුමක් තිබෙනවා. ඒ ඉල්ලුමේ හැටියට සපයන්න ඉදිරියේදී තව යන්ත්‍රාගාරයක් ඒ ස්ථානයේ සවි කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ අනුව අපේ ප්‍රදේශය තුළ -පොල් ත්‍රිකෝණය තුළ- පොල් පොහොර ගැන දැඩි විශ්වාසයක් ගොඩ නැඟිලා තිබෙනවාය කියන එක මා මේ අවස්ථාවේදී තමුන්නාන්සේට ප්‍රකාශ කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වන කොට රට තුළට ටීඑස්පී පොහොර ආනයනය කරනවා, මෙට්‍රික් ටොන් 185,000ක්. අපි මේ ආයතනය තුළ ටීඑස්පී පොහොර නිෂ්පාදනය කිරීමේ වැඩ පිළිවෙළක් සඳහා යන්න ඉදිරියේදී බලාපොරොත්තු වනවා. අපි පෞද්ගලික අංශයත් සමඟ සම්බන්ධ වෙලා මේ රටට ටීඑස්පී පොහොර ගෙන්වනවා වෙනුවට, මේ රටේ නිෂ්පාදනය කරලා මේ රටේ ගොවීන්ට සහන මිලට ලබා දෙමින් ශක්තියක් වෙන්න තමයි බලාපොරොත්තු වන්නේ. අපි ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කරලා තමයි සියලුම ඉදි කිරීම්, මිලදී ගැනීම් කටයුතු සිදු කර තිබෙන්නේ. අපි බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය අනුගමනය කරලා තිබෙනවා. මේ වෙද්දි ආයතනය තුළ සේවකයන් 337ක් සේවය කරනවා. ඊට වැඩි ප්‍රමාණයක් අපි බඳවා ගෙන නැහැ. තමුන්නාන්සේලාට මම තව තවත් කරුණු ඉදිරිපත් කරන්නම්. ඊට පෙර ගරු පී. හැරිසන් මන්ත්‍රීතුමාට මා නැවත වතාවක් ආරාධනා කරනවා, ඒ ආයතනයට ගිහින් අද මොකක්ද වෙන්නේ, මොකක්ද කෙරෙන්නේ කියලා බලන්න කියලා. මොකද, තමුන්නාන්සේ ප්‍රකාශ කළා, ආරක්ෂක අංශය ගැනත්. පසු ගිය කාලයේ ආරක්ෂක අංශයේ තිබුණු පතරොම් නැති වුණා. ආරක්ෂක අංශය සිටිද්දී ආයතනය තුළ සොරකම් සිදු වුණා. ඒ නිසා අපි තීන්දු කළා, ආරක්ෂක අංශයේ අයට ඒ ගොල්ලන්ගේ කැමැත්ත මත ආයතනයේම යම් යම් ස්ථානවල සේවය ලබා දීලා, පිටින් ආරක්ෂක අංශයක් ගැනීමට. අපි දැන් ඒක ක්‍රියාත්මක කර තිබෙනවා. ඒ අනුව ආයතනයේ ආරක්ෂාව අද වැඩි වෙලා තිබෙනවා. අද පතරොම් නැති වෙන්නේ නැහැ.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි, පතරොම් නැති වුණ අවස්ථාවේ සිටි ආරක්ෂක නිලධාරින්ම නේද දැන් ඔබතුමා ඇතුළේ තියා ගෙන ඉන්නේ කියලා. ඒ ගොල්ලන්ට විරුද්ධව විධිමත් පරීක්ෂණයක් පවත්වලා වැරදිකාරයන්ට දඬුවම් දෙන්න කටයුතු කළේ නැත්තේ ඇයි? ඒ හොරු ටික නැවතත් ඇතුළේම නේ ඉන්නේ.

ගරු දයාශ්‍රිත තිසේරා මහතා
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)

ඇත්ත වශයෙන්ම මේ ආයතනයේ කටයුතු කර ගෙන යෑමේදී ප්‍රදේශයෙන් යම් යම් බලපෑම් හා ඉල්ලීම් එනවා. ඒ නිසා මම ඇමතිවරයා හැටියට උපදෙස් දීලා තිබෙන්නේ, ඒ අයව හදන්න පුළුවන් නම් අරගෙන හදා ගන්න කියලායි. නමුත් ඔබතුමා කියනවා නම් ඒ අය ගැන තවදුරටත් පරීක්ෂණයක් පවත්වන්න කියලා අපි ඉදිරියේදී ඒ ගැන කටයුතු කරන්නම්.

තමුන්නාන්සේ සාමාන්‍යාධිකාරිතුමා, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිතුමා සම්බන්ධව කිව්වා. ඒ අය වැඩ බැලීමේ පදනම මතයි ඉන්නේ. ඒ අයගෙන් යම් අකටයුත්තක් සිදු වනවා නම් මම ඒ ගැන සොයා බලා කටයුතු කරන්නම්. නමුත් රජයෙන් දෙන වැටුප දිහා බැලුවාම අපේ ආයතනවලට නිලධාරින් බඳවා ගැනීමේදී යම් යම් ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා. ඒ නිසා අපට සිද්ධ වෙලා තිබෙනවා මේ ආයතන තවදුරටත් පවත්වා ගෙන යෑම සඳහා වයස්ගත වූවත් ඒ ආයතනවල ඉන්න හොඳ දැනුමක් හා අත් දැකීම් තිබෙන උදවියගෙන් ප්‍රයෝජන ගන්න. ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ ඉදිරිපත් කරන ලද යෝජනා, චෝදනා සියල්ල අපි ගොනු කර ගෙන ඉදිරියේදී ආයතනයේ ශුභ සිද්ධිය වෙනුවෙන් කටයුතු කරනවා. ඔබ තමුන්නාන්සේලා ඒ ප්‍රදේශයේ ජීවත්වන මන්ත්‍රීවරුන් හැටියට මේ දක්වන උනන්දුව හා සහයෝගය ගැනත් ඇත්ත වශයෙන්ම මම ස්තුතිවන්ත වනවා.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු ඇමතිතුමනි, පොඩි කාරණයක් කියන්න ඕනෑ. ඉස්සර මේ ආයතනයේ සිටියා සාමාන්‍යාධිකාරිවරයෙක්, නැත්නම් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයෙක්. ඒ දෙදෙනාගෙන් එක් කෙනෙක් එප්පාවලම නවත්වා ගන්න වැඩ පිළිවෙළක් සකස් කරන්න පුළුවන්ද කියලා මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

ගරු දයාශ්‍රිත තිසේරා මහතා
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)

ඒ ගැන ඔබතුමා ඉදිරිපත් කළ යෝජනා, චෝදනා අපි සාකච්ඡා කරලා තමුන්නාන්සේගේ ඒ කාර්ය භාරය සඳහා යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නම්. විපක්ෂයේ වුණත්, තමුන්නාන්සේලා අපේ ආයතනය ගැන සොයා බලා කටයුතු කිරීම ගැන ඇත්ත වශයෙන්ම මා සන්තෝෂ වෙනවා. අපට නොපෙනෙන තැන් තිබෙනවා නම්, ඒවා පෙන්වා දෙනවා නම් බොහොම ස්තුතියි. නමුත් මේ ආයතනය කඩා වැටෙන ආකාරයට කටයුතු කරන්න, පෞද්ගලීකරණය කරන්න කිසිසේත්ම මේ රජය - අපි - කටයුතු කරන්නේ නැහැ. ඒ වාගේම කෑගල්ලේ තිබෙන අපේ ඉඩමේ ඉදිරියේදී රබර් පොහොර නිෂ්පාදනයත් අපි ආරම්භ කරනවා. තමුන්නාන්සේ ඒ ගැනත් කරුණු ඉදිරිපත් කරලා තිබුණා. ඒ වාගේම ඉදිරියේදී මේ රටේ TSP පොහොර, DAP පොහොර නිෂ්පාදනය කිරීමට අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලය තුළ ක්‍රියා කරනවා කියන එකත් මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන අතර තමුන්නාන්සේලා සියලු දෙනාටම ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව රීට අනුකූලව අ. භා. 6.59ට, අද දින සභා සම්මතිය අනුව, 2014 ඔක්තෝබර් 23 වන බ්‍රහස්පතින්දා අ.භා. 1.00 වන තෙක් කල් ගියේය.

අතන්පටි. පි.ප. 6.59 මණික්කු, පාරාළුමන්ත්‍රම් අතනතු ඉන්රෙය තීර්මානත්තුක්කිණങ්ක, 2014 ඔක්ටෝපර් 23, වියාළක්කිළමෙ පි.ප. 1.00 මණිවරෙ ඔත්තිවෛක්කප්පට්ටතු.

Adjourned accordingly at 6.59 p.m. until 1.00 p.m. on Thursday 23rd, October, 2014, pursuant to the Resolution of Parliament of this day.

සැ.යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

NOTE

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

Contents of Proceedings :

Final set of manuscripts Received from Parliament :

Printed copies dispatched :

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

சந்தா ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

Subscriptions : The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year .
Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.